# සම්මත අතුරු ව්‍යවස්ථා

01. නගර සභාවේ රැස්වීම් පිළිබඳ උපනීති
02. බේකරි පිළිබඳ උපනීති
03. බත්කඩ,තේ කෝපි කඩ පිළිබඳ උපනීති
04. භෝජනාගාර පිළිබඳ උපනීති
05. භෝජනාශාලා පිළිබඳ උපනීති
06. ලැගුම්හල් පිළිබඳ උපනීති
07. අප්‍රියවූද අන්තරාදායකවූද කර්මාන්ත පිළිබඳ උපනීති
08. සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ උපනීති
09. අයිස් කර්මාන්තශාලා පිළිබඳ උපනීති
10. කිරිපිටි හා කිරි විකිණීම පිළිබඳ උපනීති
11. කරණවෑම් මැදිරි හා බාබර් සාප්පු පිළිබඳ උපනීති
12. මාළු විකිණීම පිළිබඳ උපනීති
13. මස් විකිණීම පිළිබඳ උපනීති
14. හරක්ගාල් පිළිබඳ උපනීති
15. පොදු මාර්කට්ටු පිළිබඳ උපනීති
16. පුස්තකාලයන් පිළිබඳ උපනීති
17. මහජන සෞඛ්‍ය පිළිබඳ උපනීති
18. නිකරුනේ ඇවිදීම පිළිබඳ උපනීති
19. කසල ගොඩනය පිළිබඳ උපනීති
20. කැලිකසල ඉවත්කිරීම පිළිබඳ උපනීති
21. දියවැසිකිලි හා වැසිකිලි සාදා තබාගැනීම පිළිබඳ උපනීති
22. රථවාහන හා සත්ව බද්ද පිළිබඳ උපනීති
23. උකස් ලියාපදිංචිකිරීම් පිළිබඳ උපනීති
24. වාහන නතර කර තැබීම පිළිබඳ උපනීති
25. ජලසම්පාදනය පිළිබඳ උපනීති
26. ආහාර විකිණීම පිළිබඳ උපනීති
27. ළිං හෑරීම පිළිබඳ උපනීති
28. බැම්මක් බැඳ නැති ළිං පිළිබඳ උපනීති
29. සිනමා ශාලා තුල දුම් පානය කිරීමට පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
30. පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
31. ගොඩනැගිලි සැලැස්මවලට අතුරු ව්‍යවස්ථාව

32. [illegible] පිළිබඳ අතුරු ව්‍යවස්ථා.

# ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

මෙම අතුරු ව්‍යවස්ථාව 28 වගන්තිය
නාගරික සභා ආඥාපනත 153 (2) අනුව සකස් කිරීම

සැ. යු. - 2019.03.22 දින පළ වූ අංක 2,116 දරන ගැසට් පත්‍රයේ II, III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,117 - 2019 මාර්තු මස 29 වැනි සිකුරාදා - 2019.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... | 774 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| ඔප්පුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 794 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 797 |


සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව ලියපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අප්‍රේල් මස 18 වැනි දින පළකරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2019 අප්‍රේල් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


773 - B 81509— 5,403 (2019/03)

(4)



## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2018.07.12 දින ගරු මහා සභා අනුමැතිය මත 1975 අංක 04 දරන වීථි නම් කිරීම හා ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනත හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව 2018.12.27 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලැබී ඇති ගෝණගල්දෙණිය රෝහල අසළින් වෙන්දේසිවත්ත දක්වා දිවෙන මාර්ගය සඳහා ''දේවප්‍රිය මාවත'' නම භාවිතා කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

03-1424

---

## බලංගොඩ නගර සභාව

[redacted]

### සම්මත අතුරු ව්‍යවස්ථාව

261 වන අධිකාරිය වන අංක 1952 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බලංගොඩ නගර සභාව විසින් 2018.12.13 දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් අංක 05:01:19 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බලංගොඩ නගර සභාව.

2019 මාර්තු මස 07 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

''1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධි විධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබ 2013.06.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරන ලද, සබරගමුව පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බව 2018.07.20 දිනැති අංක 2.081 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරන ලද්ද වූ සබරගමුව පළාතේ නගර සභා බල ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ බලංගොඩ නගර සභාව යෝජනා කරන්නීය.''

03-1273

திணைக்களத் தலைவரின் உறுதியுரை :
(அரசாங்க சேவை/மாகாண அரசாங்க சேவை/அரச கூட்டுத்தாபன/சட்டவாக்க சபையில் பணியாற்றும் விண்ணப்பதாரிகளுக்கு மட்டும்.)

திரு./திருமதி/செல்வி ........................................................................................ என்ற விண்ணப்பதாரி இந்த நிறுவனத்தில்/ திணைக்களத்தில் ..............................................ஆகப் பணியாற்றுகிறார். அவரது வேலை நடத்தை திருப்தியானவை எனவும் அவர் எவ்வகையிலான ஒழுக்காற்றுத் தண்டத்துக்கும் உட்படவில்லை என்பதையும் அதற்கென நடவடிக்கை எடுக்க உத்தேசிக்கப்படவில்லை என்பதையும் உறுதிப்படுத்தி அவரது விண்ணப்பத்தைப் பரிந்துரை செய்கின்றேன். அவர் இந்தப் பதவிக்குத் தெரிவு செய்யப்பட்டால் அவரது தற்போதைய சேவையிலிருந்து அவரை விடுவிக்க முடியும் /முடியாது எனவும் உறுதிப்படுத்துகின்றேன்.

......................................................
திணைக்களத் தலவரது கையொப்பம்.

பதவி(முத்திரை):..................................
திகதி: ..................................

03-1448

---

# உள்ளூராட்சி அறிவித்தல்கள்

## பலாங்கொடை நகர சபை

[redacted]

நிறைவேற்றப்பட்ட இடைக்கால யாப்பு

261 ஆம் அதிகார இலக்கம்1952 ஆம் ஆண்டின் அதிகார உள்ளூராட்சி நிறுவன (அங்கீகரிக்கப்பட்ட இடைக்கால அரசியலமைப்பு) யாப்பு 3 ஆம் உறுப்புரை (1) ஆவது துணை உறுப்புரையில் கொடுக்கப்பட்ட அதிகாரத்தின்படி பலாங்கொடை நகர சபையினால் 2018.12.13 ஆந் திகதி நடாத்தப்பட்ட சபைக் கூட்டத்தின் கீழ் துணை நூலில் குறிப்பிட்ட இல. 05:01:19 கொண்ட ஆலோசனை அனுமதிக்கப்பட்டது என இதில் அறிவிக்கப்படுகிறது.

பலாங்கொடை நகர சபை.

நகர சபை அலுவலகம்,
பலாங்கொடை,
2019, மாச்சு 07.

### தீர்மானம்

1989 ஆம் ஆண்டின் 12 ஆம் இலக்க, உள்ளூராட்சி (சட்டத்தால் அங்கீகரிக்கப்பட்ட ஏற்பாடு) யாப்பு 2 ஆவது உறுப்புரை (1) ஆவது துணை உறுப்புரை (அ) பந்தி உடன் வாசிக்க வேண்டும் 261 ஆவது அதிகாரம் 1952 ஆம் ஆண்டின் 6 ஆம் இலக்க, உள்ளூராட்சி நிறுவன (அங்கீகரிக்கப்பட்ட இடைக்கால அரசியலமைப்பு) யாப்பு 2 ஆம் உறுப்புரையில் 1ஆவது துணை உறுப்புரையின் கீழ் சப்பிரகமுவ மாகாண சபையில் உள்ளூராட்சி நெறி தொடர்பான அமைச்சருக்கு அளிக்கப்பட்ட அதிகாரத்தின் படி தயாரிக்கப்பட்ட 2013.06.28 ஆந் திகதிய படி இலங்கைச் சனநாயகச் சோசலிசக் குடியரசின் வர்த்தமானியில் IV (அ) பகுதியில் வெளியிடப்பட்ட சப்பரகமுவ மாகாண சபையினால் அனுமதிக்கப்பட்டுள்ளதாக 2018.07.20 ஆந் திகதிய 2081 ஆம் இலக்க, இலங்கைச் சனநாயகச் சோசலிசக் குடியரசின் வர்த்தமானியில் IV (அ) பகுதியில் வெளியிடப்பட்ட சப்பிரகமுவ மாகாணத்தின், மாநகர சபை, நகர சபை, பிரதேச சபை, அதிகார எல்லைக்குள் திட கழிவு மேலாண்மை தொடர்பான இடைக்கால அரசியலமைப்பு இந்த ஆலோசனை அரசியல் பத்திரத்தில் வெளியிடப்பட்ட திகதியிலிருந்து நடைமுறைப்படுத்துவதற்கும் ஏற்றுக் கொள்வதற்கும் மேற் கூறப்பட்ட உள்ளூராட்சி நிறுவன (அங்கீகரிக்கப்பட்ட இடைக்கால அரசியலமைப்பு) சட்டத்தின் 3 ஆவது உறுப்புரையின் (1) ஆம் துணை உறுப்புரையின் கீழ் பலாங்கொடை நகர சபையில் தீர்மானிக்கப்பட்டது.

03 - 1273

6



*Recommendation of the Head of the Institution*

(Only for the applicants already occupied in the Public Service, Provincial Government Service/ Government Corporation or Statutory Boards)

I hereby recommend the application of Mr. /Mrs. / Miss ................................ serving in this Institution / Department as ........................... and, I further certify that he /she can be released / cannot be released if selected, and his / her work and conduct is satisfactory and has not been subjected to any inquiry on disciplinary ground and no intention of taking such actions against him and I do forward the application.

..........................................,
Signature of the Head of the Department,
and the official seal.

Date :-------------.

03–1448

---

# Local Government Notifications

## RUWANWELLA PRADESHIYA SABHA

### Notice in respect of Naming of Roads

I hereby notice to the general public that the road starting near the Gonagaldeniya Hospital and running to Vendesiwatta will be declared as "Devapriya Mawatha" as per the decision taken by the Ruwanwella Pradeshiya Sabha at the General Meeting held on 12.07.2018 on which the approval has been granted by the Hon. Governor of the Sabaragamuwa Province, by her letter dated 27.12.2018 in terms of the Naming of streets and control of the Erection of Monument Act, No. 04 of 1975 and Section 198 to be read with Section 9.3 of the Pradeshiya Sabha Act, No. 15 of 1987.

L. H. Sudath Manjula,
Chairman.

Ruwanwella Pradeshiya Sabha,

03–1424

---

## BALANGODA URBAN COUNCIL

[redacted]

### Approved By-Law

AS per the powers vested in Sub-section (1) of Section 3 of the Local Government (Approved By-laws) Act of Chapter 261 No. 1952 the suggestion No. 05:01:19 mentioned in the following Schedule at the Council meeting held by the Balangoda Urban Council on 13th December 2018.

Balangoda Urban Council.

Balangoda Urban Council Office,
07th March, 2019.

SCHEDULE

As per the powers vested in the Minister in charge of the subject in the Provincial Council of Sabaragamuwa under Sub-section (1) of Section 2 of the Local Government (Approved By-laws) Act. No. 06 of 1952 that should be read with Sub-section (1) of Section 2 of the Provincial Council (Incidental Provisions) Act, No. 12 of 1989 in the suggestion

## සබරගමුව පළාත් සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ, පළාතේ සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.06.28 වැනි දිනැති ගැසට් පත්‍රයේ IV (අ) වන කොටසේ නිවේදනය කරනු ලැබූ සබරගමුව පළාතේ මහ නගර සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සබරගමුව පළාතේ පළාත් සභාව විසින් 2017.09.26 වැනි දින සබරගමු පළාත් සභාවේදී කියවා සම්මත කරනු ලැබූ බව නිවේදනය කරනු ලැබේ.

ශ්‍රියානි පද්මලතා,<br>
ලේකම්,<br>
නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන,<br>
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, විනිතා කටයුතු, සමුපකාර,<br>
වෙළෙඳ හා ආහාර, මගී ප්‍රවාහන සහ විදුලි සුබසාධන, පරිසර,<br>
ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශය,<br>
සබරගමුව පළාත් සභාව.

2018 ජූනි මස 11 වැනි දින.

07-498/1

---

## සබරගමුව පළාත් සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ, පළාතේ සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.06.28 වැනි දිනැති ගැසට් පත්‍රයේ IV (අ) වන කොටසේ නිවේදනය කරනු ලැබූ සබරගමුව පළාත් නගර සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සබරගමුව පළාතේ පළාත් සභාව විසින් 2017.09.26 වැනි දින සබරගමු පළාත් සභාවේදී කියවා සම්මත කරනු ලැබූ බව නිවේදනය කරනු ලැබේ.

ශ්‍රියානි පද්මලතා,<br>
ලේකම්,<br>
නීතිය හා සාමය, මුදල් හා සැලසුම්. පළාත් පාලන,<br>
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, විනිතා කටයුතු, සමුපකාර,<br>
වෙළෙඳ හා ආහාර, මගී ප්‍රවාහන සහ විදුලි සුබසාධන, පරිසර,<br>
ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශය,<br>
සබරගමුව පළාත් සභාව.

2018 ජූනි මස 11 වැනි දින.

07-498/2

---

## සබරගමුව පළාත් සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ. පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.06.28 වැනි දිනැති ගැසට් පත්‍රයේ IV (අ) වන කොටසේ නිවේදනය කරනු ලැබූ

## නගර සභා බල ප්‍රදේශ තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මා විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 153 වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 118 සහ 157 වගන්තියේ 9 වැනි උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදයන්ගෙන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට නගර සභාවලට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැලඳ ගැනීම සඳහා සබරගමුව පළාතේ නගර සභාවලට බලය පැවරී ඇත.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2013 මැයි මස 06 වැනි දින,

### ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මා විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 153 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 118 වගන්තිය සහ 157 වැනි වගන්තියේ 9 වැනි උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදයන්ගෙන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට නගර සභාවලට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැලඳ ගැනීම සඳහා සබරගමුව පළාතේ නගර සභාවලට බලය පැවරී ඇත.

පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2013 මැයි මස 06 වැනි දින,

#### සාමාන්‍ය

1. මෙම අතුරු ව්‍යවස්ථා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

2. නාගරික සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීථිවල, මංමාවත්වල ජනනය වන ඝණ අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍ර අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හෝ ප්‍රසන්න තත්වයෙන් තබා ගත යුත්තේ ය.

4. නගර සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍ර ඇතුළත ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කළ යුත්තේ ය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව එසේ කරවිය යුත්තේ ය.

5. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔහුගේ/ඇයගේ පරිශ්‍ර තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව වෙන් කළ යුත්තේ ය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩාකිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් වෙනත් බහාලුමක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ එක් රැස් කරනු ලැබීම පිණිස හොඳ තත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේ ය. ඒවා ඉරී, සිදුරු වී, කැඩී හෝ එකදිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොළොක්වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකළ යුත්තේ ය. හිමිකරුවන් හෝ පදිංචිකරුවන් අපේක්ෂා කරන්නේ නම් සභාව විසින් ගනු ලබන තීරණයක් අනුව කොටසක් සහනාධාරයක් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම සහනාධාරයක් වශයෙන් හෝ එවැනි බහාලුම් සභාවෙන්ම සැපයිය හැකි ය.

(iv) I උපවගන්තියේ විධිවිධානවල සඳහන් ආකාරයට එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ සභා බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස්කිරීමේ ක්‍රමයට හා කාල සටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් බැහැර කළ යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේ ය.

6. (i) කිසිම තැනැත්තෙක්, වීථියකට, පාරකට, මංමාවතකට, පටුමාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජලමාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් නගර සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට/ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(iv) අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකි ය.

(අ) සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි,

(ආ) සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම් විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකි ය. නැතිනම් ලේකම් විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම්, සැකසීම හෝ වැළලීම කළ හැකි ය.

(iii) යම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු "කොම්පෝස්ට් බඳුන්" සඳහා ලේකම් වෙතින් ඉල්ලීමක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් පරිශ්‍රය තුළ තිබේනම් ලේකම් එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින්ම හෝ සහනාධාරයක් වශයෙන් ලබාදෙමින් එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සපයනු ඇත.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන "ගෙවතු අපද්‍රව්‍ය" හැකිතාක් දුරට ලේකම් විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේ ය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේනම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක්, හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේ ය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේය. එසේත් නැතිනම් සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ භාරකරුට භාරදිය යුත්තේ ය.

(vi) සෑම තැනැත්තෙක්ම ඔහුගේ/ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක. මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේ ය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vii) කිසිම තැනැත්තෙක් නගර සභා ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයන් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ, පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(viii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අළුත්වැඩියා කිරීමට අයැදුම් කරන යම් කෙනෙක් ඔහුගේ/ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ/ඇයගේ අයැදුම් පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය.

### නිවාස පරිශ්‍රයන්

8. (i) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි (තෝරා) වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ;
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය ;
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ;
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේ ය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්නණීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළක්මින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේ ය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, ලැබූ සහ මීයන් කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුලුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේ ය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වභාවය හා සැලකිල්ලට ගෙන නගර සභා බල ප්‍රදේශය සඳහා කලින් කලට සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයා වෙත ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නොකුට භාරදිය යුත්තේ ය .

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතිමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකුට භාරදිය හැකි ය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු/ඇය (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග අදාළ අපද්‍රව්‍ය නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය. නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් එක් එක් අපද්‍රව්‍ය වර්ගය සඳහා ඉදිකරනු ලැබ ඇති බක්කිවල හෝ එවැනි අපද්‍රව්‍ය සඳහා සභාව විසින් සපයනු ලැබ ඇති බක්කිවල හෝ බහාලුම්වල හෝ තැන්පත් කළ යුත්තේ ය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ;

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය ;
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි ;
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු, ලේකම් විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව තුන් වර්ගයක බඳුන් හෝ බහාලුම් සැපයිය යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්වයෙන් නඩත්තු කළ යුත්තේ ය.

(iii) (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (ii) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වීම අපොහොසත් වන අවස්ථාවක දී ලේකම් විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇත්තේ ය. ලේකම්ගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ i වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් (ඇ) සහ (ඈ) අයිතිමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

10. (i) සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා කොමසාරිස් විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලයේ සැපයීම නිත්‍යානුකූල වේ.

(ii) සෑම මුඩුක්කු නිවෙසකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ/ඇයගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කර ඔහුගේ/ඇයගේ වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ;
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට අවසර දීමට ලේකම්වරයාට බලය ඇත්තේ ය.

## සාප්පු සහ කාර්යාල

11. (i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ;
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය ;
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හා පදිංචිකරු ලේකම් විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුට සහ පදිංචිකරුවෙකුට අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග සහ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතිමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ගයක් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්ට ගෙවීම මත අදාළ වන පරිදි හිමිකරු හෝ පදිංචිකරු විසින් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදෙනු ලැබිය යුත්තේ ය.

(vii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම වගකීම වන්නේ ය.

(viii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"කාර්යාලය" යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරිය) දී ඇති අර්ථයම ඇත.

"පදිංචිකරු" යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරු ය.

"සාප්පුව" යන්නෙන් අදහස් කරන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර

ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

හෝටල්

12. (i) යම් හෝටල්කරුවෙකු හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය ;
(ආ) ප්‍රතිභාවිතාකරණීය සහ ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය ;
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බදුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම හෝටල්කරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුලුවීම වළක්මින් සියලුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතිමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් හිමිකරු හෝ පදිංචිකරු විසින් ලේකම්ට ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස 'හෝටලය' යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක් තානායමක් වන්දනාකාරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ හෝටලයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

එළවළු සහ පළතුරු වෙළඳසැල්

13 (i) සෑම එළවළු හෝ පළතුරු වෙළඳසැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) මිනිස් පාරිභෝජනයට නුසුදුසු එළවළු, පළතුරු හෝ වෙනත් යම් අපද්‍රව්‍ය ;
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය ;
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුලුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්ට ගෙවීම මත නාගරික එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස එළවළු හා පළතුරු වෙළඳසැල යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

මස්, මාළු, කුකුළුමස් හෝ බිත්තර වෙළඳ කුටි

14. (i) තත් කාර්යය සඳහා ලේකම් විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේ දී කිසිම තැනැත්තෙක් හෝ ඝාතක ආඥාපනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හෝ පක්ෂීන් හැරුණුවිට වෙනත් කිසිම සතෙකු හෝ පක්ෂියෙකු ඝාතනය නොකළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම ඝාතනය කරනු ලැබිය හැකි සතාගේ හෝ පක්ෂියාගේ වර්ගය, ඝාතකාගාරය ඉදිකරනු ලැබිය යුතු ආකාරය, පිරිසිදු කිරීමට හා මිනිස් පරිභෝජනයට නොගන්නා ලේ, අතුණු බහන් හා වෙනත් කොටස් ඉවත් කිරීමට අදාළ කොන්දේසි සහ සභාව යෝග්‍යයයි කල්පනා කරන වෙනත් කොන්දේසි විශේෂයෙන් සඳහන් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා කලින් කලට සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම් විසින් අයකරනු ඇති අතර, එම ගාස්තුව බලපත්‍රය නිකුත් කරනු ලබන අවස්ථාවේ දී ගෙවිය යුතුවේ.

(iv) මස්, කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාරය කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) මිනිස් පරිභෝජනය නුසුදුසු සත්ව මළකුණු සහ මළකුණුවල කොටස් හෝ බිත්තර ;
(ආ) ප්‍රතිභාවිතාකරණීය වන ප්‍රතිචක්‍රීයකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය ;
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(v) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක තැබිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුළත තැබිය යුතු අතර එම බහාලුමට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුලුවීම වළකමින් එය හිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත දුර්ගන්ධය පැතිරයාමට පෙර නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධව අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මස්, මාළු, කුකුළු මස් හෝ බිත්තර වෙළඳකුටිය යන්නෙන් අදහස් කෙරෙන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්යය සඳහා ගබඩාකර ඇති හෝ අලෙවිය සඳහා තබා හෝ නිරවාරණය කර හෝ ඇති ස්ථානයකි.

### පදික වෙළඳාම

15. (i) අපද්‍රව්‍ය ජනනය වන්නාවූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම් විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයක නොදැමිය යුත්තේ ය.

(ii) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(iii) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය,

(අ) ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ;
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(iv) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තාවූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවූ අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(v) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරුව්‍යස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගයද සමග නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේ ය. ව්‍යාපාරය පවත්වාගෙන යනු නොලබන අවස්ථාවේ අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් පදික වේදිකාවක පාර අයිනේ හෝ මහා මාර්ගයේ නොතැබිය යුත්තේ ය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට පෙර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේ ය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස "පදික වෙළෙන්දා" යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නා වූ හෝ සේවාවක් සපයන්නා වූ හෝ තැනැත්තෙකි.

### කර්මාන්තශාලා

16. (i) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය,

(අ) ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ;
(ආ) ප්‍රතිභාවිතාකරණීය සහ ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය ;
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්ට ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස "කර්මාන්තශාලාව" යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථයම අදාළ වන්නේ ය.

### කැනීම, ඉදිකිරීම සහ කඩා දැමීම

17. (i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩාදමන සෑම තැනැත්තෙක්ම එමගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක් පරිශ්‍රය ඇතුළත හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැනීම, ඉදිකිරීම හා කඩාදැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු" යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

"අපද්‍රව්‍ය" යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි අපද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩාදැමීමේ දී ජනනය වන්නාවූ අපද්‍රව්‍ය ඇතුළත් වේ.

18. (i) ගෑස්, විදුලිය, ජලය දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින යම් තැනැත්තෙක් ලේකම්ගෙන් ලිඛිතව පූර්ව අනුමැතිය ලබාගත යුත්තේ ය.

(ii) ඉහත (i) වැනි උපවගන්තිය යටතේ අනුමැතිය දීමට පෙර ලේකම් විසින් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් යොදා ඇති වැඩපිළිවෙල, යෝජිත කාර්යය නිමවීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයක තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත්කිරීම අතපසු කරයි නම් ඒය ඉවත් කිරීමට අවශ්‍ය වන පිරිවැයද සැලකිල්ලට ගත යුත්තේය. අනුමැතිය ලබාදීමට පෙර ඉල්ලුම්කරු ඇස්තමේන්තුගත පිරිවැයට සමාන වූ මුදලක් තැන්පතුවක් වශයෙන් ගෙවීම අවශ්‍ය වන්නේ ය.

(iii) යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණයම හෝ එයින් කොටසක් හෝ ඉවත් කිරීමට අපොහොසත් වේ නම් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ලේකම් විසින් තීරණ කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර එහි ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම (සස) වැනි උපවගන්තිය යටතේ තැන්පත් කරනු ලබන මුදල්වලට හිලව් කරනු ලැබේ.

ආරෝග්‍යශාලා

19. (i) ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය ;

(අ) ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) මෙම උපවගන්තියේ (ඈ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ගය හැර වෙනත් උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) උපද්‍රවකාරී ආරක්ෂන අපද්‍රව්‍ය,
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේ ය. (i) වැනි උපවගන්ති යටතේ (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේය. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේ ය.

(iii) (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"ආරෝග්‍යශාලාව" යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ සතුන් පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයකින් විස්තර කරනු ලැබුවද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක් මාතෘ නිවාසයක් හා සත්ත්ව රෝහලක්/සත්ව සායන ඊට ඇතුළත් වේ.

"උපද්‍රවකාරී ආරක්ෂණ අපද්‍රව්‍ය" යන්නෙන් අදහස් කරන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදැමස්, ආසාදනය වන සුළු හා අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටුය.

වෙනත් පරිශ්‍රයන්

20. (i) අංක 8 සිට 19 දක්වා අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සමාජයීය, සංස්කෘතික හා අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි අයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය ;

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තයේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා සභාවට දැනුම්දිය යුත්තේ ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ (i) වැනි උපවගන්තියේ (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගයද සමග සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

වීථි හා පොදු ස්ථාන

21 (i) ලේකම් විසින් සභාපති සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේ ය.

(අ) නගර සභා ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොලවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වා ගැනීම,

(ආ) වීථි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සපයා සවිකිරීම හා නඩත්තු කිරීම,

(ඇ) උත්සවවල දී, විශේෂ සිදුවීම් අවස්ථාවල දී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී සභාවෙන් තීරණය කරන විටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම,

(ඈ) නේවාසික ප්‍රදේශයන්හි සවිකර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම,

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙතමනය, වානිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

### නගර සභාවේ යුතුකම්

22. (i) ලේකම් විසින් සභාපති සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය.

(අ) අපද්‍රව්‍ය අඩුකිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රියකරණයට ජනතාව ධෛර්යමත් කිරීම,

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම සහ බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම,

(ඇ) ප්‍රතිභාවිතාකරණය හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකින්ට පහසුකම් සැපයීම,

(ඈ) අපද්‍රව්‍ය අඩුකිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරිගැන්වීම පිරිනැමීම,

(ඉ) අපද්‍රව්‍ය මුදහාරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

(ඊ) නාගරිකයේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්ය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්ය සටහනට ඇතුළත් කිරීම.

(උ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්ය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(එ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ ලේකම් විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය, පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීම,

(ඒ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙළක්ද ඇතුළත්ව නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කරනු ලබන, වෙන් කරන ලද, අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාත්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම් අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම,

(ඔ) මධ්‍යම පරිසර අධිකාරිය සමග සාකච්ඡා කර ලේකම් විසින් අනුමත කරනු ලබන ආකාරයට සියළුම අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම,

(ඕ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම,

(ක) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරුකිරීම හා බැහැරලීම යන කාර්යයන්හි නිරතවන සෑම සේවකයෙකුට සුදුසු ඇඳුම් අත් ආවරණ මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම,

(ග) නිවෙසෙක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සභාවට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නාවූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩ ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී යක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම,

(ජ) සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පිළියෙළ කිරීම,

(ට) 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ගය සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂය ආවරනය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම, එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබීම.

(ඩ) (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළතත් වෙනත් පැමිණිල්ලක් නම් දින දාහතරක් ඇතුළතත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

### අවසර පත්‍ර

23. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නාවූ සහ ප්‍රතිචක්‍රීකරණය කරන්නාවූ හෝ කොම්පෝස්ට්, ජීවවායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නාවූ යම් තැනැත්තෙක් පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසරපත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාර නාගරික ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම,

(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම,

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම,

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය ලේකම් විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම,

(ඉ) අදාළ ව්‍යාපාරය නගර සභා සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්ට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේ දී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නාවූ හෝ ප්‍රතික්ෂේප වන්නාවූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟවීම.

(ii) සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභ කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බපත්‍රය සඳහා ඉල්ලුම්පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.

(iii) ලේකම් විසින්, වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කළ යුත්තේ ය.

(v) (iv) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී කිසි තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුත්තේ ය. එවැනි අවස්ථාවක දී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම් මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

### අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ

24. සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යය සඳහා වෙන් කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඉවත ලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේ ය.

25. අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්ගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් නගර සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නාවූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

### වෙනත්

26. (i) ලේකම්ට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියළු සාධාරණ වේලාවන්හි දී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේදැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමනාකරු හෝ එහි වාසය කරන්නාවූ හෝ සේවය කරන්නාවූ යම් තැනැත්තෙක් ලේකම්ට හෝ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමේහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

27. සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණ අනුව, මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියත්මක කරන යම් බලයලත් නිලධාරියෙකුට දිරිගැන්වීම පිරිනමනු ලැබිය හැකිය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් නගර සභා ආඥාපනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය.

### අර්ථ නිරූපණය

29. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන්, ඒවා ඉවත දැමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර, රොඩු, කසළ, වීථි ශුද්ධ කිරීමේ දී එකතුවන අපද්‍රව්‍ය. දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන් මිනිස් පරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස්, මාළු, කුකුල් මස්, බිත්තර, එළවළු පලතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යන්නෙන් මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලී ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"එක්රැස්කිරීම" යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම් අදහස් කෙරේ.

"කොම්පෝස්ට්" යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

"ලේකම්" යන්නෙන් නාගරිකයක් සම්බන්ධයෙන් වන විට නගර සභා ආඥාපනත (255 අධිකාරිය) යටතේ එම නාගරිකය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාවේ ලේකම් අදහස් කෙරෙන අතර, එම නගර සභාවේ ලේකම් වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ නගර සභා ආඥාපනත යටතේ ලේකම්ගේ බලතල, යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණයට ඊට ඇතුළත් වේ.

"ගබඩා කිරීම" යන්නෙන් හිමිකරුවෙකුගේ හෝ පදිංචිකරුවකුගේ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ,

"ගාස්තුව" යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන් ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැලවලින් ඉවත් කෙරෙන ශාඛා කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් කෙරේ.

"ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය" යන්නෙන් ක්ෂුද්‍ර ජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"පොදු ස්ථානය" යන්නෙන් පාරක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පළක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දොළක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතුගඟක්, ජල මාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

"ප්‍රතිචක්‍රීයකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පාරිභෝජන නිෂ්පාදනයක් කිරීමට යොදාගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් සේදීමෙන් විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"ප්‍රවාහනය" යන්නෙන් මිනිස් සත්ත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙනයාම අදහස් කෙරේ.

"බක්කිය/බදුන් හෝ වෙනත් බහාලුම්" යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

"බලයලත් එක්රැස් කරන්නා" යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබාගැනීමට ලේකම්ගෙන් අවසර පත්‍රයක් ලබාගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

"බලයලත් නිලධාරී" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරී ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම් විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

"බැහැරලීම" යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දාවූත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත්, සැකසුම් නොකරන ලද්දාවූත්, පිරියම් නොකරන ලද්දාවූත් සියළුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමෙක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

"මාරු කරන ස්ථානය" යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරුකිරීම එහිදී සිදු කෙරේ.

"තැනැත්තා" යන්නෙන් සංස්ථාගත හෝ සංස්ථාගත නොවන සමාගමක් හෝ පුද්ගලයින්ගේ සමිතියක් හෝ මඩුල්ලක් අදහස් කෙරේ.

"නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නා" යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබාගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ යම් කාර්යයන් ඉටුකිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

"වෙන් කිරීම" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි දී යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

"සැකසීම" යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

"සභාව" යන්නෙන් .................................................. නගර සභාව අදහස් කෙරේ.

"නාගරික ප්‍රදේශය" යන්නෙන් නගර සභා ආඥාපනත (255 අධිකාරිය) බලය යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

"සනීපාරක්ෂක බිම් පිරවුම" යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජයීය, සෞඛ්‍ය හා පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

"හිමිකරු හෝ පදිංචිකරු" යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබාගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු.

පැ. යු. 2010.10.15 දින පළ වූ අංක 1,676 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.
මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අධිකරණ කලාපයට අයත් සාමාන්‍ය ජූරි සභිකයින්ගේ හා විශේෂ ජූරි සභිකයින්ගේ නාමාවලියක් (සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයට පමණක් අයත්) මෙම ගැසට් අංකය හා එයට අදාළ ... දින ... පළ වේ


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,677 - 2010 ඔක්තෝබර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2010.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| ... ... ... | — |
| පළාත් සභා නිවේදන | 1656 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... | — |
| තනතුරු ඇබෑර්තු | 1226 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය | — |


සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන ... දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව ... දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිර්වද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 29 වැනි දින පළ කරනු ගැසට් පත්‍රයේ දැන්වීම් 2010 ඔක්තෝබර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

ලක්ෂමන් ගුණවර්ධන,
රජයේ මුද්‍රණාලයාධිපති

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය


1655 - B 80164-- 7,100 (2010/10)
PI-(S/E)

# පළාත් පාලන නිවේදන

## යටිනුවර ප්‍රාදේශීය සභාව

### ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන සෙවලුන් විසින් 2013 වර්ෂයට එම උපලේඛනයේ දක්වා ඇති ස්ථානවල එළගව මස් වෙළඳසැල් පවත්වා යාම පිණිස බලපත්‍ර ලබාදෙන ලෙස ඉල්ලුම් කර ඇති බවත් ඒ අනුව එකී උපලේඛනයේ නම් සඳහන් අයවලුන්ට බදුදීම ගැන යටිනුවර බල ප්‍ර තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතුව සඳහන් කර ලියවිල්ලක් පිටපත් 02කින් යුක්තව මෙය ගැසට් පත්‍රයේ ප 14ක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු බව ගෝසාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) යටතේය.

එම්. එම්. කුසිත කුමාර වල ...,<br>සභාපති,<br>යටිනුවර ප්‍රාදේශීය සභාව.

2013.03.<br>ප්‍රාදේශීය සභාව,<br>ඇඹිල්මීගම,<br>පිළිමතලාව.

| | ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| 01. | එම්. අයි. එම්. නියාස් මයා | අංක 37ඒ/1, යහලතැන්න, මහනුවර | එළගව මස් වෙළඳාම |
| 02. | වී. එම්. එස්. හමීඩ් මයා | දෙහිඅංග, පල්ලිය අසල, මුරුතලාව | එළගව මස් වෙළඳාම |
| 03. | ටී. එම්. මහරූප් මයා | 144, දඹුලුවේ ඉන්න පාර, යහලතැන්න | එළගව මස් වෙළඳාම |
| 04. | වී. එම්. එම්. සිදු මයා | 100/1, අඹුකොටුව හන්දිය දෙහිඅංග උතුර, මුරුතලාව | එළගත මස් වෙළඳාම |

04-680

---

## බළන්ගොඩ නගර සභාව

1987 අංක 18 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1939 අංක 61 දරන ලංකා නීති ප්‍රඥප්තියේ 250 වැනි අධිකාරිය වූ නගර සභා ආඥා පනතේ කොටසේ 153 වගන්තිය අනුව සාදනු ලැබූ 1956 ජුනි මස 08 වැනි දින අංක 10939 මගින් ප්‍රසිද්ධ කරන ලද 1952 අංක 6 දරන පළාත් පාලන ම (ආදර්ශ උප නීති) I,II,III,IV,V,VI, VII,VIII,IX,X,XI,XII,XIII,XIV,XV,XVI,XVII,XVIII,XIX,XX,XXI,XXII,XXIII,XXIV, XXVI,XXVII, XXVIII,XXIX යන කාණ්ඩ සබරගමුව පළාත් සභාව විසින් ද, වැළඳගෙන ඇති බැවින් එවා ඒ අයුරින්ම වැළඳ ගැනීම ... ක්‍රියා කිරීමටත් 2011.06.01 වැනි දින පැවති බළන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය කාරක සභාවේ දී යෝජනා අංක 10 යටතේ යෝජනා කරන 2011.06.30 වන දින පැවති මහා සභාවේ යෝජනා අංක 11 යටතේ සම්මත කර ඇති බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,<br>සභාපති,<br>බළන්ගොඩ නගර සභාව.

04-710

---

## අකුරැස්ස ප්‍රාදේශීය සභාව

1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබද ආඥා පනතේ II පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර.

අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යාකබැද්ද ගමෙහි තිප්පලහේන නැමැති ඉඩමට මායිම්ව උතුරට අවසන් ගම පිඹුරු අංක 179 හි කැබලි 130 ද, බස්නාහිරට අවසන් ගම් පිඹුරු අංක 179 හි කැබලි අංක 130 ද තුළ පිහිටි අ.ග. පි. කැබලි අංක 221 දරන ඉඩම.

# IV වැනි කොටස—පළාත් පාලනය

## ව්‍යවස්ථා

### 1952 යේ 6 වැනි අධිකාරය දරණ පළාත් පාලන මණ්ඩල (ආදර්ශ උප නීති පිළිබඳ) පනත

උපනීති

1952 යේ 6 වැනි අංකය දරණ පළාත් පාලන මණ්ඩල (ආදර්ශ උපනීති පිළිබඳ) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරන ලදින් මෙහි පහත දක්වන කෙටුම්පත් උපනීති ඒ වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් උපනීතිවල ඇති විධිවිධානයන් අඩංගුකොට උප නීති සැදුගැනීමට 1939 යේ 41 වැනි අංකය දරණ නාගරසභා ආඥා පනතේ 166 වැනි, 170 වැනි වගන්තිවලින් නාගරසභාවලට බලය ලැබෙනවාත් හැර එකී 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව එකී පනත අනුව මේ උපනීති වැළඳ ගැනීමට අවසරද ලැබේ.

සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර,
පළාත් පාලන ඇමති.

1953 සැප්තැම්බර් 25 වැනි දින
කොළඹ.

උපනීති

I වැනි කාණ්ඩය

සියලු ආදර්ශ උපනීතිවල අර්ථ නිරූපණය පිළිබඳ උපනීතිය

මෙ ආදර්ශ උපනීතිවල අර්ථ නිරූපණයේදී නාගරසභාවක් විසින් පිළිවු පරිදි වැළඳගත් යම් ආදර්ශ උපනීතියක සඳහන් "නාගරසභාව", "සභාපති", "නාගරසභා ප්‍රදේශය" යන මේ වචනවලින් ප්‍රකාශ විය යුත්තේ පිළිවෙළින් ඒ නාගරසභාව, ඒ නාගරසභාවේ සභාපතිතුමා හෝ සභාපතිනිය, ඒ නාගරසභා ප්‍රදේශය යන මොනුය.

II වැනි කාණ්ඩය

නාගරසභාවේ රැස්වීම් පිළිබඳ උපනීති

අර්ථ නිරූපණය

1. පද සම්බන්ධයෙන් අන් කිසිවක් අවශ්‍යවුව හොත් මිස නැත් නම් රැස්වීම් සම්බන්ධයෙන් මේ උපනීතිවල—

"රැස්වීම" යනුවෙන් නාගරසභාවේ රැස්වීමක් හෝ ඒ සභාවේ කිසියම් කාරක සභාවක රැස්වීමක් හෝ අදහස් කරනු ලැබේ;

"ලේකම්" යනුවෙන් නාගරසභාවේ ලේකම් අදහස් කරනු ලැබේ.

දැන්වීම, න්‍යාය පත්‍රය, ගණපූරණය යනා මේ ආදිය

2. (අ) හැම සාමාන්‍ය රැස්වීමක් ගැනත් එහිදී කිරීමට අදහස් කරන වැඩ ගැනත් දැන්වීමක් යටත් පිරිසෙයින් ඒ රැස්වීමට (ඉරිදා හා ආණ්ඩුවේ නිවාඩු දවස් හැර) දවස් හතරකට වත් කලින් එක් එක් සාමාජිකයාට භාරදිය යුතුය.

(ආ) රැස්වීම පිළිබඳ දැන්වීමේ සඳහන් කටයුතු හැර වෙන කිසිම කටයුත්තක් සාමාන්‍ය හෝ වේවා විශේෂ හෝ වේවා කිසිම රැස්වීමක් ඉදිරියට සභාවේ අවසරය නැතිව නොගෙන යුතුය; නැතහොත් ඒ රැස්වීමකදී නොකළ යුතුය.

(ඇ) ගණපූරණයකට සෑහෙන තරම් සාමාජිකයන් යම්කිසි රැස්වීමක නොසිටිය හොත් සභාපතිතුමා විසින් තමාට සුදුසුයයි කල්පනා වන්නා වූද ඒ රැස්වීම පවත්වන්ට නියමව තිබුණ දිනයේ සිට පසලොස් දවසක් ගතවන්ට මත්තෙන් වූද දිනයකට ඒ රැස්වීම කල් දැමිය යුතුය. නොපැවැත්වූ ඒ රැස්වීමෙහි ගණපූර්ණයකට සෑහෙන පිරිසක් සිටියා නම් එහිදී කරන්ට තිබුණ කටයුතු වූකලී කල් දමා පවත්වන රැස්වීම ඉදිරියට ගෙනැවිත් කළ යුතුය.

රැස්වීම කල්දැමීම

3. (අ) සභාවෙන් නියමිත ගණපූරණයක් ඇති සාමාන්‍ය හෝ වේවා විශේෂ හෝ වේවා ඕනෑම රැස්වීමක සභාපතිහට ඒ රැස්වීම එහිම සාමාජිකයන්ගේ කැමැත්ත ඇතිව වරින් වර කල්දැමීමට බලය තිබේ. එහෙත්, කල්දැමූ රැස්වීමේදී නිමකරගත නොහැකිව ඉතිරිවූ කටයුතු හැර වෙන කිසිම කටයුත්තක්, කල් දමා පවත්වන මොනම රැස්වීමක දී වත් සභාවේ අවසරය නැතිව නොකළ යුතුය.

(ආ) කල් දමා පවත්වන රැස්වීමක් පිළිබඳ දැන්වීම ඒ රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් තුන් දවසකට වත් කලින් සාමාජිකයන්ට භාරදිය යුතුය. එසේ දැනුම් නොදිය යුත්තේ ඒ රැස්වීම පැ විසිනයරක් ඇතුළතදී නැවතත් පැවැත්වීමට පළමු රැස්වීමේදී නියමකරගෙන තිබුණොත් පමණකි.

අමුත්තන්ගේ පැමිණීම

4. ප්‍රවෘත්ති පත්‍ර නියෝජිතයන් ඇතුළු අමුත්තන්ට රැස්වීමකට අවුත් තමන් වෙනුවෙන් වෙන්කර තිබෙන තැන්වල සිටින්ට පුළුවන. එහෙත්, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගෙන් වැඩි දෙනා, අමුත්තන් බැහැර කිරීම මහජනයාගේ යහපත පිණිස වේයයි කල්පනාකොට ඒ බව යෝජනාවකින් ප්‍රකාශ කිරීම නිසා සභාපතිතුමා ඔවුන්ට ඉවත්ව යැමට නියම කළ හොත් ඔවුන් ඉවත්ව යා යුතුය.

කටයුතු කළයුතු පිළිවෙළ

5. සභාවේ කටයුතු කළයුත්තේ පහත සඳහන් පිළිවෙළටය:—

(අ) පසුගිය (කලින් අන්තිම වරට පැවැත්වූ) රැස්වීමේ වාර්තාව ස්ථිර කිරීම;

(ආ) සභාවේ නමට එවා තිබෙන අයදුම් පත්, පෙත්සම්, පැමිණිලි, ලියවිලි යන මේවා සභාව ඉදිරියේ තැබීම;

(ඇ) විධිවූ පරිදි කලින් ලියා එවා තිබෙන ප්‍රශ්න;

(ඈ) විධිවූ පරිදි කලින් ලියා එවන තිබෙන යෝජනා;

(ඉ) රැස්වීම පිළිබඳ දැන්වීමේ සඳහන් යෙදූ කරුණු ඒ සඳහන් වූ පිළිවෙළටම හෝ විශේෂ කරුණු නිසා සභාව යොදා ගන්නා පිළිවෙළකට;

(ඊ) මාසික අය වැය සටහන් හා කර්මාන්ත පිළිබඳ ප්‍රගති වාර්තාවනුත් සභාවට වුවමනා වන එවැනි වෙන ලිපින් සභාවට ඉදිරිපත් කළ යුතුය.

මහලු පිළිවෙළ

6. සභාව පිළිබඳ සියලු කටයුතු සම්බන්ධයෙන් සාමාජිකයන්ගේ මහලු පිළිවෙළ පහත දක්වන අයුරු විය යුතුය.

සභාපතිතුමා ළඟට උප සභාපතිතුමාද ඊළඟට තම තමාගේ තේරීම ඉස්සර වූ හැටියට සාමාජිකයන්ද මහලු පිළිවෙළ ගත යුතුය. නැවතත් තේරුණාවූද කලින් සිටියාවූද සාමාජිකයන් තම තමන් සාමාජිකත්වය දරා ඇති අඛණ්ඩ කාලපරිච්ඡේදයන් අනුව මහලු පිළිවෙළ ගත යුතුය.

වාර්තා

7. එක් එක් රැස්වීමේ වාර්තාව එක් එක් සාමාජිකයා වෙත යැවිය යුතුය. ඊළඟ රැස්වීමේදී හෝ පසුව පවත්වන යම්කිසි රැස්වීමකදී, ඒ වාර්තාව කියවූවාක් මෙන් භාරගෙන ස්ථිර කළ යුතුද යන ප්‍රශ්නය ඉදිරිපත් කළ යුතුය. ඒ සම්බන්ධයෙන් විරුද්ධයක් හෝ යෝජනාවක් ඉදිරිපත් නොකොළොත් ඒ වාර්තාව ලියා ඇති හැටියටම ස්ථිර කළ යුතුය.

අයදුම්පත්, පෙත්සම් ආදිය

8. (අ) පෙත්සමක් හෝ අයදුම්පතක් ඉදිරිපත් කරන සාමාජිකයකුට එහි අදහස සංක්ෂේපයෙන් සභාවට කියා දීමට බලය ඇත්තේ ය.

(ආ) කවර කොටසක් වුවත් ශිෂ්ට භාෂාවෙන් ලියා නැත්තාවූද ලියන ලද අයගේ නම හා ලිපිනය නැත්තාවූද කිසිම පෙත්සමක් හෝ අයදුම්පතක් හෝ වෙන ලියවිල්ලක් කිසිම සාමාජිකයකු විසින් ඉදිරිපත් නොකළ යුතුය.

(ඇ) ඒ පෙත්සම හෝ අයදුම්පත කියවිය යුතුයයි යෝජනා කිරීමට ඕනෑම සාමාජිකයකුට බලය තිබේ. එසේ යෝජනාවක් කරන විට පෙත්සම කියවීමට කියන්නේ මේ නිසායයි ඔහු විසින් සංක්ෂේපයෙන් හේතු දක්විය යුතුය.

(ඈ) ඒ යෝජනාව ගැන විවාදයක් කිරීමට අවසර නොදිය යුතුය. ඒ යෝජනාව විධිමත් ලෙස ස්ථිර කරනවා විනා වෙන කිසිම සාමාජිකයකු විසින් ඒ පෙත්සම හෝ අයදුම්පත ගැන හෝ සම්බන්ධයෙන් කථා නොකළ යුතුය.

(ඉ) ඒ යෝජනාව ස්ථිර කළ විට ඒ පෙත්සම හෝ අයදුම්පත කියවිය යුතුද නැද්ද යන ප්‍රශ්නය ඉදිරිපත් කළ යුතුය.

ප්‍රශ්න

9. (අ) සභාවේ කටයුතු පිළිබඳ ප්‍රශ්න සභාපතිතුමාගෙන් ඇසිය හැකිය.

(ආ) ඒ ප්‍රශ්න සම්බන්ධයෙන් (ඉරිදා දවස් හා ආණ්ඩුවේ නිවාඩු දවස් හැර) සම්පූර්ණ හත් දවසක් කල් දිය යුතුය.

(ඇ) රැස්වීමේ සභාපතිතුමා විසින් එක් එක් ප්‍රශ්නය වෙනුවෙන් ලිඛිත පිළිතුරක් රැස්වීමකදී කියවිය යුතුය.

(ඈ) කිසිම ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සාමාජිකයකු විසින් සභාව අමතා කථා නොකළ යුතුය. එසේම කිසිම ප්‍රශ්නයකට ඒ ප්‍රශ්නය පහදදීමට වුවමනා වන වචන මිස කිසිම තර්කයක් හෝ අයථා චෝදනාරෝපණයක් හෝ මත ප්‍රකාශයක් හෝ කරුණු දැක්වීමක් ඇතුළත් නොවිය යුතුය.

(ඉ) රැස්වීමකදී පිළිතුරක් දී තිබෙන යම් දෙයක් හෝ කරුණක් ගැන වැඩි දුරටත් යමක් පැහැදිලි කරවා ගැනීම සඳහා අතිරේක ප්‍රශ්නයක් ඇසීමට ඕනෑම සාමාජිකයකුට බලය තිබේ. එහෙත්, රැස්වීමේ සභාපතිහට යම් අතිරේක ප්‍රශ්නයක් (ප්‍රශ්නවල කරුණු පිළිබඳ) මේ උපනීතියේ පූර්වෝක්ත විධිවිධානයන්ට අනුකූල නොවේයයි කල්පනා වුවහොත් ඒ ප්‍රශ්නය ඇසීමට ඉඩ නොදෙන්ට බලය තිබේ. එවැනි ප්‍රස්තාවයකදී ඒ ප්‍රශ්නය සභාවේ වාර්තාවට ඇතුළත් නොකළ යුතුය.

යෝජනා

10. (අ) යෝජනාවක් කරන බවට එවන හැම දැන්වීමක්ම ඒ දැන්වීම කරන (සභාවේ) සාමාජිකයාගේ අත්සනින් ලියා එවිය යුතුය. සභාවේ රැස්වීමට (ඉරිදා හා ආණ්ඩුවේ නිවාඩු දවස් හැර) සම්පූර්ණ දවස් ගනනකට කලින් ඒ දැන්වීම ලේකමට ලැබුණොත් මිස නැත්නම් ඒ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් නොවන්ට පුළුවන.

(ආ) ලැබෙන ලැබෙන පිළිවෙළට දිනයන් හා අංකයන් යෙදීමෙන් පසු ලේකම් විසින් යෝජනාවන් පිළිබඳ සියලු දැන්වීම් න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතුය.

(ඇ) යෝජනාවක් පිළිබඳ ඕනෑම දැන්වීමක් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ප්‍රථමයෙන් සභාපතිහට ඔප්පු කළ යුතුය. එවිට ඔහු ඒ යෝජනාව නිසි පිළිවෙළට නොතිබේයයි කල්පනා කළහොත් එය න්‍යාය පත්‍රයට ඇතුළත් නොකරන ලෙස නියමකොට දැන්වීම කළ අයට ඒ බව නිවේදනය කරවිය යුතුය.

(ඈ) දැන්වීමකට භාජනවූ කොයි යෝජනාවක් සභාවේ පාලනය පිළිබඳ යම්කිසි ප්‍රශ්නයකට අදාල විය යුතුය.

(ඉ) ගතවූ හමාසය ඇතුළත සභා සම්මතවූ යෝජනාවක් අවලංගු කිරීම සඳහා එවන යෝජනාවක් හෝ ගතවූ හමාසය ඇතුළත ප්‍රතික්ෂේපවූ යෝජනාවක අදහසට සමාන වූ අදහස ඇති යෝජනාවක්, නිසි පිළිවෙළට ඇත්තේයයි නොසැලකිය යුතුය. එවැනි යෝජනාවක් නිසි පිළිවෙළට ඇත්තේයයි සැලකිය යුත්තේ ඒ පිළිබඳ දැන්වීම එවා තිබීමය, එය න්‍යාය පත්‍රයට ඇතුළත් කොට තිබීමය, ඒ දැන්වීමෙහි යෝජනාව ගෙනෙන අයගේ අත්සන හා තවත් සාමාජිකයන් දෙදෙනෙකුගේ අත්සන් යොදා තිබීමය යන මේ කරුණු සම්පූර්ණ වුවහොත් පමණකි. ඒ දැන්වීම සම්බන්ධයෙන් කටයුතු කළ පසු කිසිම සාමාජිකයකුට එවැනි යෝජනාවක් ඊළඟ හමාසය ඇතුළතදී ගෙන ඊමට බලයක් නැත්තේ ය.

(ඊ) යෝජනාවක් යෝජනා කොට සථිර කරන තුරු විවාදය පිණිස ඉදිරිපත් කරන ලද්දක් කොට නොසැලකිය යුතුය.

(උ) සාමාජිකයකුට තම ආසනයෙන් නැගිට මූලාසනයට ආචාර කොට විවාදයේ පසු අවස්ථාවකදී කථා කිරීමට ඇති අයිතිවාසිකමට හානියක් කර නොගෙන යෝජනාවක් හෝ අතුරු යෝජනාවක් විධිවත් ලෙස සථිර කරන්ට බලය තිබේ.

(ඌ) කලින් දැන්වීමක් නොකළ යෝජනාවක් සභාවට ගෙන ඊමට මත්තෙන් යෝජනා කරන්නා විසින් එය ලියා අත්සන් කොට ලේකමට බාරදිය යුතුය.

(එ) රැස්වීමකදී යෝජනාවක් යෝජනා කොට සථිර කෙළෙත් ඒ පිළිබඳ විවාදය අවසන්වූ විට සභාපතිහු විසින් ඒ යෝජනාව සම්බන්ධයෙන් ඡන්දය විමසිය යුතුය.

යෝජනාවක් හෝ අතුරු යෝජනාවක් ඉල්ලා අස්කර ගැනීම

11. කවර සාමාජිකයකුට වුවත් තමා විසින් කරන ලද යෝජනාවක් හෝ අතුරු යෝජනාවක් සභාවේ සර්වසම්මත අවසරය ලබාගෙන ඉල්ලා අස්කර ගැනීමට පුළුවන. ඒ අවසරය විවාදයක් නොකරම දිය යුතුය. යෝජනාව ගෙන සාමාජිකයා එසේ අවසර ඉල්ලූ කල, ඒ අවසරය ප්‍රතික්ෂේප කළහොත් මිස නැත්නම් කිසිම සාමාජිකයකුට ඒ යෝජනාව ගැන කථා කිරීමට බලය නොතිබිය යුතුය.

යෝජනාවන් නැවත ගෙන ඊම

12. ඉල්ලා අස්කර ගන්නා ලද යෝජනාවක් පසුව පවත්වන ඕනෑම රැස්වීමකදී නැවතත් ඉදිරියට ගෙනෙන්ට පුළුවන. එහෙත් 10 (ඉ) වැනි උපනීතියේ සඳහන් සමස් කාලපරිච්ඡේදය ඇතුළතදී සම්මතවූ හෝ ප්‍රතික්ෂේපවූ යෝජනාවකට අදහසින් සමාන කිසිම යෝජනාවක් නොගෙන යුතුය.

අතුරු යෝජනා

13. (අ) හැම අතුරු යෝජනාවක්ම එය ගෙනෙන සාමාජිකයා විසින් ලියා ලේකමට භාරදිය යුතුය.

(ආ) හැම අතුරු යෝජනාවක්ම සාකච්ඡාවට භාජනව පවත්නා මුල් යෝජනාවට ගැලපිය යුතුය.

(ඇ) හැම අතුරු යෝජනාවක්ම යෝජනා කිරීමට මත්තෙන් කිය විය යුතුය.

(ඈ) සථිර කරන තුරු කිසිම අතුරු යෝජනාවක් ගැන සාකච්ඡා කිරීම වත් ඡන්දය ගැනීම වත් නොකළ යුතුය.

(ඉ) විධිවත් ලෙස අතුරු යෝජනාවක් සථිර කළ සාමාජිකයකුට පසුව ඒ සම්බන්ධයෙන් කථා කිරීමට ඉඩ දිය යුතුය.

(ඊ) සාකච්ඡාවට භාජනව පවත්නා යම් යෝජනාවක් සම්බන්ධයෙන් අතුරු යෝජනාවක් ඉදිරිපත්කොට සථිර කරතිබෙන කොයි විටකදී වුවත් පළමුවැනි අතුරු යෝජනාවේ කටයුතු අවසන් වන තුරු දෙවැනි අතුරු යෝජනාවක් හෝ තදනන්තර අතුරු යෝජනාවක් ඉදිරිපත් නොකළ යුතුය. අතුරු යෝජනාවක් සම්මත වුවහොත් මුල් යෝජනාව අතුරු යෝජනාවෙන් සංශෝධිතවූ පරිදි වෙනස් කළ යුතුය. ඉන් පසු වෙන අතුරු යෝජනාවක් ඉදිරිපත් කරතොත් එසේ කළ යුත්තේ සංශෝධිත යෝජනාව සම්බන්ධයෙනි.

යෝජනාව සම්පූර්ණ වශයෙන් සභාවට දැමූ විට විවාදය නැවැත්විය යුතු බව

14. රැස්වීමේ සභාපතිහු යම් යෝජනාවක් සම්පූර්ණ වශයෙන් සභාවට දැමූ පසු ඒ යෝජනාව සම්බන්ධයෙන් කිසිම සාමාජිකයකු විසින් රැස්වීමේදී කථා නොකළ යුතුය. යෝජනාවක් සම්පූර්ණ වශයෙන් සභාවට දැමුවා වෙන්නේ ඒ සම්බන්ධයෙන් ඡන්දය ගෙන තිබෙන විටය.

ඡන්දය දීම හා ඡන්දය ලකුණු කිරීම

15. රැස්වීමේ සභාපතිහු විසින් යෝජනාව සභාවට දමා ඡන්දය ගත යුතුය. මේ ඡන්දය ගැනීම සභාව තීරණය කරන පරිදි අත් එසවීමෙන් හෝ රහස් සීට්ටු ඇදීමෙන් කළ යුතුය. ඡන්දය ගත් පසු එහි ප්‍රතිඵලය සභාපතිහු විසින් ප්‍රකාශ කළ යුතුය. එහෙත් රහස් සීට්ටු ඇදීමෙන් හැර වෙන යම් විදියකින් ඡන්දය ගත් කොයි ප්‍රස්තාවයේදීත් පක්ෂවූවන්ගේ ගණනත් විපක්ෂ වූවන්ගේ ගණනත් වෙන වෙනම ගණන් කරන ලෙස ඉල්ලා සිටීමට ඕනෑම සාමාජිකයකුට බලය තිබේ. එසේ ඉල්ලූ ප්‍රස්තාවයකදී ලේකම් විසින් සාමාජිකයන්ගේ මහගුපිළිවෙළ අනුව එක් එක් සාමාජිකයාගෙන් ඡන්ද දෙන්නේ කෙසේදැයි වෙන වෙනම අසා ඒ එක් එක් ගවතාගේ ඡන්දය ලකුණු කළ යුතුය.

විපක්ෂ වන සාමාජිකයෝ

16. අඩු පක්ෂයක සිටින ඕනෑම සාමාජිකයකුට තමා වැඩි පක්ෂයේ අදහසට විපක්ෂ වූයේ මේ මේ සාධකයන් පිටයයි සාධකයන් සඳහන් කරවා ගැනීමට බලය ඇත්තේ ය. රැස්වීම පැවැත්වූ දිනයේ සිට සතියක් ඇතුළතදී ඒ සාධකයන් ලේකම වෙත ලියා එව්වොත් ලේකම විසින් ඒවා රැස්වීමේ වාර්තාව අගට යෙදිය යුතුය.

න්‍යාය පත්‍රය

17. 5 වැනි උපනීතිය අනුව පිළියෙළ කරන ලද සියලු කටයුතු න්‍යාය පත්‍රයට ඇතුළත් විය යුතුය. වෙන අන්දමකට සම්මත කරගත හොත් මිස නැත්නම් ඒ කටයුතු න්‍යාය පත්‍රයේ මුද්‍රණය කර තිබෙන පිළිවෙළටම සභාවේදී කළ යුතුය.

සංවරය රැකීම

18. (අ) සංවරය රැකීම වනාහි රැස්වීමක සභාපතිහුගේ යුතුකමය. සංවරය සම්බන්ධයෙන් විවාදයට භාජනව පවතින හැම පදයක්ම ගැන ඔහුගේ තීරණය අවසාන තීරණය විය යුතුය.

(ආ) රැස්වීමකදී මේ උපනීතිවලට පිටුපා ක්‍රියා කරන ඕනෑම සාමාජිකයකුට වහාම සංවරය රැක ගන්නා ලෙස සිය කැමැත්තෙන්ම නියම කිරීමට හෝ වෙන යම්කිසි සාමාජිකයකු ඒ බව පෙන්වා දුන් විට එසේ නියම කිරීමට හෝ සභාපතිහට බලය ඇත්තේ ය.

සංවරය පිළිබඳ ප්‍රශ්න විසඳීම

19. සංවරය පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කළ විට එය ඉදිරිපත් කළ සාමාජිකයා තම ආසනයෙහි වාඩි විය යුතුය. රැස්වීමේ සභාපතිහු ඒ ප්‍රශ්නය විසඳා නිමවන තුරු මූලාසනයේ අවසරය ඇතිව මිස වෙන කිසිම සාමාජිකයකු කථා නොකළ යුතුය. සභාපතිහු විසින් ප්‍රශ්නය විසඳූ පසු මූලාසනයේ තීරණය පිළිපදිතොත්, සභාව හෝ කාරක සභාව අමතා කථා කරමින් සිටි සාමාජිකයාට තම කථාව කරගෙන යෑමට අයිතිවාසිකම් තිබිය යුතුය. ඔහු මූලාසනයේ තීරණය නොපිළිපදිතොත් ඔහුට ඒ කථාව කරගෙන යෑමට අවසර නොදීමට මූලාසනයට බලය තිබේ.

වචන පහද නොදෙන හෝ අස්කර නොගන්නා සාමාජිකයෝ

20. තමා විසින් පාවිච්චි කරන ලද නුසුදුසු වචන පහද නොදෙන්නා වූ හෝ අස්කර නොගන්නාවූ හෝ ඒ වචන පාවිච්චි කිරීම ගැන සභාව පිළිගන්නා පරිදි සමාවක් නොසිල්ලන්නාවූ කවර සාමාජිකයකුට වුවත් දෝෂාරෝපණය කළ හැකිය; නැතහොත් සභාවට හොඳය කියා සිතෙන වෙන විදියකින් දඬුවම් කළ හැකිය.

සභාපතිහු කථා කිරීම

21. රැස්වීමේ සභාපතිහු කථා කිරීමට කැමති බැව් ප්‍රකාශ කළ විට කථා කරමින් සිටි කවර සාමාජිකයකු වුවත් වහාම වාඩිවිය යුතුය.

සාමාජිකයන් අකීකරුවූවන් කොට සැලකීම

22. (අ) මූලාසනයේ බලය ගැන නොසලකන්නාවූ හෝ සභාවේ කටයුතුවලට හිතාමතාමෙන දිගින් දිගටම බාධා පමුණුවමින් සභාවේ මේ උපනීති කඩන්නාවූ ඕනෑම සාමාජිකයකු අකීකරු වූවකු කොට සැලකීමට සභාපතිහට බලය තිබේ. " ඒ සාමාජිකයාගේ වැඩ කලකට තහනම් කළ යුතුය " යන යෝජනාව වෙන ඕනෑම සාමාජිකයකු කළ විට හෝ නාමාම සිය කැමැත්තෙන්ම කළ විට (අතුරු යෝජනාවකට හෝ කල් දැමීමකට හෝ විවාදයකට ඉඩ නොදී) ඡන්දය ගැනීම පිණිස සභාවට ඒ ක්ෂණයෙහි දැමීමටද සභාපතිහට බලය ඇත්තේය.

(ආ) ඒ යෝජනාව සභා සම්මතවීමෙන් මේ නියෝගය යටතේ යම් සාමාජිකයකුගේ වැඩ තහනම් කරනු ලැබුවොත් ඒ තහනම පළමුවැනි වතාවේදී මාසයක්ද දෙවැනි වතාවේදී දෙමාසයක්ද තුන්වැනි වතාවේදී හෝ ඊට පසු එක් එක් වතාවේදී තුන්මාසයක්ද පැවතිය යුතුය.

(ඇ) ඇවිත් සිටින සාමාජිකයන් කිප දෙනෙකු එකතුව මූලාසනයේ බලය ගැන නොසලකා ක්‍රියාකර ඇතොත් මිස නැත්නම් එක් වරකට එක් සාමාජිකයකුට වැඩි දෙනෙකු අකීකරු වූවන් කොට නොසැලකිය යුතුය.

(ඈ) මෙ උපනීතිය යටතේ වැඩ තහනම් කරනු ලැබූ යම් සාමාජිකයකු හෝ යම් යම් සාමාජිකයන් එක්ව එකතුව ඒ තහනම පවතින කාලයේ යම් විටෙක සභාශාලා ස්ථානයෙන් පිටවී යැමට (රැස්වීමක) සභාපතිනු කරන නියමයට අකීකරු වූවහොත් තම නියමය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය වන විධිවිධානයන් යෙදීමට ඒ සභාපතිහට බලය තිබේ.

## නොගැළපෙන කරුණු ගෙනහැර දැම හෝ එකම කරුණු නැවත නැවත කීම

23. විවාදයකදී ප්‍රස්තුත කාරණයට නොගැළපෙන දේ කියන්නාවූ හෝ තමාම ගෙන හැර දක්වූ හෝ සෙසු සාමාජිකයන් ගෙනහැර දක්වූ තර්කයන් හිතට එපාවන ලෙස නැවත නැවත කියන්නාවූ සාමාජිකයකුට ඒ බව සිහිපත් කරවා ඔහුගේ ඒ කථාව නවත්වන ලෙස නියම කිරීමට සභාපතිහට බලය තිබේ.

## කලබල කිරීම

24. (අ) නදින් කලබල කරන සාමාජිකයන්ට වහාම සභා ශාලාවෙන් පිටවීමට නියම කොට එදා රැස්වීමේ ඉතිරි කටයුතුවලට සහභාගී නොවන ලෙස අණකිරීමටත් තමාගේ ඒ අණව ක්‍රියාවෙහි යෙදවීමට අවශ්‍ය වන විධිවිධානයන් යෙදීමටත් රැස්වීමක සභාපතිහට බලය ඇත්තේය.

(ආ) මේ නියෝගය යටතේ තමාට ඇති බලය ප්‍රමාණවත් නොවේ යයි කල්පනා වන කොයි විටකදී වුවත් 22 වැනි උපනීතිය යටතේ ඒ සාමාජිකයා හෝ සාමාජිකයන් අකීකරුවූවන්කොට සැලකීමට රැස්වීමේ සභාපතිහට බලය ඇත්තේය.

## කලකට වැඩ තහනම කිරීමේ අණවට හෝ පිටකර දැමීමේ අණවට කීකරු විය යුතු බව

25. 22 වැනි උපවගන්තිය යටතේ කලකට වැඩ තහනම් කරනු ලැබුවාවූ හෝ 24 වැනි උපනීතිය යටතේ පිටවීමට නියම කරනු ලැබූවාවූ සාමාජිකයන් වහාම සභාශාලා ස්ථානයෙන් පිට විය යුතුය.

## රැස්වීම් කල් දැමීමේ බලය

26. ඕනෑම යෝජනාවක් පිළිබඳ විවාදය කල් දමන මෙන් කොයි විටෙකදී වුවත් යෝජනා කිරීමට සාමාජිකයකුට බලය තිබේ. ඒ යෝජනාව ස්ථිර කරනු ලැබුවොත් ඡන්දය ගැනීම සඳහා වහාම සභාවට දැමිය යුතුය.

27. රැස්වීමකදී නදබද කලබලයක් ඇතිවීම නිසා කල් දැමීමේ යෝජනාව ගැන ඡන්දය නොවිමසා ඒ රැස්වීම කල් දැමීම අවශ්‍ය යයි ඒ රැස්වීමේ සභාපතිහට සිතුණොත් ඒ රැස්වීම එසේ කල් දැමීමට හෝ අසවල් කාලයට යයි කාලය සඳහන් කොට නතර කිරීමට ඔහුට බලය තිබේ.

## කථා පවත්වන සාමාජිකයින් විසින් පිළිපැදිය යුතු නියෝග

28. සභාවේ හෝ කාරක සභාවක ස්වරූපයට පත් මුළු සභාවේ කල්පනාවට භාජනව පවතින යම් යෝජනාවක් සම්බන්ධයෙන් කථා කිරීමේදී පහත පෙනෙන නියෝගයන් හොඳින්ම පිළිපැදිය යුතුය :—

(අ) කාරක සභා රැස්වීමකදී හැර හැම සාමාජිකයකුම තමාට කියන්ට තිබෙන දේ නැගිට සිටගෙන සභාපතිහට කිය යුතුය ;

(ආ) කථාකරගෙන යන විට ක්‍රමවිරෝධී වුවහොත් මිස නැත්නම් කිසිම සාමාජිකයකුට බාධා නොකළ යුතුය ;

(ඇ) ඕනෑම සාමාජිකයකු තමාට කියන්ට තිබෙන දේ කියා නිම කළ පසු තම ආසනයෙහි වාඩිවිය යුතුය. එවිට සභාව අමතා කථා කිරීමට කැමති වෙන ඕනෑම සාමාජිකයකුට කථා කළ හැකිය ;

(ඈ) සාමාජිකයකු තම කථාව ලියාගෙන ඇවිත් නොකියවිය යුතුය. එහෙත් ඔහුට තමාගේ තර්කයන් තහවුරු කිරීම සඳහා මුද්‍රිත හෝ ලිඛිත යමකින් කොටස් කියවන්ට පුළුවන.

(ඉ) රැස්වීමකදී සාමාජිකයන් දෙදෙනෙකු එක විටම කථා කරන්ට නැගුණොත් නැතහොත් ඔවුන් දෙදෙනාට එක විටම කථා කරන්ට වුවමනා වුවහොත් ඒ රැස්වීමේ සභාපතිනු තමාට පළමුකොටම ඇහැගෙන සාමාජිකයාට කථා කිරීමට නියම කළ යුතුය ;

(ක) කල්පනාවට භාජනව පවතින කාරණයට නොගැළපෙන දෙයක් කිසිම සාමාජිකයකු නොකිය යුතුය ;

(ග) කිසිම සාමාජිකයකු වෙන සාමාජිකයකුට අයථා චේතනාරෝපණයක් නොකළ යුතුය ;

(ජ) පුද්ගලයන් වශයෙන් සාමාජිකයන් පිළිබඳව මොනම දෙයක් වත් නොකිය යුතුය ;

(ට) සභාව ඉදිරියේ තිබෙන යෝජනාව සම්බන්ධයෙන් හෝ ඒ යෝජනාව පිළිබඳ ඕනෑම අතුරු යෝජනාවක් සම්බන්ධයෙන් කථා කිරීමට සාමාජිකයකුට බලය තිබේ ;

(ඩ) සභාව ඉදිරියේ තිබෙන යම් යෝජනාවක් සම්බන්ධයෙන් කරුණු පහදදීම් වශයෙන් හෝ ක්‍රම විරෝධයක් පෙන්වාදීම් වශයෙන් හෝ කාරකසභා ස්වරූපයට පත් ප්‍රස්තාවයකදී හෝ 13 (ඔ) උපනීතියේ ඉඩ දී ඇති අයුරු හෝ මිස සාමාජිකයකු එක් වරකට වඩා කථා නොකළ යුතුය ;

(ණ) සභාව ඉදිරිපිට යෝජනාවක් නැතත් සභාවේ අවසරය ඇතිව සාමාජිකයකුට පුද්ගලික කරුණු පහදදීමට බලය තිබේ. එහෙත් ඒ කරුණු පිළිබඳව විවාද නොකළ යුතුය. එසේම ඒ කරුණු පහදදීම කළ යුත්තේ ඒ සාමාජිකයා විසින් තමාගේ ක්‍රියාමාර්ගයේ නිරවද්‍යතාව තහවුරු කිරීමට පමණකි;

(ත) යෝජනාවක් සම්බන්ධයෙන් සභාව අමතා කථා කිරීමට සභාවේ සිටින සෙසු සියලු සාමාජිකයන්ට ප්‍රස්ථාවය ලැබුණු පසු ඒ යෝජනාව ගැන ඡන්දය විමසීමට පෙර්තෙන් ඔවුන්ට පිළිතුරු දීම් වශයෙන් යෝජනාකාරයාට කථා කරන්ට බලය ඇත්තේය. එහෙත්, ඔහු ඒ කථාවේදී කලින් කථා කළ වුන්ට පිළිතුරු දීමෙන් පිට නොයා යුතුවා පමණක් නොව විවාදයට අලුත් කරුණු ඉදිරිපත් කිරීමද නොකළ යුතුය. අතුරු යෝජනාකාරයකුට වූකලී පිළිතුරු දීමට අයිතිවාසිකමක් නැත්තේය.

## සභාව කාරක සභාවක් වීම

29. සභාවට ඕනෑම වේලාවකදී, මුළු සභාවම කාරක සභාවක ස්වරූපය ගත යුතුයයි සම්මත කරගත හැකිය. ඒ කාරක සභාව ආපසු සභාවක ස්වරූපය ගත් කල එහිදී (කාරක සභාවේදී) සම්මත කර ගත්තා ලද තීරණයන් සභාවේදීද සම්මත කරගත යුතුය.

30. මුළු සභාවම කාරක සභාවක් වී කරන ඕනෑම සාකච්ඡාවක ඕනෑම අවස්ථාවකදී ඒ කාරක සභාව, සභාවක ස්වරූපයට පත්විය යුතුයයි යෝජනා කිරීමට ඕනෑම සාමාජිකයකුට බලය තිබේ. එවිට ඒ කාරක සභාවේ සභාපතිනු විසින් ඒ යෝජනාව ගැන ඡන්දය විමසිය යුතුය. යෝජනාව සම්මත වුවහොත් කාරක සභාව සභාවක ස්වරූපය ගත යුතුය.

## විශේෂ කාරක සභාවෝ

31. (අ) 1939යේ 61 වැනි අංකය දරණ නගරසභා ආඥාපනතේ අභිප්‍රායයන් පිළිබඳ යම් යම් කරුණු විභාග කොට වාර්තා කිරීම සඳහා සුදුසුයයි කල්පනා වන සාමාජිකයන් ගණනක් ඇතිව සුදුසුයයි කල්පනා වන විශේෂ කාරක සභාවන් හෝ නිත්‍ය කාරක සභාවක් කලින් කල පත්කර ගැනීමට නගර සභාවට බලය ඇත්තේය.

(ආ) ඒ කාරක සභාවන් පූර්වෝක්ත ප්‍රකාරයට පත්වූ අවුරුද්ද ඉකුත් වූ පසු කිසිම කටයුත්තක් නොකළ යුතුය.

(ඇ) වෙන ගණනක් විශේෂයෙන් නියම කරතොත් මිස නැත්නම් ඒ හැම කාරක සභා රැස්වීමකම ගණපූරණය විය යුත්තේ සාමාජිකයන් දෙදෙනකු පමණකි.

(ඈ) යම් කාරකසභා රැස්වීමකට සභාපතිනු නාවොත් ඇවිත් සිටින සාමාජිකයන් තමන්ගෙන් කෙනෙකු මූලාසනයට තෝරාගත යුතුය. මූලාසනයට තෝරාගත් ඒ සාමාජිකයාට සභාපතිනුගේ මුළු බලය ඒ රැස්වීමේදී තිබිය යුතුය.

(ඉ) කාරකසභාවක් වාර්තාවක් සම්බන්ධයෙන් එකඟවූ විට ඒ වාර්තාව ඒ කාරකසභාවේ හැම සාමාජිකයකුම විසින් අත්සන් කොට රැස්වීමේ වාර්තාව සමග සභාවට ඉදිරිපත් කළ යුතුය.

(ක) කාරක සභාවකදී සාමාජිකයන් පක්ෂව හා විපක්ෂව දෙකට බෙදුණොත් ඉදිරිපත් කරන ලද යෝජනාවත් එය ඉදිරිපත් කළ සාමාජිකයාගේ නමත් ඇවිත් සිටි සාමාජිකයන්ගෙන් ඊට පක්ෂවූ ගණනත් විපක්ෂවූ ගණනත් සඳහන් කරමින් ඒ සම්බන්ධයෙන් සටහනක් ඒ රැස්වීමේ වාර්තාවට ඇතුලත් කොට ඒ වාර්තාව ඒ කාරක සභාවේ වාර්තාවක් සමග සභාවට ඉදිරිපත් කළ යුතුය.

32. මොනම විශේෂ කාරකසභා රැස්වීමකට වත් නිත්‍ය කාරකසභා රැස්වීමකටවත් ප්‍රවෘත්ති පත්‍ර නියෝජිතයන්ට ඊමට ඉඩ නොදිය යුතුය.

## III කාණ්ඩය

### බේකරි පිළිබඳ උපනීති

1. මේ උපනීතිවල "බේකරිය" යන්නෙන් අදහස් කරන්නේ මනුෂ්‍යයන්ට ආහාර වශයෙන් විකිණීම පිණිස පාන් හෝ විස්කෝතු හෝ කේක් පේස්ට්‍රි පුළුස්සන හෝ සාදන ඕනෑම ස්ථානයකි. ඒ හෝ ආහාර වර්ග සකස් කරන හෝ ඒ ආහාර වර්ග සකස් කිරීමට ගන්නා ද්‍රව්‍යයන් රැස්කර තබන ඕනෑම ස්ථානයක් ඊට ඇතුළත් වේ.

2. (1) සභාපතිතුමාගෙන් බේකරියක් දමා ගැනීමට ලබාගත් බල පත්‍රයක් පිට මිස කිසිවකු විසින් බේකරියක් දැමීම හෝ කිසිම බේකරියක වෙළඳාම කරගෙන යෑම නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බල පත්‍රයක්ම 27 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දුන් අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදට අහෝසිවිය යුතුය.

3. බලපත්‍රය දීමට තිබෙන ස්ථානයත් බේකරියේ උපකරණත් පහත සඳහන් කොන්දේසිවලට ගැළපෙනොත් මිස නැත්නම් බේකරියක් දැමීම පිණිස බලපත්‍රයක් ලබා ගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය :—

(1) (අ) ගොඩනැගිල්ල හොඳින් අලුත්වැඩියාකොට හොඳින් වාතය හා ආලෝකය ලැබෙන පරිද්දෙන්ම තිබිය යුතුය. එහි හැම කාමරයකම විවෘත කළ හැකිවූද විවෘත කළ විට කාමරයේ බිමේ වර්ගප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු වර්ග ප්‍රමාණයක් ඇත්තාවූද ජනෙල් තිබිය යුතුය ;

(ආ) හැම කාමරයකම කොයිම බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොලින් හෝ කළුගලෙන් හෝ බැඳ තිබිය යුතුය. ඒවායේ ඇතුල් පැත්ත හුණු බදාමෙන් සපලාරු කොට සුදුහුණු ගා තිබිය යුතුය ;

(ඇ) වහල්පලය පොළොවේ සිට යටත් පිරිසෙයින් අඩි නයක් වත් උස්විය යුතුය ;

(ඈ) වහල කල් පවතින ස්ථිර ද්‍රව්‍යයකින් සෙවෙලි කොට තිබිය යුතුය ;

(ඉ) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය ;

(ඊ) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය ;

(උ) වතුර බැසයෑම සඳහා බිමේ සෑහෙන තරම් කානු ආදී පහසුකම් තිබිය යුතුය.

2. (අ) පිටි පදම් කරන කාමරයේ බිම දිගින් අඩි පහළොවකට හා පළලින් අඩි දොළහකට අඩු නොවිය යුතුය. එහි බිත්තිවල ඇතුල් පැත්තේ, බිම සිට අඩි හතරක් උසට පිඟන් ගඩොළු අල්ලා තිබිය යුතුය. නැතහොත් ඒ හරිය සිමෙන්තියෙන් සපලාරු කොට තිබිය යුතුය.

(ආ) පිටි පදම් කරන කාමරයේ දොරවල් හා ජනෙල් ඇති පැති දෙකකින් වත් ඔබ්බෙහි පළලින් අඩි හතකට නොඅඩු හිස් බිම් තීරුවක් තිබිය යුතුය.

(ඇ) පෝරණුවේ දොර, පිටි පදම් කරන කාමරයට කෙළින්ම විවෘත නොවිය යුතුය.

(ඈ) පිටි පදම් කරන හැම කාමරයකටම, සපලාරු කොට සුදුහුණු ගාතලද සිලිමක් හෝ හොඳට යන්ත්‍ර තුවන පදිදි ලෑලි ගසා සාදා තීන්ත හෝ සුදුහුණු ගාතලද සිලිමක් තිබිය යුතුය.

3. (අ) පාන් සෑදීමේදී පාවිච්චි කරන බාල්දිත් මේසත් සියලු භාජනත් බිම හා බිත්ති ශුද්ධපවිත්‍ර කරන විට එහා මෙහා කළහැකි පිදියේ දේවල් විය යුතුය.

(ආ) පාන් සෑදීමේදී පාවිච්චි කරන මේසවල උඩ තට්ටුව හොඳින් පදම්වූද එකිනෙකට හොඳින් යේත්තු වන්නාවූද ලෑලිවලින් හෝ උපද්‍රවදායක නොවන්නාවූද දිය බී නොගන්නාවූද යම්කිසි ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

4. (අ) බේකරියෙහි සෞඛ්‍යානුකූල කුණුබාල්දියක්ද, යටත් පිරිසෙයින් පඩික්කම් දෙකක්ද සෑහෙන තරම් වැසිකිළිද තිබිය යුතුය.

(ආ) බේකරිය ඕනෑම වැසිකිළියක හෝ කසළවළක හෝ පෝර ගොඩක හෝ මතුපිටින් නොවැසූ මලමූත්‍ර නාලිකාව සිට යටත් පිරිසෙයින් අඩි පනහක් වත් ඈතින් තිබිය යුතුය.

(ඇ) බේකරිය ඇතුළත හෝ බේකරියට කෙළින්ම සම්බන්ධවන පරිද්දෙන් කසළවළක් හෝ වැසිකිළියක් හෝ අලුවළක් හෝ නොතිබිය යුතුය.

4. (1) ඕනෑම බේකරියකට බල පත්‍රයක් දී තිබෙන කාලපරිච්ඡේදය ඇතුළත ඕනෑම වේලාවකදී ඒ බේකරිය සඳහා පාවිච්චි කරන ඕනෑම ගොඩනැගිල්ලක් 3 වැනි උපනීතියේ විධිවිධානයන්ට නොගැළපෙන තත්ත්වයකට පත්වුව හොත් ඒ ගොඩනැගිල්ල ඒ විධිවිධානයන්ට අනුකූල කරවීමට කළයුතු හැම දෙයක්ම අසවල් දිනයට මත්තෙන් කළ යුතුයයි නියම කොට ඒ බේකරියේ බලපත්‍රකාරයා වෙත දැන්වීමක් යවන්ට සැලැස්වීමට සභාපතිහට බලය ඇත්තේ ය. සභාපතිතුමා නියම [illegible] විය යුතුය.

(2) මේ උප නීතියේ (1) වැනි ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් බාරදෙනු ලැබූ කිසිම බේකරි බලපත්‍රකාරයකු ඒ දැන්වීමේ නියමිත කාලය ඇතුළත එහි කියා ඇති කටයුතු නොකළ සිටිය යුතු නොවේ.

(3). (1) වැනි ඡේදය යටතේ ඕනෑම දැන්වීමක් (බලපත්‍රකාරයා) බේකරියේ කටයුතු කරගෙනයන ස්ථානයෙහි නැතුව හොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයෙහි රක්ෂාවෙහි යොදවාගෙන සිටිය යම්කිසිවකුට බාරදුන්නොත් බලපත්‍රකාරයාටම බාරදුන්නා කොට සැලකිය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් තම බේකරියේ පිට පැත්තේ ප්‍රකට ස්ථානයක තමාගේ නම සහ "බල පත්‍රයක් ලත් බේකරිය" යන වචන සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් පින්තාරු කොට ලෑල්ලක් එල්ලා තබාගත යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා බේකරි පිළිබඳ මේ උපනීතිවල සිංහල පිටපතක්ද දෙමළ පිටපතක්ද ඉංග්‍රීසි පිට පතක්ද බලපත්‍රයද රාමුවක දමා බේකරියේ ප්‍රමුඛ ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. එසේම ඔහු වැඩට ගන්නා සියලු සේවක යන්ගේ (පාන් විකිණීමට ගෙනයන අයත් ඇතුළුවයි) නම් හා ලිපිනයන් යුක්තිසහගත කොයි වේලාවකදී වුවත් සභාපතිහට හෝ ඔහුගෙන් බලය ලත් වෙන ඕනෑම කෙනෙකුට පරීක්ෂා කරබැලිය හැකි වන සේ බේකරියේ තබා තිබීමට සැලැස්විය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවතාවක් බේකරියේ හැම කාමරයකම බිත්තිවල හා සිලිමේ සුදුහුණු ගෑවීමත් එහි ලී දඬුවල තීන්ත ගා නැති නම් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් යටත්පිරිසෙයින් අවුරුද්දකට දෙවතාවක් වත් ඒවායෙහි සුදුහුණු ගෑවීමත් තීන්ත ගා තිබේ නම් ඒ ලීදඬු යටත්පිරිසෙයින් එලෙසටම අවුරුද්දකට දෙවතාවක් වත් සබන් හා උණුවතුරෙන් සේදවීමත්, මෙකී වතාවලට අතිරේක වශයෙන් සභාපතිතුමා ලියවිල්ලකින් නියමකර එව්වොත් වෙන ඕනෑම විටෙකදී බිත්ති, සිලිං, ලීදඬු යනා මේවා සම්බන්ධයෙන් යථෝක්ත පිරියම් කරවීමත් කළ යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් එහි බිමත් බිත්තිවල පිඟන් ගඩොළු අල්ලා හෝ සිමෙන්ති දමා තිබෙන කොටසුත් මේසවල උඩතට්ටුත් ලයිසන් පත්‍රයේ සඳහන්කර තිබෙන වේලාවලදී හැමදාම සේදවිය යුතුය. ඔහු විසින් බේකරියේ හැම තැන මත් එහි අවටත් කානුත් ශුද්ධපවිත්‍ර කොට කැබලි බිඳුම් නැතිව මනා තත්ත්වයක තිබීමටත් ඒ ස්ථානයෙහි වූ යම් කානුවකින් හෝ වැසිකිළියකින් හෝ කසළවළකින් හෝ සෙසු අප්‍රිය දෙයකින් පැනනගින දුර්ගන්ධයෙන් තොරව තිබීමටත් සලස්වාගත යුතුය. පාන් සෑදීමේදී පාවිච්චි කරන ලිඹුබු, භාජන, උපකරණ යනා මේවා ශුද්ධ පවිත්‍ර ලෙසත් සෞඛ්‍යානුකූල ලෙසත් තබාගැනීමට සැලැස්විය යුතුය. වෙළඳාම සඳහා තිබෙන ද්‍රව්‍යවලින් අහක යන දේ හා ගෙදරදොරේ එකතුවන කුණු රොඩු ආදිය පියනක් ඇත්තාවූද දියසිරාව නාල්ලත්තාවූද භාජනයකට වහාම දමා තබ්බවා දවසකට එක් වරක් බේකරියෙන් ඉවත්කරවිය යුතුය, කුණුරොඩු දමන කල හැර අනික් කොයිවේලාවලදීත් ඒ භාජනය වසා තැබ්බවිය යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් පාන් සෑදීම සඳහා හොඳවූද පරාවූද පිටිත් වතුර හා වෙන ද්‍රව්‍යයනුත් ගත යුතුය. ඔහු විසින් පිටිමිටි ගොබගසා තබාගත යුත්තේ මෙහි පහත පෙනෙන අන්දමට සාදන ලද්දාවූද එහා මෙහා කළ හැකිවූද වේදිකාවක් උඩය—

මේ වේදිකාව තමාට පහසු දිග පළලකට සාදගත හැකිය. එය යටත් පිරිසෙයින් අඩි තුනක් වත් උස කකුල් පිට සවිකළ ශක්තිමත් තනි ලෑලි තට්ටුවකින් යුක්තවිය යුතුය. එහි කකුල් නොගැළවිය හැකි පරිද්දෙන් හිමට සවිකොටකළ යුතුය. මීයන්ට කකුල් දිගේ නොහැ ලෑලි තට්ටුව උඩට නගින්ට බැරිවන ලෙස ලෑලි තට්ටුවේ අයින රාමුවෙන් පිටතට අඟල් 9ක් එළියට නෙරා තිබිය යුතුය. මීයන්ට සැඟවී සිටීමට ලෑලි තට්ටුවේ යට පැත්තේ රුක්කි හෝ කුහර නොතිබිය යුතුය. උත්සා බිම ශුද්ධපවිත්‍ර කළහැකිවන සේ ඒ වේදිකාව එහා මෙහා කළ හැකි විය යුතුය. එහි බිත්තියේ සිට යටත්පිරිසෙයින් අඟල් 9ක් වත් ඈතින් තැබිය යුතුය.

10. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා 9 වැනි උප නීතියේ සඳහන් වේදිකාව යට හා අවට කිසිවක් තමන්ට ඉඩ නොදී ඒ හරිය නිදහස්ව තබාගත යුතුය. සෞඛ්‍යානුකූල කුණු බාල්දියක්ද යටත්පිරිසෙයින් පඩික්කන් දෙකක්ද බලපත්‍රය ලත් ස්ථානයේ ඔහු විසින් තැබ්බවිය යුතුය. කුණු බාල්දි තැබිය යුත්තේ පාන් සාදන අයට පහසුවෙන් ආගැකි තැන්වල්ය එහෙත් ඒවා පිටි පදම් කරන කාමරයේ නොතැබිය යුතුය.

11. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් බේකරිය මීයන්ගෙන් තොරව තබාගත යුතුවාත් හැර ඒ ස්ථානයේ පෙනෙන්ට තිබෙන සියලු මීගුල් වීදුරු කැලිවලින් පුරවා සිමෙන්ති බද මෙන් වසා දැමීම විය යුතුය.

12. බේකරිය තුළ (තබා තිබෙන) පඩික්කමට මිස වෙන තැනක කිසිවකු විසින් කෙළ නොගැසිය යුතුය.

13. කිසිවකු විසින් මොනම කරුණක් සඳහාවත් බේකරියේ කිසිම සතකු හෝ කුරුල්ලකු තබානොගත යුතුය.

14. (1) යම්කිසි වසංගත රෝගයකින් හෝ සංස්පර්ශක (ස්පර්ශයෙන් බෝවෙන) රෝගයකින් හෝ චම් රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කළාවූ කිසිවකු ඒ රෝගය බෝවෙන කාලපරිච්ඡේදය හා එහි රෝග බීජයන් මෝරණ කාලපරිච්ඡේදය ඉකුත්වී යන තෙක් බේකරිය තිබෙන ස්ථානයට ඇතුළුවීම හෝ එහි පාන් සෑදීමේ හෝ විකිණීමේ කටයුතුවලට සහභාගිවීම හෝ ඒ ස්ථානයෙන් පාන් විකිණීමට ගෙනයාම නොකළ යුතුය.

(2) බේකරියක බලපත්‍රකාරයා විසින් දැන දැනම කිසිවකුට මේ උප නීතියේ (1) වැනි ඡේදයේ විධිවිධානයන් කඩකිරීමට ඉඩ නොදිය යුතුය.

15. පාන් සාදන්නාවූ හෝ එනාතුකර තබන්නාවූ හෝ පාන් සෑදීමට ගන්නා ද්‍රව්‍යයන් තබන්නාවූ කාමරයෙහි, පාන් සෑදීමට පාවිච්චි කරන ලීබඩු ආදිය හැර වෙන ලීබඩුවක් හෝ රෙදිපිළි හෝ පැදුරු හෝ බඩුවක් බේකරියක බලපත්‍රකාරයා විසින් තබා නොගත යුතුය; නැතහොත් තබා ගැනීමට ඉඩ නොදිය යුතුය.

16. බේකරියක බලපත්‍රකාරයා විසින් බේකරියේම හිමෙ හෝ බේකරි ගොඩනැගිල්ලේම වූ කිසි තැනක්, පාන් සාදන්නාවූ හෝ එකතු කර තබන්නාවූ හෝ පාන් සෑදීමට ගන්නා ද්‍රව්‍යයන් රැස්කර තබන්නාවූ ස්ථානවලින්, (බිම සිට සිලිම දක්වාවූ ආවරණයකින්) හොඳින් වෙන් වීත් (පිටතට ඇඹු) ජනේලයකින් යුක්තවත් තිබෙනොත් මිස නැත්නම්, නිදගැනීමේ ස්ථානයක් වශයෙන් පාවිච්චි නොකළ යුතුය; නැතහොත් පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය. ඒ ජනේලය ඇරිය විට එහි වර්ග ප්‍රමාණය භූමියේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය.

17. පාන් සකස්කිරීමේ හා සෑදීමේ කටයුතු කරන හැම අයකුම විසින් ඒ කටයුතුවල යෙදීමට මත්තෙන් අත් සෝදාගෙන පපුව හා ශරීරය වැසෙන පරිදි පිරිසිදු සුදු ඒප්‍රණයක් (Apron) ඇඳගෙන හිසේ පිරිසිදු සුදු කැප් තොප්පියක් දමාගත යුතුය; නැතහොත් පිරිසිදු තලප්පාවක් බැඳගත යුතුය.

18. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් පාන් සෑදීමේ කටයුතුවල යෙදී සිටින අයට පිරිසිදු වතුර, පිරිසිදු තුවා, නිය පොතු බුරුසු, සබන් යන මේවා සැපයිය යුතුවාත් හැර ඒවා ඔවුන්ට පහසුවෙන් ගතහැකි තැනක තැබිබිය යුතුය.

19. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් බීමට යෝග්‍ය වතුර සෑහෙන තරමට ඒ බේකරියට ලබාදිය යුතුය.

20. බලපත්‍රයක් ලත් කිසිම බේකරියක බලපත්‍රකාරයා විසින් මී, මැසි, කුරුමිණී ආදී සතුන් හා දූවිලි නොවදින පරිදි නිසි ලෙස සෑදූ පිරිසිදු වීදුරු පෙට්ටිවල දමා මිස ඒ බේකරිය තුළ විකිණීම සඳහා පාන් පෑඩීම හෝ හැඩිබවීම නොකළ යුතුය.

21. බලපත්‍රයක් ලත් හැම බේකරියකම බලපත්‍රකාරයා විසින් ඒ බේකරියේ කාටත් පෙනෙන තැනක සම්මත පඩි සහිත තරාදියක් එල්ලා තැබීමට සැලැස්විය යුතුවාත් හැර විකුණන ලද පාන් ගෙඩියක් හෝ විකිණීමට තබා තිබෙන පාන් ගෙඩියක් කිරන්ට ඕනෑයයි යම් ගැනුම්කාරයකු කියා සිටියොත් එසේද කළ යුතුය.

22. කිසිම බේකරියක බලපත්‍රකාරයා විසින් සභාපතිහුත් තමාත් අත්සන් කළ ලියාපදිංචිකිරීමේ කාඩ්පත්‍රයක් ලඟ නැති කිසිවකුට තම බේකරියෙන් විකිණීම සඳහා පාන් ගෙනයෑමට ඉඩ නොදිය යුතුය.

23. බේකරියක බලපත්‍රකාරයා පාන් විකිණීමට යැවීම පිණිස රඳවා ගෙන සිටින එක් එක් අයගේ පාවිච්චියට දීමට ලියාපදිංචිකිරීමේ කාඩ් පත් ඉල්ලූ විට සභාපතිහු විසින් ඒවා නොමිලයේ දිය යුතුය.

24. වසාලද රථයක හෝ වසාලද පෙට්ටියක හෝ ටින් එකක හෝ වෙන සුදුසු භාජනයක නොදමා බේකරියක බලපත්‍රකාරයා විසින් තමාගේ බේකරියෙන් විකිණීම සඳහා පාන් ගෙනයෑමට ඉඩ නොදිය යුතුය. එසේ ගෙනයෑමට ඉඩ දීමට මත්තෙන් බලපත්‍රකාරයා විසින් ඒ රථය හෝ පෙට්ටිය හෝ ටින්එක හෝ භාජනය පරීක්‍ෂාකොට එය පිරිසිදුවටත් සෞඛ්‍යදායක ලෙසටත් තිබෙන බව පිළිගත යුතුය.

25. යුක්තියකගත ඕනෑම වේලාවකදී හෝ පිටි පදම්කිරීම හෝ පාන් පිළිස්සීම කරන ඕනෑම වේලාවකදී—

(1) සභාපතිහට හෝ ඔහු විසින් ඒ සඳහා සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද්දාවූ (නගර සභාවේ) ඕනෑම නිලධාරියකුට බේකරියට ඇතුළුවී එය පරීක්‍ෂාකිරීමට බලය තිබිය යුතුය.

(2) බේකරියක බලපත්‍රකාරයා විසින් හෝ ඒ බේකරිය භාරයේ සිටින තැනැත්තා විසින් සභාපතිහට හෝ ඔහුගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියකුට බේකරියට ඇතුළුවී පරීක්‍ෂා කිරීමට ඉඩ දී ඒ සම්බන්ධයෙන් වුවමනාවිය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

26. බේකරි පිළිබඳ මේ උප නීතිවලින් තවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසියපනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද, ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීමක් ගැන සිහිපත් කරමා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම්පතක් භාර දුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අම්තර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

27. බේකරි පිළිබඳ මේ උපනීතිවලින් තවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍ර කාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන යම්කිසි දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ඇති) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## IV වැනි කාණ්ඩය

### බත්කඩ, තේ කෝපි කඩ යන මේවා පිළිබඳ උපනීති

1. (1) සභාපතිහුගෙන් බත්කඩයක් හෝ භෝජනාගාරයක් හෝ තේ කෝපි කඩයක් දමා ගැනීමට ලබාගත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් බත්කඩයක් හෝ තේ කෝපි කඩයක් දැමීම හෝ පවත්වාගෙන යෑම නොකළ යුතුය.

(2) මේ උප නීතියේ 1 වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 25 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකළහොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිද අහෝසි විය යුතුය.

2. බලපත්‍රය දීමට තිබෙන ස්ථානය පහත සඳහන් කොන්දේසිවලට ගැළපෙනොත් මිස නැත් නම් බත්කඩයක් හෝ තේ කෝපි කඩයක් දැමීම පිණිස බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය:—

(1) ගොඩනැගිල්ල හොඳින් අලුත්වැඩියා කොට හොඳින් වාතය හා ආලෝකය ලැබෙන ලෙසට සාදා තිබිය යුතුය. හැම කාමරයකම බිමේ වර්ග ප්‍රමාණය යටත් පිරිසෙයින් වර්ග අඩි එක්සිය විස්සක් වත් විය යුතුවාත් හැර විවෘතකළ හැකි ජනෙල්ද තිබිය යුතුය. ඒ ජනෙල් විවෘත කළ විට ඒවායේ වර්ග ප්‍රමාණය බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය;

(2) හැම කාමරයකම කොයිම බිත්තියක්වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොලෙන් හෝ කළු ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ තිබිය යුතුය. ඒවායේ ඇතුල් පැත්ත හුණු බදාමෙන් කපරාරුකොට සුදුහුණු ගා තිබිය යුතුය;

(3) වහල්පලය පොළෝ මට්ටමේ සිට යටත්පිරිසෙයින් අඩි 6ක් වත් උස්විය යුතුය;

(4) කල් පවතින ද්‍රව්‍යයකින් වහල සෙවිලි කොට තිබිය යුතුය;

(5) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(6) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(7) ස්ථානයෙහි සෑහෙන පමණ කානුද සවස්ථානුකූල කුණු බාල්දියක්ද සෑහෙන පමණ වැසිකිළිද තිබිය යුතුය.

3. (1) ඕනෑම බත්කඩයකට හෝ තේ කෝපි කඩයකට බලපත්‍රයක් දී තිබෙන කාලපරිච්ඡේදය ඇතුළත ඕනෑම වේලාවකදී ඒ බත්කඩය හෝ තේ කෝපි කඩය සඳහා පාවිච්චිකරන ඕනෑම ගොඩනැගිල්ලක් 2වැනි උපනීතියේ විධිවිධානයන්ට නොගැළපෙන තත්ත්වයකට පත් වුවහොත් ඒ ගොඩනැගිල්ල ඒ විධිවිධානයන්ට අනුකූල කරවීමට කළ යුතු හැම දෙයක්ම අසවල් දිනයට මත්තෙන් කළ යුතුයයි නියම්කොට ඒ බත්කඩයේ හෝ තේ කෝපි කඩයේ බලපත්‍රකාරයා වෙත දැන්වීමක් යවන්ට සැලැස්වීමට සභාපතිහට බලය ඇත්තේය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ බලපත්‍රකාරයකු ඒ දැන්වීමේ නියමිත කාලපරිච්ඡේදය ඇතුළතදී එහි කියා ඇති කටයුතු නොකර සිටිය යුතු නොවේ.

(3) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේවූ ඕනෑම දැන්වීමක් (බලපත්‍රකාරයා) බත්කඩයේ හෝ තේ කෝපි කඩයේ කටයුතු කර ගෙන යන ස්ථානයෙහි ගැසුවහොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයෙහි රැකෙවෙහි ඝයාදවාගෙන සිටින යම් කිසිවකුට භාරදුන් හොත් බලපත්‍රකාරයාටම භාරදුන්නාකොට සැලකිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් තමාගේ නම හා "බලපත්‍රයක් ලත් බත්කඩය" හෝ "බලපත්‍රයක් ලත් තේ කෝපි කඩය" යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාත්‍රයෙන් ලෑල්ලක පැහැදිලි ලෙස පින්තාරුකොට ඒ ස්ථානයේ පිට පැත්තේ ප්‍රකට ස්ථානයක එල්ලා තබාගත යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් බත්කඩ හෝ තේ කෝපි කඩ පිළිබඳ උප නීති මාලාවේ සිංහල පිටපතක්ද දෙමළ පිටපතක්ද ඉංග්‍රීසි පිටපතක්ද බලපත්‍රයද රාමුවල දමා ඒ කඩයේ ප්‍රකට ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් වැඩට ගන්නා සියලු සේවක යන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා සභාපතිහට හෝ ඔහුගෙන් බලය ලත් වෙන ඕනෑම කෙනෙකුට යුක්තියකගත කොයි වේලාවකදී වුවත් පරීක්‍ෂාකර බැලීමට හැකිවන සේ ඒ කඩයේ තබා තිබීමට සැලැස්විය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවතාවක් ඒ කඩයේ හැම කාමරයකම සිවිලිම සුදුහුණු ගෑමිමත් මාර්තු මාසයේදී වරක්ද ජූනි මාසයේදී වරක්ද සැප්තැම්බර් මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට සතර වතාවක් සිලිමේ සුදුහුණු ගෑමිමත් කරවිය යුතුය. එසේම ලී දඬුවල තීන්ත ගා තිබේ නම් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට යටත්පිරිසෙයින් සෞඛ්‍යාධිකාරීන් හා සභාපතිතුමා නියම කරන සෙසු වකවානුවලදී ඒ ලීදඬු සබන් හා උණුවතුරෙන් සේදවිමත් තීන්ත ගා නැතිනම් එසේදී දෙන්ම ඒවායෙහි සුදුහුණු ගෑමිමත් කරවිය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයේ හැම තැනකමත් එහි අවටත් කාණුත් ශුද්ධ පවිත්‍රකොට කැබලිතිද්දුම් නැතිව මනා තත්ත්වයක තිබීමටද ඒ ස්ථානයේවූ යම් කාණුවකින් තෝ වැසිකිළියකින් හෝ කසලවලකින් හෝ සෙසු අප්‍රිය දෙයකින් පැනනගින දුර්ගන්ධයෙන් තොරව තිබීමටද සැලැස්විය යුතුය. ආහාරපාන වගී පිළියෙල කිරීම හෝ විකිණීම හෝ කෑම බීම සඳහා පාවිච්චිකරන සියලු ලීබඩු, භාජන, උපකරණ සහ මේවා ශුද්ධපවිත්‍ර ලෙසත් සෞඛ්‍යානුකූල ලෙසත් තබාගැනීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා ආහාරපාන පිළියෙල කිරීම හෝ විකිණීම හෝ කෑමබීම සඳහා ඒ ස්ථානයෙහි පාවිච්චි කරන සියලු භාජන යටත්පිරිසෙයින් පැයක්ගනරකට වරක් වත් සබන් හා උණු වතුරෙන් සේදවිය යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයට කෑමට බීමට එන කෙනෙකු භාජන යක් පාවිච්චිකළ වහාම වෙන අයකු පාවිච්චි කරන්නට මත්තෙන් එය සේදවිය යුතුය.

10. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් ආහාරපානාදියෙන් අහක යන කොටස හා ඒ ස්ථානයෙහි එකතුවන කුණු රොඩු පියනක් ඇති (වතුර උරා නො ගන්නා) භාජනයකට දම්මවා දින පතා ඒ භූමිභාගයෙන් ඉවත්කරවිය යුතුය. කුණු රොඩු ඇතුළට දමන වේලාවේදී හැර සෙසු හැම විටම ඔහු විසින් ඒ භාජනය වසා තැබ්බවිය යුතුය. අහක් දමන සියලු තේ රොඩු, හෝ කෝපි මණ්ඩි හෝ කිරි හෝ ඉඳුල් කෑම හෝ ආහාර ද්‍රව්‍යවලින් අහක යන දේ ඔහු විසින් බිම දමන්ට ඉඩ නොදී ඒ භාජනයට දමා එකතු කරවිය යුතුය.

11. බත්කඩයක හෝ තේ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් තේ හෝ කෝපි හෝ කිරි දෙන කොයි කවුන්ටරයක් හෝ ස්ථානයක් වුවත් ප්‍රශ්වාසාගම් සහශූවකින් හෝ දිය සිරාව කාල්ලන වෙන ද්‍රව්‍යයකින් වසා තිබෙනොත් මිස නැත්නම් ඒ සඳහා පාවිච්චි නොකළ යුතුය.

12. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩය කම බලපත්‍රකාරයා විසින් එහි රැකෙවෙ නියුක්තවූවන්ට හා ඒ ස්ථාන යට පැමිණෙන ආගන්තුකයන්ටද පහසුවෙන් පාවිච්චිකළ හැකිවන පරිද්දෙන් ඒ ස්ථානයෙහි සෞඛ්‍යානුකූල බාල්දියක්ද, යටත්පිරිසෙ යින් පඩික්කම් දෙකක්ද නිතරම තැබ්බවිය යුතුය.

13. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මියන් මැද්ද නොදී තබාගත යුතු වාත් හැර ඒ ස්ථානයේ මීගුල් තිබෙනවා දකින්ට ලැබුණොත් වහාම ඒවා සියල්ල මිදුරු කැබලිවලින් පුරවා සිමෙන්තියෙන් කපලාරුකොට වසා දැම්මවිය යුතුය.

14. බලපත්‍රයක් ලත් හැම බත්කඩයකම හෝ තේ හා කෝපි කඩය කම බලපත්‍රකාරයා විසින් බීමට සුදුසු වතුර සැපෙන තරමට ඒ ස්ථාන යෙහි තබාගත යුතුය.

15. බලපත්‍රයක් ලත් කිසිම බත්කඩයක හෝ තේ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් කිසිම ආහාර වර්ගයක් මැසි, කෘමි ආදී සතුන් හා දූවිලි නොවදින ලෙස සැදූ භාජනවල දමා මිස විකිණීම පිණිස තැබීම හෝ රැස්කර තැබීම හෝ පෙනෙන්ට තැබීම නොකට යුතුය. ඔහු විසින් ඒ භාජන පිරිසිදු ලෙසත් සෞඛ්‍යානුකූල ලෙසත් තබාගත යුතුය.

16. කිසිම බත්කඩයක හෝ භෝජනාගාරයකට හෝ තේ කෝපි කඩයකට අයත් භූමිභාගයෙහි දූෂිත කිරි තබාගැනීම හෝ විකිණීම හෝ නොකට යුතුය.

මේ උපනීතිය සම්බන්ධයෙන් "දූෂිත කිරි" යන්නෙන් අදහස් කරන්නේ වතුර හෝ වෙන ඕනෑම බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයක් මිශ්‍ර කරනලද කිරිය; නැතහොත් මේදය හැර ක්ෂීර ධාතුව සියයට 8.5ට අඩුවූ හෝ මේදය සියයට 3.5ට අඩුවූ එළකිරිය; නැතහොත් මේදය හැර ක්ෂීරධාතුව සියයට 9කට අඩුවූ හෝ මේදය සියයට 7ට අඩුවූ මී කිරිය. මේ ව්‍යවස්ථාව කඩ කළොත් ඒ ගැන වගකිවයුත්තේ බලපත්‍රකාරයාය.

17. බලපත්‍රයක් ලත් ස්ථානය ඇතුළත පනික්කමකට මිස වෙන කිසිම තැනක කිසිවකු විසින් කෙළ නොගැසිය යුතුය.

18. යම්කිසි වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්මරෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කළාවූ කිසිවකු ඒ රෝගය බෝවෙන කාලපරිච්ඡේදය හා එහි රෝග බීජයන් මෙරීමට ගතවන කාලපරිච්ඡේදය ඉකුත් වී යන තෙක් බත්කඩයට හෝ තේ කෝපි කඩයට ඇතුල්වීම හෝ එහි ආහාරපාන වගී පිළියෙල කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ කටයුතුවලට සහභාගිවීම නොකළ යුතුය.

19. කිසිම බත්කඩයක් හෝ තේ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් දැන දැනම කිසිවකුට 17 වැනි උපනීතියේ හෝ 18 වැනි උප නීතියේ විධිවිධාන කඩ කිරීමට ඉඩ නොදිය යුතුය.

20. කිසිම බත්කඩයක හෝ තේ කෝපි කඩයක බලපත්‍රකාරයා විසින් සභාපතිතුමා හා තමා අත්සන් කළ ලියාපදිංචිකිරීමේ කාඩ්පත්‍රයක් ළඟ ඇතුවද වැසූ පෙට්ටියක හෝ ටින් එකක හෝ වෙන සුදුසු භාජන යක දමා ගෙනද මිස නැත් නම් කිසිවකුට බලපත්‍රය ලත් ස්ථානයෙන් පිටතට විකිණීම සඳහා පිසූ ආහාර ගෙන යෑමට ඉඩදිය නොදිය යුතුය

21. ආහාර ගෙනයෑම සඳහා පාවිච්චි කරන සියලු රථවාහන හෝ පෙට්ටි හෝ ටින් හෝ සෙසු භාජන ආහාර දමන වේලාවේදී පිරිසිදුව තිබෙන බවට (බලපත්‍රයක් ලත්) හැම බත්කඩයකම හෝ තේ කෝපි කඩයකම බලපත්‍රකාරයා විසින් වග බලාගත යුතුය.

22. ඕනෑම බත්කඩයක හෝ තේ කෝපි කඩයක (පිසූ) ආහාර විකිණීමට යැවීම සඳහා රඳවාගෙන සිටින හැම පුද්ගලයකුගේම ළඟ තබාගැනීමට ආහාර රෙජිස්තර (ලියාපදිංචි කිරීමේ) කාඩ්පත්‍ර ඒ බත්කඩයේ හෝ තේ කෝපි කඩයේ බලපත්‍රකාරයා ඉල්ලූ විටෙක සභාපතිතුමාමිලයේ දිය යුතුය.

23. (1) සභාපතිහට හෝ ඔහු විසින් ඒ සඳහා සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද (නගර සභාවේ) ඕනෑම නිලධාරියකුට යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඕනෑම බත් කඩයට හෝ තේ කෝපි කඩයකට ඇතුල් වී එය පරීක්ෂාකිරීමට බලය තිබිය යුතුය.

(2) බත්කඩයේ හෝ තේ කෝපි කඩයේ බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිහට හෝ ඔහුගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වී පරීක්ෂාකිරීමට ඉඩ දී ඒ සඳහා සභාපතිහට හෝ ඒ නිලධාරියාට වුව මනා විය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

24. බත්කඩ හෝ තේ කෝපි කඩ පිළිබඳ මේ උපනීතිවලින් කව රක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පු වූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත් කරවා සභාපතිතුමා හෝ ඔහු විසින් බලය පවරනලද නිලධාරියකු දැන්වීම් පතක් භාර දුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නොවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

25. බත්කඩ හෝ තේ කෝපි කඩ පිළිබඳ මේ උපනීතිවලින් කව රක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන යම්කිසි දඬුවමක් දීමටද (සැසෙන අධිකරණ බලය ඇති) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## V වැනි කාණ්ඩය

### භෝජනාගාර පිළිබඳ උපනීති

1. (1) භෝජනාගාරයක් දමා ගැනීමට සභාපතිතුමාගෙන් ලත් බල පත්‍රයක් පිට මිස කිසිවකු විසින් භෝජනාගාරයක් (Restaurant) දමා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍ර යක්ම 22 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස 31 වැනිදා අහෝසි විය යුතුය.

2. බලපත්‍රයක් දීමට තිබෙන ස්ථානය පහත සඳහන් කොන්දේසි වලට ගැළපෙනොත් මිස නැත්නම් භෝජනාගාරයක් දැමීම පිණිස බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය :—

(1) ගොඩනැගිල්ල හොඳින් අලුත්වැඩියා කොට හොඳින් වාතය හා ආලෝකය ලැබෙන ලෙසට සාද තිබිය යුතුය. හැම කාමර යකම බිමේ වර්ග ප්‍රමාණය අඩුම ගණනේ වර්ග අඩි 120ක් වත් විය යුතුවාත් හැර විවෘත කළ හැකි ජනෙල්ද තිබිය යුතුය. ඒ ජනෙල් විවෘත කළ විට ඒවායේ වර්ග ප්‍රමාණය බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය ;

(2) හැම කාමරයකම කොසිම බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොළින් හෝ කළුගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ තිබිය යුතුය. ඒවායේ ඇතුල් පැත්ත හුණු බදාමෙන් කපලාරු කොට සුදුහුණු ගා තිබිය යුතුය ;

(3) වහල්පලය පොළොව මට්ටමේ සිට අඩුම ගණනේ අඩි 6ක් වත් උස් විය යුතුය;

(4) කල් පවතින ද්‍රව්‍යයකින් වහල සෙවිලි කොට තිබිය යුතුය;

(5) ලී දැඩුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(6) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(7) ස්ථානයේ සෑහෙන පමණ කානුද සෞඛ්‍යානුකූල කුණු බාල්දි යක්ද සෑහෙන පමණ වැසිකිළිද තිබිය යුතුය.

3. (1) ඕනෑම භෝජනාගාරයකට බලපත්‍රයක් දී තිබෙන කාල පරිච්ඡේදය ඇතුළත ඕනෑම වේලාවකදී ඒ භෝජනාගාරය සඳහා පාවිච්චි කරන ඕනෑම ගොඩනැගිල්ලක් 2 වැනි උපනීතියේ විධිවිධාන යන්ට නොගැළපෙන තත්ත්වයකට පත්වුව හොත් ඒ ගොඩනැගිල්ල ඒ විධිවිධානයන්ට අනුකූල කරවීමට කළයුතු හැම දෙයක්ම අසවල් දිනයට ඉන්පෙර කළ යුතුයයි නියමකොට ඒ භෝජනාගාරයේ බල පත්‍රකාරයා වෙත දැන්වීමක් යවන්ට සැලැස්වීමට සභාපති හට බලය ඇත්තේය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ බලපත්‍රකාරයකු ඒ දැන්වීමේ නියමිත කාලපරිච්ඡේදය ඇතුළතදී ඒ කටයුතු නොකර සිටිය යුතු නොවේ.

(3) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ වූ ඕනෑම දැන්වීමක් බලපත්‍රකාරයා භෝජනාගාරයේ කටයුතු කරගෙන යන ස්ථානයෙහි ගැසුව හොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයෙහි රක්ෂාවෙහි යොදවාගෙන සිටින යම් කිසිවකුට භාරදුන් හොත් බලපත්‍රකාරයාටම භාරදුන්නා කොට සැලකිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් භෝජනාගාර පිළිබඳ මේ උපනීති මාලාවේ සිංහල පිටපතක්ද දෙමළ පිටපතක්ද ඉංග්‍රීසි පිටපතක්ද බලපත්‍රයද රාමුවල දමා, ඒ ස්ථානයෙහි කාටත් පෙනෙන තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් වැඩට ගන්නා සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා සභාපතිහට හෝ ඔහුගෙන් බලය ලත් ඕනෑම කෙනෙකුට යුක්ති සහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට හැකිවන සේ ඒ ස්ථානයෙහි තබා තිබිය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවතාවක් ඒ ස්ථානයේ හැම කාමරයකම බිත්තිවල සුදුහුණු ගෑවිය යුතුය. එසේම මාර්තු මාසයේදී වරක්ද ජූනි මාසයේදී වරක්ද සැප්තැම්බර් මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට හතර වතාවක් සිලිමේ සුදුහුණු ගෑවිමත් ලීදඬුවල තීන්ත ගා තිබේ නම් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට යටත්පිරිසෙයින් දෙවතාවක් හා සභාපතිහු ලියවිල්ලකින් නියම කරන සෙසු වකවානුවලදී ඒ ලීදඬු සබන් ගා උණු වතුරෙන් සේදවීමත් තීන්ත ගා නැති නම් එපරිද්දෙන්ම ඒවායේ සුදුහුණු ගෑවීමත් කරවිය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයේ හැම තැනමත් එහි අවටත් කාණුත් ශුද්ධපවිත්‍ර කොට කැඩුම් බිඳුම් නැතිව මනා තත්වයක තිබීමටද ඒ ස්ථානයේ වූ කානු වකින් හෝ වැසිකිළියකින් හෝ කසළවළකින් හෝ සෙසු අප්‍රිය දෙයකින් පැන නගින දුර්ගන්ධයෙන් තොරව තිබීමටද සැලැස්විය යුතුය. ආහාරපාන වර්ග පිළියෙල කිරීමට හෝ විකිණීමට හෝ කෑම බීමට පාවිච්චි කරන සියලු ලීබඩු, භාජන, උපකරණ යනා මේවා ශුද්ධ පවිත්‍ර ලෙසත් සෞඛ්‍යානුකූල ලෙසත් තබාගැනීමට ඔහු විසින් සැලැස් විය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් තේ හෝ කෝපි හෝ කිරි දීම සඳහා පාවිච්චි කරන කවුන්ටරයෙහි හෝ මේසයෙහි තුත්තනාගම් තහඩුවක් හෝ දිය සිරාව නැල්ලන වෙන ද්‍රව්‍යයක් ඇල්ලවිය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ආහාරවර්ග පිළියෙල කිරීමට හෝ විකිණීමට හෝ තැබීමට පාවිච්චි කරන සියලු භාජන ශුද්ධපවිත්‍රව හා සෞඛ්‍යානුකූලව තිබීමට අවශ්‍ය වන පරිදි සබන් ගාවා සේදවිය යුතුය. මේ සේදවීම පැ විසිහතරකට එක් වරකට අඩු නොවිය යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයට කෑමට බීමට එන කෙනෙකු පාවිච්චි කළ කොයි භාජන යක් වුවත් වෙන කෙනෙකු පාවිච්චි කරන්ට ඉන්පෙර සේදවිය යුතුය.

10. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි සෞඛ්‍යානුකූල කුණු බාල්දියක්ද යටත්පිරිසෙයින් පඩික්කම් දෙකක්ද නිතරම තබා තිබීමට සැලැස්විය යුතුය. ඔහු විසින් ඒ පඩික්කම් තැබිය යුත්තේ ඒ ස්ථානයේ රක්ෂාවේ නියුක්තවූ අයට හෝ එහිදී කෑම බීම කන බොන අයට පහසුවෙන් ආ හැකි තැන්වලය.

11. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ආහාරපානාදියෙන් අහක යන කොටස හා ඒ ස්ථානයෙහි එකතුවන කුණුකරාබු ආදිය (පියනක් ඇත්තාවූද වතුර උරා නොගන්නාවූද) භාජනයකට දම්මවා දිනපතා ඒ ස්ථානයෙන් ඉවත් කරවිය යුතුය. අහක දමන සියලු තේ රොඩු හෝ කෝපි මණ්ඩි හෝ කිරි හෝ ඉඳුල් කෑම හෝ ආහාර ද්‍රව්‍යවලින් අහක යන දේ ඔහු විසින් ඒ භාජනයට දම්මවා එකතු කරවිය යුතුය. කුණුකරාබු ඇතුළට දමන වේලාවලදී හැර සෙසු හැම විටම ඒ භාජනය වසා තැබිබවිය යුතුය.

12. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මීයන් වැද්ද නොදී තබාගත යුතුවාත් හැර ඒ ස්ථානයේ මීගුල් තිබෙනවා දකින්ට ලැබුණොත් වහාම ඒවා සියල්ල වීදුරු කැබලිවලින් පුරවා සිමෙන්තියෙන් කපලාරු කොට වසා දම්ම විය යුතුය.

13. ඕනෑම භෝජනාගාරයක බලපත්‍රකාරයා විසින් කිසිවකුට ඒ ස්ථානයේදී පඩික්කමකට මිස වෙන කිසිම තැනක කෙළ ගැසීමට ඉඩ නොදිය යුතුය. වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුනාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කිරීමෙයි යෙදී සිටියාවූ කිසිම කෙනෙකුට ඒ රෝගය බෝවීමට හා රෝග බීජ මේරීමට ගතවන කාලපරිච්ඡේදයත් පසුවන තෙක් ඒ ස්ථානයට ඇතුල්වීමට හෝ ආහාර පාන වර්ග සකස් කිරීමේ හෝ විකිණීමේ කටයුතුවලට සහභාගිවීමට ඔහු විසින් ඉඩ නොදිය යුතුය.

14. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින්, බීමට සුදුසු වතුර සෑහෙන තරමට ඒ ස්ථානයෙහි තබාගත යුතුය.

15. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම බලපත්‍රකාරයා විසින් රස්කර තබන්නාවූ හෝ විකිණීම පිණිස පෙනෙන්ට තබන්නාවූ සියලු ආහාර මැසි, කෘමි ආදි සතුන් හා දූවිලි නොවදින ලෙස භාජන වල දමා තැබීමට සැලැස්විය යුතුය. ඔහු විසින් ඒ භාජන නිතරම පිරිසිදු ලෙසත් සෞඛ්‍යානුකූල ලෙසත් තබාගත යුතුය.

16. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම පාවිච්චි කරන සීනි, කට පළල්වූද වීදුරු මූඩියක් ඇත්තාවූද බෝතලවල දමා තැබීමට ඒ ස්ථානයේ බලපත්‍රකාරයා විසින් සැලැස්විය යුතුය.

17. ඕනෑම භෝජනාගාරයක බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි දූෂිත කිරි විකිණීම හෝ තබා ගැනීම නොකළ යුතුය.

මේ උපනීතිය සම්බන්ධයෙන් "දූෂිත කිරි" යන්නෙන් අදහස් කරන්නේ වතුර හෝ වෙන ඕනෑම බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයක් මිශ්‍ර කරන ලද කිරිය; නැතහොත් මේදය නුවූ ඝනරධාතුව සියයට 8.5ට අඩුවූ හෝ මේදය සියයට 3.5ට අඩුවූ එළකිරිය; නැතහොත් මේදය නුවූ ඝනරධාතුව සියයට 9කට අඩුවූ හෝ මේදය සියයට 7ට අඩුවූ මීකිරිය.

18. ඕනෑම භෝජනාගාරයක බලපත්‍රකාරයා විසින් සභාපතිහු හා තමා අත්සන් කළ ලියාපදිංචි කිරීමේ පත්‍රයක් ළඟ ඇතිව වැසූ රථ වාහනයක හෝ පෙට්ටියක හෝ ටින් එකක හෝ වෙන සුදුසු භාජනයක දමාගෙන ගෙනයනොත් මිස නැත්නම් කිසිම කෙනෙකුට ඒ ස්ථාන යෙන් පිටතට විකිණීම සඳහා පිසූ ආහාර වර්ග ගෙනයෑමට ඉඩ නොදිය යුතුය. ඒ හැම රථවාහනයක්ම හෝ පෙට්ටියක්ම හෝ ටින් එකක්ම හෝ වෙන භාජනයක්ම නිතරම පිරිසිදු ලෙසත් සෞඛ්‍යානුකූල ලෙසත් තබා ගැනීමට ඒ බලපත්‍රකාරයා විසින් වගබලාගත යුතුය.

19. බලපත්‍රයක් ලත් හැම භෝජනාගාරයකම (පිසූ) ආහාර විකිණීමට යැවීම සඳහා රඳවාගෙන සිටින හැම පුද්ගලයකුගේම ළඟ තබාගැනීමට ලියාපදිංචි කිරීමේ පත්‍ර ඒ භෝජනාගාරයේ බලපත්‍රකාරයා ඉල්ලූ විටෙක සභාපතිහු විසින් නොමිලයේ දිය යුතුය.

20. (1) සභාපතිහට හෝ ඔහු විසින් ඒ සඳහා සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඕනෑම භෝජනාගාරයකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) භෝජනාගාරයේ බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතියට හෝ ඔහුගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වී පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා වුවමනා විය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

21. භෝජනාගාරයන් පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත්කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

22. භෝජනාගාරයන් පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන යම්කිසි දඬුවමක් දීමටද (නඩුගෙන අධිකරණ බලය ඇති) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

(8)

## VI වැනි කාණ්ඩය

### භෝජනශාලා පිළිබඳ උපනීති

1. (1) සභාපතිවරයාගෙන් භෝජනශාලාවක් දමා ගැනීමට ලබාගත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් භෝජනශාලාවක් දමා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 22 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදාට අහෝසි විය යුතුය.

2. බලපත්‍රය ලබාගැනීමට නියමිත ස්ථානය පහත සඳහන් කොන්දේසිවලට ගැළපෙනොත් මිස නැත්නම් භෝජනශාලාවක් දැමීමට බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය :—

(1) ගොඩනැගිල්ල ශක්තිමත් ලෙස සාදන ලදින් යහපත් තත්වයක තිබිය යුතුය. එහි හැම කාමරයක්ම හොඳින් වාතය හා ආලෝකය ලැබෙන ලෙස සාද තිබිය යුතුය. හැම කාමරයකටම විවෘත කළ හැකි ජනෙල් සවිකොට තිබිය යුතුය. ඒ ජනෙල් විවෘත කළ විට ඒවායේ වර්ග ප්‍රමාණය බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය. හැම කාමරයකම බිමේ වර්ග ප්‍රමාණය අඩුම ගණනේ වර්ග අඩි එකසිය පනස්සක්වත් විය යුතුය ;

(2) හැම කාමරයකම කොයි බිත්තියක් වත් උසින් අඩි දහයකට අඩු නොවිය යුතුය. ඒවායේ සුදුහුණු ගා තිබිය යුතුය ;

(3) වහල්පලය පොළේ මට්ටමේ සිට අඩුම ගණනේ අඩි හයක් වත් උස්විය යුතුය ;

(4) වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවිලි කොට තිබිය යුතුය.

(5) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය ;

(6) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය ;

(7) ස්ථානයෙහි සෑහෙන පමණ කානු දමා තිබිය යුතුය ;

(8) ගෙය අතුගා දමන කුණුරොඩු දැමීමට සෑහෙන පමණ උස මනා ඇතිවූද සෞඛ්‍යානුකූලවූද කුණුබාල්දි සෑහෙන ගණනකුත් සියලු සෞඛ්‍ය අවශ්‍යතාවන් පිරිමසාලීමට ප්‍රමාණවත්වන පරිදි කෑම තැන් හා වැසිකිළිත් ස්ථානයෙහි තිබිය යුතුය. මේ වැසිකිළි ගණන වූකලී බලපත්‍රය දීමට තිබෙන ගොඩනැගිල්ලේ තාවකාලික දහදෙනාකුට යටත්පිරිසෙයින් තනි එකකට අඩු නොවන සංඛ්‍යාවක් විය යුතුය ;

(9) ගොඩනැගිල්ලේ සෑහෙන තරම් ජලය ලබාගැනීමේ පහසුකම් තිබිය යුතුය. බීමට වතුර ගන්නා ලැබුනත් නාන ලැබුනත් පිහිටුවාගත යුත්තේ බීමට ගන්නා වතුර මිනිසුන්ගේ නෑම නිසා අපවිත්‍ර නොවන ලෙසටය ;

(10) ගොඩනැගිල්ලේ මුළුතැන්ගෙය වශයෙන් වෙනම කාමරයක් තිබිය යුතුය. එහි දුම් හොඳින් පිටවී යෑමට විවරයක් හෝ චිමිනියක් තිබිය යුතුය.

3. (1) ඕනෑම භෝජනශාලාවකට බලපත්‍රයක් දී තිබෙන කාල පරිච්ඡේදය ඇතුළත ඒ භෝජනශාලාව සඳහා පාවිච්චි කරන ඕනෑම ගොඩනැගිල්ලක් 2 වැනි උපනීතියේ විධිවිධානයන්ට නොගැළපෙන තත්වයකට ඕනෑම විටෙකදී පත්වූව හොත් ඒ ගොඩනැගිල්ල ඒ විධිවිධානයන්ට අනුකූල කරවීමට කළයුතු හැම දෙයක්ම අසවල් දිනයට මත්තෙන් කළ යුතුයයි නියමකොට ඒ භෝජනශාලාවේ බලපත්‍රකාරයා වෙත දැන්වීමක් යැවීමට සලස්වන්ට සභාපතිගට බලය ඇත්තේ ය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ (භෝජන ශාලාවක) බලපත්‍රකාරයකු විසින් ඒ දැන්වීමේ නියමිත කාලපරිච්ඡේදය ඇතුළතදී එහි කියා ඇති කටයුතු නොකළ සිටිය යුතු නොවේ.

(3) මේ උපනීතියේ 1 වැනි ඡේදය යටතේ ඕනෑම දැන්වීමක් භෝජනශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානයෙහි ගැසුව හොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයෙහි රක්ෂාවෙහි යොදවා ගෙන සිටින යම් කිසිවකුට භාරදුන්නොත් ඒ දැන්වීම බලපත්‍රකාරයාටම භාර දුන් කොට සැලකිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් භෝජනශාලා පිළිබඳ මේ උපනීති මාලාවේ ඉංග්‍රීසි පිටපතක් හා සිංහල පිටපතක් හා දෙමළ පිටපතක්ද බලපත්‍රයද රාමුවල දමා ඒ භෝජනශාලාවේ ප්‍රකට ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් වැඩට ගන්නා සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් සභාපතිගට හෝ ඔහුගෙන් බලය ලත් ඕනෑම කෙනෙකුට යුක්ති සහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට හැකිවන සේ ඒ භෝජනශාලාවේ තබා තිබීමට සැලැස්විය යුතුය.

5. සභාපතිවරයා විසින් හැම භෝජනශාලාවකම බලපත්‍රයට ඒ ස්ථානයේ සැලැස්මක් ඇමිණීමට සලස්වා එහි ඇති නිදන කාමර හා (බිමේ වර්ගප්‍රමාණයෙන් එක් එක් හතරැස් අඩි 40ට එක් පුද්ගලයකුට වඩා වැඩි නොවන ලෙසට) ඒ එක් එක් කාමරයේ නිදාගැනීමට අවසර දී ඇති අයගේ ගණන දැක්විය යුතුය. මේ උපනීතිය සම්බන්ධයෙන් වයස අවුරුදු 10ට අඩු ළමයින් දෙදෙනාකු එක් පුද්ගලයකු වශයෙන් ගණන් ගත යුතුය.

6. බලපත්‍රයට අමුණා ඇති සැලැස්මෙහි විශේෂ වශයෙන් නිදාගැනීම සඳහා වෙන්කර ඇති කාමරයක මිස භෝජනශාලාවේ වෙන කිසිම තැනක කිසිවකුට නිදාගැනීමට භෝජනශාලාවක බලපත්‍රකාරයා විසින් ඉඩ නොදිය යුතුය.

7. සැලැස්මෙහි දක්වා ඇති පුද්ගලයන් ගණනට වඩා වැඩි ගණනකට කිසිම කාමරයක නිදාගැනීමට භෝජනශාලාවක බලපත්‍රකාරයා විසින් ඉඩ නොදිය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් තම භෝජනශාලාවේ නැවතී සිටින එක් එක් අයගේ නාමය, රක්ෂාවය, උපන් ගමය, ඔහු එහි නැවතීමට එන්ට මත්තෙන් තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් නැවතී සිටි ස්ථානය යන මේවා ලකුණු කොට ලේඛන පොතක් තබාගත යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් එහි එක් එක් නිදන කාමරයේ ජනෙල් දිනපතා යටත්පිරිසෙයින් පැය හතරක් වත් සම්පූර්ණ වශයෙන් ඇරලා තැබීමට සැලැස් විය යුතුය.

එහෙත් කාලගුණයේ හැටියට ජනෙල් වසා තැබීම අවශ්‍යකට පවතී නම් එකල්හි බලපත්‍රකාරයා විසින් ජනෙල් ඇරවීම හෝ ඇරලා තැබීම විම අවශ්‍ය නොවේ.

10. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේදී වරක් බැගින් අවුරුද්දකට සතර වරක්ද සභාපතිවරයා ලියුමකින් නියම කරන සෙසු වකවානුවලදීද හැම කාමරයකම ඇතුල් බිත්තිවල හා සිලිමේ සුදුහුණු ගෑවීමටත් ලීදඬුවල සුදුහුණු ගෑවීමට හෝ ඒවායේ තීන්ත ගා තිබේ නම් ඒවා උණුවතුරෙන් සේදවීමටත් සැලැස්විය යුතුය.

11. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් භෝජනශාලාවේ සෑම තැනමත් එහි අවටත් කානුත් ශුද්ධපවිත්‍ර කොට කැඩුම්බිඳුම් නැතිව මනා තත්වයක තිබීමටද ඒ ස්ථානයේ වූ යම් කානුවකින් හෝ වැසිකිළියකින් හෝ කසළවලකින් හෝ සෙසු අප්‍රිය දෙයකින් පැනනගින දුර්ගන්ධයෙන් තොරකොට තබාගැනීමටද සැලැස්විය යුතුය. ඔහු විසින් භෝජනශාලාවෙහි වූ සියලු ලී බඩු, භාජන, උපකරණ යන මේවා ශුද්ධපවිත්‍ර ලෙස හා සෞඛ්‍යානුකූල ලෙස තබාගැනීමටද සැලැස්විය යුතුය.

12. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් එහි සියලු කාමර, ගෙමිදුල (සොල්දර පඩි පෙළ), ඉස්තෝප්පු, කානු යන මේවා හා ඒ ස්ථානයට අයිති ඉඩම අඩුම ගණනේ දවසකට එක් වරක් වත් මධ්‍යාහ්නයට කලින් අතුගා දැමීමට සැලැස්විය යුතුය.

13. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් සියලු කැළිකසළ, ගේ අතුගා දමන කුණුරොඩු යන මේවාත් සෙසු අප්‍රිය දේවලුත් පියන සහිතවූද සිදුරු රහිතවූද තුත්තනාගම් භාජනය කට හෝ ගැල්වනයිස් භාජනයකට වහාම දමවා දිනපතා ඒ භූමි භාගයෙන් ඉවත් කරවිය යුතුය. ඒ කැළිකසළ කුණුරොඩු ආදිය දමන වේලාවේදී හැර අනික් කොයි වේලාවේදීත් ඒ භාජනය වසා තැබිය යුතුය.

14. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා පිසූ සියලු ආහාර වර්ග මැස්සන් හෝ සෙසු කෘමීන් නොවදිනා ලෙස තැබ්බවිය යුතුය.

15. භෝජනශාලාවක බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයට වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන කිසිවකු වැද්ද නොගත යුතුය.

16. භෝජනශාලාවක නැවතී සිටින කෙනෙකුට යම් වසංගත රෝගයක් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයක් වැළඳුණොත් ඒ භෝජනශාලාවේ බලපත්‍රකාරයා විසින් ඒ බව ඒ භෝජනශාලාව පිහිටි කොට්ඨාශයේ සෞඛ්‍ය පරීක්ෂකතැනට හෝ සභාපතිගට වහාම දැක්විය යුතුය. ඒ භෝජනශාලාවේ සිටින අය එයින් අස්කළ යුතුයයි සභාපතිවරයා නියම කළොත් බලපත්‍රකාරයා විසින් එසේ කොට, එකී රෝගියා පාවිච්චිකළ ඇඳඇතිරිලිවලත් රෙදිපිළිවලත් සෙසු ද්‍රව්‍යවලත් විෂබීජ විනාශ කරවීමට හෝ අවශ්‍ය නම් ඒ ඇඳඇතිරිලි ආදිය විනාශ කරදැමීමටද සභාපතිවරයා නියමකරන ආකාරයකට පොදු අරමුදලෙන් ඒ ගෙයි බෙහෙත් දුම් ගස්වා විෂබීජ විනාශකොට සුදුහුණු ගෑවීමටද ඉඩ දිය යුතුය.

17. වසංගත රෝගයක් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයක් පැවතුණ භෝජනශාලාවක බලපත්‍රකාරයා ඒ ස්ථානය සභාපතිවරයා පරීක්ෂාකර රෝගබීජවලින් තොරයයි සහතික කරන තුරු ඒ ස්ථානයට කිසිම අයකු භාර නොගත යුතුය.

18. භෝජනශාලාවක බලපත්‍රකාරයා විසින් ඒ භෝජනශාලාව ඇතුළේ හරකුන් හෝ එළුවන් හෝ කුකුළන් තබාගැනීමට ඉඩ නොදිය යුතුය.

19. බලපත්‍රයක් ලත් හැම භෝජනශාලාවකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මීයන්ගෙන් තොරව තබාගැනීමටත් මීයුල් දකින්ට ලැබුණ වහාම ඒවා සියල්ල වීදුරු කැබලිවලින් පුරවා සිමෙන්තියෙන් සපලාරු කිරීමටත් සැලැස්විය යුතුය.

20. (1) සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද (නගර සභාවේ) ඕනෑම නිලධාරියකුට යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඕනෑම භෝජනශාලාවකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) භෝජනශාලාවේ බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වී පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා ප්‍රස්තාවයේ හැටියට සභාපතිහට හෝ ඒ නිලධාරියාට වුවමනා විය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

21. භෝජනශාලා පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකිය.

22. භෝජනශාලා පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩ කිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයකු කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමද ඊට අතිරේක වශයෙන් වෙන යම්කිසි දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## VII වැනි කාණ්ඩය

### ලැගුම්හල් පිළිබඳ උපනීති

1. (1) ලැගුම්හලක් දමා ගැනීමට සභාපතිහුගෙන් ලත් බලපත්‍රයක් ඇතිව මිස කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත කිසිම ලැගුම්හලක් දමා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 24 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදට අහෝසි විය යුතුය.

2. (1) සභාපතිහු දෙන බලපත්‍රයක බලය යටතේ මිස කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත කිසිම ලැගුම්හලක් දමා නොගත යුතුය.

(2) පහත සඳහන් අයුරු වුවහොත් මිස නැත්නම් ලැගුම්හලක් දැමීමට බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය :—

(අ) යහපත් චරිතයක් ඇත්තකු බවට මහෙස්ත්‍රාත් කෙනෙකු විසින් හෝ සමාදාන විනිශ්චයකාරයකු විසින් අත්සන් කරන ලද චරිත සහතිකයක් සභාපතිහු වෙත තැන්පත් කිරීම හෝ තමා යහපත් චරිතයක් ඇත්තකු බැව් සභාපතිහට පිළිගත හැකි ලෙස වෙන අන් දමකින් ඔප්පුකිරීම ;

(ආ) බලපත්‍රය දීමට තිබෙන ස්ථානය පහත පෙනෙන කොන්දේසිවලට ගැළපීම :—

(1) ගොඩනැගිල්ල ශක්තිමත් ලෙස සාදන ලදින් යහපත් තත්වයක තිබිය යුතුය. එහි හැම කාමරයක්ම හොඳින් වාතය හා ආලෝකය ලැබෙන ලෙස සාද තිබිය යුතුය. හැම කාමරයකටම විවෘත කළහැකි ජනෙල් සවිකොට තිබිය යුතුය. ඒ ජනෙල් විවෘත කළ විට ඒවායේ වර්ගප්‍රමාණය බිමේ වර්ගප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය. හැම කාමරයකම බිමේ වර්ගප්‍රමාණය අඩුම ගණනේ වර්ග අඩි එකසිය විස්සක් වත් විය යුතුය ;

(2) හැම කාමරයකම කොයිම බිත්තියක් වත් උසින් අඩි දහයකට අඩු නොවිය යුතුය. ඒවායේ සුදුහුණු ගා තිබිය යුතුය ;

(3) වහල්පලය පොළෝ මට්ටමේ සිට අඩුම ගණනේ අඩි හයක් වත් උස් විය යුතුය ;

(4) වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවෙලි කොට තිබිය යුතුය ;

(5) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය ;

(6) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය ;

(7) ස්ථානයෙහි යැහෙන පමණ කානු දමා තිබිය යුතුය ;

(8) ගෙය අතුගා දමන කුණුරොඩු දැමීමට ස්ථානයේ හැහෙන පමණ උස මිහත ඇතිවූද සෞඛ්‍යානුකූල වූද කුණු බාල්දි හැහෙන ගණනකුත් නාන තැන් හා වැසිකිළිත් තිබිය යුතුය. මේ වැසිකිළි ගණන වූකලී බලපත්‍රය දීමට තිබෙන ගොඩනැගිල්ලේ නවතින දහදෙනෙකුට තනි එකකට අඩු නොවන සංඛ්‍යාවක් විය යුතුය ;

(9) ගොඩනැගිල්ලට හොඳට ජලය ලබාගැනීමේ පහසුකම් තිබිය යුතුය. බීමට වතුර ගන්නා තැනුත් නාන තැනුත් පිහිටුවා ගත යුත්තේ බීමට ගන්නා වතුර මිනිසුන්ගේ නෑම නිසා අපවිත්‍ර නොවන ලෙසය ;

(10) ගොඩනැගිල්ලේ මුළුතැන්ගෙය වශයෙන් වෙනම කාමරයක් තිබිය යුතුය. එහි දුම හොඳින් පිටවී යැමට විවරයක් හෝ මාර්ගයක් තිබිය යුතුය.

3. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් තමාගේ නමත්, "බලපත්‍රයක් ලත් ලැගුම්හල" යන්නත් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාත්‍රයෙන් ලෑල්ලක පැහැදිලි ලෙස පින්තාරුකොට ඒ ස්ථානයේ පිට පැත්තේ ප්‍රකට ස්ථානයක එල්ලා තබාගත යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් ලැගුම්හල් පිළිබඳ මේ උපනීතිමාලාවේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ එක් එක් භාෂාවෙන් පිටපතක් බැගින්ද බලපත්‍රයද රාමුවල දමා ලැගුම්හලේ ප්‍රකට ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් වැඩට ගන්නා සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා සභාපතිහට හෝ ඔහුගෙන් බලය ලත් ඕනෑම කෙනෙකුට යුක්ති සහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂා කර බැලිය හැකිවන සේ ඒ ලැගුම්හලේ තබා තිබීමට සැලැස්විය යුතුය.

5. ලැගුම්හලේ සැලැස්මෙහි නිදන කාමර වශයෙන් විශේෂයෙන් වෙන්කර ඇති කාමරවල මිස වෙන කිසිම කාමරයක කිසිවකුට නිදාගන්ට ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ඉඩ නොදිය යුතුය. ඒ සැලැස්ම බලපත්‍රයට ඇමිණිය යුතුවා පමණක් නොව සභාපතිහු විසින් අත්සන් කළ යුතුද වන්නේය.

6. යම් කාමරයක නිදාගැනීමට සභාපතිහු සැලැස්මේ නියමකර ඇති අයගේ ගණනට වඩා වැඩි දෙනෙකුට ඒ කාමරයෙහි නිදාගැනීමට ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ඉඩ නොදිය යුතුය. කාමරයක නිදාගැනීමට අවසර දෙන අයගේ ගණන ඒ කාමරයේ බිමේ වර්ග ප්‍රමාණයෙන් එක් එක් හතරැස් අඩි 36කට එක් පුද්ගලයකුට වඩා වැඩි නොවිය යුතුය. මේ උපනීතිය සම්බන්ධයෙන් වයස අවුරුදු 10ට අඩු ළමෝ දෙදෙනෙක් එක් පුද්ගලයෙකු වශයෙන් ගණන් ගනු ලැබේ.

7. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් එක් එක් කාමරයෙහි දිග පළල හා එහි නිදාගැනීමට ඉඩ දෙන අයගේ වැඩිම ගණනද දක්වා දැන්වීම් ලෑල්ලක් ඒ එක් එක් කාමරයෙහි එල්ලා තැබිය යුතුය.

8. ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ස්වාමිපුරුෂයන්ට හා භාර්යාවන්ටද දෙමව්පියන්ට හා දූදරුවන්ටද හැර වයස අවුරුදු 10ට වැඩි ගැණු පිරිමින්ට එකම නිදන කාමරයක නැවතී සිටින්ට ඉඩ නොදිය යුතුය.

9. ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් තම ස්ථානය අශික්ෂිත ක්‍රියා සඳහා පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය. ඔහු විසින් ඒ ලැගුම්හල ඇතුළේ සංවරය හා ශිෂ්ටත්වය ආරක්ෂා කටයුතුය.

10. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් තම ලැගුම්හලේ නැවතී සිටින එක් එක් අයගේ නාමය, රක්ෂාව, උපන් ගමය, ඔහු එහි නැවතීමට එන්ට ඉන් පෙර තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් නැවතී සිටි ස්ථානය යන මේවා ලකුණු කොට ලේඛන පොතක් තබාගත යුතුය.

11. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් එහි එක් එක් නිදන කාමරයේ ජනේල දිනපතා යටත් පිරිසෙයින් පැය හතරක් වත් සම්පූර්ණ වශයෙන් ඇරලා තැබීමට සැලැස්විය යුතුය. එහෙත්, කාලගුණයේ හැටියට ජනෙල් වසා තැබීම අවශ්‍යතාව පවතී නම් එකල්හි බලපත්‍රකාරයා විසින් ජනෙල් ඇරවීම හෝ ඇරලා තැබීම අවශ්‍ය නොවේ.

12. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේදී වරක් බැගින් අවුරුද්දකට හතරවරක්ද සභාපතිහු ලියුමකින් නියම කරන සෙසු වකවානුවලදීද හැම කාමරයකම ඇතුල් බිත්තිවල හා සිලිමේ සුදු හුණු ගෑවීමටත් ලී දඬු සුදුහුණු ගෑවීමටත හෝ ඒවායේ තීන්ත ගා තිබේ නම් ඒවා සබන් හා උණු වතුරෙන් සේදවීමටත් සැලැස්විය යුතුය.

13. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් ලැගුම්හලේ හැම තැනමත් එහි අවටත් කානුත් ශුද්ධපවිත්‍ර කොට කැඩුම් බිඳුම් නැතිව මනා තත්වයක තිබීමටද ස්ථානයෙහිවූ යම් කානුවකින් හෝ වැසිකිළියකින් හෝ කසළවළකින් හෝ සෙසු අප්‍රිය දෙයකින් පැන නගින දුර්ගන්ධයෙන් තොර කොට තබා ගැනීමටද සැලැස්විය යුතුය. ඔහු විසින් සියලු ලීබඩු, භාජන, උපකරණ යන මේවා ශුද්ධ පවිත්‍ර ලෙස හා සෞඛ්‍යානුකූල ලෙස තබාගැනීමටද සැලැස්විය යුතුය.

14. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් එහි සියලු කාමර, ගෙමං තීරු (කොල්දර පඩිපෙළ) ඉස්තෝප්පු, කානු යනා මේවා හා ඒ ස්ථානයට අයිති ඉඩම අඩුම ගණනේ දවසකට එක් වරක් වත් මධ්‍යාහ්නයට කලින් අතුගාදැමීමට සැලැස්විය යුතුය.

15. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින්, සියලු ආහාර වර්ග මැස්සන් හෝ සෙසු කෘමීන් නොවදිනා ලෙස තැබිය යුතුය.

16. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා, සියලු කැළි කසළ හෝ අතුගා දමන කුණුරොඩු හෝ සෙසු අප්‍රිය දේවල් පියන සහිතවූද තුත්තනාගමෙන් හෝ ගැල්වනයිස් යකඩෙන් සාදන ලද්දවූද භාජනයකට වහාම දම්මවා දිනපතා ඒ භූමිභාගයෙන් ඉවත් කරවිය යුතුය. ඒ කැළිකසළ කුණුරොඩු ආදිය දමන වේලාවේදී හැර අනික් කොයි වේලාවේදීත් ඒ භාජනය වසා තැබිය යුතුය.

17. ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයට වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙලෙන කිසිවකු වැද්ද නොගත යුතුය.

18. (1) ලැගුම්හලක නැවතී සිටින කෙනෙකුට යම් වසංගත රෝගයක් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයක් හෝ චර්ම රෝගයක් වැළඳුණොත් ඒ ලැගුම්හලේ බලපත්‍රකාරයා විසින් ඒ බව ඒ ලැගුම්හල පිහිටි කොට්ඨාශයේ සෞඛ්‍ය පරීක්ෂකතැනට හෝ සභාපතිහට වහාම දැන්විය යුතුය. ඒ ලැගුම්හලේ බලපත්‍රකාරයා විසින් සභාපතිහු කියනා විදියකට පොදු අරමුදලෙන් ඒ ගෙයි බෙහෙත් දුම් ගස්වා විෂබීජ විනාශ කොට සුදුහුණු ගෑවීමටද සැලැස්විය යුතුය.

(2) (1) වැනි ඡේදයේ කී ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය සභාපතිහු පරීක්ෂාකර බලා රෝග බීජවලින් තොරව තිබේයයි සහතික කරන තුරු ඒ ස්ථානයට කිසිවකු වැද්ද නොගත යුතුය.

19. ලැගුම්හලක බලපත්‍රකාරයා විසින් ඒ ගොඩනැගිල්ල ඇතුළත ගවයන් හෝ එළුවන් හෝ සූකුලන් තබා ගැනීමට ඉඩ නොදිය යුතුය.

20. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් ඒ ගෙට අයිති හැම දිය වැසිකිළියක හා පස් වැසිකිළියක වාඩිවෙන පටවුව, බිම, බිත්තිය යනා මේවා පිරිසිදුව සෞඛ්‍යානුකූල ලෙස තබාගැනීමට අවශ්‍ය වන වාර ගණනක් ඒ ඒ වේලාවලදී ශුද්ධ කරවිය යුතුය.

21. බලපත්‍රයක් ලත් හැම ලැගුම්හලකම බලපත්‍රකාරයා විසින් ඒ ලැගුම්හලේ පාවිච්චි කරන සියලු පැදුරු, ඇඳඇතිරිලි, කොට්ට මෙට්ට ඇඳන් යනා මේවා පිරිසිදුව සෞඛ්‍යානුකූල ලෙස තබාගැනීමට අවශ්‍ය වන වාර ගණනක් කලින් කල ශුද්ධපවිත්‍ර කරවිය යුතුය.

22. (1) සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද (නගර සභාවේ) ඕනෑම නිලධාරියකුට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඕනෑම ලැගුම්හලකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) ලැගුම්හලේ බලපත්‍රකාරයා හෝ එය භාරව සිටින තැනැත්තා සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනලද ඕනෑම නිලධාරියකුට ලැගුම්හලට ඇතුල්වී පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා ප්‍රස්තාවයේ හැටියට සභාපතිහට හෝ ඒ නිලධාරියාට වුවමනා විය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

23. ලැගුම්හල් පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පණහකට වැඩිනුවූ දඩයක් ගැසීමෙන්ද, ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිගිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් භාරකර දුන් පසු ඒ කඩකිරීම කර ගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකිවිය යුතුය.

24. ලැගුම්හල් පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයවූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## VIII වැනි කාණ්ඩය

### අප්‍රියවූද අන්තරායදායකවූද කර්මාන්ත පිළිබඳ උපනීති

1. මේ උපනීතිවල "අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක්" යන්නෙන් අදහස් කරන්නේ නගර සභාව විසින් අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක්ය යි ප්‍රකාශ කරන ලද ඕනෑම කර්මාන්තයකි.

2. (1) අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමකට සභාපතිහුගෙන් ලත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කිසිම කර්මාන්තයක් නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 16 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වෙනිදාට අහෝසිවිය යුතුය.

3. පහත පෙනෙන අයුරු වුවහොත් මිස නැත්නම් අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය :—

(1) අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තය කරගෙන යාම බලාපොරොත්තුවන ස්ථානය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැන විසින් හෝ ඔහුගෙන් බලය ලත් යම් කිසිවකු විසින් අනුමත කරන ලද්දක් විය යුතුය ; එසේම

(2) ඒ කර්මාන්තය කරගෙන යෑමට බලාපොරොත්තුවන ස්ථානය හා ගොඩනැගිල්ල පහත පෙනෙන කොන්දේසිවලට ගැළපෙන සේ තිබිය යුතුය :—

(අ) ගොඩනැගිල්ල කැඩුම් බිඳුම් කිසිවක් නැතිව යහපත් තත්වයක තිබිය යුතුය. ඊට හොඳින් වාතය හා ආලෝකය ලැබිය යුතුය. එහි හැම කාමරයකම විවෘත කළ විට ඒ කාමරයේ බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවන වර්ග ප්‍රමාණයක් ඇත්තාවූද විවෘත කළ හැකිවූද ජනෙල් තිබිය යුතුය ;

(ඉ) හැම කාමරයකම කොයිම බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොලෙන් හෝ ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ තිබිය යුතුය. ඒ එක් එක් බිත්තියේ ඇතුල් පැත්ත පොළවේ සිට අඩි හතරක් උසට සිමෙන්තියෙන් කපලාරු කොට තිබිය යුතුය. එහි ඉතිරි හරිය හුණු බදාමෙන් කපලාරු කොට සුදුහුණු ගා තිබිය යුතුය ;

(උ) වහලේ හැම පලයක්ම පොළවේ සිට අඩුම ගණනේ අඩි 6ක් වත් උස්විය යුතුය ;

(එ) වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවෙලි කොට තිබිය යුතුය ;

(ඔ) ලීදඬුවල තීන්ත හෝ සුදු හුණු ගා තිබිය යුතුය ;

(ක) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය ;

(ග) ස්ථානයෙහි සෑහෙන පමණ කානු දමා තිබිය යුතුය ;

(ජ) ස්ථානයෙහි සෞඛ්‍යානුකූල කුණු බාල්දියක්ද, සෑහෙන තරම් වැසිකිළිද තිබිය යුතුය.

4. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් ඒ කර්මාන්තය කරගෙන යෑමට වුවමනා වන සියලු ද්‍රව්‍ය දුර්ගන්ධයක් හෝ වෙන හැහැවක් ඇති නොවන අන්දමකට තැන්පත් කර තබාගත යුතුය.

5. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් අප්‍රිය විය හැකිවූ හෝ දුර්ගන්ධයක් ඇතිවිය හැකිවූ යම් ද්‍රව්‍යයක්, යම් පොදු ස්ථානයක් හෝ මහ පාරක් දිගේ ගෙනයන විට දියසීරුව ඇද නොගන්නාවූද කිසිම හැහැවක් ඇති නොවන්නාවූද භාජනවල දමා පියන්වලින් වසාගෙන ගෙනයා යුතුය.

6. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් ඒ කර්මාන්තයේ කොයිම අවස්ථාවකදී වුවත් නිකුත් වන අප්‍රිය වාෂ්ප හෝ වායු (ගෑස්) උපද්‍රවදායකවූ හෝ අප්‍රියවූ විපාකයක් ඇති නොකොට ඉහළ යොස් බාහිර වාතය හා සම්මිශ්‍රවීමට හෝ කෙළින්ම ගින්නක් මැදින් යෑමට හෝ ශුද්ධිකරණ උපකරණයක් ඇතුළට යැවීමට සැලැස්විය යුතුය.

7. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් දරණ කාවිසිනුත් ඒ කර්මාන්තය කරන ස්ථානයෙහි වතුර බැස යෑමට සෑහෙන පමණ කානු දම්මවාගෙන ඒ කානු මනා තත්වයක තබා ගැනීමටත් දිනපතා සේදීමටත් සැලැස්විය යුතුය.

8. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කා විසිනුත් ඒ කර්මාන්තය කරන ගොඩනැගිල්ලේ බිම වතුර නාල්ලන ද්‍රව්‍යයකින් සාදවා තිසි පරිදි අලුත්වැඩියා කොට හොඳ හැටි තබා ගැනීමටත් දිනපතා ශුද්ධපවිත්‍ර කිරීමටත් සැලැස්විය යුතුය.

9. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් ඒ කර්මාන්තය කරන ගොඩනැගිල්ලේ බිත්ති කුණු නොබැඳෙන සේ මනා තත්වයක තබාගෙන ඒවායේ අවුරුදු පතා සුදුහුණු ගෑවිය යුතුය.

10. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් ඒ කර්මාන්තය සඳහා පාවිච්චි කරන මෙවලම් හා භාජන ඇතුළු සියලු උපකරණ ශුද්ධපවිත්‍රව තැබීමට සලස්වා හැකි නම් දිනපතා පිරිසිදු කරවිය යුතුය.

11. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කාවිසිනුත් ඒ කර්මාන්තයෙන් අපතේ යන්නාවූද ඒ කර්මාන්තයේ වෙන අවස්ථාවක් සම්බන්ධයෙන් ඒ ස්ථානයේදී එකෙණෙහිම වැඩට නොගන්නාවූද ද්‍රව්‍ය හා උපද්‍රව්‍ය සමග සියලු කුණු රොඩු කැළිකසළ ආදිය පියන සහිත භාජනවල දමා ඒ කර්මාන්තය කරන ස්ථානයෙන් දිනපතා ඉවත් කරවිය යුතුය.

12. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කවරකු විසිනුත් හම් හෝ වෙන යම්කිසි ද්‍රව්‍යයක් පොඟවන හෝ සෝදන වැන්කිවලින් දුර්ගන්ධයක් හට නොගන්නා පරිද්දෙන් ඒ වැන්කි නිතර නිතර හිස්කොට ශුද්ධපවිත්‍ර කළ යුතුය.

13. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්තයක් කිරීමට බලපත්‍රයක් ලත් කවරකු විසිනුත් කිසිම ගංගාවකට හෝ ඇළකට හෝ දොළකට හෝ දියපාරකට හෝ ළිඳකට හෝ වැවකට හෝ වෙන අනාවරණ ජලාශයකට අපිරිසිදු හෝ දුර්ගන්ධය හමන්නාවූ හෝ අප්‍රිය ස්වභාවයෙන් යුක්තවූ වතුර හෝ වෙන ද්‍රව්‍යයක් බැස්සවීමෙන් හෝ ඔසින්ට හැරීමෙන් හෝ යම් අප්‍රිය ද්‍රව්‍යයක් එහි විසිකිරීමෙන් හෝ යෝදෙන්ට දැමීමෙන් හෝ වෙන යම්කිසි විදියකින් ඒ ගංගාව හෝ ඇළ හෝ දොළ හෝ දියපාර හෝ ළිඳ හෝ වැව හෝ ජලාශය අපිරිසිදු නොකළ යුතුය.

14. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ ඕනෑම කර්මාන්තයක් කරන ඕනෑම ස්ථානයකට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඇතුල්වී එය පරීක්ෂා කිරීමට සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට බලය තිබිය යුතුය. ඒ පරීක්ෂාව කිරීමට බලපත්‍රකාරයා විසින් හෝ ඒ ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් අවසර දිය යුතුය.

15. අප්‍රියවූ හා අන්තරායදායකවූ කර්මාන්ත පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්ථාවයකදීම රුපියල් පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

16. අප්‍රියවූ හෝ අන්තරායදායකවූ කර්මාන්ත පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## IX වන කාණ්ඩය

### (සෝඩා ලෙමනේඩ් ආදී) සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ උපනීති

1. (1) සභාපතිහුගෙන් (සෝඩා ලෙමනේඩ් ආදී) සිසිල් බීම කර්මාන්තශාලාවක් දමාගැනීමට ලබාගත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් සිසිල් බීම කර්මාන්තශාලාවක් දමාගැනීම හෝ පවත්වාගෙන යැම නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 22 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදාට අහෝසි විය යුතුය.

2. බලපත්‍රයක් දෙන්ට තිබෙන ස්ථානය පහත පෙනෙන කොන්දේසිවලට ගැළපෙනොත් මිස නැත්නම් (සෝඩා ලෙමනේඩ් ආදී) සිසිල් බීම කර්මාන්තශාලාවක් දමා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය :—

(1) (අ) ගොඩනැගිල්ල කැඩුම් බිඳුම් කිසිවක් නැතිව යහපත් තත්වයක තිබිය යුතුය. ඊට හොඳින් වාතය හා ආලෝකය ලැබිය යුතුය. එහි හැම කාමරයකම ඇරිය හැකි ජනෙල් සවිකොට තිබිය යුතුය. ඒ ජනෙල් ඇරිය විට කාමරයේ බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය;

(ආ) හැම කාමරයකම කොයිම බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොලෙන් හෝ ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ තිබිය යුතුය. එක් එක් බිත්තියේ ඇතුල් පැත්ත හුණු බදාමෙන් කපරාරු කොට තිබිය යුතුය. එහි සුදුහුණුද ගා තිබිය යුතුය;

(ඇ) වහල් පලය බිම සිට අඩුම ගණනේ අඩි හයක් වත් උස්විය යුතුය;

(ඈ) වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවිලිකොට තිබිය යුතුය;

(ඉ) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(ඊ) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(උ) ස්ථානයෙහි සෑහෙන හාරම් කානු දමා තිබිය යුතුය.

(2) සිසිල් බීම සෑදීම පිණිස අඩුම ගණනේ එක් කාමරයක් වත් වෙන්කොට තිබිය යුතුය.

(3) සිසිල් බීම සෑදීමට ගන්නා පැණි වර්ග සුවඳ වර්ග රසායන ද්‍රව්‍ය යනා මේවා තැන්පත්කර තැබීම සඳහා (මැස්සන්ට ඇතුල් විය නොහැකි ලෙස සාදනලද) වෙනම කාමරයක් තිබිය යුතුය.

(4) බෝතල් සේදීමට වෙනම ස්ථානයක් තිබිය යුතුය.

(5) කර්මාන්තශාලාවේ පාවිච්චියට ගන්නා ජලය අපිරිසිදු නොවන ලෙස සෑහෙන පරිදි ආරක්ෂාකොට ඇති ස්ථානයකින් ලබාගත යුතුය. ඒ ජලය කර්මාන්තශාලාවට ගෙනා යුත්තේ ඒ ගෙනීමේදී අපවිත්‍ර නොවන අන්දමකටය. එසේම ඒ ජලය කර්මාන්තශාලාවෙහි නිසි ලෙස බඳින ලද වැන්කිවල හෝ ජලාශයවල රැස්කර තබාගත යුතුය.

(6) සිසිල්බීම සෑදීමට ගන්නාවූද (ඒ කටයුත්තේ කොයි අංශයකදී වුවත් පාවිච්චියට ගන්නාවූද) බෝතල් භාජන උපකරණ යනා මේවා සේදීමට ගන්නාවූද ජලය වූකලී සභාපතිහු විසින් අනුමත කරන ලද්දාවූද යන්ත්‍රොපකරණයට සම්බන්ධ කරන ලද්දාවූද සුදුසු පෙරන උපකරණයකින් පෙරීගෙන යා යුතුය. ඒ ජලය රසායනික පරීක්ෂණයකින් හා සූක්ෂ්මදර්ශීය පරීක්ෂණයකින් පවිත්‍ර හා පථ්‍ය ජලය බව පෙනීගොස් තිබිය යුතුය. එහෙත් අනුමත කරනලද පොදු ජලාශයකින් ලබාගන්නා ජලය මේ උපනීතිගත කටයුතුවලින් නිදහස් කිරීමට සභාපතිහට බලය තිබිය යුතුය.

(7) (අ) සිසිල් බීම කර්මාන්තශාලාවෙහි සෞඛ්‍යානුකූල කුණු බාල්දියක්ද, අඩුම ගණනේ පඩික්කම් දෙකක්ද එහි රක්ෂාවෙහි යෙදී සිටින සේවකයන් දසදෙනෙකුට එකකට අඩු නොවන ගණනක් වැසිකිළිද තිබිය යුතුය.

(ආ) සිසිල් බීම කර්මාන්තශාලාව ඕනෑම වැසිකිළියක හෝ කසළ වළක හෝ ගවමඩුවක හෝ පෝර ගොඩක හෝ නොවසන ලද මල මූත්‍ර නාලිකාවක සිට අඩුම ගණනේ අඩි පනහක් වත් ඈතින් පිහිටා තිබිය යුතුය;

(ඇ) සිසිල් බීම කර්මාන්තශාලාව ඇතුළත හෝ ඊට කෙළින්ම සම්බන්ධවන පරිද්දෙන් කිසිම කසළ වළක් හෝ වැසිකිළියක් හෝ ගවමඩුවක් හෝ අපු වළක් නොතිබිය යුතුය.

3. (1) සිසිල් බීම කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් බලපත්‍රයක් දී ඇති කාලපරිච්ඡේදය ඇතුළත ඕනෑම වේලාවකදී ඒ සිසිල් බීම කර්මාන්තශාලාව වෙනුවෙන් පාවිච්චි කරන කිසියම් ගොඩනැගිල්ලක් 2 වැනි උපනීතියේ විධිවිධානවලට නොගැළපෙන තත්වයකට පත්වුවහොත් බලපත්‍රකාරයා වෙත දැන්වීමක් යවා ඒ දැන්වීමේ නියම කරන දවසට කලින් ඒ ගොඩනැගිල්ල එකී විධිවිධානවලට ගැළපෙන අයුරු වීමට අවශ්‍යවන හැම දෙයක්ම කරවන මෙන් ඒ බලපත්‍රකාරයාට නිවේදනය කිරීමට සභාපතිහට බලය තිබිය යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දැන්වීම් පතක් භාර දෙනු ලැබූ (සිසිල් බීම කර්මාන්තශාලාවක) බලපත්‍රකාරයා විසින් ඒ දැන්වීමේ කියා ඇති දේ එහි සඳහන් කාලය ඇතුළතදී කිරීම පැහැර නොහැරිය යුතුය.

(3) (1) ඡේදය යටතේ ඕනෑම දැන්වීමක් සිසිල් බීම කර්මාන්තශාලාවේ කටයුතු කරන ස්ථානයේ ගැසුවහොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයේ රක්ෂාවෙහි යෙදවාගෙන සිටින යම් කිසිවකුට භාරදුන්නොත් ඒ දැන්වීම බලපත්‍රකාරයාටම භාරදුන්නා කොට සැලකිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් තම නමත් "බලපත්‍රයක් ලත් සිසිල් බීම කර්මාන්තශාලාව" යන මේ වචනත් ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරු කරනලද ලෑල්ලක් කර්මාන්තශාලාවේ පිට පැත්තේ ප්‍රකටවම පෙනෙන තැනක එල්ලා තැබිය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ මේ උපනීති මාලාවේ ඉංග්‍රීසි පිටපතක් හා සිංහල පිටපතක් හා දෙමළ පිටපතක් බලපත්‍රයද රාමුවල දමා කර්මාන්තශාලාවෙහි ප්‍රකට ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. ඔහු විසින් (සිසිල් බීම විකුණන්නන් ඇතුළුව) එහි වැඩට ගන්නා සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා සභාපතිහට හෝ ඔහු විසින් බලය පවරන ලද ඕනෑම කෙනෙකුට යුක්තිසහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට පුළුවන්වන සේ ඒ කර්මාන්තශාලාවෙහි තබා තිබීමට සැලැස්විය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් සිසිල් බීම කර්මාන්තශාලාවට ඇතුළත් හැම කාමරයකම බිත්තිවල ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවතාවක් සුදුහුණු ගෑවිය යුතුය. ලීදඬුවල තීන්ත ගා නැත්නම් එහි සුදුහුණු ගෑවීමද තීන්ත ගා තිබේ නම් ඒ ලීදඬු සබන් හා උණුවතුරෙන් සේදීමද ජූනි මාසයේදී වරක් හා දෙසැම්බර් මාසයේදී වරක් බැගින් අඩුම ගණනේ අවුරුද්දකට දෙවරකුත් සභාපතිහු ලියවිල්ලකින් නියමකරන වෙන වකවානුවලදීත් කරවිය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් ඒ කර්මාන්තශාලාවේ බිම අඩුම ගණනේ දවසකට වරක් බැගින්වත් සේදවිය යුතුය.

8. බලපත්‍රයක් ලත් සෑම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් ඒ කර්මාන්තශාලාවේ පාවිච්චි කරන සියලු බෝතල් පහත සඳහන් අන්දමට සේදීමට සැලැස්විය යුතුය :—

බෝතල් සේදීමට වෙන වෙනම වැන්කි දෙකක් තිබිය යුතුය. බෝතල් සේදීමට ඉන් එකක් ලේබල් ගලවා පළමු වරට බෝතල් සේදීමට පාවිච්චි කළ යුතුය. අනික බෝතල් ශුද්ධකොට අවසාන වරට සේදීමට පාවිච්චි කළ යුතුය. වතුර ලබාගන්නේ පයිප්ප මගින් නම් අවසාන වරට කරන සේදීම කළ යුත්තේ බෝතල් පයිප්පයට ඇල්ලීමෙනි.

9. බලපත්‍රයක් ලත් සෑම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් කර්මාන්තශාලාවේ හැම තැනමත් අවටත් කාණුත් ලී බඩුත් භාජනත් සිසිල් බීම සෑදීමට පාවිච්චි කරන උපකරණත් ශුද්ධ පවිත්‍රව හා යහපත් තත්වයක තබාගැනීමට සැලැස්විය යුතුය.

10. සිසිල් බීම කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා විසින් සිසිල් බීම සෑදීමට ගන්නා ද්‍රව්‍ය හා බඩු හැර අන් කිසි ද්‍රව්‍යයක් හෝ බඩුවක් ඒ කර්මාන්තශාලාව ඇතුළට ගෙනෙන්ට ඉඩ නොදිය යුතුය.

11. සිසිල් බීම කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා අපවිත්‍රවූ හෝ අපරාධවූ හෝ අයහපත්වූ කිසිම ද්‍රව්‍යයක් කර්මාන්තශාලාවේ පාවිච්චියට නොගත යුතුය.

12. බලපත්‍රයක් ලත් සෑම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් කර්මාන්තශාලාවේ පාවිච්චි කරන ද්‍රව්‍ය මී, කුරුමිණී, පණු ආදී සතුන්ට ඇතුල්විය නොහැකි පෙට්ටිවල හෝ රාක්කවල දමා තබාගත යුතුය.

13. බලපත්‍රයක් ලත් සෑම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් සිසිල් බීම අඩංගු සෑම බෝතලයකම පිටපැත්තේ ඒ බෝතලය ඇතුලේ තිබෙන සිසිල් බීම වර්ගයේ නමත් එය සාදන ලද කර්මාන්තශාලාව අයිති පුද්ගලයාගේ හෝ සමාගමේ නමත් ස්ථානයත් සභාපතිතුමා විසින් කර්මාන්තශාලාවට නියමකර තිබෙන අංකයත් සඳහන් ලේබලයක් අලවා තිබීමට සැලැස්විය යුතුය.

14. සිසිල් බීම කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා විසින් වයස අවුරුදු දහහතරෙන් පහළ කිසිවකු ඒ කර්මාන්තශාලාවේ වැඩට නොගත යුතුය.

15. වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිවකු, ඒ රෝගය බෝවීමට හා රෝග බීජ මේරීමට ගතවන කාල පරිච්ඡේදය පසුවන තෙක් සිසිල් බීම කර්මාන්තශාලාවට ඇතුල් වීම හෝ සිසිල් බීම සෑදීමේ හෝ වෙළඳාමේ හෝ ගෙනයෑමේ වැඩට සම්බන්ධවීම නොකළ යුතුය.

16. බලපත්‍රයක් ලත් සෑම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා, සිසිල් බීම බෝතල්වල වත්කරන කාවත් එසේ වත්කරන වේලාවේදී මුහුණේ යටාබ දල් වෙස් මුහුණක් හා අත්වල හම් මේස් දමාගැනීමට සැලැස්විය යුතුය.

17. බලපත්‍රයක් ලත් සෑම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා පැණි හෝ සුවඳ ද්‍රව්‍ය හෝ රසායන ද්‍රව්‍ය හෝ සෙසු ද්‍රව්‍ය දැමීම පිණිස විදුරුවලින් හෝ පිඟන් මැටියෙන් හෝ ඔප දමාපු මැටියෙන් හෝ ඉනැමල් ගාන ලද යකඩෙන් හෝ තුත්තනාගම් ගාන ලද යකඩෙන් හෝ බෙලෙක්වලින් සාදන ලද භාජන පාවිච්චිකළ යුතුය. ඔහු විසින් ඒ භාජන වෙන කටයුත්තකට පාවිච්චි නොකළ යුතුය. එසේම වෙනම තැනක තැබිබිය යුතුය.

18. බලපත්‍රයක් ලත් සෑම සිසිල් බීම කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් ගොම, කුණුකසළ, මූත්‍ර, කුණුවතුර යන මේවා අවුම ගණනේ දවසකට වරක් වත් ගව මඩුවෙන් හෝ වැසිකිළියෙන් හෝ කර්මාන්තශාලාවේ ඒ ඒ කොටස්වලින් ඉවත් කරවා ඒවායින් හැහැවක් නොවන අයුරක් කරවිය යුතුය.

19. සිසිල් බීම කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා විසින් මොනම කාරණයක් සඳහාවත් ඒ ස්ථානයෙහි කිසිම සතකු හෝ කුරුල්ලකු තබා නොගත යුතුය.

20. සභාපතිට හෝ ඕනෑම සෞඛ්‍ය පරීක්ෂකයකුට හෝ සභාපතිතුමා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම කෙනෙකුට සිසිල් බීම සෑදීම සඳහා විකිණීම සඳහා පාවිච්චි කරන ඕනෑම ස්ථානයක් ඇරලා තිබෙන ඕනෑම වේලාවක ඒ ස්ථානයට ඇතුල්වී එහි සාදන හෝ විකිණීමට තබා තිබෙන ඕනෑම වර්ගයක සිසිල් බීම බෝතලයක් එහි වටිනාකම ගෙවා සැම්පලයක් වශයෙන් ගැනීමට බලය තිබිය යුතුය. තවද බලපත්‍රකාරයා විසින් හෝ ස්ථානය භාරව සිටින කිසිම කෙනෙකු විසින් ඒ සැම්පලය ගෙනයෑමට ඉඩ දීමට බැරිය නොකිය යුතුය.

21. සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ මේ උප නීතිවලින් කවරක් වුවත් කඩකරන සෑම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් නියමවේ. ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත් කරවා සභාපතිතුමා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම පත්‍රක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහට වැඩි නුවූ අමතර දඩයක් නියමවේ ද දඬුවම් දිය හැකිවිය යුතුයි.

22. සිසිල් බීම කර්මාන්තශාලා පිළිබඳ මේ උප නීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සැහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## X වැනි කාණ්ඩය

### අයිස් කර්මාන්තශාලා පිළිබඳ උපනීති

1. (1) සභාපතිතුමාගෙන් අයිස් කර්මාන්තශාලාවක් දමාගැනීමට ලබා ගත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත අයිස් කර්මාන්තශාලාවක් දමා නොගත යුතුය.

(2) මේ උපනීතියේ 1 වැනි ඡේදය යටතේ දෙන සෑම බලපත්‍රයක්ම 17 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස් එක්වැනිදට අහෝසිවිය යුතුය.

2. බලපත්‍රයක් දෙන්ට තිබෙන ස්ථානය පහත පෙනෙන කොන්දේසි වලට ගැළපෙනොත් මිස නැත්නම් කිසිවකුට අයිස් කර්මාන්තශාලාවක් දමා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

(1) ගොඩනැගිල්ල—

(අ) කැඩුම් බිඳුම් නැතිව යහපත් තත්වයක තිබිය යුතුය. ඊට හොඳින් වාතය හා ආලෝකය ලැබිය යුතුය. එහි සෑම කාමරයකටම ඇරිය හැකි ජනෙල් සවිකොට තිබිය යුතුය. ඒ ජනෙල් ඇරිය විට කාමරයේ බිමේ වර්ගප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය ;

(ඉ) සෑම කාමරයකම කොයි බිත්තියක්වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒ බිත්ති ගඩොලෙන් හෝ ගලෙන් හෝ කලුක් ගලෙන් බැඳ තිබිය යුතුය. එක් එක් බිත්තියේ ඇතුල් පැත්ත හුණු බදාමෙන් කපලාරු කොට තිබිය යුතුය. එහි සුදු හුණුද ගා තිබිය යුතුය ;

(උ) වහල් පලය බිම සිට අඩුම ගණනේ අඩි නයක් වත් උස්විය යුතුය ;

(එ) වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවෙලිකොට තිබිය යුතුය ;

(ඔ) ලීදඬුවල ජින්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය ;

(ක) බිම සෑම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය ;

(ග) ස්ථානයෙහි සෑහෙන තරම් කාණු දමා තිබිය යුතුය ;

(ජ) ඒ කර්මාන්තශාලාවේ එක් කාමරයක් අයිස් සෑදීම සඳහාම වෙන්කර තිබිය යුතුය ;

(ට) අපිරිසිදු නොවන ලෙස ආරක්ෂාකොට ඇති ස්ථානය කින් ලබාගන්නාවූද ගෙනීමේදී අපවිත්‍රවීමක් හෝ දූෂ්‍යවීමක් කිසි ලෙසකට ලක් නොවන ක්‍රමයකට ගෙනානැබිවූද ජලය සෑහෙන තරමට ඒ ස්ථානයට ලැබිය යුතුය. ඒ වතුර රැස්කර තැබීම සඳහා නිසි පරිදි සාදන ලද වැන්කි හෝ ජලාශ තිබිය යුතුය ;

(ඩ) කර්මාන්තශාලාවේ සෞඛ්‍යානුකූලව කුණු බැල් දියක්ද අඩුම ගණනේ පඩික් නම් දෙකක්ද සෑහෙන තරමක් වැසිකිළිද තිබිය යුතුය ;

(ණ) කර්මාන්තශාලාව ඕනෑම වැසිකිළියක හෝ කසළ වළක හෝ ගවමඩුවක හෝ පෝරගොඩක හෝ නොවසන ලද මලමූත්‍ර නාලිකාවක සිට අඩුම ගණනේ අඩි පනහක් වත් ඈතින් පිහිටා තිබිය යුතුය ;

(ත) කර්මාන්තශාලාව ඇතුළත හෝ ඊට කෙළින්ම සම්බන්ධවන පරිද්දෙන් කිසිම කසළවළක් හෝ වැසිකිළියක් හෝ ගවමඩුවක් හෝ අගුවළක් නොතිබිය යුතුය ;

(2) අයිස් සාදන්නාවූ හෝ රැස්කර තබන්නාවූ හෝ ගෙනයෑමට තබා ඇත්තාවූ මොනම කාමරයක් වත් මැදින් නොගොස් දර ආදී ඉන්ධන ද්‍රව්‍ය උදුනට ගෙන යෑමට හෝ උදුනෙන් පිටතට ගෙනයෑමට පුළුවන්වන පරිදි ඒ ඉන්ධන ද්‍රව්‍ය රැස් කර තැබීම පිණිස විශේෂ කාමරයක් හෝ තැනක් තිබිය යුතුය ;

(3) අයිස් සෑදීමට ගන්නා ජලය සභාපතිතුමා විසින් අනුමත කරන ලද්දාවූද යන්ත්‍රෝපකරණයට සම්බන්ධකරන ලද්දාවූද ශුද්ධ පෙරන උපකරණයකින් පෙරීගනයෑමට සැලැස්විය යුතුය. එහෙත් අනුමත කරනලද පොදු ජලාශයකින් ලබාගන්නා ජලය මේ උපනීතිගත කටයුතුවලින් නිදහස් කිරීමට සභාපතිතුමාට බලය තිබිය යුතුය.

3. බලපත්‍රයක් ලත් හැම අයිස් කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් තම නමත් "බලපත්‍රයක් ලත් අයිස් කර්මාන්තශාලාව" යන ඒ නමත් ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරු කරනලද ලෑල්ලක් කර්මාන්තශාලාවේ පිට පැත්තේ ප්‍රකටව පෙනෙන තැනක එල්ලා තැබිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම අයිස් කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් අයිස් කර්මාන්තශාලා පිළිබඳ මේ උපනීති මාලාවේ ඉංග්‍රීසි පිටපතක් හා සිංහල පිටපතක් හා දෙමළ පිටපතක්ද බලපත්‍රයද රාමුවල දමා කර්මාන්තශාලාවේ ප්‍රකට ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. ඔහු වැඩට ගන්නා සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා සභාපතිහට හෝ ඔහු විසින් බලය පවරන ලද ඕනෑම කෙනෙකුට යුක්ති සහගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට පුළුවන් වන සේ ඒ කර්මාන්තශාලාවෙහි තබා තිබීමට සැලැස්විය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම අයිස් කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් අයිස් කර්මාන්තශාලාවට ඇතුළත් හැම කාමරයකම බිත්තිවල ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවරක් සුදුහුණු ගෑවිය යුතුය. ලීදඬුවල තීන්ත ගා නැත් නම් එහි සුදුහුණු ගෑමද තීන්ත ගා තිබේ නම් ඒ ලීදඬු සබන් හා උණුවතුරෙන් සේදීමද ජූනි මාසයේදී වරක් හා දෙසැම්බර් මාසයේදී වරක් බැගින් අවුරුද්දට දෙවරකුත් සභාපතිහු ලියවිල්ලකින් නියම කරන වෙන වකවානුවලදීත් කරවිය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම අයිස් කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් කර්මාන්තශාලාවේ බිම අඩු ගණනේ දවසකට එක වරක් වත් සේදවිය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම අයිස් කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් කර්මාන්තශාලාවේ හැම තැනමත් අවටත් කානුත් ටැංකිත් භාජනත් අයිස් සෑදීමට පාවිච්චි කරන උපකරණත් ශුද්ධපවිත්‍රව කැඩුම් බිඳුම් නැතිව යහපත් තත්ත්වයක තබාගැනීමට සැලැස්විය යුතුය.

8. අයිස් කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා විසින්, අයිස් සෑදීමට පාවිච්චි කරන ද්‍රව්‍ය හා බඩු හැර අන් කිසි ද්‍රව්‍යයක් හෝ බඩුවක් ඒ කර්මාන්තශාලාව ඇතුළට ගෙනෙන්ට ඉඩ නොදිය යුතුය.

9. අයිස් කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා විසින් වයස අවුරුදු දහහතරෙන් පහළ කිසිවකු ඒ කර්මාන්තශාලාවේ වැඩට නොගත යුතුය.

10. වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ඒ රෝගයකින් ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන අයෙකුට ළඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිවකු ඒ රෝගය බෝවීමට හා රෝග බීජ මේරීමට ගතවන කාල පරිච්ඡේදය පසුවන තෙක් අයිස් කර්මාන්තශාලාවට ඇතුල්වීම හෝ අයිස් සෑදීමේ හෝ අතපත ගෑමේ හෝ විකිණීමේ හෝ ගෙනයෑමේ වැඩකට සම්බන්ධවීම නොකළ යුතුය.

11. බලපත්‍රයක් ලත් හැම අයිස් කර්මාන්තශාලාවකම බලපත්‍රකාරයා විසින් ගොම, කුණුකසළ, මූත්‍රා, කුණුවතුර යන මේවා අඩුම ගණනේ දවසකට වරක් වත් ගවමඩුවෙන් හෝ වැසිකිළියෙන් හෝ කර්මාන්තශාලාවේ ඒ ඒ කොටස්වලින් ඉවත් කරවා එයින් ගැහැටක් නොවන අයුරක් කරවීමට සැලැස්විය යුතුය.

12. අයිස් කර්මාන්තශාලාවක බලපත්‍රකාරයා විසින් මොනම කාරණයක් සඳහාවත් ඒ ස්ථානයෙහි කිසිම සතකු හෝ කුරුල්ලකු තබා නොගත යුතුය.

13. සභාපතිහට හෝ සෞඛ්‍ය පරීක්ෂකතැනට හෝ සභාපතිහු විසින් ලියවිල්ලකින් බලය පවරනලද ඕනෑම කෙනෙකුට ඕනෑම අයිස් කර්මාන්තශාලාවක ඇරලා තිබෙන ඕනෑම විටක ඒ කර්මාන්තශාලාවට ඇතුල්වී අයිස් සෑදීමට ගන්නා වතුර සැම්පලයක් හෝ එහි සාදන අයිස්වලින් උපදින වතුර සැම්පලයක් ගැනීමට බලය තිබිය යුතුය. තවද බලපත්‍රකාරයා විසින් හෝ ඒ කර්මාන්තශාලාව භාරව සිටින කිසිම කෙනෙකු විසින් ඒ සැම්පලය ගෙනයෑමට ඉඩ දීමට බැරිය නොකිය යුතුය.

14. කිසිම බලපත්‍රකාරයකු අපථ්‍යවූ හෝ පරිභෝගයට නුසුදුසුවූ වතුර අයිස් සෑදීමට නොගත යුතුය.

15. (1) සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඕනෑම අයිස් කර්මාන්තශාලාවකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) අයිස් කර්මාන්තශාලාවේ බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින අය විසින් සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට අයිස් කර්මාන්තශාලාවට ඇතුල්වී පරීක්ෂා කිරීමට ඉඩදී ඒ සඳහා ඔහුට වුවමනා හැම උදව්වක්ම කළ යුතුය.

16. අයිස් කර්මාන්තශාලා පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද යම් නිලධාරියකු දන්වීම් පතක් භාර දුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ අමතර දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

17. අයිස් කර්මාන්තශාලා පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා කරනු ලැබූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකරගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XI වැනි කාණ්ඩය

### කිරිපට්ටි හා කිරි විකිණීම පිළිබඳ උපනීති

1. (1) කිරිපට්ටියක් තබා ගැනීම සඳහා සභාපතිහුගෙන් ලබාගත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් කිරිපට්ටියක් තබා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 38 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස් එක්වැනිදට අහෝසිවිය යුතුය.

2. (1) බලපත්‍රය දෙන්ට තිබෙන ස්ථානය පහත පෙනෙන කොන්දේසිවලට ගැළපෙනොත් මිස නැත්නම් කිසිවකුට කිරිපට්ටියක් තබා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට අයිතිවාසිකමක් නොතිබිය යුතුය :—

(අ) ගොඩනැගිලි කැඩුම්බිඳුම් කිසිවක් නැතිව යහපත් තත්ත්වයක තිබිය යුතුය. ඊට හොඳින් වාතය හා ආලෝකය ලැබිය යුතුය;

(ආ) ගොඩනැගිලිවල බිත්ති හා වහල කල් පවතින ද්‍රව්‍යයකින් සාද තිබිය යුතුය;

(ඇ) ලීදඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය.

(ඈ) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය; නැතහොත් දැඩිවූද දියසිරාව බී නොගන්නාවූද යම්කිසි ද්‍රව්‍යයක් අල්ලා තිබිය යුතුය.

(ඉ) භූමිභාගයෙහි වතුර බැසයෑම සඳහා සෑහෙන තරම් කානු දමා තිබිය යුතුය.

(ඊ) කිරිපට්ටියේ පාවිච්චිය සඳහා (අපිරිසිදුවිය නොදී ආරක්ෂා කරනලද) පිරිසිදු වතුර සෑහෙන තරමට ඒ අසල තිබිය යුතුය;

(උ) ගවයන් බැඳ තැබීමට ඇති හැම ගොඩනැගිල්ලක්ම හෝ මඩුවක්ම ගඩොළෙන් හෝ ගලෙන් හෝ කබුක්ගලෙන් සාද තිබිය යුතුය. එහි බිත්ති හා කුළුණු සුදුහුණු ගාලා බිම සිට අඩි හතරක් උසට සිමෙන්තියෙන් කපලාරු කොට තිබිය යුතුය. වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවෙලිකර තිබිය යුතුය. බිම, සිමෙන්ති හෝ සිමෙන්ති කොන්ක්‍රීට් හෝ ගල්පාර දමා ගඩොළු හෝ ගල් අල්ලා තිබිය යුතුය. එහි මූත්‍රා හා සෝදන වතුර හා වැසි වතුර (පියන සහිත භාජනයකට හෝ ඊට වැඩි ගණනකට) ගලා යෑමට ඒ ද්‍රව්‍යවලින් කානු දමා තිබිය යුතුය;

(ඌ) ගවයන් මඩුවේ සිටත් වෙන ගොඩනැගිල්ලක සිටත් අඩි විසිපයකට නො අඩු දුරක් ඇත්තාවූද සුදුසුවූද තැනක කිරි කාමරය තිබිය යුතුය;

(එ) කිරිකාමරයේ බිම සිමෙන්ති දමා තිබිය යුතුය. එහි බිත්ති හා බිම සන්ධිවන තැන වටකුරු කොට තිබිය යුතුය. බිත්ති අඩි හතකට නොඅඩු උසට ගඩොළෙන් හෝ ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ ඇතුල් පැති සුමුදු බදාමෙන් කපලාරු කොට සුදුහුණු ගා තිබිය යුතුය. අඩුම ගණනේ එහි දෙපැත්තේ බිත්ති දෙකක් වත් එළිමහන දෙසට තිබිය යුතුය. ඇතුළට දූලි වැටීම වළක්වන සේ පුළුගු වද්දා ලෑලි යෑහු සිලිමක් වහලේ තිබිය යුතුය. ඒ සිලිමේ තීන්ත ගා තිබිය යුතුය. වහල්පලය පොළෝ මට්ටමේ සිට අඩුම ගණනේ අඩි හයක් වත් උස්විය යුතුය. එහි අඩුම ගණනේ ජනේලයක් හා දොරක්ද තිබිය යුතුය. ජනේලයේ වර්ග ප්‍රමාණය බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය. මැස්සන් ඇතුල් නොවන්ට ජනේලයට දැල් ගසා තිබිය යුතුය. දොර තැබිය යුත්තේ ජනේලයට ප්‍රතිවිරුද්ධ පැත්තෙනි. ඒ දොර හොඳට හේත්තුවෙන්ට වැසිය හැක්කක් විය යුතුය. මැස්සන්ට ඇතුල්විය නොහැකි ලෙස ඊටද දැල් ගසා තිබිය යුතුය;

(ඛ) කිරිගරුඬ හෝ ගල් ලෑලි හෝ පුත්තනාගම් තහඩු හෝ අනුමත කරන ලද්දාවූද දියසීරාව ඇද නොගන්නාවූද වෙනත් ද්‍රව්‍යයක් හෝ උඩට ඇල්ලූ මේසයක් කිරිකාමරයෙහි තිබිය යුතුය ;

(ඝ) කිරිකාමරයේ සෞඛ්‍යානුකූල කුණු බාල්දියක් තබා තිබිය යුතුය ;

(ඞ) කිරිකාමරය ඕනෑම වැසිකිළියක හෝ කසලවළක හෝ පෝර ගොඩක හෝ නොවැසූ මලමූත්‍ර නාලිකාවක සිට අඩුම ගණනේ අඩි සියයක් වත් දුරින් විය යුතුය ;

(ද) කිරිකාමරය තුළ හෝ ඊට කෙළින්ම සම්බන්ධවන පරිද්දෙන් කසලවළක් හෝ වැසිකිළියක් හෝ අපූවළක් නොතිබිය යුතුය.

(2) බලපත්‍රයක් දෙන්ට තිබෙන එක් එක් කිරිපට්ටියේ සිටින දෙනුන් ගණන ඒ කිරිපට්ටිය වෙනුවෙන් බලපත්‍රය ඉල්ලන අයදුම් පතේ සඳහන් කළ යුතුය. එක් දෙනකට දිගින් අඩි අටක හා පළලින් අඩි පහක බිමද අඩුම ගණනේ ඝන අඩි 400ක වාතයද තිබෙන පරිදි ඒ දෙනුන් ගණන ගව මඩුවේ මහතදෙහෙතට ප්‍රමාණික විය යුතුය.

3. (1) යම් කිරිපට්ටියක් වෙනුවෙන් බලපත්‍රයක් දෙන ලද කාල සීමාවක් ඇතුළත ඒ කිරිපට්ටිය සඳහා පාවිච්චි කරන යම් ගොඩනැගිල්ලක් 2 වැනි උපනීතියේ විධිවිධානවලට නොගැළපෙන තත්ත්වයට යම් විටෙකදී පත්වුව හොත් ඒ ගොඩනැගිල්ල ඒ විධිවිධානවලට ගැළපෙන අයුරු තිබීමට අවශ්‍ය සෑම දෙයක්ම අසවල් දිනයට මත්තෙන් කළ යුතුයයි නියම කොට ඒ කිරිපට්ටියේ බලපත්‍රකාරයා වෙත දැන්වීමක් යවන්ට සැලැස්වීමට සභාපතිගට බලය තිබේ.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ කිරිපට්ටි බලපත්‍රකාරයකු ඒ දැන්වීමේ දක්වා ඇති දේ එහි සඳහන් කාලය ඇතුළතදී කිරීම පැහැර හැරිය යුතු නොවේ.

(3) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ වූ ඕනෑම දැන්වීමක්, බලපත්‍රකාරයා කිරිපට්ටිය පිළිබඳ කටයුතු කරගෙන යන ස්ථානයෙහි ගැසුවහොත් නැතහොත් බලපත්‍රකාරයා ඒ ස්ථානයෙහි රක්ෂාවේ යොදවාගෙන සිටින යම් කිසිවකුට භාර දුන්නොත් ඒ දැන්වීම බලපත්‍රකාරයාට භාරදුන්නා කොට සැලකිය යුතුය.

4. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් ඒ කිරිපට්ටියේ පිටපැත්තේ කාටත් පෙනෙන තැනක ඔහුගේ නම හා “ බලපත්‍රයක් ලත් කිරිපට්ටිය ” යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරු කරවා ලෑල්ලක් ගසා තැබීමට සැලැස්විය යුතුය.

5. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරිපට්ටි පිළිබඳ මේ උපනීතිමාලාවේ සිංහල පිටපතක් හා දෙමළ පිටපතක් හා ඉංග්‍රීසි පිටපතක්ද බලපත්‍රයද රාමුවල දමා ඒ කිරිපට්ටිය තුළ කාටත් පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් කිරිපට්ටියේ වැඩට ගන්නා සියලු සේවකයන්ගේ (කිරි විකුණන්නන්ද ඇතුළුවයි.) නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියවා සභාපතිගට හෝ ඔහුගෙන් බලය ලත් ඕනෑම කෙනෙකුට යුක්තියගත කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට හැකිවන සේ කිරිපට්ටියේ තැබිවිය යුතුය.

6. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අවුරුද්දකට දෙවරක් කිරිපට්ටියේ සෑම කාමරයකම බිත්තිවල සුදුහුණු ගෑවිය යුතුය. ඔහු විසින් එහි ලිදවූ ජූනි මාසයේදී වරක්ද දෙසැම්බර් මාසයේදී වරක්ද බැගින් අඩුම ගණනේ අවුරුද්දකට දෙවරකුත් සභාපතිතු නියම කරන වෙනත් වකවානුවලදීත් සබන් හා උණුවතුරෙන් සේදවිය යුතුය.

7. බලපත්‍රයේ ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් බිම හා කිරිකාමරයේ ඇති මේසයේ උඩුතට්ටුව දවසකට වරක් බැගින් වත් සේදවිය යුතුය.

8. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරිපට්ටියේ පාවිච්චි කරන හෝ කිරිපට්ටියට අයිති සියලු භාජන, ලීබඩු, සෙසු උපකරණ යන මේවා පිරිසිදුව තබාගැනීමට සැලැස්විය යුතුය.

9. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරිපට්ටියේ සෑම තැනමත් එහි අවටත් කානුත් ශුද්ධපවිත්‍රකොට කැඩුම් බිඳුම් නැතිව තිබීමට සැලැස්විය යුතුය.

10. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරි වක්කර පිටත යවන සෑම භාජනයක්ම පිරිසිදු කරවා පිරිසිදු වැස්මකින් සුදුසු පරිදි වස්සවා කිරි එසේ මෙසේ ගෙනයෑමේදී අපිරිසිදුවීම වළක්වාලීමට අවශ්‍ය සියලු විධිවිධාන යෙදවිය යුතුය.

11. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරි වක්කර තැබීම සඳහා වීදුරු භාජන හෝ පිඟන් මැටි භාජන හෝ ඔප දැමූ මැටි භාජන හෝ ඇනමල් ගෑ යකඩ භාජන හෝ තුත්තනාගම් ගෑ යකඩ භාජන හෝ බෙලෙක් භාජන පාවිච්චි කළ යුතුය. ඔහු ඒ භාජන ගවමඩුවේ තැන්පත් කර තැබීමට ඉඩ නොදිය යුතුය.

12. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් සියලු ගොම, කුණුකසළ, මුත්‍ර, කුණුවතුර යන මේවා කිරිපට්ටියෙන් අඩුම ගණනේ දවසකට වරක් වත් ඉවත් කොට ඒවායින් ගැහැටක් නොවන අයුරක් කරවිය යුතුය.

13. කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් මොනම කරුණක් නිසා වත් කිසිම සතකු හෝ කුරුල්ලකු කිරි කාමරයේ තබා නොගත යුතුය.

14. කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් කිරිපට්ටියේ ඇති කිරි වක් කරන භාජන හෝ වෙඬරු දමන භාජන හෝ වෙඬරු සාදන භාජන (යන්ත්‍ර) හෝ යොදය වෙන්කරන යන්ත්‍ර හෝ සෙසු බඩු නියමිත කටයුතුවලට හැර වෙන කටයුත්තකට ගැනීමට ඉඩ නොදිය යුතුය. ඔහු විසින් ඒවා අඩුම ගණනේ දවසකට වරක් වත් උණුවතුරෙන් සේදවිය යුතුය.

15. වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිවකු ඒ රෝගය බෝවීමට හා රෝග බීජ මේරීමට ගතවන කාලපරිච්ඡේදය පසුවන තෙක් කිරිපට්ටියකට ඇතුල්වීම වත් එහි කිරි පිළියෙල කිරීමේ හෝ විකිණීමේ හෝ ගෙනයෑමේ කටයුත්තකට සම්බන්ධවීම වත් නොකළ යුතුය.

16. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින්නාවූ හෝ පාලනය කරන්නාවූ තැනැත්තා විසින් යම් වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිවකු ඒ රෝගය බෝවීමට හා එහි රෝග බීජ මේරීමට ගතවන කාලපරිච්ඡේදය පසුවන තෙක් දැන දැනම කිරිපට්ටියේ වැඩට ගැනීම හෝ එය ඇතුළට වැද්ද ගැනීම නොකළ යුතුය.

17. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් ඒ කිරිපට්ටියේ ප්‍රයෝජනය සඳහා ජලය ලබාගත යුත්තේ—

(අ) පොදු ජලසම්පාදන ක්‍රමයක් පිහිටුවා තිබේ නම් එයින්. එසේ වූවිට ළඟින්ම පිහිටි ප්‍රධාන ජල මාර්ගයට දියනල සම්බන්ධ කරවා වතුර පයිප්ප ගොඩනැගිල්ල ඇතුළේ සවිකරවාගෙන ඒ මගින්,

(ආ) පොදු ජලසම්පාදන ක්‍රමයක් නැත්තේ වී නම් පිරිසිදු වතුර සැහෙන ප්‍රමාණයක් ලබාගත හැකි සුදුසු ස්ථානයකින්.

18. බලපත්‍රයක් ලද්දාවූද පොදු ජලසම්පාදනයක් නොවන ජලසම්පාදනයකින් වතුර ලබාගන්නාවූද සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා පොදු ජලසම්පාදනයක් ඇතිවූ වහාම අනික් ජලසම්පාදනයෙන් වතුර ගැනීම නවත්වා ඒ පොදු ජලසම්පාදනයෙන් වතුර ගත යුතුය.

19. කිරි දෝනා වේලාවේදී දෙනුගේ බුරුල්ල හා තනපුඩු ශුද්ධපවිත්‍ර වද කිරි දෝනා තැනැත්තාගේ අත් පිරිසිදුව සියලු රෝග බීජයන්ගෙන් තොරවද තිබෙතොත් මිස නැත්නම් කිසිම දෙනකුගෙන් විකිණීම සඳහා කිරි දෙවීමට කිරිපට්ටියක බලපත්‍රකාරයාට ඉඩ නොදිය යුතුය.

20. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා කිරිපට්ටියේ වැඩට යොදවාගෙන සිටින මිනිසුන්ගෙන් කවරෙකුට වුවත් යම් වසංගත රෝගයක් හෝ චර්ම රෝගයක් වැළඳුණොත් නැතහොත් වැළඳුනේ ඒ රෝගයකැයි සැකයක් ඇතිවූව හොත් ඒ බව වහාම සභාපතිගට දැන්විය යුතුය.

21. (1) බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් කිරිපට්ටියේ සිටින කොයි ගවයකුට වුවත් ස්පර්ශයෙන් බෝවෙන රෝගයක් හෝ වසංගත රෝගයක් වැළඳුණොත් ඒ බව වහාම සභාපතිගට දැන්විය යුතුය. තවද බලපත්‍රකාරයා තම කිරිපට්ටියේ සිටින්නාවූද ඒ ඕනෑම වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ පෙළෙතැයි සැක කරනු ලබන්නාවූද ඕනෑම සතකු ඒ රෝගය බෝවීම වළක්වාලීම සඳහා අනික් සතුන් සිටින තැනින් ඉවතට ගත යුතුය; නැතහොත් ඉවත් කරවිය යුතුය.

(2) බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා යම් වසංගත රෝගයක් හෝ බෝවෙන රෝගයක් ඇතිවූ විට ඒ රෝගය මර්දනය කිරීම සඳහා සභාපතිතු හෝ වෙනත් නිසි බලධාරියකු කලින් කල නිකුත් කරන නියමයන් පිළිපැදිය යුතුය.

(3) බුරුල්ලේ හෝ ඒවා වෙන තැනක හෝ ඒවා හටගත් ක්ෂය රෝගයෙන් හෝ බුරුල්ලේ තද දැවිල්ලෙන් හෝ කුර ලෙඩෙන් හෝ කට ලෙඩෙන් හෝ “ඇන්ත්‍රැක්ස්” වසංගතයෙන් හෝ බුරුල්ලේ සෑදෙන “ඇක්ටිනොමයිකෝසිස්” රෝගයෙන් පෙළෙන කිසිම දෙනකුගේ කිරි විකිණීම හෝ විකිණීමට ඉඩ දීම නැතහොත් මනුෂ්‍යයන්ගේ පරිභෝගය පිණිස විකිණීමට ගන්නා වෙනත් (සතුන්ගේ) කිරි සමග මිශ්‍ර කිරීම හෝ මිශ්‍ර කිරීමට ඉඩ දීම කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් නොකළ යුතුය.

22. බලපත්‍රයක් ලත් සෑම කිරිපට්ටියකම බලපත්‍රකාරයා විසින් තණකොළ හා පිදුරු හැර සෙසු සියලු ගව ආහාර මීයන්ට ඇතුල්විය නොහැකි සුදුසු භාජනයක දමා තැබීමට සැලැස්විය යුතුය.

23. (1) විකිණීමට තිබෙන කිරි, කිරි කාමරයෙන් පිට කිසිම තැනක තැබීමට කිරිපට්ටියක බලපත්‍රකාරයා ඉඩ නොදිය යුතුය.

(2) කිරි එකතුකර තැබීම හා සකස් කිරීම හැර වෙන මොනම කටයුත්තක් සඳහා වත් කිරිකාමරයක පාවිච්චිකිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩ දීම කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් නොකළ යුතුය.

24. කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් වතුර හෝ වෙන බාහිර ද්‍රව යක් හෝ ද්‍රව්‍යයක් මිශ්‍රකොට කිරි දූෂණය කිරීම වත් ඒ දූෂිත කිරි විකිණීම වත් විකිණීමට ඉදිරිපත් කිරීම වත් විකිණීමට තැබීම වත් හැනින් හැන ගෙන ගොස් විකිණීම වත් භාරදීම වත් නොකළ යුතුය.

25. "යොදය ඉවත්කළ" යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාවලින් හොඳට පැහැදිලිව ලියනලද ලේබලයක් කාටත් පෙනෙන්ට පිට අලවා ඇති භාජනයක බහා යොදය ඉවත්කළ කිරි බව අඟවා මිස නැත්නම් යොදය ඉවත්කළ කිසිම කිරක් කිරිපට්ටියක බලපත්‍ර කාරයා විසින් විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම හෝ විකිණීමට තැබීම හෝ හැනින් හැන ගෙන ගොස් විකිණීම හෝ භාරදීම නොකළ යුතුය.

26. බලපත්‍රයක් ලත් කිරිපට්ටියක සිටින දෙනුන් හැර වෙන දෙනුන් ගෙන් ලබාගත් කිරි, කිරිපට්ටියක බලපත්‍රකාරයා විසින් විකිණීම හෝ සැපයීම නොකළ යුතුය.

27. සභාපතිහට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනට හෝ සනීපාරක්ෂක පරීක්ෂක තැනට හෝ සභාපතිතුමා විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් බලය පවරන ලද වෙන යම් නිලධාරියකුට විග්‍රහකර බැලීම පිණිස සැම්පලයක් වශයෙන් කිරි ටිකක් වටිනාකම ගෙවා ඕනෑම කිරිපට්ටියකින් නැතහොත් කිරි විකුණන්නාවූ හෝ විකිණීම පිණිස ඉදිරිපත් කරන්නාවූ හෝ හැනින් හැන් ගෙනගොස් විකුණන්නාවූ හෝ භාරදෙන්නාවූ තැනැත්තකුගෙන් ඕනෑම වේලාවකදී ලබාගැනීමට බලය තිබිය යුතුය. තවද මුදල් ගෙවා ඒ කිරි සැම්පලය ඉල්ලූ විට, කිරිපට්ටියක බලපත්‍රකාරයා හෝ ලියාපදිංචි කරනු ලැබූ කිරි විකුණන්නකු හෝ අන් කිසිවකු විසින් ඒ ඉල්ලීම ප්‍රතික්ෂෙප නොකළ යුතුය.

28. සභාපතිතුමා විසින් දෙනලද බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත වූ කිසිම තැනක්, පිටතින් ලබාගන්නා කිරි විකිණීම සඳහා පාවිච්චි නොකළ යුතුය.

29. කිරි ලබාගැනීමට අදහස් කරනු ලබන කිරිපට්ටිය යම් ප්‍රාදේශික සභාවක සභාපති කෙනෙකුගේ පාලන ප්‍රදේශය ඇතුළත පිහිටියේ නම් ඔහු විසින් හෝ එවැනි ප්‍රාදේශික සභාවක් නැති නම් ඒ කිරි පට්ටිය පිහිටි දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැන විසින් හෝ පරීක්ෂාකොට නිදහස්කයක් කළොත් මිස නැත්නම් 28වැනි උපනීතිය යටතේ බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

30. 28වැනි උපනීතිය යටතේ දෙන හැම බලපත්‍රයක්ම එය දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එකවැනිදා වනතෙක් වලංගුව පැවතිය යුතුය.

31. සභාපතිතුමා විසින් තත් වර්ෂය වෙනුවෙන් විධිවූ පරිදි දුන් ලියා පදිංචි කිරීමේ පත්‍රයක් ගාමා ළඟ ඇතිව මිය කිසිවකු නගර සභා ප්‍රදේශය ඇතුළත කිරි භාරදීම හෝ විකිණීම පිණිස ගෙනයාම හෝ හැනින් හැන ගෙන ගොස් විකිණීම නොකළ යුතුය.

32. සභාපතිතුමා නියම කරන වෛද්‍ය නිලධාරියකු විසින් පරීක්ෂාකර බලා වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් තොරව සිටින බවට සහතික කරනතුරු 31වැනි උපනීතිය යටතේ කවරකුට වුවත් ලියාපදිංචි කිරීමේ පත්‍රයක් දීම ප්‍රතික්ෂෙප කිරීමට සභාපතිහට බලය ඇත්තේය.

33. 31වැනි උපනීතිය යටතේ සභාපතිතුමා දෙන හැම ලියාපදිංචි කිරීමේ පත්‍රයකම පහත සඳහන් කරුණු අඩංගු විය යුතුය:—

(අ) ස්වාමියාගේ නම හා ලේඛනගත අංකය;

(ආ) සේවකයාගේ හෝ නියෝජිතයාගේ නම හා මහපට ඇඟිල්ලේ සලකුණ.

34. නගර සභා ප්‍රදේශය ඇතුළත කිරි භාරදෙන හෝ විකිණීම පිණිස ගෙනයන හෝ හැනින් හැන ගෙනගොස් විකුණන කිසිවකු තත් වර්ෂය සඳහා තමාට ලැබී ඇති ලියාපදිංචි කිරීමේ පත්‍රය පරීක්ෂා කර බැලීමට ඉදිරිපත් කරන මෙන් සනීපාරක්ෂක පරීක්ෂකයකු හෝ ඒ සඳහා සභාපතිතුමාගෙන් විශේෂ වශයෙන් හෝ සාමාන්‍ය වශයෙන් බලය ලත් ඕනෑම කෙනෙකු නියම කළ කල මොන යම් කරුණක් නිසා වත් එසේ නොකර සිටීම හෝ කරන්ට බැරිය කීම නොකළ යුතුය.

35. කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත මෙහි පහත පෙනෙන අයුරුවූ කිරි විකිණීම හෝ විකිණීම් වශයෙන් භාරදීම හෝ විකිණීමට තැබීම හෝ විකිණීමට ගෙනයාම හෝ හැනින් හැන ගෙන ගොස් විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම නොකළ යුතුය:—

(1) (අ) තෙල හැර මිශ්‍රදෙන කොටස සියයට 8.5කට අඩුවෙන් අන්තර්ගතවූ හෝ තෙල සියයට 3.5කට අඩුවෙන් අන්තර් ගතවූ එළකිරි;

(ආ) තෙල හැර මිශ්‍රදෙන කොටස සියයට 9කට අඩුවෙන් අන්තර් ගතවූ හෝ තෙල සියයට 7කට අඩුවෙන් අන්තර්ගතවූ මීකිරි.

(2) "යොදය ඉවත්කළ" යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාවලින් හොඳට පැහැදිලිව ලියනලද ලේබලයක් කාටත් පෙනෙන්ට පිට අලවා ඇති භාජනයක බහා යොදය ඉවත් කළ කිරිබව අඟවා මිස නැත්නම් යොදය ඉවත්කළ කිසිම කිරක්;

(3) වතුර හෝ වෙන බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රවයක් සමග මිශ්‍රකොට දූෂණය කරනලද කිරි: එහෙත් තේ සඳහාකදී හෝ කෝපි සඳහාකදී හෝ බත් කඩයකදී පරිභෝග කිරීම පිණිස තේ හෝ කෝපි හෝ කොකෝවා සමග මිශ්‍රකරනලද කිරි මේ උපනීතිය සම්බන්ධයෙන් දූෂිත කිරි වශයෙන් නොසැලකිය යුතුය.

(4) කඩදාසියකින් හෝ දියසිරාව ඇද නොගන්නා වෙන යම් ද්‍රව්‍යයකින් කට නොවැසූ බෝතල්වල වත්කර තිබෙන කිරි.

36. (1) සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද (නගර සභාවේ) ඕනෑම නිලධාරියකුට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඕනෑම කිරි පට්ටියකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) කිරිපට්ටියේ බලපත්‍රකාරයා හෝ එය භාරව සිටින තැනැත්තා සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනලද ඕනෑම නිලධාරියකුට කිරිපට්ටියට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දී ප්‍රස්තාව වශයේ ගැටියට සභාපතිහට හෝ ඒ නිලධාරියාට වුවමනා විය හැකි හැම උපකාරයක්ම කළ යුතුය.

37. කිරිපට්ටි පිළිබඳ මේ උපනීති මාලාවෙන් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්තාවයකදීම ඒ හැම කඩකිරීමකට රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම සිහිපත් කරවා සභාපතිතුමා හෝ ඔහු විසින් බලය පවරනලද නිලධාරියකු දැන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

38. කිරිපට්ටි හා කිරි විකිණීම පිළිබඳ මේ උපනීති මාලාවෙන් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා වූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සැහෙන අධිකරණය බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XII වැනි කාණ්ඩය

### කරනැවෑම් මැදිරි හා බාබර් සාප්පු පිළිබඳ උපනීති

1. (1) කරනැවෑම් මැදිරියක් හෝ බාබර් සාප්පුවක් දමා ගැනීම සඳහා සභාපතිතුමාගෙන් ලත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් කරනැවෑම් මැදිරියක් (Hair Dressing Saloon) හෝ බාබර් සාප්පුවක් දමා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍ර යක්ම 14වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදාට අහෝසි විය යුතුය.

2. කරනැවෑම් මැදිරියක් හෝ බාබර් සාප්පුවක් සඳහා පාවිච්චි කිරීමට අදහස් කරන ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටසද ඒ ස්ථානයේ හෝ සාප්පුවේ උපකරණද පහත පෙනෙන කොන්දේසි වලට හා නියමයන්ට ගැළපෙනොත් මිස නැත්නම් ඒ මැදිරියක් හෝ සාප්පුවක් දමා ගැනීම පිණිස බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය—

(1) ඒ ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස:—

(අ) ශක්තිමත් ලෙස සාදා තිබිය යුතුය. එහි බිම වගී අඩි එකසිය විස්සකට අඩු නොවිය යුතුය;

(ආ) බිත්ති හුණු බදාමෙන් කපලාරු කොට තිබිය යුතුය, ඒවායෙහි හුණුහුණු ගා තිබිය යුතුය, සුදු නිත්ත ගා ලෑලිවලින් හෝ එවැනි වෙන ද්‍රව්‍යයකින් සාදනලද සිලිමක් වහලට යටා තිබිය යුතුය. බිමේ සිමෙන්ති දමා තිබිය යුතුය, බිත්ති හා බිම සන්ධිවන තැන සිමෙන්තියෙන් වටකුරු කර තිබිය යුතුය;

(ඇ) ඊට හොඳින් ආලෝකය හා වාතය ලැබිය යුතුය;

(ඈ) එහි හොඳ කාණු දමා තිබිය යුතුය, ගොඩනැගිල්ල ඇතුළතම හෝ ඒ ඉඩමේම, සැහෙන තරම් වැසිකිළි තිබිය යුතුය.

එහෙත් කරනැවෑම් මැදිරි හෝ බාබර් සාප්පු පිළිබඳ මේ උපනීතිමාලාව නගර සභාව විසින් වැළඳගත් දිනය වන විට පවත්වා ගෙන ගිය හෝ දමාගෙන තිබුණ කරනැවෑම් මැදිරියක් හෝ බාබර් සාප්පුවක් පිහිටි කිසිම ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් (අ) උප ඡේදයේ දැක්වූ නියමයන් අදාළ නොවිය යුතුය.

(2) ගොඩනැගිල්ලේ කිසියම් කොටසක් නිවාසස්ථානයක් වශයෙන් පාවිච්චි කරනොත් එසේ නැත්නම් එසේ පාවිච්චිකිරීමට අදහස් කරතොත් ඒ කොටස නිවාස හා නගර සංවර්ධන ආඥාපණතේ (199 වැනි පරිච්ඡේදයේ) විධිවිධානවලට අනුකූලව විය යුතුය.

(3) කරනැවුම් මැදිරියෙහි හෝ බාබර් සාප්පුවේ—

(අ) (ගිසකේ හා රැවුල් කැපීමට ඇරලා තිබෙන කොයි වේලාවේදීත්) සෑහෙන තරම් ජලයද;

(ආ) දිනපතා පාවිච්චි කරන මෙවලම් හෝ උපකරණ සේදීම පිණිස හෝ ඒවායේ ඇති විෂබීජ විනාශ කිරීම පිණිස උණුවතුර හෝ විෂබීජ නාශක ද්‍රව සෑහෙන තරම් ලබාගැනීමට මාර්ගයක් ද;

(ඇ) ගිසකේ කපන්නන්ට හෝ බාබර්වරුන්ට තම වැඩ පල කරන අතරම, අත් සෝදා ගැනීමට තැන්ද;

(ඈ) මෙවලම් හෝ උපකරණ සේදීමට ගන්නා විෂබීජ නාශක ද්‍රව වක්කර තැබීමට සෑහෙන තරම් භාජනද;

(ඉ) ගිසකේ රැවුල් කප්පවා ගැනීමට එන අයගේ ප්‍රයෝජනය සඳහා තුවා හා උඩවැසුම් සෑහෙන ගණනක් ද;

(ඊ) ගිසකේ, රැවුල් කප්පවා ගැනීමට එන අයට හා සේවකයන්ට පහසුවෙන් කෙළ ගැසීමට පුළුවන් වෙන පරිදි සුදු ලග තබා තිබෙන පඩික්කම් සෑහෙන ගණනක් ද;

(උ) කැපී යන ගිසකේ කොට, රැවුල් ගස් හා සෙසු කුණු කසළ දැමීමට (තුත්තනාගම් හෝ) යකඩෙන් හෝ දියහිරාව නාල්ලන වෙන ද්‍රව්‍යයකින් සාදන ලද්දාවූද හැනින් හෑක ගෙනය හැකිවූද පියනක් සහිතවූද කුණුබාල්දියක් ද;

තිබිය යුතුය.

3. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් :—

(අ) කරනැවුම් මැදිරියේ හෝ බාබර් සාප්පුවේ පිටපැත්තේ කාටත් පෙනෙන තැනක ප්‍රවේශයේ ගැටියට "බලපත්‍රයක් ලත් කරනැවුම් මැදිරිය හෝ බලපත්‍රයක් ලත් බාබර් සාප්පුව" යන මේ වචන පින්තාරු කරනලද දැන්වීම් පුවරුවක් සවිකොට තබාගත යුතුය.

(ආ) කරනැවුම් මැදිරි හෝ බාබර් සාප්පු පිළිබඳ මේ උපනීති මාලාවේ සිංහල පිටපතක් හා දෙමළ පිටපතක් හා ඉංග්‍රීසි පිටපතක් හා වෙන වෙනම රාමුවල දමමවා ඒ මැදිරියේ හෝ සාප්පුවේ පිට පැත්තේ කාටත් පෙනෙන තැනක එල්ලා තැබිය යුතුය.

4. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් :—

(අ) සමයකට වරක් බැගින් වත් ඒ මැදිරියේ හෝ සාප්පුවේ බිත්තිවල සුදුහුණු ගෑවීමට හා සිලිමේ තීන්ත ගෑවීමටත් ;

(ආ) ඒ මැදිරියේ හෝ සාප්පුවේ බිම, බිත්ති, සිලිම සවිකළ දේවල්, ලී බඩු, උපකරණ යන මේවා නිතරම පිරිසිදුව තබාගැනීමටත්

සැලැස්විය යුතුය.

5. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් තමා එහි වැඩට ගන්නා හැම කරනැවුම්යකුටම—හෝ බාබර් කෙනෙකුටම—

(අ) ශරීර හා ඇඳුම් ශුද්ධපවිත්‍රව තබාගැනීමටත් ;

(ආ) ඇඟිලිවල නියපොතු කොටවෙන්ට කපා කුණු නැතිව තබා ගැනීමටත් ;

(ඇ) ගිසකේ, රැවුල් කප්පවා ගැනීමට එන එක් එක් තැනැත්තාට කරනැවුම්කම් කරන්ට මත්තෙන් සබන් හා උණුවතුරෙන් අත් සෝදා ගැනීමටත්

සැලැස්විය යුතුය.

6. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් :—

(අ) ඒ මැදිරියේ හෝ සාප්පුවේ තිබෙන හැම පඩික්කමක්ම පිරිසිදුව සෞඛ්‍යානුකූලව තබා ගැනීමටත් ;

(ආ) ඒ මැදිරියේ හෝ සාප්පුවේ ගිසකේ පිසදැමීම සඳහා පාවිච්චි කරන හැම බුරුසුවක් හෝ ගිසකෙස් පීරන හැම පනාවක්ම හැමදම සෝදා හෝ ශුද්ධපවිත්‍රකොට විෂබීජ විනාශකොට හෝ වළඳකොට නිතරම පිරිසිදුව සෞඛ්‍යානුකූලව තබාගැනීමටත් ;

(ඇ) ඒ මැදිරියේ හෝ සාප්පුවේ පාවිච්චියට ගන්නා සබන් දිය කරන ජෝගු හෝ කෝප්ප, බුරුසු, ගිසකේ කපන යන්ත්‍ර, දැළිපිහිය හෝ (ගිසකේ කපන) සෙසු උපකරණ යන මේවා පාවිච්චියට ගන්නා එක් එක් වතාවෙන් පසු හොඳට උණු වතුරේ දමා සෝදා පවිත්‍ර කරවීමටත් ;

(ඈ) ගිසකේ හා රැවුල් කප්පවා ගැනීමට එන එක් එක් තැනැත්තාට කරනැවුම්කම් කල පසු ගිසකේ කොට හා කුණු කසළ එකතු කරමා (ඒ සඳහා එහි තබා ඇති) කුණු බාල්දියකට දැමීමටත් ;

සැලැස්විය යුතුය.

7. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් ගිස රැවුල් කප්පවා ගැනීමට එන මොනම කෙනෙකුගේ වත් කැපී මඟින් ලේ නැවැත්වීම පිණිස :—

(අ) ලේ නැවැත්වීමට පොදුවේ පාවිච්ච කරන ඖෂධයක් හෝ (Styptic Peneil) පුයර මලක් හෝ මුදු හත්තක් (Sponge) ; නැතහොත්

(ආ) සීතක්කාරම් හෝ වෙන යම් ද්‍රව්‍යයක් කුඩුකර හෝ දියකර තිබෙනොත් මිස නැත්නම් ;

පාවිච්චි කිරීම හෝ ඒ මැදිරියේ හෝ සාප්පුවේ වැඩට ගෙන සිටින කිසිම බාබර් කෙනෙකුට හෝ ගිසකේ කපන්නකුට පාවිච්චි කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

8. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් ඒ මැදිරියට හෝ සාප්පුවට එන කිසිවකුගේ පාවිච්චියට වරක් පාවිච්චි කළ තුවායක් හෝ අපිරිසිදු උඩවැස්මක් නොදිය යුතුය.

9. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් :—

(අ) කිසිම වසංගත රෝග විශේෂයකින් හෝ ස්පර්ශයෙන් බෝවන රෝග විශේෂයකින් පෙළෙන්නාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ලෙඩ සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ හෝ කිසිවකුට මොනම කරුණක් නිසාවත් ඒ මැදිරියට හෝ සාප්පුවට ඇතුල්වීමට දැන දැනම ඉඩ නොදිය යුතුය;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් කිසිවකු ඒ මැදිරියේ හෝ සාප්පුවේ මොනම වැඩකට වත් නොගත යුතුය;

(ඇ) මැදිරියේ හෝ සාප්පුවේ රක්ෂාව කරන කිසිම බාබර් කෙනෙකුට හෝ ගිස රැවුල් කපන්නකුට (අ) ඡේදයෙහි සඳහන් කිසිවකුගේ ගිස රැවුල් කැපීමට දැන දැනම ඉඩ නොදිය යුතුය;

(ඈ) ඒ බාබර් කෙනෙකු හෝ ගිස රැවුල් කපන්නකු වැරදීමකින් හෝ අහම්බෙන් (අ) ඡේදයේ සඳහන් කිසිවකුගේ ගිස රැවුල් කැපුවොත් ඔහුට අත් සෝදා ශුද්ධපවිත්‍ර කර නොගෙන වෙන කෙනෙකුගේ ගිස රැවුල් කැපීමට ඉඩ නොදිය යුතුය :

(ඉ) (අ) ඡේදයේ සඳහන් කිසිවකුගේ ගිස රැවුල් කැපීමට ගන්නා ලද මොනම මෙවලමක් වුවත් විෂබීජ විනාශ කර දමන තුරු වෙන කෙනෙකුගේ ගිස රැවුල් කැපීම සඳහා පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය.

10. කිසිවකු කිසිම කරනැවුම් මැදිරියක් හෝ බාබර් සාප්පුවක් ඇතුළත පඩික්කමකට මිස වෙන තැනක කෙළ නොගැසිය යුතුය.

11. කරනැවුම් මැදිරියක හෝ බාබර් සාප්පුවක බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය :—

(අ) මොනම වේලාවකදී වත් ආගාර ගන්නා ස්ථානයක් වශයෙන් හෝ ;

(ආ) රාත්‍රිකාලය තුළ ඒ ස්ථානයෙහි ගිස රැවුල් කැපීම නොකරනවිට හැර නිදාගැනීමේ ස්ථානයක් වශයෙන්

පාවිච්චි කිරීම හෝ වෙන කෙනෙකුට එසේ පාවිච්චි කිරීමට ඉඩ දීම නොකළ යුතුය.

12. (1) සභාපතිගේ හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඕනෑම කරනැවුම් මැදිරියකට හෝ බාබර් සාප්පුවකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) කරනැවුම් මැදිරියේ හෝ බාබර් සාප්පුවේ බලපත්‍රකාරයා හෝ එය භාරව සිටින තැනැත්තා සභාපතිගේ හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට එකී ස්ථානයට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා වුවමනාවන හැම උපකාරයක්ම කළ යුතුය.

13. කරනැවුම් මැදිරි හෝ බාබර් සාප්පු පිළිබඳ උපනීති මාලාවෙන් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීමක් ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීමක් ගැන සිහිපත්කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියහොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකිවිය යුතුය.

14. කරනැවුම් මැදිරි හෝ බාබර් සාප්පු පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩකිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයාවූ බලපත්‍රකාරයකුගේ බල පත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකරගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

(14)

## XIII වැනි කාණ්ඩය

### මාලු විකිණීම පිළිබඳ උපනීති

1. (1) මාලු විකිණීම සඳහා සභාපතිතුමාගෙන් ලත් බල පත්‍රයක් පිට මිස කිසිවකු විසින් මාලු විකිණීම පිණිස (මාරකැට්ටුවක් හැර වෙන) කිසිම කඩයක් හෝ ස්ථානයක් පාවිච්චි නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බල පත්‍රයක්ම 24 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක් වැනිදාට අහෝසි විය යුතුය.

2. බලපත්‍රය දීමට තිබෙන ස්ථානයත් ඒ ස්ථානයේ ඇති උපකරණත් පහත පෙනෙන කොන්දේසිවලට ගැළපෙතොත් මිස නැත්නම් කිසිවකුට මාලු කඩයක් දමාගැනීම පිණිස බල පත්‍රයක් ලබාගැනීමට අයිතිවාසිකමක් නොතිබිය යුතුය :—

(1) ගොඩනැගිල්ල කැඩුම් බිඳුම් නැතිව මනා තත්ත්වයක තිබිය යුතුය. එට හොඳ වාතය හා ආලෝකය ලැබිය යුතුය. එහි හැම කාමරයකම ඇරියහැකි ජනේල තිබිය යුතුය. ඒ ජනේල වල වර්ගප්‍රමාණය බිමේ වර්ගප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය ;

(2) හැම කාමරයකම කොයි බිත්තියක් වත් උසින් අඩි හතකට අඩු නොවිය යුතුය. ඒවායේ පිහන් ගඩොල් ඇල්ලූ කොටස් හෝ සිමෙන්තියෙන් කපලාරු කළ කොටස් හැර සෙසු හැම තැනම හුණු බදාමෙන් කපලාරුකොට සුදුහුණු ගා තිබිය යුතුය ;

(3) හැම වහල්පලයක්ම බිම සිට අඩුම ගණනේ අඩි හයක් වත් උස්විය යුතුය ;

(4) සියලු ලී දඬුවල තීන්ත ගා තිබිය යුතුය ; නැතහොත් සුදුහුණු ගා තිබිය යුතුය ;

(5) බිම සිමෙන්ති දමා මැදලා (වැටෙන) වතුර හොඳින් බැසයන පරිදි කානුවක් දෙසට බෑවුමට තිබිය යුතුය. ඒ කානුව සිමෙන්තියෙන් බැඳ සිමෙන්තියෙන් කපලාරුකොට තිබිය යුතුවා පමණක් නොව බාල්දියකට ගලා බැස්ස යුතුය ;

(6) මාලු තබන හැම මේසයකම උඩුපැත්තේ තුත්තනාගම් තහඩු හෝ දියසීරාව ඇද නොගන්නා වෙන ද්‍රව්‍යයක් ගසා තිබිය යුතුය ;

(7) ස්ථානයෙහි සෞඛ්‍යානුකූල කුණු බාල්දියක් හා සෑහෙන පමණ වැසිකිළි තිබිය යුතුය ;

(8) ස්ථානය යම්කිසි වැසිකිළියක හෝ කසළ වළක හෝ පෝර ගොඩක හෝ නොවැසූ මලමූත්‍ර නාලිකාවක සිට අඩුම ගණනේ අඩි පනහක් වත් ඈතින් පිහිටා තිබිය යුතුය ;

(9) ස්ථානය ඇතුළත හෝ එට කෙළින්ම සම්බන්ධවෙන්ට කිසිම කසළ වළක් හෝ වැසිකිළියක් හෝ අලුවළක් නොතිබිය යුතුය.

3. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් තමාගේ නම සහ "බලපත්‍රයක් ලත් මාලුකඩය" යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරුකොට ලෑල්ලක් ඒ ස්ථානයේ පිටපැත්තේ කාටත් පෙනෙන තැනක ගසා තැබිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් මාලුකඩ පිළිබඳ මේ උපනීතිමාලාවේ සිංහල පිටපතක් හා දෙමළ පිටපතක් හා ඉංග්‍රීසි පිටපතක් වෙන වෙනම රාමුවල දමමවා ඒ ස්ථානයේ කාටත් පෙනෙන තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලීමට හැකිවන සේ (මාලු විකුණන්නන් ඇතුළුව එහි සිටින) සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා ඔහු විසින් ඒ ස්ථානයේ තබා ගත යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේදී වරක් බැගින් අඩුම ගණනේ අවුරුද්දකට සතර වරකුත් සභාපතිතුමා ලියවිල්ලකින් නියම කරන වෙන වකවානුවලදීත් ඒ මාලුකඩේ හැම කාමරයකම බිත්තිවල පිහන් ගඩොල් අල්ලා ඇති කොටස් හා සිමෙන්තියෙන් කපලාරුකොට ඇති කොටස් හැර සෙසු සියලු කොටස් වල සුදුහුණු ගෑවීමද ලී දඬුවල තීන්ත ගා තිබේ නම් සබන් හා උණු වතුරෙන් සේදවීමද ඒවායේ තීන්ත ගා නැත්නම් සුදුහුණු ගෑවීමද කරවිය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් දවසකට වරක් බැගින් බලපත්‍රයේ සඳහන් කොට ඇති වේලාවේදී මාලුකඩයේ බිමද, බිත්තිවල පිහන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්තියෙන් කපලාරු කළ කොටස්ද, මේසවල උඩුපැත්ද, මාලුකොළොම්බුද බුරුසුවකින් හොඳින් උලා සේදීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් මාලු එල්ලා තැබීමට පාවිච්චිකරන සියලු කොකු මලකඩ නොකන අන්දමට හොඳට පිරිසිදු කොට තැබ්බවිය යුතුය.



7. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ කඩයේ හැම තැනමද, එහි පරිසරයද කානුද ලීබඩුද මාලු දමා තැබීම හා සකස්කිරීම හා විකිණීම සඳහා පාවිච්චි කරන භාජන හා උපකරණද කැඩුම් බිඳුම් නැතිව ශුඩ පවිත්‍ර කොට මනා තත්ත්වයක තබාගත යුතුය. එසේම යම් කානුවකින් හෝ වැසිකිළියකින් හෝ කසළ වළ කින් හෝ වෙන අප්‍රසන්න දෙයකින් නැගෙන දුර්ගන්ධයක් ඒවාට වැදෙන්ට ඔහු විසින් ඉඩ නොතැබිය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි සෞඛ්‍යානුකූල කුණුබාල්දියක් හා අඩුම ගණනේ එක් පඩික්කමක්ද සේවකයන්ට පහසුවෙන් පාවිච්චි කළ හැකි වන සේ තැබ්බවීමට සැලැස්විය යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි ඇති කුණුරොඩු හා නොවිකිණිය හැකි කටු, බොකු, බඩ වැල් ආදී දේ දියසීරාව බී නොගන්නාවූද පියනක් සහිතවූද භාජනය කට වසාම දමමවා දිනපතා ඒ ස්ථානයෙන් ඉවත් කරවීමට සැලැස් විය යුතුය. කුණු රොඩු ආදිය දමන වේලාවලදී හැර අනික් කොයි වේලාවේදීත් ඒ භාජනය වසා තැබීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

10. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම ලබපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මියන් වැද්ද නොදී තබාගත යුතුවාත් හැර මීගුල් තිබෙනවා දකින්ට ලැබුණු වහාම විදුරු කැබලි පුරවා සිමෙන්ති දමා කපලාරු කොට වසා දැමීමට සැලැස්විය යුතුය.

11. බලපත්‍රයක් ලත් ස්ථානයෙහි මොනම කරුණක් නිසා වත් කිසිවකු විසින් කිසිම සතකු වත් කුරුල්ලකු වත් තබා නොගත යුතුය.

12. මාලු කඩයක් ඇතුළත තබා තිබෙන පඩික්කමකට මිස ඒ කඩයේ වෙන තැනක කිසිවකු විසින් කෙළ නොගැසිය යුතුය.

13. වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ලඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළුණ කෙනෙකුට ළඟදී සාත්තු කළාවූ කිසිවකු මාලු කඩයකට ඇතුල්වීම හෝ එහි මාලු රැස්කර තැබීමේ හෝ සකස් කිරීමේ හෝ විකිණීමේ කටයුත්තකට සම්බන්ධවීම හෝ ඒ මාලු කඩයට මාලු ගෙනඒමට හෝ ඒ මාලු කඩේ සිට මාලු ගෙනයෑමට සම්බන්ධවීම නොකළ යුතුය.

14. මාලු කඩයක බලපත්‍රකාරයා විසින් කිසිවකුට වත් 11 වැනි උප නීතිය හෝ 12 වැනි උපනීතිය හෝ 13 වැනි උපනීතිය කඩ කිරීමට ඉඩ දීම හෝ ඒ කඩ කිරීමක් ඉවසීම නොකළ යුතුය.

15. බලපත්‍රයක් ලත් මාලු කඩයෙහි මාලු දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන දේවල් හැර කිසිම ලී බඩුවක් වත් ඇඳුමක් වත් නිදාගන්නා පැදුරක් වත් වෙන දෙයක් වත් තබා නොගත යුතුය.

16. මාලු කඩේම කොටසක්වූද, ඒ මට්ටමටම පිහිටියාවූද කිසිම තැනක් බිම සිට වහලේ සිලිම දක්වා පාටිෂන් බිත්තියකින් හොඳට වෙන්වී බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවන වර්ග ප්‍රමාණයකින් යුත් (පිටතට ඇරිය හැකි) ජනේලයක් ඇතිව තිබෙතොත් මිස නැත්නම් නිදාගැනීමේ ස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීමට මාලු කඩයක බලපත්‍රකාරයා විසින් ඉඩ නොදිය යුතුය.

17. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි බීමට සුදුසු වතුර සෑහෙන තරමට තබාගත යුතුය.

18. බලපත්‍රයක් ලත් හැම මාලු කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මාලු විකිණීම සඳහා දිනපතා ඇරලා තබාගත යුතුය.

19. මාලු කඩයක බලපත්‍රකාරයා විසින් කිසිවකුට සභාපතිතුමන් තමාගේ අත්සන් කළ ලියාපදිංචිකිරීමේ පත්‍රයක් ළඟ තබා නොගෙන තමාගේ මාලු කඩයෙන් විකිණීම සඳහා මාලු ගෙන යෑමට ඉඩ නොදිය යුතුය.

20. ආවරණය කළ රථයක හෝ වැසූ පෙට්ටියක හෝ බෙලෙක් බඳුනක හෝ වෙන සුදුසු භාජනයක දමාගෙන මිස මාලු කඩයෙන් විකිණීම පිණිස පිටතට මාලු ගෙන යෑමට මාලු කඩයක බලපත්‍රකාරයා විසින් කිසිවකුට ඉඩ නොදිය යුතුය. තවද ඔහු විසින් ඒ රථය හෝ පෙට්ටිය හෝ බෙලෙක් බඳුන හෝ භාජනය හැම වේලෙහිම ශුද්ධ පවිත්‍ර කොට සෞඛ්‍යාදායක ලෙස තබා ගැනීමට සැලැස්විය යුතුය.

21. මාලු කඩයක බලපත්‍රකාරයා ඉල්ලූ විට සභාපතිතුමා විසින් ඒ බල පත්‍රකාරයා යටතේ වෙළඳාම සඳහා මාලු එහා මෙහා ගෙනයෑමට රඳවාගෙන සිටින කාටත් ලියාපදිංචිකිරීමේ පත්‍ර නොමිලයේ දිය යුතුය.

22. (1) සභාපති හට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද නාගර සභාවේ ඕනෑම නිලධාරියකුට යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඕනෑම මාලු කඩයකට හෝ මාලු විකුණන ස්ථානයකට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) මාලු වෙළඳාම කරන කඩයේ හෝ ස්ථානයේ බලපත්‍රකාරයා හෝ එය භාරව සිටින තැනැත්තා සභාපතිහට හෝ ඔහු විසින් ලිය විල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා වුවමනා හැම උප කාරයක්ම කළ යුතුය.

23. මාලු වෙළඳාම පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩ කිරීමක් ගැන වරදකාරයා බව ඔප්පු වූ පසු හෝ ඒ කඩ කිරීමක් ගැන සෞඛ්‍ය සේවා ස්ථාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් බාරදුන පසු ඒ කඩ කිරීම කරගෙන ගියොත් එසේ කඩ කරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

24. මාලු වෙළඳාම පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩ කිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයා වූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමටද (සෑහෙන අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XIV වැනි කාණ්ඩය

### මස් විකිණීම පිළිබඳ උපනීති

1. (1) මස් විකිණීම පිණිස සභාපතිතුමාගෙන් ලත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් මස් විකිණීම පිණිස (මාර්කට්වලදී හැර වෙන) කිසිම කඩයක් හෝ ස්ථානයක් පාවිච්චි නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 25 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදාට අහෝසි විය යුතුය.

2. බලපත්‍රය දෙන්ට තිබෙන ස්ථානයත් ඒ ස්ථානයේ ඇති උපකරණත් පහත පෙනෙන කොන්දේසිවලට ගැළපෙනොත් මිස නැත්නම් මස් විකිණීම පිණිස කඩයක් දමා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය—

(1) ගොඩනැගිල්ල කැඩුම් බිඳුම් නැතිව මනා තත්ත්වයක තිබිය යුතුය. ඊට හොඳින් වාතය හා ආලෝකය ලැබිය යුතුය. එහි හැම කාමරයකම ඇරිය හැකි ජනේල තිබිය යුතුය. ඒ ජනේලවල වර්ග ප්‍රමාණය කාමරයේ බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතුය;

(2) හැම කාමරයකම කොයි බිත්තියක් වත් උසින් අඩි ගානකට අඩු නොවිය යුතුය. ඒවා ගඩොලෙන් හෝ කළු ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ තිබිය යුතුය. ඒවායේ ඇතුල් පැත්ත සුණු බදාමෙන් කපලාරුකොට සුදුහුණු ගා තිබිය යුතුය. එක් එක් බිත්තියේ ඇතුල් පැත්තේ පොළොවේ සිට අඩි හතරක් උසට සිමෙන්තියෙන් කපලාරුවක් දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතුය;

(3) හැම වහල් පලයක්ම බිම සිට අඩුම ගණනේ අඩි ගයක් වත් උස් විය යුතුය;

(4) වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවෙලිකර තිබිය යුතුය;

(5) සියලු ලී දඬුවල තීන්ත හෝ සුදුහුණු ගා තිබිය යුතුය;

(6) බිම හැම තැනම සිමෙන්ති දමා තිබිය යුතුය;

(7) ස්ථානයෙහි වතුර බැසයාම සඳහා සෑහෙන තරම් කාණු දමා තිබිය යුතුය;

(8) බිත්ති හා බිම ශුද්ධ පවිත්‍ර කළ හැකි වන සේ මේස හා සෙසු සියලු ලී බඩු එහා මෙහා කරන්ට පුළුවන් සේ තිබිය යුතුය;

(9) මස් තබන හැම මේසයකම උඩු පැත්තේ තුත්තනාගම් තහඩු හෝ දිය සීරාව බී නොගන්නා වෙන ද්‍රව්‍යයක් ගසා තිබිය යුතුය;

(10) සෞඛ්‍යානුකූල කුණු බාල්දියකුත් අඩුම ගණනේ එක පඩික්කමක් වත් සෑහෙන පමණ වැසිකිළිත් ස්ථානයෙහි තිබිය යුතුය;

(11) ස්ථානය, ඕනෑම වැසිකිළියක හෝ කසළ වළක හෝ පෝර ගොඩක හෝ නොවැසූ මල මූත්‍ර කාලිකාවක සිට අඩුම ගණනේ අඩි පනහක් වත් ඈතින් පිහිටා තිබිය යුතුය;

(12) ස්ථානය ඇතුළත හෝ ඊට කෙළින්ම සම්බන්ධවන සේ කිසිම කසළ වළක් හෝ වැසිකිළියක් හෝ අලු වළක් නොතිබිය යුතුය.

3. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් තමාගේ නම හා "බලපත්‍රයක් ලත් මස් කඩය" යන්න සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරුකොට ලෑල්ලක් ඒ ස්ථානයේ පිට පැත්තේ කාටත් පෙනෙන තැනක ගසා තැබිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් මස්කඩ පිළිබඳ මේ උපනීතිමාලාවේ සිංහල පිටපතක් හා දෙමළ පිටපතක් හා ඉංග්‍රීසි පිටපතක් වෙන වෙනම රාමුවල දම්මවා ඒ ස්ථානයේ කාටත් පෙනෙන තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද කොයි වේලාවකදී වුවත් පරීක්ෂාකර බැලිය හැකි වන සේ මස් විකුණන්නන් ඇතුළු සියලු සේවකයන්ගේ නම් හා ලිපිනයන් ලැයිස්තුවක් වශයෙන් ලියා ඔහු විසින් ඒ ස්ථානයේ තබාගත යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේදී වරක් බැගින් අඩුම ගණනේ අවුරුද්දකට සතර වරකුත් සභාපතිතුමා ලියවිල්ලකින් නියම කරන වෙන වකවානුවලදීත් ඒ මස් කඩයේ හැම කාමරයකම බිත්තිවල පිඟන් ගඩොල් අල්ලා ඇති කොටස් හා සිමෙන්තියෙන් කපලාරුකොට ඇති කොටස් හැර සෙසු සියලු කොටස්වල සුදුහුණු ගෑවීමද ලී දඬුවල තීන්ත ගා තිබේ නම් සබන් හා උණු වතුරෙන් සේදවීමද ඒවායේ තීන්ත ගා නැති නම් සුදුහුණු ගෑවීමද කරවිය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් දවසකට වරක් බැගින් බලපත්‍රයේ සඳහන් කොට ඇති වේලාවේදී මස්කඩයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති දයක් කපරාරු කළ කොටස්ද, මේසවල උඩුපැත්ද මස් කොලොම්බුද බුරුසුවකින් හොඳින් උලා සේදවීමට සැලැස්විය යුතුය. තවද ඔහු විසින් මස් එල්ලා තැබීමට පාවිච්චි කරන සියලු කොකු, මලකඩ නොකන අන්දමට හොඳට ශුද්ධ කොට තැබ්බවිය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ කඩයේ හැම තැනමද එහි පරිසරයද කාණුද ලී බඩුද මස් දමා තැබීම හා සකස් කිරීම හා විකිණීම සඳහා පාවිච්චි කරන භාජන හා උපකරණද කැඩුම් බිඳුම් නැතිව ශුද්ධ පවිත්‍ර කොට තබාගත යුතුය. එසේම යම් කාණුවකින් හෝ වැසිකිළියකින් හෝ කසළ වළකින් හෝ වෙන අප්‍රසන්න දෙයකින් නැගෙන දුර්ගන්ධයක් ඒවාට වැදෙන්ට ඔහු විසින් ඉඩ නොදිය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි සෞඛ්‍යානුකූල කුණුබාල්දියක් හා අඩුම ගණනේ එක් පඩික්කමක්වත් සේවකයන්ට පහසුවෙන් පාවිච්චි කළ හැකි වන සේ තැබ්බවීමට සැලැස්විය යුතුය.

9. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි ඇති කුණු රොඩු, හා විකිණිය නොහැකි කටු ආදී දේ, දියසීරාව බී නොගන්නාවූද පියනක් සහිතවූද තුත්තනාගම් තහඩුවලින් හෝ තුත්තනාගම් ගෑ යකඩ තහඩුවලින් සාදන ලද්දවූද භාජනයකට වහාම දම්මවා දින පතා ඒ ස්ථානයෙන් ඉවත් කරවීමට සැලැස් විය යුතුය. ඇතුළට කුණු රොඩු ආදිය දැමීමට පාවිච්චි කරන වේලාවලදී හැර අනික් කොයි වේලාවේදීත් ඒ භාජනය වසා තැබීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

10. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය මීයන් වැද්ද නොදී තබාගත යුතුවාත් හැර මීයුල් තිබෙනවා දකින්ට ලැබුණු වහාම වීදුරු කැබලි පුරවා සිමෙන්ති දමා කපලාරුකොට වසා දැමීමට සැලැස්විය යුතුය.

11. බලපත්‍රයක් ලත් ස්ථානයෙහි මොනම කරුණක් නිසා වත් කිසිවකු විසින් කිසිම සතකු වත් කුරුල්ලකු වත් තබා නොගත යුතුය.

12. මස් කඩයක් ඇතුළත තබා තිබෙන පඩික්කමකට මිස ඒ කඩයේ වෙන තැනක කිසිවකු විසින් කෙළ නොගැසිය යුතුය.

13. යම්කිසි වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුණාවූ හෝ ඒ රෝගයකින් පෙළුණ කෙනෙකුට ළඟදී සාත්තු කළාවූ කිසිවකු මස් කඩයකට ඇතුල්වීම හෝ එහි මස් රැස්කර තැබීමේ හෝ සකස් කිරීමේ හෝ විකිණීමේ කටයුත්තකට සම්බන්ධ වීම හෝ මස් කඩයට මස් ගෙන ඊමට හෝ මස් කඩයේ සිට මස් ගෙනයෑමට සම්බන්ධවීම නොකළ යුතුය.

14. මස් කඩයක බලපත්‍රකාරයා විසින් කිසිවකුට 12 වැනි උපනීතිය හෝ 13 වැනි උපනීතිය කඩ කිරීමට ඉඩ නොදිය යුතුය.

15. බලපත්‍රයක් ලත් මස් කඩයෙහි මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන දේවල් හැර කිසිම ලී බඩුවක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙන දෙයක් තබා නොගත යුතුය.

16. මස් කඩයක බලපත්‍රකාරයා විසින්, මස් කඩේම කොටසක්වූද ඒ මට්ටමටම පිහිටියාවූද, කිසිම තැනක් බිම සිට වහලේ සිලිම දක්වා පාටිෂන් බිත්තියකින් හොඳට වෙන් වී බිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවන වර්ග ප්‍රමාණයකින් යුත් (පිටතට ඇරිය හැකි) ජනේලයක් ඇතිව තිබෙනොත් මිස නැත්නම් නිදාගැනීමේ ස්ථානයක් වශයෙන් පාවිච්චිකිරීමට ඉඩ නොදිය යුතුය.

17. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානයෙහි බීමට සුදුසු වතුර සෑහෙන තරමට තබාගත යුතුය.

18. මස් කඩයක බලපත්‍රකාරයා විසින් සභාවේ පාලන ප්‍රදේශය ඇතුළත පිහිටියාවූද මසට සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදයේ) 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශකොට ප්‍රසිද්ධ කරනු ලැබුවාවූද පොදු වධ්‍යශාලාවකදී (slaughter-house) මරන ලද හෝ මසට සතුන් මැරීම සඳහා එකී ආඥාපනතේ 11 වැනි වගන්තිය යටතේ නීති පාලන මණ්ඩලයක් නියම කරන ලද ස්ථානයකදී මරන ලද හෝ එකී ආඥාපනතේ 14 වැනි වගන්තිය යටතේ දුන් අවසරයක පිට මරන ලද සතුන්ගේ මස් හැර වෙන කිසිම මසක් ඒ මස කඩය තුළ විකිණීම හෝ විකිණීමට තැබීම නොකළ යුතුය.

19. බලපත්‍රයක් ලත් හැම මස් කඩයකම බලපත්‍රකාරයා විසින් ඒ කඩය මස් විකිණීම සඳහා පෙරවරු 7 සිට පෙරවරු 10 දක්වාත් පස්වරු 3 සිට පස්වරු 7 දක්වාත් දිනපතා ඇරලා තැබිය යුතුය.

20. මස් කඩයක බලපත්‍රකාරයා විසින් තමා ළඟ රක්ෂාවේ යොදවා ගෙන සිටින කිසිවකුට සභාපතිහුත් තමාත් අත්සන් කළ ලියාපදිංචි කිරීමේ පත්‍රයක් ළඟ තබාගෙන මිස විකිණීම සඳහා ඒ කඩයෙන් මස් ගෙනයෑමට ඉඩ නොදිය යුතුය.

21. මස් කඩයක බලපත්‍රකාරයා විසින් තමා ළඟ රක්ෂාවෙහි යොදවා ගෙන සිටින කිසිවකුට ආවරණය කළ රථයක හෝ වැසූ පෙට්ටියක හෝ බෙලෙක් බඳුනක හෝ වෙන සුදුසු භාජනයක දමාගෙන මිස ඒ කඩයෙන් විකිණීම පිණිස පිටතට මොනම මසක් වත් ගෙන යෑමට ඉඩ නොදිය යුතුය. තවද ඔහු විසින් ඒ රථය හෝ පෙට්ටිය හෝ බෙලෙක් බඳුන හෝ භාජනය කොයි වේලාවේදීත් ශුද්ධපවිත්‍ර ලෙස හා සවසථානුකූල ලෙස තබාගැනීමට සැලැස්විය යුතුය.

22. මස් කඩයක බලපත්‍රකාරයා ඉල්ලූ විට සභාපතිහු ඒ බලපත්‍ර කාරයා යටතේ වෙළඳාම් සඳහා මස් එහා මෙහා ගෙනයෑමට රඳාගෙන සිටින කාටත් ලියාපදිංචිකිරීමේ පත්‍ර දිය යුතුය.

23. (1) සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට මස් විකුණන ඕනෑම කඩයකට හෝ ස්ථානයකට යුක්ති සහගත ඕනෑම වේලාවකදී ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) මස් විකුණන ඕනෑම කඩයක හෝ ස්ථානයක බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා වුවමනාවන හැම උපකාරයක්ම කළ යුතුය.

24. මස් විකිණීම පිළිබඳ මේ උපනීති මාලාවෙන් කවරක් වුවත් කඩ කරන හැම ප්‍රස්ථාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩ කිරීමක් ගැන වරදකාරයා බව ඔප්පු වූ පසු ඒ කඩ කිරීමක් ගැන සිහිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩ කිරීම කරගෙන ගියොත් එසේ කඩ කරන එක් එක් දවසට රුපියල් විසිපහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

25. මස් විකිණීම පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩ කිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයාවූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් ඔහුට වෙන දඬුවමක් දීමට (නැහෙහා අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන කිසිම අලාභයක් අයකර ගැනීමට බලපත්‍රකාරයාට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XV වැනි කාණ්ඩය

### හරක් ගාල් පිළිබඳ උපනීති

1. (1) හරක් ගාලක් තබාගැනීමට සභාපතිහුගෙන් ලත් බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් හරක් ගාලක් තබා නොගත යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ දෙන හැම බලපත්‍රයක්ම 11 වැනි උපනීතිය යටතේ කලින් අවලංගු නොකොළොත් ඒ දෙන අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක්වැනිදාට අහෝසිවිය යුතුය.

2. බලපත්‍රයක් දෙන්ට තිබෙන ස්ථානය පහත පෙනෙන කොන්දේසි වලට ගැළපෙහොත් මිස නැත්නම් ගාලක් දමාගැනීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය—

(1) භූමිභාගය සමතලාකොට තිබිය යුතුය. එහි වතුර බැසයෑමේ පහසුකම් තිබිය යුතුය. පාදට හා සමතලාවට ත්බෙන සේ බිමේ කළුගල් අල්ලා තිබිය යුතුය; නැතහොත් බිම කළුගල් අතුරා තලා තිබිය යුතුය.

(2) ගාලක හරකුන් දමීමට තිබෙන හැම ගොඩනැගිල්ලක්ම නැත හොත් මඩුවක්ම ගඩොලෙන් හෝ ගලෙන් හෝ කබුක්ගලෙන් සාදා තිබිය යුතුය. එහි බිත්ති හා කුලුණු බිම සිට අඩි හතරක් උසට සිමෙන්තියෙන් කපලාරුකොට සුදුහුණු ගා තිබිය යුතුය. වහල කල් පවතින ද්‍රව්‍යයකින් සෙවිලිකොට තිබිය යුතුය. බිම සිමෙන්ති හෝ කොන්ක්‍රීට් හෝ ගල් තාර දමා ඊමත ගඩොළ හෝ ගල් අල්ලා තිබිය යුතුය. ගෝ මූත්‍ර, සෝදන වතුර, වැහිවතුර යන මේවා බැස්සවීමට එපරිද්දෙන්ම බඳින ලද කානු තිබිය යුතුය. වසන ලද භාජනයකට හෝ ඊට වැඩි ගණනකට ඒ කානු වැටිය යුතුය.

(3) බීමටත් ස්ථානය සේදීමටත් ඒ ස්ථානයෙහි සෑහෙන තරම් ජලය තිබිය යුතුය.

(4) ස්ථානයෙහි සෑහෙන තරම් වැසිකිළි තිබිය යුතුය.

3. බලපත්‍රයක් ලත් හැම හරක් ගාලකම බලපත්‍රකාරයා විසින් "බලපත්‍රයක් ලත් ගාල" යන්නත් තමාගේ නමත් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ භාෂාවලින් පැහැදිලි ලෙස පින්තාරුකොට ලෑල්ලක ගාලේ පිටපැත්තේ කාටත් පෙනෙන තැනක ගසා තැබිය යුතුය.

4. බලපත්‍රයක් ලත් හැම ගාලකම බලපත්‍රකාරයා විසින් ගාල් පිළිබඳ මේ උපනීතිමාලාවේ සිංහල පිටපතක් දෙමළ පිටපතක් හා ඉංග්‍රීසි පිටපතක් වෙන වෙනම රාමුවල දමමවා ඒ ස්ථානයෙහි කාටත් පෙනෙන තැනක එල්ලා තැබිය යුතුය.

5. බලපත්‍රයක් ලත් හැම ගාලකම බලපත්‍රකාරයා විසින් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන මේ එක් එක් මාසයේදී වරක් බැගින් අවුරුද්දකට හතර වරක් ගාලේ බිත්තිවල හා කුලුණුවල සුදුහුණු හෝ තාර ගෑවීමට සැලැස්විය යුතුය.

6. බලපත්‍රයක් ලත් හැම ගාලකම බලපත්‍රකාරයා විසින් ගාලත් එහි තිබෙන සියලු ගොඩනැගිලිත් කැඩුම් බිඳුම් නැතිව ශුද්ධපවිත්‍රකොට සවසථානුකූලව තබාගෙන දිනපතා සෝදා අතුගෑවීමට සැලැස්විය යුතුය.

7. බලපත්‍රයක් ලත් හැම ගාලකම බලපත්‍රකාරයා විසින් ඒ ස්ථානය ශුද්ධපවිත්‍රව සවසථානුකූලව තබාගැනීම පිණිස ඒ ස්ථානයෙහි ඇති සියලු ගොම හා සෙසු කැලිකසළ දිනපතා කලට වේලාවට එකතුකරවා එසේ එකතුකරනලද ඒ ගොම හා කැලිකසළ (දියසිරාව නී නොගන්නා ද්‍රව්‍යයකින් සාදන ලද්දාවූද වසන ලද්දාවූද) භාජන එකකට හෝ ඊට වැඩි ගණනකට දැමීමට සැලැස්විය යුතුය.

8. බලපත්‍රයක් ලත් හැම ගාලකම බලපකාරයා විසින් සියලු ගොම, කැලිකසළ, මූත්‍ර සේදී යන වතුර යන මේවා අඩුම ගණනේ දවසකට වරක් බැගින් වත් ගාලෙන් ඉවත්කරවා කිසිවකුට වත් එයින් ගැහැටක් නොවන පරිද්දෙන් ඒවාට සුදුස්සක් කරවිය යුතුය.

9. (1) සභාපතිහට හෝ ඔහු විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලියවිල්ලකින් බලය පවරනලද නගර සභාවේ ඕනෑම නිලධාරියකුට ඕනෑම ගාලකට යුක්තිසහගත ඕනෑම වේලාවකදී ඇතුල්වී එය පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය.

(2) ගාලේ බලපත්‍රකාරයා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට ගාලට ඇතුල්වී එය පරීක්ෂා කිරීමට ඉඩ දී ඒ සඳහා වුවමනා වන හැම උපකාරයක්ම කළ යුතුය.

10. ගාල් පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීමක් ගැන සිහිපත් කරවා සභාපතිහු හෝ ඔහු විසින් බලය පවරනලද නිලධාරියකු දැන්වීම් පතක් භාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහම වැඩි නුවූ අතිරේක දඩයක් ගැසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

11. හරක් ගාල් පිළිබඳ මේ උපනීතිමාලාවෙන් කවරක් වුවත් කඩ කිරීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකාරයාවූ බලපත්‍රකාරයකුගේ බලපත්‍රය අවලංගු කිරීමටද ඊට අතිරේක වශයෙන් වෙන දඬුවමක් දීමටද (නැහෙහා අධිකරණ බලය ලත්) උසාවියකට බලය තිබිය යුතුය. එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන මොනම අලාභයක් වත් අය කර ගැනීමට ඒ බලපත්‍රකාරයාට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

## XVI වැනි කාණ්ඩය

### පොදු මාර්කැට්වූ පිළිබඳ උපනීති

1. මේ උපනීතිමාලාවේ "මාර්කැට්වූ ප්‍රදේශය" යන්නෙන් අදහස් කරන්නේ පොදු මාර්කැට්වුවක වෙළෙඳ ප්‍රදේශය වශයෙන් නගර සභාව විසින් මේයයි ප්‍රකාශ කරනලද ප්‍රදේශයයි.

2. මේ උපනීති යටතේ සභාපතිහු දුන් හෝ ඔහුගේ බලය යටතේ දුන් අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් දරන්නකු හෝ ඔහුගේ (දරන්නාගේ) සේවකයකු හෝ නියෝජිතයකු වී ඒ අවසර පත්‍රයේ හෝ ප්‍රවේශ පත්‍රයේ කොන්දේසිවලට හා නියමයන්ට අනුකූල වුවහොත් මිස නැත්නම් කිසිවකු විසින් පොදු මාර්කැට්වුවේ කිසිම කඩයක් හෝ බංකුවක් හෝ බිමක් පාවිච්චි කිරීම හෝ භුක්ති විඳීම නොකළ යුතුය. එසේම ඒ සේවකයාගේ හෝ නියෝජිතයාගේ නම නගර සභා කාර්යාලයෙහි ලියාපදිංචිකර තිබෙනොත් මිස නැත්නම් ඔහු ඒ කිසිම කඩයක් හෝ බංකුවක් හෝ බිමක් පාවිච්චි කිරීම හෝ භුක්ති විඳීම නොකළ යුතුය.

3. (1) පොදු මාර්කැට්වුවේ කඩයක හෝ බංකුවක හෝ බිමක බද්ද මාසයකට නොඅඩු කාල පරිච්ඡේදයක් සඳහා වූ විට මෙහි පහත සඳහන් "අ" උපලේඛනයේ සඳහන් "අ" ෆෝරමයේ ප්‍රකාරයට අවසර පත්‍රයක් දිය යුතුය.

(2) පොදු මාර්කැට්වුවේ කඩයක් හෝ බංකුවක් හෝ බිමක් මාසයකට වඩා අඩු ඕනෑම කාලපරිච්ඡේදයකට පාවිච්චි කිරීමට හෝ භුක්ති විඳීමට බලය දිය යුත්තේ මෙහි පහත සඳහන් "අ" උපලේඛනයේ "ආ" ෆෝරමයේ ප්‍රකාර දිනපතා හෝ දක්නාවූද දෙන කාලපරිච්ඡේදයට පමණක් වලංගුවන්නාවූද ප්‍රවේශ පත්‍රයකිනි.

4. අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් දරණ සෑම සිසිනුත් නගර සභාව ඒ සඳහා දවසකට හෝ මාසයකට හෝ මෙපමණය කියා නියම කරන ගණනක් අනුව බද්දක් හෝ ගාස්තුවක් ගෙවිය යුතුය.

5. මාර්කට්ටුවේ ස්ථාන පාවිච්චි කිරීම සඳහා ගෙවිය යුතු බදු හා ගාස්තු එකතු කිරීම පිණිස නගර සභාව නිලධාරියකු නොයොදවතොත්—

(අ) පුද්ගලික ගිවිසුමකින්, හෝ

(ආ) වෙන්ඩර් ඉල්ලීමෙන්, හෝ

(ඇ) ප්‍රසිද්ධ වෙන්දේසියේ දැමීමෙන්

අනුමත කරන ලද ඕනෑම කෙනෙකුට ඒ බදු හා ගාස්තු එකතු කිරීමේ අයිතිවාසිකම් බදු දීමට ඒ සභාවට බලය තිබේ.

6. (1) පොදු මාර්කට්ටුවේ එක් එක් කඩය හෝ බංකුව හෝ බිම වෙනුවෙන් ගෙවිය යුතු බද්ද හෝ ගාස්තුව සභාපතිට හෝ ඒ බද්ද හෝ ගාස්තුව එකතු කිරීමට නගර සභාව විසින් පත් කරන ලද නිලධාරියාට හෝ බදුකාරයාට හෝ සභාපතිතුමාගෙන් ලියවිල්ලකින් අනුමතිය ලබාගෙන බදුකාරයා විසින් පත් කරන ලද කෙනෙකුට මෙහි පහත පෙන්වන කාලයේදී ගෙවිය යුතුය.

(2) එකී බද්ද හෝ ගාස්තුව මුදලි—

(අ) අවසර පත්‍රයක් දෙන විට ඒ දෙන වේලාවේදීම හෝ ඒ අවසර පත්‍රය යම් කාලපරිච්ඡේදයක් වෙනුවෙන් දෙතොත් එකී එක් එක් මාසයේ මුල දිනයේදී මාස් පතා කොටස් වශයෙන් ද,

(ආ) අවසර පත්‍රයක් දෙන විට එය දෙන වේලාවේදීමද

ගෙවිය යුතුය.

එසේවුවද වුවත්, අවසර පත්‍රයක් දරණ ඕනෑම කෙනෙකුට හැකි හේතුවක් පිට බද්දක් ගෙවීම සඳහා සතියකට නොවැඩි කාලයක් දිය හැකිය. ඒ අවසර පත්‍රය දරන්නා ඒ කාලය ඉකුත්වූ පසු ඒ බද්ද ඉල්ලූ විටක ගෙවීමට යටත් විය යුතුය. එසේ යටත් විය යුත්තේ අවසර පත්‍රයට ඇතුළත් කාලපරිච්ඡේදයේ බද්දක් හිඟයිරි එක් එක් දිනය වෙනුවෙන් ශත දහය බැගින් අතිරේක බද්දක් ගෙවීමටය.

7. (1) අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් දරණ කිසිවකු විසින් සභාපතිතුමා අවසර දී එවූ ලියුමක් නැතිව—

(අ) ඒ අවසර පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රය අන් කිසිවකුට පැවරීම, හෝ

(ආ) තමාට දෙන ලද කඩයේ හෝ බංකුවේ හෝ බිමේ කිසිම කොටසක් වෙන කෙනෙකුට යැවත බදු දීම, හෝ

(ඇ) තමාට දෙන ලද කඩයේ හෝ බංකුවේ හෝ බිමේ කිසිම කොටසක් නගර සභා කාර්යාලයේ නම ලියාපදිංචි කරන ලද තමාගේ සේවකයකුට හෝ නියෝජිතයකුට හැර අන් කිසිවකුට පාවිච්චි කිරීමට හෝ බුක්ති විඳීමට ඉඩ දීම,

නොකළ යුතුය.

(2) වෙන කෙනෙකු පවරා දුන් නාය හෝ නැවත බදු දුන් නාය යන කීම පිට සභාපතිතුමාගෙන් ලිඛිත අවසරය ලබා නොගෙන කිසිවකු විසින් පොදු මාර්කට්ටුවක තිබියම් කඩයක් හෝ බංකුවක් හෝ බිමක් හෝ ඒ කඩයක හෝ බංකුවක හෝ බිමක කිසිම කොටසක් පාවිච්චි කිරීම හෝ බුක්ති විඳීම නොකළ යුතුය.

8. මාසයකට වැඩි ඕනෑම කාලපරිච්ඡේදයක් සඳහා අවසර පත්‍රයක් දරණ ඕනෑම කෙනෙකු තම බද්ද අවසන් කිරීමට තමා අදහස් කරන බව සභාපතිතුමා වෙත මාසයකට කලින් දන්විය යුතුය; නැතහොත් මාසයක ගාස්තුව ගෙවිය යුතුය.

9. අවසර පත්‍රයක් දරණ සෑම සිසිනුත්—

(අ) ආහාර ද්‍රව්‍ය හෝ බිම වගී තබන හෝ විකිණීම පිණිස ඉදිරිපත් කර තබන සෑම බංකුවක්ම හෝ රාක්කයක්ම හෝ කවුන්ටරයක්ම හෝ මේසයක්ම දිනපතා හොඳින් ශුද්ධපවිත්‍ර කිරීම වත් මස් හෝ මාලු තබන හෝ විකිණීම පිණිස ඉදිරිපත් කර තබන සෑම ලෑල්ලක්ම දිනපතා හොඳට සූරා සේදීමටත්,

(ආ) තමා බුක්ති විඳින කඩය හෝ බිම හා ඒ කඩයට හෝ බිමට එන පාර වැටී ඇති හිස් බිම හෝ කඩයට හෝ බිමට ඇතුල්වන දොරටුව දිනපතා අතුගෑමට හෝ අතුගෑවීමටත්,

(ඇ) හොඳින් හේත්තුව පියවෙන මූඩියක් ඇත්තාවූද මැස්සන් නොවැද්ද හැකිවූද භාජනයක් තමාගේ කඩය හෝ බිම ලඟ තබාගෙන අතුගා ඉවත දමන සියලු කුණුරොඩු, කැලිකසල ආදිය ඒ භාජනයට දැමීමටත්,

සැලැස්විය යුතුය.

10. අවසර පත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් දරන කිසිවකු විසින්—

(අ) පොදු මාර්කට්ටුවකට එන කිසිම කෙනෙකු කිසියම් අපහාසය කට හෝ ගිරිහැරයකට හෝ කෝපයකට හෝ ප්‍රමාදයකට භාජනය කිරීම, නැතහොත්

(ආ) තමා යම් වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙමින් සිටියදී ඒ කඩයේ හෝ බංකුවේ හෝ බිමේ සිටීම හෝ එහි මොනම වෙළඳාමකට වත් සහභාගිවීම නැතහොත් ඒ රෝගයකින් පෙළෙන්නාවූ කිසිම කෙනෙකු ඒ කඩයේ හෝ බංකුවේ හෝ බිමේ සිටවීම හෝ ඒ තැනැත්තාට එහි මොනම වෙළඳාමකට වත් සහභාගිවීමට ඉඩ දීම, නැතහොත්

(ඇ) සභාපතිතුමාගෙන් ලබාගත් ලිඛිත අවසරයක් නැතිව ඒ කඩයේ හෝ බංකුවේ හෝ බිමේ කිසියම් කොටසක් කොටුකිරීම හෝ එහි තාවකාලිකව හෝ ස්ථිරව පවතින ලෙසට යම් ආවරණයක් හෝ පැලැල්ලක් සෑදීම, නැතහොත්

(ඈ) නගර සභාවේ දේපලක් වූ යම් පෙට්ටියක් හෝ මේසයක් හෝ පුටුවක් හෝ එබඳු වෙන ලීබඩුවක් තමාගේ කඩය හෝ බංකුව හෝ බිම ඇතුළට ගෙනයාම හෝ එහි තබාගැනීම නැතහොත් සභාපතිතුමාගෙන් ලිඛිත අවසරයක් ලබා නොගෙන ඒ කඩයේ හෝ බංකුවේ හෝ බිමේ කිසිම රාක්කයක් හෝ වෙන යම් දෙයක් සවිකිරීම, නැතහොත්

(ඉ) තමාගේ අවසර පත්‍රයේ හෝ ප්‍රවේශ පත්‍රයේ සඳහන් නුවූ හෝ නගර සභාව විසින් තහනම් කරන ලද්දවූ හෝ අපථ්‍යවූ හෝ කෝසිම විධියකින් වත් මහජන සෞඛ්‍යයට අන්තරායදායකවූ කිසිම බඩුවක් තමාගේ කඩයේ හෝ බංකුවේ හෝ බිමේ වෙළඳාමට තැබීම හෝ ඉදිරිපත් කර තැබීම, නැතහොත්

(ඊ) මාලු කටු හෝ මාලු වරල් හෝ මාලු කොරහ හෝ කුණු රොඩු හෝ කැලිකසළ මාර්කට්ටුවට අයිති ස්ථානයේ කිසිම තැනකට හෝ කානුවකට විසිකිරීම, නැතහොත්

(උ) මාර්කට්ටුවට අයිති භූමිභාගයේ කිසිම තැනක මොනම සතෙකුගේ වත් හම හෝ වරල් වියලීම හෝ සකස් කිරීම, නැතහොත්

(ඌ) මාර්කට්ටුවට අයිති ස්ථානයෙහි කිසිම තැනක මාලු වියලීම හෝ ලුණු දැමීම හෝ අයිස් දැමීම,

නොකළ යුතුය.

11. කිසිවකු විසින් පොදු මාර්කට්ටුව ඇතුළත හෝ පොදු මාර්කට්ටුවට අයිති භූමිභාගය ඇතුළත—

(අ) ආහාර පිසීම, හෝ

(ආ) නිමක් නැතිව හෝ නොමනා අන්දමින් හැසිරීම හෝ මොනම අන්දමේ ඝෝෂාවක් හෝ කලබලයක් කිරීම හෝ වෙන කෙනෙකු සමග දබර කිරීම හෝ අපහාස වචන හෝ අශිෂ්ට වචන හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම, හෝ

(ඇ) හිඟමන් ඉල්ලීම, හෝ

(ඈ) තමා ගැන පිළිගත හැකි විස්තරයක් කියන්ට නැතිව මඟ මොබ හැසිරීම හෝ මාර්කට්ටු පාලකයා හෝ නගර සභාවේ නිලධාරියකු හෝ ගම්මුලාදෑනියා හෝ පොලිස් කොස්තාපල් කෙනෙකු හෝ සභාපතිතුමාගේ නීත්‍යනුකූල අණවක් යටතේ ක්‍රියාකරන කිසිවකු ඉවත්වී යෑමට තමාට නියම කළ පසු නතරවී සිටීම,

නොකළ යුතුය.

12. කිසිවකු විසින්—

(අ) මාර්කට්ටු ගොඩනැගිල්ලේ කිසිම කොටසක් හෝ පොදු මාර්කට්ටුවක් ඇතුළත හෝ එහි අවට තිබෙන්නාවූද නගර සභාවට අයිතිවූද ලීබඩු හෝ ලාම්පු හෝ වෙන දේපල පලුදු කිරීම හෝ විරූප කිරීම, හෝ

(ආ) පොදු මාර්කට්ටුවේ ප්‍රයෝජනය සඳහා සපයා ඇති වතුර අපිරිසිදු කිරීම හෝ නරක් කිරීම හෝ අපතේ යැවීම හෝ ඒ වතුරෙන් තමාගේ ශරීරය හෝ කිසිම සතකු හෝ ඇඳුම් හෝ බඩු සේදීම, හෝ

(ඇ) මාර්කට්ටුවට අයිති භූමිභාගය ඇතුළට කිසිම බල්ලකු හෝ රථවාහනයක් ගෙනීම,

නොකළ යුතුය.

13. (1) පොදු මාර්කට්ටුවක කඩයක් හෝ බිමක් හෝ බංකුවක් බුක්ති විඳීම සඳහා ගෙවිය යුතු බදු හෝ ගාස්තු පිළිබඳ ලැයිස්තුවක් සභාපතිතුමා විසින් ඒ මාර්කට්ටුවේ කාටත් පෙනෙන තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය.

(2) මාර්කට්ටු පාලකයා විසින් හෝ බදුකාරයා විසින් හෝ බදු හෝ ගාස්තු අයකිරීම පිණිස බදුකාරයා විසින් පත් කළ කිසිවකු විසින්—

(අ) යථෝක්ත ලැයිස්තුවෙහි බද්ද හෝ ගාස්තුව වශයෙන් සඳහන් මුදලට වඩා වැඩි මුදලක් ඉල්ලීම හෝ ගැනීම, හෝ

(ආ) තමා කෙරෙහි පවරා තිබෙන්නාවූ හෝ තමාට දී තිබෙන්නාවූ යම් බලයක් ක්‍රියාවේ යෙදීමක් හෝ රාජකාරියක් කිරීම් වශයෙන් අගවා කිසිවකු සම්බන්ධයෙන් නුසුදුසු ලෙසින් ක්‍රියා කිරීම හෝ කිසිවකු කරදරයකට භාජන කිරීම,

නොකළ යුතුය.

14. ඕනෑම බද්දක් හෝ ගාස්තුවක් පිළිබඳ ඕනෑම ආරවුලක් ගැන සෝදිසිකර බලා යුක්තිසහගතයයි තමාට පෙනීයන අණවක් කිරීමට සභාපතිහට බලය තිබිය යුතුය.

15. (1) සභාපතිහට හෝ ඔහු විසින් විධිවූ පරිදි බලය පවරන ලද වෙන ඕනෑම නිලධාරියකුට පොදු මාර්කට්ටුවක් පරීක්ෂා කිරීමටත් එහි ඕනෑම කඩයක් හෝ බංකුවක් හෝ බිමක් පාවිච්චි කරන හෝ බුක්ති විඳින ඕනෑම කෙනෙකුගේ අවසර පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කිරීමට දෙන ලෙස නියම කිරීමටත් බලය තිබිය යුතුය.

(2) සභාපතිහු හෝ ඔහු විසින් විධිවූ පරිදි බලය පවරනලද යම් බලය පවරනලද එවැනි නිලධාරියකු ඒ අවසර පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කිරීමට දෙන ලෙස කියා සිටි විගාම ඒ අවසර පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීම එය දරන ඕනෑම කෙනෙකුගේ යුතුකම විය යුතුය.

### පුද්ගලික මාර්කට්වු හා බලය ලත් වෙන ස්ථාන

16. (1) කොයි පොදු මාර්කට්ටුවක වත් වෙළෙඳ ප්‍රදේශය ඇතුළත කිසිවකු විසින් ඒ මාර්කට්ටුව හැර වෙන ඕනෑම ස්ථානයක වත් තබාගෙන කිසිම මසක් හෝ කුකුළු, තාරා ගණයට අයිති සතකු හෝ මාලු වර්ගයක් හෝ පලතුරක් හෝ එළවළුවක් නොවික්ක යුතුය; නැතහොත් විකිණීමට ඉදිරිපත් නොකළ යුතුය.

එනමුදුවුවත් මේ උපනීතියේ ඉහත සඳහන් විධිවිධාන—

(අ) වෙළඳාම් කිරීම පිණිස නියම ස්ථානයක් නැත්තාවූ හෝ මහ පාරේ හෝ සෙසු පොදු ස්ථානවල තබාගෙන වෙළෙඳාම් නොකොට නැතින් නැන ගොස් වෙළෙඳාම් කරන්නාවූ වෙළෙඳුන් කරන කුකුළු, තාරා ගණයේ සතුන් විකිණීම හෝ පලතුරු විකිණීම හෝ එළවළු විකිණීම, නැතහොත්

(ආ) බලපත්‍රයක් ඇත්තාවූද නැතින් නැන ගොස් වෙළෙඳාම කරන්නාවූද වෙළෙඳුන් මාර්කට්ටු ප්‍රදේශය ඇතුළත කරන මාලු විකිණීම, නැතහොත්

(ඇ) බත් කඩයක හෝ තේ, කෝපි කඩයක බලපත්‍රකාරයා වෙත අයට ඒ ස්ථානයේදීම අනුභව කිරීම සඳහා කරන පලතුරු විකිණීම, නැතහොත්

(ඈ) කවරකු විසින් වුවත් කරන කුරුම්බා විකිණීම, නැතහොත්

(ඉ) පොදු මාර්කට්ටුව හැර වෙන ඕනෑම ස්ථානයකදී කරන ඌරු මස් විකිණීම හෝ පලතුරු විකිණීම හෝ එළවළු විකිණීම

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය.

මේ ඡේදයේ "බලපත්‍රයක් ලත් ස්ථානය" යන්නෙන් අදහස් කරන්නේ සභාපතිහු විසින් දෙන ලද බලපත්‍රයකින් බලය පවරන ලද ඕනෑම ස්ථානයකි.

(2) (1) (ඔ) වැනි ඡේදයේ සඳහන් හැම බලපත්‍රයක්ම—

(අ) මෙහි සඳහන් "ආ" උපලේඛනයේ සඳහන් පෝරමයේ ප්‍රකාරයට විය යුතුය.

(ආ) එසේම බලපත්‍රයේ දක්වන පරිදි මාස එකකට වඩා අඩු නොවන්නාවූද මාස දොළහකට වඩා වැඩි නොවන්නාවූද කාලපරිච්ඡේදයකට වලංගුවිය යුතුය.

(3) නගර සභාව නියම කරන ගාස්තුවක් ගෙවන තුරු (1) (ඔ) වැනි ඡේදය යටතේ බලපත්‍රයක් නොදිය යුතුය.

(4) හැම බලපත්‍රකාරයාම විසින් තමාගේ නම හා තම වෙළෙඳ අතවැසියන්ගේ නම් නගරසභා කාර්යාලයේ ලියාපදිංචි කරනැබිය යුතුය.

(5) නගරසභා කාර්යාලයේ නම ලියාපදිංචි නොකළ කිසිම වෙළඳ අනවැසියකු බලය ලත් කිසිම ස්ථානයක කිසිම වෙළෙඳාමකට සහභාගි නොවිය යුතුය.

17. සභාපතිහු විසින් දෙනලද බලපත්‍රක් ඇතොත් මිස නැත්නම් කිසිවකු විසින් වෙළෙඳ ප්‍රදේශය ඇතුළත නැතින් නැන ගොස් මස් හෝ මාලු නොවිකිණිය යුතුය. කිසිම වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන කෙනෙකුට ඒ බලපත්‍රයක් නොදිය යුතුය.

### සාමාන්‍ය

18. පොදු වධශාලාවක නොමරණ ලද කිසිම සතෙකුගේ මළකුණක් හෝ මසක් නගර සභා පාලන ප්‍රදේශ සීමාව ඇතුළත වූ කිසිම පොදු මාර්කට්ටුවකට හෝ පුද්ගලික මාර්කට්ටුවකට හෝ වෙන ස්ථානයකට ගෙනඒම හෝ විකිණීම පිණිස එහි තැබීම හෝ එහිදී විකිණීම නොකළ යුතුය.

එහෙත් පිටරටින් මෙරටට ගෙනෙන ලද්දවූද ශීත කරන ලද්දවූද මස් හෝ දඩ මස් විකිණීම සම්බන්ධයෙන් මේ උපනීතිය අදාළ නොවේ.

19. (1) පොදු මාර්කට්ටුවේ කඩයක් සම්බන්ධයෙන් අවසර පත්‍රයක් දරණ කාගේත් යුතුකම විය යුත්තේ මහජනයාට වුවමනාවන බඩුවක් ගැනීම සඳහා ඒ කඩය පෙරවරු 6 සිට පස්වරු 9 දක්වා ඇරලා තැබීමය.

(2) ඒ අවසර පත්‍රයක් දරණ කවරකු වත් විසින් සභාපතිතුමාගෙන් ලිඛිත අවසරයක් ලබා නොගෙන මහජනයාට බඩු විකිණීම පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ඕනෑකමින්ම නොකළ යුතුය.

20. (1) මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන අවසර පත්‍රය දරන්නා දෙවැනි වරට හෝ ඊට පසුව (නඩු අසන අධිකරණ බලය ඇති) උසාවියකින් වරදකාරයා කරනු ලැබූ විට මේ උපනීති යටතේ නිකුත් කරනලද ඕනෑම අවසර පත්‍රයක් අවලංගු කිරීමට ඒ උසාවියට බලය තිබිය යුතුය.

(2) සභාපතිහට—

(අ) අවසර පත්‍රය අවලංගු කරනු ලැබුවාවූ හෝ මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන වරදකාරයා කරනු ලැබුවාවූ කිසිවකුට අලුත් අවසර පත්‍රයක් දීමට, හෝ

(ආ) මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකිරීම ගැන වරදකාරයා කරනු ලැබුවාවූ කිසිවකුට අලුත් ප්‍රවේශ පත්‍රයක් දීමට

බැරිය කීමට බලය ඇත්තේය.

21. සභාපතිට හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන නගර සභාවේ ඕනෑම නිලධාරියකුට ඕනෑම මාර්කට්ටුවක් පරීක්ෂා කොට එහි වෙළඳාම පිණිස ඉදිරිපත් කර තිබෙන්නාවූ හෝ තබා තිබෙන්නාවූ ඕනෑම ආහාර ද්‍රව්‍යයක් අපථ්‍යයයි හැඟිගියොත් ඒ ආහාර ද්‍රව්‍යය අල්ලා තහනම් කරගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිහු වෙත ගෙනයෑමට බලය තිබිය යුතුය. එසේ අල්ලා තහනම් කරන ලද ඕනෑම ආහාර ද්‍රව්‍යයක් අපථ්‍යයයි ඒ වෛද්‍ය නිලධාරිහු සහතික කළොත් එය යමෙකුගෙන් අල්ලාගන්නා ලද්දේ නම් ඔහුට කිසිම වන්දි මුදලක් නොගෙවා ඒ ද්‍රව්‍ය විනාශ කරදැමිය හැකිය.

22. කිසිම මාර්කට්ටු පාලකයකුට හෝ මාර්කට්ටුව පාලනය කිරීම පිණිස හෝ එහි බදු හෝ ගාස්තු එකතු කිරීම පිණිස නගර සභාව විසින් පත්කළ කිසිම නිලධාරියකුට හෝ පුද්ගලයකුට රාජකාරිය කිරීමේදී කිසිවකු විසින් විරුද්ධකමක් හෝ බාධාවක් හෝ කරදරයක් හෝ පීඩාවක් නොකළ යුතුය.

23. මේ උපනීතිවලින් කවරක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවයකදීම රුපියල් පනහකට වැඩි නුවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම ගැන සිහිපත් කරවා සභාපතිහු දන්වීම් පතක් යැවූ පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එලෙස කඩකරගෙන යන එක් එක් දවසකට රුපියල් දහයකට වැඩි අතිරේක දඩක් ගැසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

## "අ" උපලේඛනය

### "අ" පෝරමය

### 3 (1) වැනි උපනීතිය

ගෙවූ ගාස්තුව—රුපියල් :————.

ගෙවූ ගාස්තුව : රුපියල්————.

මෙහි පිටපැත්තේ සඳහන් කොන්දේසිවලට යටත් කොට———— වැනි දිනයෙන් අවසන්වන මාසය/මාස————ක්වූ කාලපරිච්ඡේදයේදී————මාර්කට්ටුවේ————වෙළඳාම් කිරීම සඳහා අංක ————දරණ කඩය/බිම බුක්තියවිඳීමට————පදිංචි————ට මෙයින් අවසර දෙමි.

————,
නගර සභාවේ සභාපති.

### පෝර්මය පිටපැත්තේ සඳහන් කොන්දේසි

(1) හුරතල් සතුන් හා කුරුල්ලන් කඩයට/බිමට ගෙනඒම හෝ එහි තබාගැනීම නොකළ යුතුය.

(2) රාත්‍රී 9 යෙන් පසු කඩයේ/බිමේ ගිනි ගොඩවල් හෝ පහන් නොදල්විය යුතුය.

(3) රාත්‍රී 9 යෙන් පසු කිසිවකු කඩයේ හෝ බිමේ නැවතී නොසිටිය යුතුය.

(4) ඕනෑම දවසක රාත්‍රී 9ත් උදේ 6ත් අතර කාලය ඇතුළත කඩයේ/බිමේ තබා තිබෙන කිසිම බඩුවක් ගැන (මේ අවසර පත්‍රය දරන්නාට) වගකියනු නොලැබේ.

(5) මේ කොන්දේසි කඩකළොත් මේ උපනීති යටතේ දෙන වෙන ඕනෑම දඬුවමක් පමණක් නොව, මේ අවසර පත්‍රය දරන්නාගේ බද්ද වහාම අවසන්වීමට පුළුවන්කමද තිබිය යුතුය.

### "ආ" පෝරමය

### 3 (2) වැනි උපනීතිය

### බුක්තිවිඳීම පිළිබඳ ප්‍රවේශ පත්‍රය

ගෙවූ ගාස්තුව : රුපියල්————.

මෙහි පිටපැත්තේ සඳහන් කොන්දේසිවලට යටත්කොට 195————මාසයේ———වැනි දින පෙරවරු 6යේ සිට රාත්‍රී 9 දක්වා අතර කාලය තුළ————මාර්කට්ටුවේ————වෙළඳාම පිණිස අංක————දරණ කඩකක්කිය/බිම බුක්තිවිඳීමට————පදිංචි ————ට මෙයින් අවසර දෙමි.

————,
සභාපතිහුගේ අණ පරිදි.

————,
ප්‍රවේශ පත්‍රය නිකුත්කරන නැනැත්තාගේ අත්සන.

පෝරමය පිටපැත්තේ සඳහන් කොන්දේසි

(1) පුරතල් සතුන් හෝ කුරුල්ලන් කඩයට/බිමට ගෙනඊම හෝ එහි තබාගැනීම නොකළ යුතුය.

(2) රාත්‍රී 9 යෙන් පසු කඩයේ/බිමේ ගිනිගොඩවල් හෝ පහන් නොදැල්විය යුතුය.

(3) රාත්‍රී 9 යෙන් පසු කිසිවකු කඩයේ/බිමේ නැවතී නොසිටිය යුතුය.

(4) ඕනෑම දවසක රාත්‍රී 9ත් උදේ 6ත් අතර කාලය ඇතුළත කඩයේ/බිමේ හැර තිබෙන කිසිම බඩුවක් ගැන (මේ අවසර පත්‍රය දරන්නාට) වගකියනු නොලැබේ.

(5) මේ කොන්දේසි කඩකළොත් මේ උපනීති යටතේ දෙන වෙන ඕනෑම දඬුවමක් පමණක් නොව, මේ අවසර දරන්නාගේ බද්ද වහාම අවසන්වීමට පුළුවන්කමද තිබිය යුතුය.

"ඉ" උපලේඛනය

16 වැනි උපනීතිය

බලපත්‍ර පෝරමය

ගෙවූ ගාස්තුව—රුපියල් :————.

————නගර සභාවේ සභාපති ධුරන්දර————වන මම, වරිපනම් අංක——දරණ ස්ථානයෙහි————විකිණීමට————ට හෝ ඔහුගේ (ලියාපදිංචි කරනලද) වෙළෙඳ අතවැසියන්ට මේ බලපත්‍රයෙන් බලය දෙමි.

———— දිනය තෙක් මේ බලපත්‍රය වලංගුව පැවතිය යුතුය.

————,
නගර සභාවේ සභාපති.

XVII වැනි කාණ්ඩය

පුස්තකාලයන් පිළිබඳ උපනීති

1. පද සම්බන්ධයෙන් වෙන තේරුමක් අවශ්‍ය වුවහොත් මිස නැත්නම් පුස්තකාලයන් පිළිබඳ මේ උපනීතිවල "පුස්තකාලයාධිපති" යන්නෙන් අදහස් කරන්නේ පුස්තකාලය භාරව සිටීම පිණිස නගර සභාව විසින් පත්කළ තැනැත්තාය. එසේම ඔහුගේ සහකාර යෙද් එයින් අදහස් කරනු ලැබේත්.

2. නගර සභාව විසින් පිහිටුවාගෙන පවත්වන පොදු පුස්තකාලය—

(අ) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයකින්ද,

(ඉ) ආශ්‍රය පුස්තකාලයකින්ද,

(උ) කියවීම් ශාලාවකින්ද,

සමන්විත විය යුතුය.

3. (1) පොදු පුස්තකාලයේ පරිපාලනය හා සාමාන්‍ය පාලනය වූකලී මින් පසු "කාරක සභාවය" යි ව්‍යවහාර වන්නාවූද—

(අ) නගර සභාවේ තත්කාල සභාපති තැන,

(ඉ) නගර සභාව විසින් තෝරා පත්කරන තිදෙනකුට වැඩි නුවූ ඒ සභාවේ සාමාජිකයෝ,

(උ) නගර සභාවේ රැස්වීමකදී ඒ සභාව විසින් තෝරා පත්කරගනු ලබන්නාවූද නගර සභා ප්‍රදේශය තුළ පදිංචිවූවන් අතර ප්‍රමුඛත්වයක් දරන්නාවූද පස් දෙනෙක් යන මොවුන් ගෙන් යුක්තවූද පුස්තකාලයීය කාරක සභාවක් කෙරෙහි පවරා තැබිය යුතුය.

(2) පොදු පුස්තකාලය භාරයේ සිටීමට පුස්තකාලයාධිපතියකු පත්කිරීමට නගර සභාවට බලය ඇත්තේය. එසේ පත්වන ඒ පුස්තකාලයාධිපති තැන ඒ පුස්තකාලය ඇතුළත සංවරය ආරක්ෂා කර ගැනීමට බැඳී සිටිය යුතුය.

4. (1) නගර සභාවේ සභාපතිතුමා ස්ථානාන්තර හේතුවෙන් ඒ කාරක සභාවේ සභාපතිතුමා විය යුතුවා පමණක් නොව, කාරක සභාවේ හැම රැස්වීමකම මූලාසනයද දැරිය යුතුය. යම් සභා රැස්වීමකට සභාපතිතුමා නාවොත් ඇවිත් සිටින සෙසු සාමාජිකයන් විසින් මූලාසනයට තෝරා ගන්නා සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

(2) යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දෙපක්ෂයෙන් දෙනලද ඡන්ද ගණන සමාන වුවහොත් ඕනෑම සභා රැස්වීමක මූලාසනය දරණ සාමාජිකයා විසින් තමාගේ ඡන්දයත් සභාපති වශයෙන් තමාට හිමි ඡන්දයත් දිය යුතුය.

5. සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුත් ගණපූරණයක් නොමැති (කාරක සභාවේ) මොනම රැස්වීමකදී වත් කිසිම කටයුත්තක් නොකළ යුතුය.

6. අවශ්‍යයයි හැඟී යන යම් යම් කොන්දේසිවලට යටත් කොට පොදු පුස්තකාලය ස්ථානයේ ඕනෑම කොටසක් පාවිච්චිකිරීමට ඕනෑම කෙනෙකුට අවසර දීමට හෝ ඒ තැනැත්තා පුස්තකාලයක් පිළිබඳ මේ උපනීතිවලින් යමක් කඩකර ඇතොත්, ඔහුට ඒ ස්ථානයේ කොයාම කොටසක් වත් පාවිච්චිකිරීමට අවසර දෙන්ට බැරිය කීමට කාරක සභාවට බලය තිබිය යුතුය.

පොත්පත් බැහැරට දෙන පුස්තකාලය

7. (1) කිසිවකු—

(අ) වයස අවුරුදු 14 කට වඩා අඩු නොවීම,

(ඉ) අකුරු කියවීමට හා ලිවීමට හැකිවීම,

(උ) නගරසභා ප්‍රදේශය ඇතුළත පදිංචිකාරයකු වීම හෝ එහි තමාගේ කාර්යාලයක් තිබීම හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබීම,

(එ) රුපියල් පහක මුදලක් පුස්තකාලයාධිපති තැන වෙත තැන්පත් කිරීම,

(ඔ) රුපියල් විසිපහකට නොඅඩු මාසික කුලියක් ගෙවන ගෙයක පදිංචිකාරයකු හෝ අයිතිකාරයකු විසින් නිර්දේශ කරනු ලැබීම,

යන මේ සුදුසුකම්වලින් යුක්තව සිටියොත් මිස නැත් නම් (පොත්පත් බැහැරට දෙන) පුස්තකාලයක සාමාජිකයකු වශයෙන් ඇතුළත් නොකළ යුතුය.

(2) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයකු වශයෙන් ඇතුළත්වීමට කැමති කා විසිනුත් ඒ සඳහා පුස්තකාලයාධිපති තැනගෙන් පෝරමයක් ලබාගෙන අයදුම් පත ලියා පහත නම් සඳහන් අවතකු, එනම්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, හෝ

(ඉ) නගර සභාවේ සාමාජිකයකු, හෝ

(උ) කාරක සභාවේ සාමාජිකයකු, හෝ

(එ) භික්ෂුන් වහන්සේ නමක් හෝ ආගමික පූජකවරයකු, හෝ

(ඔ) වෛද්‍ය වෘත්තියෙහි හෝ නීතිඥ වෘත්තියෙහි යෙදී සිටින්නකු, හෝ

(ක) සමාදාන විනිශ්චයකාරයකු, හෝ

(ග) වාර්ෂික සිවිල් ලැයිස්තුවේ නම සඳහන් ආණ්ඩුවේ සේවකයකු,

(ජ) ද්විතීයික පාඨශාලාවක ප්‍රධානයකු, හෝ

(ට) රුපියල් එක්දහස් පන්සියයකට නොඅඩු වාර්ෂික පඩියක් ලබන නගර සභාවේ සේවකයකු

ලවා සහතික කරවාගත යුතුය.

(3) ඉල්ලුම් පත්‍රයක් සහතික කිරීමට මීට ඉහළින් ඡේදය යටතේ අයිතිවාසිකමක් තිබෙන කෙනෙකුට තමාගේ ඉල්ලුම් පත්‍රය සහතික කරවා ගැනීම අවශ්‍ය නොවිය යුතුය.

8. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයකු වශයෙන් ඇතුළත් කරගන්නා හැම පුද්ගලයකුටම පුස්තකාලයාධිපතිතුමා විසින් ප්‍රවේශ පත්‍ර දෙකක් දිය යුතුය. ඒ තැනැත්තාට ඒ එක් එක් ප්‍රවේශ පත්‍රය පිට පොතක් බැගින් ලබාගෙන බැහැරට ගෙනයෑමට පුළුවන් කම තිබිය යුතුය.

9. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයකු විසින් තමාට ලැබී තිබෙන ප්‍රවේශ පත්‍රයක් පිට ඒ පුස්තකාලයෙන් බැහැරට ගෙනයන ඕනෑම පොතක් ගැන වගකිව යුතුය.

10. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයකුට 8 වැනි උපනීතිය යටතේ දෙනලද ප්‍රවේශ පත්‍රයක් නැතිවූ විට ඒ බව ඒ සාමාජිකයා විසින් පුස්තකාලයාධිපතිහට වහාම දැන්විය යුතුය. ඒ පුස්තකාලයෙන් ඒ ප්‍රවේශ පත්‍රය පිට පොතක් ගෙන ගොස් නැති බැව් පුස්තකාලයාධිපතිහට ඒත්තුගියොත් ඒ සාමාජිකයාට ප්‍රවේශ පත්‍රයේ දෙවැනි පිටපතක් දීමට ඔහුට බලය ඇත්තේය. එහෙත්, ඒ ප්‍රවේශ පත්‍රය නැතිවූ බව තමාට දැන්වූ දිනයේ සිට යටත්පිරිසෙයින් තිස් දවසක් වත් පසුවී ඇතොත් මිස නැත්නම් පුස්තකාලයාධිපතිතුමා විසින් ප්‍රවේශ පත්‍රයේ දෙවැනි පිටපතක් නොදිය යුතුය.

11. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයකු ඉල්ලා ගෙන ගිය ඕනෑම පොතක්, ඉල්ලාගත් දිනයේ පටන් දහහතර දවසක කාලපරිච්ඡේදයක් ඇතුළතදී පුස්තකාලයාධිපතිහට ආපසු බාරදිය යුතුය. වෙන සාමාජිකයකුට ඒ පොත වුවමනා නොවේ නම් තව දවස් දහහතරක කාලපරිච්ඡේදයකට ඒ පොත ඉල්ලා ගැනීමට ඒ සාමාජිකයාට ඉඩ දෙන්ට පුස්තකාලයාධිපතිහට පුළුවන් කම තිබේ.

12. 11 වැනි උපනීතියේ කී දහහතර දවස ඇතුළත පුස්තකාලයාධිපතිහට පොතක් ආපසු බාරදීම සාමාජිකයකු පැහැර හැරිය විට ඒ පොත බාරදීමට ප්‍රමාදවන එක් එක් දවසට සත දහය බැගින් වූ දඩයකට ඔහු යටත් විය යුතුය.

13. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඉල්ලාගෙන ගිය කවර පොතක් වුවත් 11 වැනි උපනීතියේ කී දහහතර දවසේ කාල පරිච්ඡේදය ඉකුත්වී තිස් දවසක් ඇතුළත සාමාජිකයකු ආපසු බාර නුදුන්නොත් ඒ පොත නැතිවූවා කොට සැලකිය යුතුය.

14. සාමාජිකයකු ඉල්ලාගෙන ගිය පොතක් නැතිවූ කල හෝ නැති වූවා කොට සැලකූ කල ඒ සාමාජිකයා ඒ වෙනුවට අලුත් පොතක් සැපයීම සඳහා යන වියදම ගෙවීමට බැඳී සිටිය යුතුය.

15. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඉල්ලාගෙන ගිය කිසිම පොතකට සාමාජිකයකු විසින් කිසිම අන්දමකින් පලුද්දක් හෝ හානියක් නොකළ යුතුය.

16. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඉල්ලා ගෙන යාමට අදහස් කරන ඕනෑම පොතකට යම් පලුද්දක් හෝ හානියක් සිදුවී තිබෙතොත් ඒ බව පුස්තකාලයාධිපතිහට දන්වීම හැම සාමාජිකයකුගේම යුතුකම විය යුතුය. ඒ පලුද්ද හෝ හානිය පුස්තකාලයාධිපතිහට නොදන්වුව හොත් ඒ පොත කිසිම පලුද්දක් හෝ හානියක් නැතිව ඔහුට දුන්නාකොට සැලකිය යුතුය.

17. සාමාජිකයකු ආපසු ගෙනැවිත් බාරදුන් පොතකට වෙන අයට දීමට බැරි තරමට පලුදු හෝ හානි සිදුවී තිබේයයි පුස්තකාලයාධිපතිහට ඒත්තුගියොත් ඒ පොත වෙනුවට අලුත් පොතක් සැපයීමට යන වියදම ගෙවීමට ඒ සාමාජිකයා බැඳී සිටිය යුතුය. ඒ පොත වෙනුවට අලුත් පොතක් ලැබුණු විට, "පොදු පුස්තකාලයෙන් පලුදුවූ පොතක් වශයෙන් විකුණන ලදී" යන මේ වචන ඇති මුද්‍රාව පිහිටුවා පලුදුවූ ඒ පොත ඒ සාමාජිකයාට දිය යුතුය.

18. (1) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඉල්ලාගත් කිසිම පොතක් කිසිම සාමාජිකයකු විසින් වෙන කිසිවකුට නොදිය යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදයේ විධිවිධාන කඩකරන කොයි සාමාජිකයකුගේ වුවත් ආධාන මුදල (deposit) නගර සභාව සන්තක කළ යුතුවාත් හැර ඔහුගේ (පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ) සාමාජිකත්වයද අහෝසිවිය යුතුය.

19. (1) වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන තැනැත්තකු පාවිච්චිකළ බව තමා දන්නා කිසිම පොතක් සාමාජිකයකු විසින් (පොත්පත් බැහැරට දෙන) පුස්තකාලයට ආපසු බාර නොදිය යුතුය.

(2) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයකු ඉල්ලාගත් පොතක් යම් වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන කවරකු වුවත් පාවිච්චි කළොත් ඒ පොත විනාශකර දැමිය යුතුය. ඒ පොත වෙනුවට අලුත් පොතක් සැපයීමට යන වියදම පුස්තකාලයාධිපතිහට ඒ සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

20. එකම පොත ඉල්ලා (පොත්පත් බැහැරට දෙන) පුස්තකාලයේ සාමාජිකයන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු අතර විවාදයක් ඇතිවූ කල පුස්තකාලයාධිපතිහු විසින් ඒ විවාදය විසඳිය යුතුය.

21. වෙන සාමාජිකයකු ඉල්ලාගෙන ගොස් ඇති පොතක් ඉල්ලා ගන්ට ඕනෑවී සිටින ඕනෑම සාමාජිකයකු තමාගේ නමත් ඒ පොතේ නමත් (ඒ සඳහා තබා තිබෙන) ලේඛනයේ ලකුණු කළ යුතුය. ඒ පොත ඉල්ලාගෙන ගිය සාමාජිකයා එය ආපසු ගෙනැවිත් බාරදුන් විට පුස්තකාලයාධිපතිහු ලේඛනයේ නම ලකුණු වී ඇති සාමාජිකයාට එය දිය යුතුය. එකම පොත ඉල්ලා ගැනීම සඳහා සාමාජිකයන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු ලේඛනයේ නම් ලකුණු කර ඇති විට ලේඛනයේ නම් ලකුණු කර තිබෙන අනුපිළිවෙලට ඔවුන්ට එය දිය යුතුය.

22. යම් සාමාජිකයකු නගරසභා ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටීම හෝ තමාගේ කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් තබාගැනීම නතරකළ විට (පොත්පත් බැහැරට දෙන) පුස්තකාලය සම්බන්ධයෙන් ඔහුගේ සාමාජිකත්වය අහෝසිවිය යුතුය. එපමණක්ද නොව, 8 වැනි උපනීතිය යටතේ ඔහුට දෙනලද ප්‍රවේශ පත්‍ර දෙක පුස්තකාලයාධිපතිහු වෙත ආපසු එවීමද ඔහු විසින් කළ යුතුය.

23. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයට සාමාජිකයකුගෙන් අයවිය යුතු මුදලක් තිබෙතොත්, 7 (1) (එ) වැනි උපනීතිය යටතේ ඔහු ගෙවා ඇති රුපියල් පහේ ආධානයෙන් අඩුකරගෙන ඉතිරි මුදල හෝ එසේ මුදලක් අයවෙන්ට නැතොත්, මුළු ආධානයම ඔහුගේ සාමාජිකත්වය නතර වීමේදී ඔහුට ආපසු දිය යුතුය.

24. පොත්පත් බැහැරට දෙන පුස්තකාලය වූකලී ඉරිදා දවස්ය, ආණ්ඩුවේ නිවාඩු දවස්ය, (යටත්පිරිසෙයින් දවස් හතකට කලින් වත් සාමාජිකයන්ට දැනුම් දී) තොග හරිවැරදි බැලීමට කාරක සභාව නියම කරන වෙන යම් යම් දවස්ය, යන මේ දවස්වලදී හැර, දිනපතා පෙරවරු 9ත් පස්වරු 6ත් කාලය තුළ ඇරලා තැබිය යුතුය.

### ආශ්‍රය පුස්තකාලය

25. පහත පෙනෙන දේ, එනම්—

(අ) පුස්තකාලය පාවිච්චි කිරීම සඳහා පුස්තකාලයාධිපතිහුගෙන් අවසර ලබාගැනීම,

(ආ) ආශ්‍රය පුස්තකාලයෙහි තබා ඇති ලේඛනය අත්සන් කිරීම, කරලා තිබෙතොත් මිස නැත්නම් කිසිවකු විසින් ආශ්‍රය පුස්තකාලය පාවිච්චි නොකළ යුතුය.

26. (අ) අකුරු ලිවීම හා කියවීම පුළුවන්වූද,

(ආ) නගර සභා ප්‍රදේශය ඇතුළත පදිංචිකාරයකු වූද,

(ඇ) වයස අවුරුදු දහහතරකට අඩු නුවූද

ඕනෑම කෙනෙකුට ආශ්‍රය පුස්තකාලය පාවිච්චි කිරීමට අවසර දීමට පුස්තකාලයාධිපතිහට බලය තිබේ.

27. බැලීම සඳහා තමාට දුන් කිසිම පොතක්, කිසිවකු විසින් ආශ්‍රය පුස්තකාලයෙන් පිටතට ගෙනයායුතු නොවේ.

28. (1) මේ උපනීතියේ (2) වැනි ඡේදයේ වූ විධිවිධානවලට යටත්ව, ඉරිදා දවස්වල හෝ ආණ්ඩුවේ නිවාඩු දවස්වල හැර වෙන ඕනෑම දවසක පෙරවරු 8 සිට දවල් 12 දක්වාත් පස්වරු 2.30 සිට පස්වරු 6.30 දක්වාත් ආශ්‍රය පුස්තකාලය ඇරලා තිබිය යුතුය.

(2) යෝජනාවක් ඉදිරිපත්කොට සම්මත කරගෙන—

(අ) මේ උපනීතියේ (1) වැනි ඡේදයේ සඳහන් කාලය දීර්ඝ කිරීමට,

(ආ) යෝජනාවේ සඳහන් පරිදි ඉරිදා දිනයක හෝ ආණ්ඩුවේ නිවාඩු දවස්වල ඒ කාලය තුළ ආශ්‍රය පුස්තකාලය ඇරලා තැබීම වීමට කාරක සභාවට නියම කිරීමට, හෝ

(ඇ) තොග හරිවැරදි බැලීම සඳහා නගර සභාව නියම කරන දවස්වලදී ආශ්‍රය පුස්තකාලය වැසීමට කාරක සභාවට නියම කිරීමට

නගර සභාවට බලය තිබේ.

### කියවීම්ශාලාව

29. පහත පෙනෙන දේ, එනම්:—

(අ) පුස්තකාලයාධිපතිහුගෙන් කියවීම් ශාලාව පාවිච්චි කිරීමට අවසර ලබා ගැනීම,

(ආ) කියවීම් ශාලාවේ තබා තිබෙන ලේඛනය අත්සන් කිරීම යන මේ කටයුතු කරලා තිබෙතොත් මිස නැත්නම් කිසිවකු විසින් කියවීම් ශාලාව පාවිච්චි නොකළ යුතුය.

30. (අ) අකුරු ලිවීම හා කියවීම පුළුවන්වූද,

(ආ) නගර සභා ප්‍රදේශය ඇතුළත පදිංචිකාරයකුවූද,

(ඇ) වයස දහහතරට අඩු නුවූද,

ඕනෑම කෙනෙකුට කියවීම් ශාලාව පාවිච්චි කිරීමට අවසර දීමට පුස්තකාලාධිපතිහට බලය තිබේ.

31. (1) මේ උපනීතියේ (2) වැනි ඡේදයේ වූ විධිවිධානවලට යටත්ව, ඉරිදා දවස් හෝ ආණ්ඩුවේ නිවාඩු දවස් හැර වෙන ඕනෑම දවසක පෙරවරු 8 සිට දවල් 12 දක්වාත් පස්වරු 2.30 සිට පස්වරු 6.30 දක්වාත් කියවීම් ශාලාව ඇරලා තැබිය යුතුය.

(2) යෝජනාවක් ඉදිරිපත් කොට සම්මත කරගෙන—

(අ) මේ උපනීතියේ (1) වැනි ඡේදයේ සඳහන් කාලය දීර්ඝ කිරීමට, හෝ

(ආ) යෝජනාවේ සඳහන් පරිදි ඉරිදා දිනයක හෝ ආණ්ඩුවේ නිවාඩු දවස්වල කියවීම් ශාලාව ඇරලා තැබබවීමට කාරක සභාවට නියම කිරීමට, හෝ

(ඇ) තොග හරිවැරදි බැලීම සඳහා නගර සභාව නියම කරන දවස්වලදී කියවීම් ශාලාව වැස්සවීමට කාරක සභාවට නියම කිරීමට නගර සභාවට බලය තිබේ.

32. කියවීම් ශාලාවේ තබා තිබෙන්නාවූ හෝ ඊට අයිතිවූ කිසිම ප්‍රවෘත්ති පත්‍රයක් හෝ සඟරා කලාපයක් හෝ සඟරාවක් හෝ සිතියමක් හෝ ලියවිල්ලක් හෝ අත් පිටපතක් හෝ වෙන මොනම දෙයක් වත් කිසිවකු විසින් කියවීම් ශාලාවෙන් පිටතට ගෙන නොගිය යුතුය.

### සාමාන්‍ය

33. ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ වසංගත රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ ලඟදී පෙළුනාවූ හෝ ඒ රෝගයකින් පෙළෙන කෙනෙකුට ලඟදී සාත්තු කළාවූ කිසිවකු විසින් ඒ රෝගය බෝවීමට හා රෝග බීජයන් මෙරීමට ගතවන කාල පරිච්ඡේදය පසුවන තෙක් පොදු පුස්තකාලයට අයිති ස්ථානයට ඇතුල් නොවිය යුතුය.

34. කිසිවකු විසින්—

(1) පොදු පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළත හෝ ඒ අසල නොමනා අන්දමින් හැසිරීම හෝ ගැහැටක් ඇතිවන කිසිම දෙයක් කිරීම, හෝ

(2) පොදු පුස්තකාලය තුළ හෝ ඒ අසල වූ නගර සභාවේ ගොඩනැගිල්ලේ කිසිම කොටසකට හෝ කිසිම දේපලකට පලුද්දක් කිරීම හෝ එය මොන අන්දමකින් වත් විරූප කිරීම, හෝ

(3) තමා ගැන පිළිගත හැකි විස්තරයක් කියන්ට නැතිව ඒ පුස්තකාලය වැසූ පසු ඒ පුස්තකාලයට අයිති ස්ථානයෙහි නතරවී සිටීම හෝ ඔබමොබ හැසිරීම, හෝ

(4) පොදු පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළතදී දුම්බීම හෝ කෙළ ගැසීම, හෝ

(5) පොදු පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළතදී දදු කෙළීම හෝ කඩදාසි කොළවලින් සූදු කෙළීම හෝ කිසිම ක්‍රීඩාවක් කිරීම, හෝ

(6) පුස්තකාලය ඇතුළේදී කෑගැසීමෙන් හෝ සින්දු කීමෙන් හෝ වෙන යම් ඝෝෂාවක් කිරීමෙන් පොදු පුස්තකාලය පාවිච්චි කරන්නන්ට කරදර කිරීම, හෝ

(7) අපිරිසිදු ලෙසින් පොදු පුස්තකාලයට අයිති ස්ථානයට ඇතුල් වීම, හෝ

(8) පොදු පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළට බල්ලකු හෝ වෙන යම් සතකු ගෙනඊම, හෝ

(9) පොදු පුස්තකාලයට අයිති ස්ථානයේ කිසිම කොටසක නිදාගැනීම හෝ කිසිම ආහාරයක් අනුභව කිරීම, හෝ

(10) මේ උපනීති යටතේ තමා වෙත පැවරී ඇති බලතල නීත්‍යානුකූල ලෙස පාවිච්චි කිරීමට පුස්තකාලයාධිපතිහට හෝ ඔහුගේ අණ පරිදි ක්‍රියා කරන අන් කිසිවකුට අවහිර කිරීම,

නොකළ යුතුය.

35. 32 වැනි උපනීතිය හෝ 33 වැනි උපනීතිය හෝ 34 වැනි උපනීතිය කඩකරන කොයි ප්‍රස්තාවයේදීත් රුපියල් පනහකට නොවැඩි දඩයකින් දඬුවම් දීමට පුළුවන් විය යුතුය.

## XVIII වැනි කාණ්ඩය

### මහජන සෞඛ්‍යය පිළිබඳ උපනීති

1. (1) වසංගත රෝගයකින් හෝ ස්ථානික වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන අයකු සිටින යම් ගෙයක හෝ ගොඩනැගිල්ලක පිට පැත්තේ කාටත් පෙනෙන හැකි සලකුණක් සවිකර තැබ්බවීමටත් ඒ සලකුණ තමාට සුදුසුයයි හැඟෙන කාලයක් තැබ්බවීමටත් සභාපතිහට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඕනෑම කෙනෙකුට බලය තිබිය යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදයේ කියා ඇති කිසිම සලකුණක් සභාපතිහුගේ අවසරය නැතිව කිසිවකු විසින් ඉවත් කිරීම හෝ මකා දැමීම නොකළ යුතුය.

2. 1 වැනි උපනීතියේ සඳහන් ඕනෑම රෝගයකින් පෙළෙන කවරකු වත් කිසිම මහ පාරකට හෝ අඩිපාරකට හෝ පොදු ස්ථානයකට හිතාමතාගෙනම නොයා යුතුය.

3. 1 වැනි උපනීතියේ සඳහන් ඕනෑම රෝගයකින් පෙළෙන ළමයකු හෝ වෙන කෙනෙකු, කිසිවකු විසින් හිතාමතාගෙනම පාරකට බැස්සවීම හෝ මහ පාරකට හෝ අඩිපාරකට හෝ පොදු ස්ථානයකට එක්ක යෑම නොකළ යුතුය.

4. මහජනයා නාන තැනක ගැණු පිරිමි දෙපක්ෂයෙන් එක් පක්ෂයකට පමණක් නගර සභාව විසින් වෙන් කරනලද කිසිම කොටුවකට අනිත් පක්ෂයේ කිසිවකු ඇතුළත් නොවිය යුතුය.

5. (1) ස්පර්ශයෙන් බෝවෙන ඕනෑම රෝගයකින් හෝ චර්ම රෝගයකින් හෝ වසංගත රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුනාවූ කිසිවකු ඒ රෝගය බෝවීමට හා රෝග බීජයන් බෙදීමට ගතවන කාලපරිච්ඡේදය පසුවන තෙක් මහජනයා නාන කිසිම ස්ථානයක නෑම හෝ මුහුණ කට සේදීම නොකළ යුතුය.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදයේ කී ඕනෑම කෙනෙකුගේ පාවිච්චිය සඳහා වුවමනාවන වතුර නීරෝගී පුද්ගලයකු විසින් ඇදලා පාවිච්චිය පිණිස පොදු ළිඳකින් හෝ මහජනයා නාන ස්ථානයකින් යටත් පිරිසෙයින් අඩි විසිපහක් වත් ඈතට ගෙන යා යුතුය.

6. කිසිවකු විසින් පොදු ළිඳකින් හෝ මහජනයා නාන ස්ථානයකින් වතුර ඇදීම පිණිස අපවිත්‍ර කිසිම භාජනයක් පාවිච්චි නොකළ යුතුය.

7. කිසිවකු විසින් :—

(1) පොදු ළිඳක හෝ මහජනයා නාන ස්ථානයක් වශයෙන් වෙන් කර තිබෙන කිසිම තැනක දමා හෝ ඒ අසළදී මොනම කරුණක් නිසා වත් කිසිම ද්‍රව්‍යයක් සේදීම හෝ සේදීමට සැලැස්වීම නොකළ යුතුය, නැතහොත්

(2) මහජනයා නාන කිසිම ස්ථානයකට මොනම කරුණක් නිසා වත් කිසිම සතකු දක්කාගෙන යෑම හෝ එළවීම හෝ අර ගෙනයෑම හෝ නොකළ යුතුය, නැතහොත්

(3) කිසිම පොදු ළිඳක හෝ මහජනයා නාන ස්ථානයක වතුර හෝ ඒ ළිඳ හෝ ස්ථානය පිහිටි භූමිය මොනම අන්දමකට වත් අපවිත්‍ර නොකළ යුතුය.

8. යෝජනාවක් ඉදිරිපත් කොට සම්මත කරගෙන යම්කිසි පොදු ළිඳකින් හෝ පිල්ලකින් හෝ වෙන ජලස්ථානයකින් නෑම හෝ මුහුණ කට සේදීම තහනම් කිරීමට නගර සභාවට බලය තිබිය යුතුය,

9. (1) සේදීම හෝ නෑම හෝ මනුෂ්‍යයන්ගේ බීමට වතුර ගෙන යෑම හෝ සතුන් නෑවීම සඳහා නගර සභාවට ස්වකීය අභිමත පරිදි ඕනෑම වැවක හෝ වෙන ජලස්ථානයක විශේෂ ස්ථාන වෙන් කිරීමට බලය තිබේ.

(2) මේ උපනීතියේ (1) වැනි ඡේදය යටතේ නගර සභාව විසින් වෙන් කර තිබෙන කිසිම ස්ථානයක් නියමිත කටයුත්තට හැර වෙන කිසිම කටයුත්තකට කිසිවකු විසින් පාවිච්චි නොකළ යුතුය.

10. (1) ගෙදර දොරේ කටයුතු සඳහා ජලය ලබා ගන්නා පොදු ළිඳකින් හෝ පිල්ලකින් හෝ උල්පොතකින් හෝ වෙන ජල ස්ථානයකින් අඩි පනහක් ඇතුළත කිසිම කසල වළක් හෝ මලමූත්‍ර වළක් හෝ ඌරු කොටුවක් හෝ ගාලක් හෝ හරක් මඩුවක් හෝ වළ වැසිකිළියක් හෝ නරක් වූ කාණුවක් හෝ තිබෙන්ට ඉඩ හැරීම වත් කිසිම ඉඩමකට වගාකිරීම සඳහා වරින් වර පෝර දැමීම වත් කිසිවකු විසින් නොකළ යුතුය.

(2) ගෙදර දොරේ කටයුතු සඳහා ජලය ලබාගන්නා පුද්ගලික ළිඳක් කිසිම මලමූත්‍ර වළකින් හෝ කසල වළකින් හෝ ඌරු කොටුවකින් හෝ ගාලකින් හෝ හරක් මඩුවකින් හෝ වළ වැසිකිළියකින් හෝ නරක්වූ කාණුවකින් හෝ වරින් වර පෝර දමා වගා කරන ඉඩමකින් අඩි පනහක් ඇතුළත කිසිවකු විසින් නොහෑරිය යුතුය.

11. වෙන කෙනෙකුට අයිති ඉඩමකට හෝ පොදු ස්ථානයකට හෝ මහපාරකට කිසිවකු විසින් කැලිකසල හෝ කුණුරොඩු හෝ ප්‍රයෝජනයට ගත නොහැකි අබලන් බඩු හෝ අන් කිසි දෙයක් විසි නොකළ යුතුය.

12. යම්කිසි සතකු මැරුණ විට ඒ වේලාවේ සිට පැ. දෙළහක් ඉකුත්වන්ට මත්තෙන් ඒ මළකුණ වළලා දැම්මවීම ඒ සතා අයිතිකාරයාගේ හෝ අයිතිකාරයෙක් නැත්නම් සතා මැරුණ ස්ථානයෙහි පදිංචිකාරයාගේ යුතුකම විය යුතුය.

13. නගර සභා ප්‍රදේශය ඇතුළත වූ ඕනෑම ගෙයක පදිංචිකාරයා විසින් හෝ පදිංචිකාරයෙක් නැත්තේ වී නම් ඒ ගෙයි අයිතිකාරයා විසින් ඒ ගෙට අයිති භූමිභාගය කුණුරොඩු හා වල්පැලෑටි ඉවත් කොට ශුද්ධපවිත්‍ර කර ස්වස්ථානුකූලව තබාගත යුතුය.

14. මලමූත්‍ර කිරීම සඳහා විශේෂයෙන් වෙන් කරනලද ස්ථානයකට හැර වෙන මොනම ස්ථානයකට වත් කිසිවකු විසින් මලමූත්‍ර පහ නොකළ යුතුය.

15. මහජන සෞඛ්‍යය පිළිබඳ මේ උපනීතිවලින් කවරක් වුවත් ඇති විධිවිධාන කඩකරන ඕනෑම කෙනෙකුට දඬුවමක් වශයෙන් රුපියල් විසිපහකට නොවැඩි දඩයක් ගැසීමට උසාවියට පුළුවන් කම තිබිය යුතුය.

## XIX වැනි කාණ්ඩය

### නිකරුණේ ඇවිදීම පිළිබඳ උපනීති

1. රාත්‍රී 11 හා උදේ 5 අතර කාලය ඇතුළත කිසිවකු එළියක් නැතිව කිසිම මහ පාරක නිකරුණේ සංචාරය නොකළ යුතුය. නියම වශයෙන් දල්වීමක් නොකර විදුලි පන්දමක් හෝ දල්විය හැකි වෙන උපකරණයක් නිකම් ළඟ තබාගැනීම එම උපනීතිය සඳහා ප්‍රමාණවත් යයි නොසැලකිය යුතුය.

2. 1වැනි උපනීතිය කඩකරන කොයි ප්‍රස්තාවයේදීත් රුපියල් දහයකට නොවැඩි දඩයකින් දඬුවම් දීමට පුළුවන් විය යුතුය.

## XX වැනි කාණ්ඩය

### කසල ශෝධනය පිළිබඳ උපනීති

1. කසල ශෝධන (අශූචි ඉවත් කිරීමේ) සේවයක් ඇති ප්‍රදේශයක් ඇතුළත පිහිටි ඕනෑම ඉඩමක අයිතිකාරයකුට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාගේ හෝ ඒ වෛද්‍ය නිලධාරිතු විසින් බලය පවරන ලද නිලධාරියකුගේ නිර්දේශය පිට තමා අනුමත කරන ප්‍රමාණයක හා වර්ගයක ජල මුද්‍රා වැසිකිළියක් හෝ පනිවටු වැසිකිළියක් තමා අනුමත කරන තැනක සාදා ගන්නා ලෙස දැන්වීම් පතකින් නියමකර යැවීමට සභාපතිහට බලය තිබේ.

2. කසල ශෝධන සේවයක් පිහිටුවා ඇති ප්‍රදේශයක් ඇතුළත පිහිටි ඕනෑම ඉඩමක තිබෙන 1වැනි උපනීතියේ කියා ඇති ප්‍රමාණයට හා වර්ගයට ගැළපෙන්ට සෑදූ ජල මුද්‍රා වැසිකිළියක් හෝ පනිවටු වැසිකිළියක් නොවන) ඕනෑම කසල වළක් හෝ වැසිකිළියක් ස්වස්ථානුකූල නොවන හෙයින් සෞඛ්‍යයට උපද්‍රවදායකය කියා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතු හෝ ඒ වෛද්‍ය නිලධාරිතු විසින් බලය පවරන ලද නිලධාරියකු සහතික කළොත් ඒ ඉඩම අයිතිකාරයාට ඒ කසල වළ හෝ වැසිකිළිය වසා දමන ලෙස නගර සභාවේ නිර්දේශය පිට දැන්වීම් පතකින් නියම කර යැවීමට සභාපතිහට බලය තිබේ,

3. 1 වැනි උපනීතියේ හෝ 2 වැනි උපනීතියේ කී දැන්වීම බාර දෙනු ලැබූ හැම අයිතිකාරයකුම ඒ දැන්වීමේ කියා ඇති නියමයන් එහි සඳහන් කාලපරිච්ඡේදය (මේ කාලපරිච්ඡේදය කොයි ප්‍රස්තාවය කදී වත් දෙමසට අඩු නොවිය යුතුය.) ඇතුළතදී ඉටුකළ යුතුය.

4. කසළ ශෝධන සේවයක් ඇති ප්‍රදේශයක් ඇතුළත පිහිටියාවූද, ජලමුත්‍රා වැසිකිළියක් හෝ පනිවටු වැසිකිළියක් තිබෙන්නාවූද ඉඩමක පදිංචිකාරයා විසින් ඒ වැසිකිළිය හැම කල්හිම ශුද්ධපවිත්‍ර කොට කිසිම කැඩුමක් බිඳුමක් නැතිව නිතරම සවස්ථානුකූලව තබාගත යුතුය.

5. නගර සභාවේ සේවය කරන කසළ ශෝධකයකු හැර අන් කිසිවකු කසළ ශෝධන සේවයක් ඇති ප්‍රදේශයක් ඇතුළත පිහිටියා වූ කිසිම වැසිකිළියකින් අශුචි ගෙනයෑම හෝ වෙන විදිය කින් අස් කිරීම නොකළ යුතුය.

6. දුප්පත්කම නිසා නගර සභාව විසින් නිදහස් කරනලද අයකු හැර, කසළ ශෝධන සේවයෙන් ප්‍රයෝජන ලබන ඕනෑම ඉඩමක අයිතිකරයා විසින් හෝ පදිංචිකාරයා විසින්, නගර සභාව වැසිකිළි යකට මෙපමණ කියා නියම කරන ගණනක් අනුව කසළ ශෝධන ගාස්තුවක් ගෙවිය යුතුය.

7. 6 වැනි උපනීතියේ කියා ඇති කසළ ශෝධන ගාස්තුව සභාපතිහට හෝ ඒ ගාස්තුව එකතුකිරීම පිණිස ඔහු විසින් ලියවිල්ලකින් විධිවූ පරිදි බලය පවරනලද ඕනෑම කෙනෙකුට ගෙවිය යුතුය.

### XXI වැනි කාණ්ඩය

#### කැළිකසළ ඉවත් කිරීම පිළිබඳ උපනීති

1. නගර සභා ප්‍රදේශයෙහි හැම තැනම හෝ එහි නියමිත කොටසක කැළිකසළ ඉවත්කිරීමේ සේවයක් පිහිටුවූ විට ඒ සේවය පිහිටුවා තිබෙන ප්‍රදේශයක් තුළ පිහිටි ඕනෑම ඉඩමක පදිංචිකාරයා විසින් තමාගේ ඉඩම අතුගා ඉවත දමන අළුය, කුණුරොඩුය, සෙසු කැලිකසළය යන මේවා එකතු කරන (සුදුසු පියනක් ඇත්තාවූද උස අඟල් විසිහතරකට අඩු නුවූද පතුලේ විෂ්කම්භය අඟල් දහහතර කට හා මුදුනේ විෂ්කම්භය අඟල් දහඅටකට අඩු නුවූද ලෝහවලින් සාදන ලද්දාවූ) කුණු බාල්දියකට දැමිම විය යුතුය.

2. 1 වැනි උපනීතියේ කී ඉඩමක පදිංචිකාරයා විසින්—

(අ) සභාපතිනු කලින් කල අණමෙර ගස්වා දන්වන හෝ වෙන යම් ක්‍රමයකින් දන්වන වේලාවල් අතර දින පතාම (1 වැනි උපනීතියේ කී) ඒ බාල්දිය ඒ ඉඩමෙන් පිටත පාරේ රථවාහන ගමනාගමනයට බාධා නොවන පරිදි අයිනකින් තැබීමට සැලැස්විය යුතුය.

(ආ) නගර සභාවේ කැළිකසළ ශෝධකයන් ඒ බාල්දිය හිස්කොට පැය බාගයක් ඇතුළතදී එය ඒ ස්ථානයෙන් අස් කර විය යුතුය.

3. 2 වැනි උපනීතියේ කී කාලවේලාවලදී මිස කිසිවකු විසින් 1 වැනි උපනීතියේ සඳහන් කිසිම බාල්දියක් කිසිම පාරක නො තැබිය යුතුය.

4. දුප්පත්කම නිසා නගර සභාව විසින් නිදහස් කරන ලද පදිංචි කාරයකු හැර කැළිකසළ ශෝධන සේවයෙන් ප්‍රයෝජන ලබන ඕනෑම ඉඩමක පදිංචිකාරයා විසින් නගර සභාව නියම කරන රේට් ගණනක් අනුව කසළ ශෝධන ගාස්තුවක් නගර සභාවට මාස් පතා ගෙවිය යුතුය.

5. සභාපතිනු බලය දී ඇතොත් මිස නැත්නම් කිසිවකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත වූ කිසිම විධියකින් හෝ පොදු ස්ථානය කින් දූවිලි, අළු, කුණු රොඩු ආදිය එකතු කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

6. 1 වැනි උපනීතිය හෝ 2 වැනි උපනීතිය හෝ 3 වැනි උපනීතිය හෝ 5 වැනි උපනීතිය කඩකරන කොයි ප්‍රස්තාවයේදීත් රුපියල් පනහකට නොවැඩි දඩයක් ගැසීමෙන් දඬුවම් කිරීමට පුළුවන්කම තිබිය යුතුය.

### XXII වැනි කාණ්ඩය

#### දියවැසිකිළි හා වැසිකිලි සාදා තබාගැනීම පිළිබඳ උපනීති

1. සභාපතිනුගෙන් අවසර පත්‍රයක් ලබාගෙන ඇතොත් මිස නැත් නම් යම් ස්ථානයක අයිතිකාරයා විසින් හෝ පදිංචිකාරයා විසින් ඒ ස්ථානයේ දියවැසිකිළියක් හෝ වැසිකිළියක් නොසෑදිය යුතුය.

2. 1 වැනි උපනීතිය යටතේ අවසර පත්‍රයක් ලබාගැනීමට කිසිවකු ඉල්ලීමක් කළ කල ඔහු සෑදීමට අදහස් කරන දියවැසිකිළියේ හෝ වැසිකිළියේ සැලැස්මක් හා වැනි විස්තර ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කරන්ට සභාපතිහට බලය තිබේ.

3. 1 වැනි උපනීතිය යටතේ සභාපතිනු දෙන ඕනෑම අවසර පත්‍රය කින් (නගර සභාව අනුමත කර ඇති වර්ගයේ) දියවැසිකිළියක් හෝ වැසිකිළියක් ඒ ස්ථානයෙහි ඒ අවසර පත්‍රයෙහි කියා ඇති තැනක සාදගැනීමට අයදුම්කරුට නියම කිරීමට සභාපතිහට බලය තිබේ.

4. සභාපතිනුගෙන් අවසර පත්‍රයක් ලබා නොගෙන හෝ 1 වැනි උපනීතිය යටතේ දෙනලද අවසර පත්‍රයේ සඳහන් නියමයන්ගෙන් යම්කට ප්‍රතිවිරුද්ධව යම් ඉඩමක දියවැසිකිළියක් හෝ වැසිකිළියක් සාදා තිබෙතොත්, ඒ ඉඩමේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා වෙත දැන්වීම් පතක් යවමින් ඒ දැන්වීමේ සඳහන් කාලපරිච්ඡේදය ඇතුළතදී ඒ දියවැසිකිළිය හෝ වැසිකිළිය වසා දමන ලෙස නියම කිරීමට සභාපතිහට බලය ඇත්තේය.

5. යම් ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා වෙත දැන්වීම් පතක් යවමින් ඒ දැන්වීමේ කියා ඇති ආකාරයට සාණු ඇතිව එහිම කියා ඇති තැන (නගර සභාව විසින් අනුමත කරනලද ප්‍රමාණයේ හා වර්ගයේ) දියවැසිකිළියක් හෝ වැසිකිළියක් ඒ ඉඩමේ සාදගන්නා ලෙස ඒ අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට නියම කිරීමට සභාපතිහට බලය ඇත්තේය.

6. ඕනෑම ඉඩමක තිබෙන දියවැසිකිළිය හෝ වැසිකිළිය—

(අ) සාදා තිබෙන ආකාරය හොඳ නැත කියා, හෝ

(ඉ) පාවිච්චි කරන කටයුත්තට නුසුදුසුය කියා, හෝ

(උ) සවස්ථානුකූල නොවේය කියා නැතහොත් සෞඛ්‍යයට අහිතය කියා, හෝ

(එ) අශුචි ඉවත් කිරීම සඳහා ඊමට නගර සභාව දමා ඇති පාර කින් පහසුවෙන් ආ නොහැකිය කියා නැතහොත් ඒ පාරකට යාවී නැත කියා හෝ

සභාපතිහට කල්පනා වුවහොත් ඒ ඉඩමේ අයිතිකාරයා හෝ පදිංචි කාරයා වෙත දැන්වීම් පතක් යවමින් ඒ දැන්වීමේ කියා තිබෙන ආකාරයට එහිම කියා ඇති කාලපරිච්ඡේදය ඇතුළත ඒ දියවැසිකිළිය හෝ වැසිකිළිය අලුත්වැඩියා කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් යම් වෙනසක් කිරීමට හෝ එය කඩා දමා අලුතුවෙන් සෑදීමට ඒ අයිති කාරයාට හෝ පදිංචිකාරයාට නියම කිරීමට සභාපතිහට බලය තිබේ.

7. දියවැසිකිළියක් හෝ, වැසිකිළියක් ඇති හැම ඉඩමකම පදිංචි කාරයා විසින් ඒ දියවැසිකිළිය හෝ වැසිකිළිය කැඩුම්බිඳුම් නැතිව සවස්ථානුකූල ලෙස නිතරම තබාගත යුතුය.

8. හොඳින් අශුචි ඉවත්කිරීම සඳහා යම්කිසි විශේෂ ප්‍රදේශයක ඉඩම්වල අයිතිකාරයන් හෝ පදිංචිකාරයන් විසින් ඒ ප්‍රදේශයෙහි පාරවල් දමාගත යුතුය කියා නගර සභාව යෝජනාවක් ඉදිරිපත් කොට තීරණය කළ කල ඒ ප්‍රදේශයේ ඕනෑම ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා වෙත දැන්වීම් පතක් යවමින් ඒ දැන්වීමේ කියා ඇති කාලපරිච්ඡේදය ඇතුළතදී ඒ ඉඩමට පිටිපසින් හෝ සමාන්තරව එහි කියා ඇති තැනක කියා ඇති පළලක (කිසි විටෙක වත් අඩි දහයකට වැඩි නොවිය යුතුය.) පාරක් දමා ගන්නා ලෙස ඒ අයිති කාරයාට හෝ පදිංචිකාරයාට නියම කිරීමට සභාපතිහට බලය ඇත්තේය.

9. නගර සභාව විසින් අනුමත කරන ලද ප්‍රමාණයේ හා වර්ගයේ දියවැසිකිළියක් හෝ වැසිකිළියක් ගොඩනැගිල්ලක් තුළ තැනීමට බාරගනිතොත් මිස නැත්නම් කිසිවකු තැනීමට අදහස් කරන ඕනෑම ගොඩනැගිල්ලක සැලැස්මක් හෝ සටහනක් හෝ වැඩ විස්තරයක් අනුමත කිරීමට බැරිය කීමට සභාපතිහට බලය ඇත්තේය.

10. මේ උපනීති යටතේ දැන්වීමක් බාරදෙනු ලැබූ කා විසිනුත් ඒ දැන්වීමේ සඳහන් නියමයන් ඒ දැන්වීමේ කියා ඇති කාල පරිච්ඡේදය ඇතුළතදී ඉටු කළ යුතුය.

11. මේ උපනීතිවලින් කවරක් වුවත් කඩ කරන ඕනෑම කෙනෙකු වරදක් කළා විය යුතුවාත් හැර වරදකාරයා බැව් උසාවියකින් තීරණය කළ කල රුපියල් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතුද වන්නේය.

### XXIII වැනි කාණ්ඩය

#### රථවාහන හා සත්ව බද්ද පිළිබඳ උපනීති

1. පද සම්බන්ධයෙන් වෙන අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස නැත් නම් රථවාහන හා සත්ව බද්ද පිළිබඳ මේ උපනීතිවල—

"ආඥාපනත" යන්නෙන් 1939යේ අංක 61 දරණ නගර සභා ආඥාපනතද ;

"ආදායම් පරීක්ෂක යන්නෙන් නගර සභාවේ ආදායම් පරීක්ෂක තැනද අදහස් කරනු ලැබේ.

2. ආඥාපනතේ 175 වැනි, 176 වැනි වගන්ති යටතේ නගර සභාව විසින් රථවාහන හා සතුන් වෙනුවෙන් අය කරන වාර්ෂික බද්ද එක් එක් අවුරුද්දේ මාර්තු මාසයේ තිස්එක්වැනිද පසුවෙන්ට මත්තෙන් නගර සභාවේ කාර්යාලයට ගෙවිය යුතුය.

3. (1) වාර්ෂික බද්ද ගෙවන ලද හැම රථවාහනයක්ම වෙනුවෙන් සභාපතිනු විසින් ලෝහ තහඩුවක් දිය යුතුය; නැතහොත් දෙවිය යුතුය. ඒ තහඩුවෙහි වූ කලී රථවාහනය හැඳින ගැනීම සඳහා ගෙනදිය යුතුයයි නගර සභාවෙන් නියම කරන අකුරුවලින් ඒ රථයට ගැළපෙන අකුරුද තහඩුව යම් අවුරුද්දක් වෙනුවෙන් දෙනොද ඒ අවුරුද්ද දක්වන ඉලක්කම්ද රථවාහන ලේඛනයෙහි ඒ රථයට [illegible] ඇති අංකයද සඳහන් කොට තිබිය යුතුය.

(2) මේ උප නීතියේ (1) වැනි ඡේදය යටතේ දුන් ඕනෑම තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් කරුණක් නිසා බැකී විරූප වී ගියොත් ඒ තහඩුව අයිතිකාරයා එය සභාපතිහට ආපසු බාරදී ගත විසිපහක් ගෙවූ විට අලුත් තහඩුවක් ලබාගැනීමට ඒ අයිතිකාරයාට අයිතිවාසිකම තිබිය යුතුය.

(3) මේ උප නීතියේ (1) වැනි ඡේදය යටතේ දුන් ඕනෑම තහඩුවක් නැතිවූ බව හෝ සොරා ගන්නා ලද බව දිවුරුම් පත්‍රයකින් හෝ වෙන යම් අන්දමකින් ඒත්තුගන්වා ඒ තහඩුව අයිතිකාරයා අලුත් තහඩුවක් ඉල්ලා ශත පණසක් ගෙවූ විට අලුත් තහඩුවක් දීමට සභාපතිහට බලය ඇත්තේ ය.

4. 1 (3) වැනි උප නීතිය යටතේ තහඩුවක් දුන් ඕනෑම රථ වාහනයක් ඇත්තාවූ හෝ බාරව සිටින්නාවූ හෝ පාලනය කරන්නාවූ පුද්ගලයා විසින් ඒ තහඩුව ඒ රථයේ කාටත් පෙනෙන තැනක සවි කරවිය යුතුය.

(2) මේ උප නීතියේ (1) වැනි ඡේදයේ විධිවිධාන කඩකරන කොයි පුද්ගලයාත් රුපියල් පණහකට නොවැඩි දඩයකින් දඬුවම් ලැබිය හැකි වරදක් කරන්නකු විය යුතුය.

5. (1) සභාපතිහට හෝ ඕවර්සියර්ට හෝ ඕනෑම පොලිස් නිලධාරිය කුට හෝ සභාපතිහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද අවන ඕනෑම නිලධාරියකුට නගර සභා ප්‍රදේශ සීමාව ඇතුළත ඕනෑම ධාරක ගමන් කරන රථවාහනයක්, 4 (1) වැනි උප නීතියෙහි සඳහන් ගල්හ තහඩුව තිබේදැයි පරීක්ෂාකර බැලීම පිණිස නැවැත්වීමට බලය තිබිය යුතුය. සභාපතිහට හෝ ඒ නිලධාරියාට ඒ පරීක්ෂාව කිරීම පිණිස ඒ ඕනෑම රථයක රියැදුරා හෝ ඒ රථය බාරව සිටින්නා විසින් අවසර දිය යුතුවාක් හැර ඒ සඳහා අවශ්‍ය හැම උපකාරයක්ම කළ යුතුද වන්නේ ය.

(2) මේ උප නීතියේ (1) වැනි ඡේදයේ විධිවිධාන කඩ කරන කොයි පුද්ගලයාත් රුපියල් පණහකට නොවැඩි දඩයකින් දඬුවම් ලැබිය හැකි වරදක් කරන්නකු විය යුතුය.

XXIV වැනි කාණ්ඩය

උකස් (කිරීම්) ලියාපදිංචි කිරීම පිළිබඳ උපනීති

1. නගර සභා පාලන ප්‍රදේශ සීමාව ඇතුළත පිහිටි හැම නිශ්චල දේපලකම උකස් හිමියාට හෝ නැසියිය ඕනෑම උකස් හිමිගකුගේ උරුමක්කාරයකුට හෝ නීත්‍යනුකූල නියෝජිතයාට ඒ ඕනෑම උකසක් නාගරසභා කායාීලයේ ලියාපදිංචි කරවා ගැනීමට නීතියෙන් බලය තිබිය යුතුය.

2. නාගරසභා කායාීලයේ උකසක් ලියාපදිංචි කරවා ගැනීමට කැමති කා විසිනුත්—

(අ) උකස් හිමියාගේ හෝ ඔහු නැසී ගියේ නම් ඔහුගේ උරුමක් කාරයකුගේ හෝ උකස් හිමියාගේ නීත්‍යනුකූල නියෝජිත යාගේ නම හා ලිපිනයද;

(ආ) උකස් කරන්නාගේ නම හා ලිපිනයද;

(ඇ) දේපල පිළිබඳ විස්තරයක් හෝ! එය හැඳින ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරුද දක්වා සටහනක් ද

සභාපතිහු වෙත එවිය යුතුය: නැතහොත් එවන්ට සැලැස්විය යුතුය.

3. 2 වැනි උපනීතිය යටතේ සටහනකුත් නගර සභාව නියම කරන රේට් ගණනක් අනුව ලියාපදිංචි කිරීමේ ගාස්තුවත් ඉල්ලුම්කාරයාගෙන් ලැබුණ විට සභාපතිහු විසින් නාම් සහ ලිපිනයත් ඇතුළු අවශ්‍ය විස්තර නාගරසභා කායාීලයේ (ඒ කටයුත්ත සඳහා තබා තිබෙන) ලේඛන යෙහි ඇතුළත් කරවිය යුතුය.

4. මෙ උපනීතිවල ප්‍රකාර යම් දේපලක් සම්බන්ධයෙන් උකසක් හා නාම් හා ලිපිනයත් ලියාපදිංචිකර ඇතොත් ඒ දේපල නගර සභාවට ලැබියයුතු වරිපණමක් හෝ අයබද්දක් හෝ ගාස්තුවක් අයකර ගැනීම් වශයෙන් අල්ලා ගතහොත් ඒ දේපල වෙන්දේසි කරන බව පළ කිරීමට යටත් පිරිසෙයින් දහ හතර දවසකටවත් කලින් සභාපතිහු විසින් ඒ අල්ලා ගැනීමත් වෙන්දේසිය පැවැත්වීමට නියම කරන ලද දිනයත් ඇල්ලීම කළේ යම් මුදල් ගණනක් අයකර ගැනීමට නම් ඒ මුදල් ගණනත් දන්වා ලිඛිත නිවේදනයක්, නාම හා ලිපිනය ලියාපදිංචිකර ඇති තැනැත්තා හෝ තැනැත්තන් වෙත බාරදිය යුතුය; නැතහොත් බාර දෙවිය යුතුය.

5. 4 වැනි උපනීතිය යටතේ බාරදුන් නිවේදනයෙහි සඳහන් මුදල් ගණන වෙන්දේසියට මත්තෙන් ඕනෑම වේලාවකදී නාගරසභාවට ගෙව්වොත් අල්ලාගනු ලැබූ ඒ දේපල නිදහස් කරනු ලැබේ.

XXV වැනි කාණ්ඩය

වාහන නතරකර තැබීම පිළිබඳ උපනීති

1. පද සම්බන්ධයෙන් වෙන අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස නැත් නම් මේ උපනීතිවල—

"රියදුරා" යන්නෙන් තනි පුද්ගලයකු නැගී යන බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ සම්බන්ධයෙන් නම් එහි නැගී යන්නාද, අත් කරත්තයක් හෝ තල්ලු කරගෙන යන කරත්තයක් සම්බන්ධයෙන් නම් ඒ කරත්තය ඇදගෙන යන හෝ තල්ලු කරගෙන යන තැනැත්තාද ජින් රික්ෂෝ රථයක් සම්බන්ධයෙන් නම් ඒ රික්ෂෝ රථය ඇදගෙන යන යන තැනැත්තාද අදහස් කරනු ලැබේ.

"නතරකර තැබීම" යන්නෙන් වාහනයක් අවල තත්වයකට ගෙන ඊම නැතහොත් එවලේම මිනිසුන් නග්ගා ගැනීමට හෝ බැස්සවීම හෝ බඩු පටවා ගැනීම හෝ බෑම හැර වෙන කටයුත්තක් සඳහා වාහනයක් නවත්වා තබාගැනීම අදහස් කරනු ලැබේ;

"වාහනය" යන්නෙන් ගොඩබිමේ ගමනාගමනය කිරීමේ උපාය මාර්ගයක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ පාවිච්චි කිරීමට පුළුවන් වූද යාන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් හෝ වෙන අන්දමකින් දුවවන්නාවූද ඕනෑම කෘත්‍රිම උපකරණයක් අදහස් කරනු ලැබේ. එහෙත් 1951 කේ අංක 14 දරණ මෝටර් වාහන ආඥා පණතේ විස්තරකර තිබෙන මෝටර් රථයක් ඊට ඇතුළත් නොවේ.

2. නාගරසභා ප්‍රදේශය ඇතුළත ඕනෑම වීථියක හෝ වීථි කැල්ලක වාහන නතරකර තැබීම හෝ නැවැත්වීම තහනම් කොට හෝ සීමාකොට හෝ විධිමත් කොට නැතහොත් වාහන නතරකර තැබීමේ බිමක් වෙන් කොට දන්වීමක් ඒ වීථියේ හෝ වීථි කැල්ලේ කාටත් පෙනෙන තැනක හෝ පෙනෙන ලෙසට තැබ්බවීමට සභාපතිට බලය තිබේ; නැතහොත් ඔහුගේ අණ පරිදි එසේ තැබ්බවිය හැකිය.

3. 2 වැනි උපනීතිය යටතේ තබ්බවන ලද දැන්වීමකින් යම් වීථියක හෝ වීථි කැල්ලක වාහන නැවැත්වීම හෝ නතරකර තැබීම තහනම් කර ඇතිවිට වාහනයක රියැදුරා විසින් :—

(අ) යම් නිලධාරියකු විසින් හෝ පාලන මණ්ඩලයක් විසින් ඒ වීථියේ හෝ ඒ වීථි කැල්ලේ ගමනාගමනය සම්බන්ධයෙන් කරන යම්කිසි සංඥාවකට හෝ එහි සවිකර තිබෙන්නාවූ හෝ තබා තිබෙන්නාවූ දැන්වීමකට කීකරුවීම් වශයෙන්; හෝ

(ආ) ඒ ප්‍රස්තාවයේදී ඒ වීථියේ හෝ ඒ වීථි කැල්ලේ පවතින ගමනාගමනයේ අනුපිළිවෙල අනුගමනය කිරීම් වශයෙන්; හෝ

(ඇ) ඒ වාහනයෙන් යමකුට බැසීමට හෝ ඊට නැගීමට ඉඩ දීම් වශයෙන්; හෝ

(ඈ) ඒ වාහනයෙන් බඩු බෑම් වශයෙන් හෝ ඊට බඩු පැටවීම් වශයෙන්

අවශ්‍ය වන කාලයට හැර ඒ වීථියේ හෝ වීථි කැල්ලේ ඒ වාහනය නවත්වා තබන්ට ඉඩ නොදිය යුතුය.

4. 2 වැනි උපනීතිය යටතේ තබන ලද දැන්වීමකින් යම් වීථියක හෝ වීථි කැල්ලක වාහන නැවැත්වීම හෝ නතරකර තැබීම තහනම් කර හෝ සීමාකර නොමැති විට ඒ වීථියේ හෝ ඒ වීථි කැල්ලේ වාහන ගමනාගමනය විධිමත් කිරීම සඳහා කටවචනයෙන් නියමයන් කරන්ට හෝ සංඥාවන් කරන්ට පොලිස් නිලධාරියකුට බලය තිබේ. පොලිස් නිලධාරියා නියම කරන අන්දමකට හෝ වේලාවක් තුළ ඒ වීථියේ හෝ ඒ වීථි කැල්ලේ ඒ වාහනය තිබෙන්ට රියැදුරා විසින් ඉඩ නොදිය යුතුය.

5. මේ උපනීති මාලවෙන් කවරක් වුවත් කඩ කරන ඕනෑම කෙනෙකු වරදක් කළා විය යුතුවාත් හැර වරදකාරයා බැව් උසාවිය කින් තීරණය කල කල රුපියල් පනහකට නොවැඩි දඩයකටද යටත් විය යුතු වන්නේ ය.

XXVI වැනි කාණ්ඩය

ජලසම්පාදනය පිළිබඳ උපනීති

වචනාර්ථ නිරූපණය

1. මේ උප නීතිවල—

ජලසම්පාදනය සම්බන්ධයෙන් ව්‍යවහාර කරන "ගෙදරදොරේ කටයුතු" යන්නට විකිණීම පිණිස හෝ කුලියට දීම පිණිස තබාගෙන ඇති අශ්වයන් හෝ ගවයන් සඳහා යන වතුර හෝ විකිණීම පිණිස හෝ කුලියට දීම පිණිස තබාගෙන ඇති රථවාහන සේදීම සඳහා යන වතුර හෝ කිසියම් කර්මාන්තයක් හෝ නිෂ්පාදනයක් හෝ ව්‍යාපාරයක් සඳහා හෝ වතුර මලක් සඳහා හෝ පිහිනුම් ටැන්කියක් සඳහා හෝ සැරසිලි කටයුතු සඳහා හෝ යාන්ත්‍රික කටයුතු සඳහා හෝ වාරිමාර්ග කටයුතු කටයුතු සඳහා යන වතුර ඇතුළත් නොවේ.

### ප්‍රාරම්භය

2. පොදු වතුර පයිප්ප කණුවලින් හෝ වතුර මල්වලින් හෝ පුද්ගලික ප්‍රයෝජනය සඳහා දමා තිබෙන වතුර පයිප්පයකින් හෝ මේ උපනීතිවලින් නියමකර තිබෙන වෙන අන්දමකින් හෝ මිස නගර සභාවේ ජල කර්මාන්තයකින් වතුර ලබා නොගත යුතුය.

### පොදු වතුර පයිප්ප කණු

3. කිසිවකු විසින් පොදු වතුර පයිප්ප කණුවකින්—

(අ) සාමාන්‍යයෙන් අතින් ගෙන යා හැකි පනිට්ටුවකින් හෝ එබඳු වෙන භාජනයකින් මිස කරත්තයකින් හෝ පීප්පයකින් හෝ වෙනයම් භාජනයකින් ; නැතහොත්

(ආ) අපතේ යා හැකි අන්දමකට හෝ ප්‍රමාණයකට

වතුර නොගෙනිය යුතුය.

4. කිසිවකු විසින් කොයිම පොදු වතුර පයිප්ප කණුවකටවත් ඊමානම හෝස් පයිප්පයක්වත් නළයක්වත් පීල්ලක්වත් මොනම විදියක වෙන උපකරණයක්වත් තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් සවි නොකළා යුතුය.

5. කොයිම පොදු වතුර පයිප්ප කණුවකටවත් සවිකර තිබෙන්නාවූ හෝ එහි කොටසක්ව පවතින්නාවූ හෝ ස්වයංකාරක (ඉබේ ක්‍රියා කරන) ඉපියාව හෝ වෙන ස්වයංකාරක උපකරණයක් අනවත හැම හෝ ඒ ඉපියාවේ හෝ උපකරණයේ ස්වයං ක්‍රියාකාරීත්වය තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් මලකින විදියේ ක්‍රියාවක් කිසිවකු විසින් නොකළ යුතුය.

6. කිසිවකු විසින් ගෙදර දොරේ කටයුතුවලට හැර වෙන මොනම කටයුත්තකටවත් පොදු වතුර පයිප්ප කණුවකින් වතුර නොගත යුතුය.

7. චම් රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ විසංගත රෝගයකින් පෙළෙන්නාවූ හෝ එබඳු රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කළාවූ කිසිවකු පොදු වතුර පයිප්පයකින් වතුර නොගත යුතුය.

8. නගර සභාව කෙරෙහි පවරා ඇත්තාවූ හෝ නගරසභාව විසින් නඩත්තු කරන්නාවූ මොනම ජලාශයකින් හෝ වතුර පයිප්ප කණුවකින් හෝ වතුර මලකින් හෝ සැලකින් හෝ පයිප්පයකින් හෝ වෙන ජල කර්මාන්තයකින් හෝ ඒ ළඟ සිටගෙන හෝ කිසිවකු නෑම හෝ තමාගේ ශරීරයේ කොටසක් සේදීම හෝ යම් සතකු නෑවීම හෝ වාහනයක් හෝ ඇඳුම් හෝ භාජන හෝ වෙන කිසිම බඩුවක් සේදීම හෝ නොකළ යුතුය.

### පුද්ගලික ප්‍රයෝජනය සඳහා දමා තිබෙන වතුර පයිප්ප හා ඒ සම්බන්ධයෙන් සවිකළ සෙසු උපකරණ පිළිබඳ නියමයෝ

9. මෙහි සඳහන් උපලේඛනයේ "අ" පෝරමයේ ප්‍රකාරයට සභාපතිතුමා වෙත ඉල්ලුම් පතක් යවා ඔහුගේ අනුමතිය ලියවිල්ලක ස්වරූපයෙන් කලින් ලබා නොගෙන කිසිවකු විසින්—

(අ) නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලින් හෝ ජල කර්මාන්ත යෙන් යම් පුද්ගලික ස්ථානයකට අලුත් ජලසම්පාදනයක් ඇතිකිරීම හෝ අලුත් අතු පයිප්පයක් දැමීම හෝ ඒ සඳහා කිසිම වැඩක් පටන් ගැනීම ; නැතහොත්

(ආ) නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ කොට තිබෙන්නාවූ යම් අතු පයිප්පයක් වෙනස් කිරීම හෝ දීර්ඝ කිරීම හෝ ශුද්ධ පවිත්‍ර කිරීම හෝ අලුත් වැඩියා කිරීම හෝ ඒ සඳහා කිසිම වැඩක් පටන්ගැනීම ;

නොකළ යුතුය.

10. 9 වැනි උපනීතිය යටතේ සභාපතිතුමා විසින් අනුමත කරන ලද ඕනෑම කර්මාන්තයක් ඔහු ලියා එවූ නියමයන් අනුව කරවිය යුතුය. සභාපතිතුමා විසින් අනුමත කරන ලදින් නගර සභාවේ මුද්‍රාව තබා නැති කිසිම උපකරණයක් ඒ කර්මාන්තයක් සඳහා සවිකිරීමට නොයොදා යුතුය.

11. යම් ඉල්ලුම්කරුවකුට දිය යුතු පයිප්පයේ මහත මෙපමණය කියා නගර සභාව විසින් තීරණය කළ යුතුය.

12. (1) පුද්ගලික ජලසම්පාදනය සඳහා පාවිච්චි කරන සියලු අතු පයිප්ප (වක්කළ) ගැල්වනයිස් යකඩෙන් හෝ තඹෙන් සාද තිබිය යුතුය. ඒ පයිප්පවල ඝනකම හෝ තත්වය සභාපතිතුමා විසින් හෝ ඔහු ලියවිල්ලකින් බලය පැවරූ නිලධාරියකු විසින් අනුමත කරන ලද ප්‍රකාර විය යුතුය.

(2) පුද්ගලික ජලසම්පාදනය සඳහා පාවිච්චි කරන සියලු (වක්කළ) ගැල්වනයිස් යකඩ පයිප්පවල පීඩනය වර්ග අඟලට රාත්තල් 2,000ක් විය යුතුය. ඒවායේ බර පහත දක්වන අයුරු විය යුතුය :—

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් $\frac{3}{8}$යි, දිග අඩි 100 ට රාත්තල් 64යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් $\frac{1}{2}$යි, දිග අඩි 100ට රාත්තල් 88යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 3/4යි, දිග අඩි 100ට රාත්තල් 125යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1යි, දිග අඩි 100ට රාත්තල් 181යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් $1\frac{1}{4}$යි, දිග අඩි 100ට රාත්තල් 256යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් $1\frac{1}{2}$යි, දිග අඩි 100ට රාත්තල් 320යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 2යි, දිග අඩි 100ට රාත්තල් 405යි.

(3) පුද්ගලික ජලසම්පාදනය සඳහා පාවිච්චි කරන සියලු තඹ පයිප්පවල පීඩනය වර්ග අඟලට රාත්තල් 200ක් විය යුතුය. ඒවායේ බර පහත දක්වන අයුරු විය යුතුය :—

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් $\frac{1}{4}$යි, දිග අඩි 100ට රාත්තල් 19යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් $\frac{3}{8}$යි, දිග අඩි 100ට රාත්තල් 27යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් $\frac{1}{2}$යි, දිග අඩි 100ට රාත්තල් 39යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1යි, දිග අඩි 100ට රාත්තල් 62යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් $1\frac{1}{4}$යි, දිග අඩි 100ට රාත්තල් 76යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් $1\frac{1}{2}$යි, දිග අඩි 100ට රාත්තල් 91යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 2යි, දිග අඩි 100ට රාත්තල් 140යි.

13. නගර සභාව විසින් එකම ස්ථානයක් වශයෙන් තක්සේරු කරන ලද්දාවූද එකම භූමිභාගයෙහි පිහිටියාවූද දේපලකට ජලය ලබා ගැනීම සඳහා නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජල කර්මාන්තයට එක් අතු පයිප්පයකට වඩා සම්බන්ධ නොකළ යුතුය.

14. යම් ස්ථානයකට වතුර ගැනීමට සවිකරන සියලු කරාම සභාපතිතුමා අනුමත කළ මෝස්තරයකට හා මහත දෙගෙතට තිබිය යුතුය.

15. වතුර ගන්නා හැම කරාමයකම කට වූකලී වතුර කාන්දුවීම පහසුවෙන් සොයාගත හැකිවන සේ කාටත් හොඳින් පෙනෙන අනාවරණ ස්ථානයක තිබිය යුතුය. එය වතුර වැක්කෙරෙන සැලේ හෝ වැංකියේ හෝ භාජනයේ ඉහළම ජල මට්ටමට පහළින් කොයිම විටෙකවත් නොතිබිය යුතුය.

16. (1) නගර සභාවේ ජලකර්මාන්තයට සම්බන්ධකොට තිබෙන ඕනෑම පුද්ගලික ජලසම්පාදන සේවයක වතුර පයිප්ප අතර හෝ පයිප්ප හා උපකරණ අතර සියලු සන්ධි විදුලිබලය යොදා පිරිද්දිය යුතුය.

(2) කිසිම සන්ධියකට විදුලි ගුණය නාල්ලන ද්‍රව්‍යයක් නොදැමිය යුතුය. එහෙත් එබඳු ද්‍රව්‍යයක් පාවිච්චි නොකරම බැරියයි සභාපති හට පෙනී ගියහොත් සන්ධියේ හෝ සන්ධිවල පයිප්ප හෝ උපකරණ විදුලිබලය යොදා පිරිද්දිය යුතුය යන කොන්දේසිය පිට ඒ ද්‍රව්‍යය පාවිච්චි කිරීමට අවසර දීමට ඔහුට බලය ඇත්තේය.

17. හැම නාන බාල්දියකටම හෝ වැසිකිළි බේසමකට හෝ මළ කූපයකට (sink) වතුර එන කට ඒ වතුර පිටවී යන ද්වාරයෙන් වෙන්වී තිබිය යුතුයි. වතුර එන ඒ කට ඒ නාන බාල්දියේ හෝ වැසිකිළි බේසමේ හෝ මලකූපයේ මුදුනෙහි තිබිය යුතුය ; නැතහොත් ඒ නාන බාල්දියට හෝ වැසිකිළි බේසමට හෝ මලකූපයට—උඩින් තිබිය යුතුය.

18. හැම සැලකටම වතුර එන කටේ හෝ වතුර එන පයිප්පයේ වතුර වැක්කෙරෙන මට්ටමම ඒ සැලේ ඉහළම ජල මට්ටමට උඩින් තිබිය යුතුය.

19. මේ උපනීති වලංගු වූ දිනයෙන් පසු—

(අ) ගෙදර දොරේ කටයුතු සඳහා දෙන වතුරෙන් කොටසක් තබා ගැනීම පිණිස යම් ස්ථානයක ගැලුම් 100 ට වැඩියෙන් අල්ලන සැලක් පිහිටුවීම හෝ සෑදීම නොකළ යුතුය.

(ආ) මහත දෙගෙත හා මෝස්තරය හා පිහිටුවන හෝ සාදන ගණන සම්බන්ධයෙන් සභාපතිතුමාගේ අනුමතිය කලින් ලබාගෙන මිස නැත්නම් කිසිම ස්ථානයක සැලක් පිහිටුවීම හෝ සෑදීම නොකළ යුතුය.

20. ජලකර්මාන්තයෙන් වතුර ලැබෙන හැම සැලකටම අනුමත කරනලද මෝස්තරයක කරාමයක් හා සමබර වටකුරු ඉපියාවක් තිබිය යුතුය. වැංකියේ ජලය ගැටියට අඟල් දෙකකට පහළින් තිබෙන විට හෝ පිටාර ගලන විට වතුර ඊම නවතින පරිද්දෙන් වටකුරු ඉපියාව සවිකළ යුතුය.

21. සෑම සැලකුම වතුර පිටකරන පයිප්පයේ අග කෙළවර මෙගාඩ නැගිල්ලෙන් පිටතට ගෙන හොඳින් පෙනෙන තැනක සවිකළ යුතුය. එසේ කළයුත්තේ වතුර කාන්දුවීම පහසුවෙන් සොයා ගත හැකිවීම පිණිසය. කිසිම සැලක වතුර පිටකරන පයිප්ප කාණුවකට හෝ මල මූත්‍රානාලිකාවකට හෝ නාන බාල්දියක කුණු වතුර ඉවත් කරන පයිප්පයකට හෝ මලකූපයකට හෝ වෙන සනීපාරක්ෂක උපකරණයකට හෝ වෙන සැලක වතුර පිටකරන පයිප්පයකට මොනම කරුණක් නිසා වත් සම්බන්ධ නොකළ යුතුය. එක් එක් සැලකට ජලය පිට කිරීමට වෙන වෙනම පයිප්පයක් තිබිය යුතුය.

22. යම් ස්ථානයකට වතුර ගෙනීමට සවිකර තිබෙන අතු පයිප්පය හෝ සැල හෝ සෙසු ජලසම්පාදන උපකරණ වෙන ස්ථානයක වූ අතු පයිප්පයකට හෝ සැලකට හෝ සෙසු ජලසම්පාදන උපකරණවලට සම්බන්ධ නොකළ යුතුය.

23. පුද්ගලික ජල සේවයක කොටසක්ව පවතින කිසිම පයිප්පයක් නගර සභාවේ විශේෂ අනුමතිය නැතිව කිසිම බොයිලේරුවකට හෝ ඝනීකරණ යන්ත්‍රයකට හෝ සෙසු යන්ත්‍ර සූත්‍රාදියකට එක එල්ලේම සම්බන්ධ නොකළ යුතුය.

24. සෑම පුද්ගලික ජල සේවයකටම—

(අ) පිත්තලෙන් හෝ තුවක්කු ලෝහ නම් ලෝකඩ විශේෂයෙන් හෝ විනවට්ටියෙන් සාදනලද පසුල ඝනබෝග්‍යකමට ඇත්තා වූද ශක්තිමත් වූද රෝධකයක් (Stop-Cock) තිබිය යුතුය. රෝධකය විනවට්ටියෙන් සෑදුවක් නම් ජලයට ඇස්බැස්ටෝස් පැකිං දමා තිබිය යුතුය; නැතහොත්

(ආ) බුරුල් ඉපියාවක් සමග පහතට නැමුනු ඉස්කුරුප්පු රෝධකයක් තිබිය යුතුය; නැතහොත්

(ඇ) අඟල් දෙකකට වඩා විෂ්කම්භය ඇති පයිප්පයකින් වතුර දෙන සේවයක් නම් සොරොව්වක් හෝ ලිස්සනසුලු ඉපියාවක් තිබිය යුතුය.

ඒ විපියේ පදික වේදිකාවක් තිබේ නම් ඒ රෝධකය හෝ ඉපියාව ඒ වේදිකාව යටින්ද ජලසේවය ලැබෙන ස්ථානයට හැකි තරම් කිට්ටු වෙන්ද සවිකළ යුතුය. කොයි වේලාවකදී වුවත් රෝධකය හෝ ඉපියාව සොයා ගත හැකිවීම පිණිස විනවට්ටි පෙට්ටියක් හා පියනක් එහි මතුපිට සවිකළ යුතුය. රෝධකය හෝ ඉපියාවත් විනවට්ටි පෙට්ටියත් සභාපතිහු අනුමත කළ මාදිලියක විය යුතුය.

25. යම් දේපලකට අලුතෙන් දමනලද ජලසම්පාදන සේවයක පයිප්ප හෝ ඉපියාවල් හෝ සෙසු උපකරණ සභාපතිහු හෝ ඔහු විසින් ලියකිල්ලකින් බලය පවරනලද නිලධාරියකු පරීක්ෂාකර ලියවිල්ලකින් අනුමත කරන තුරු නොවැසිය යුතුය.

පොළෝබද විදුලි කම්බි

26. (1) කිසිවකු වෝල්ට් 500 ක හෝ ඊට වඩා විදුලි බලය යන විපයසිය උපකරණ පෙට්ටියකින් හෝ වෙන විදුලි උපකරණ පෙට්ටියකින් නගර සභාවේ ජලකර්මාන්තයේ පයිප්පයකට හෝ උපකරණයකට හෝ ජලකර්මාන්තයට සම්බන්ධ කරනලද යම් පුද්ගලික ජල සම්පාදන සේවයකට පොළෝබද විදුලි කම්බි සවි නොකළ යුතුය.

2. 1 වැනි ඡේදයේ සඳහන් ඕනෑම විපයසිය යන්ත්‍රයක හෝ වෙන විදුලි උපකරණයක පොළෝ තහඩුව හෝ පොළෝබද විදුලි කම්බියේ ඕනෑම කොටසක් නගර සභාවේ ජලකර්මාන්තයේ හෝ නගර සභාවේ ජලකර්මාන්තයට සම්බන්ධවූ යම් පුද්ගලික ජලසම්පාදන සේවයක් පයිප්පයකින් හෝ උපකරණයකින් අඩි දෙකක් වත් ඈත් විය යුතුය.

27. විදුලි ආලෝක ක්‍රමයෙන් විදුලි බලය ලබන ගුවන් විදුලි යන්ත්‍රයකට පොළෝබද විදුලි කම්බියක් සම්බන්ධ කිරීම අවශ්‍යවූ කල ඒ සම්බන්ධ කිරීම කළ යුත්තේ නගර සභාවේ ජලකර්මාන්තයේ පයිප්පයකින් හෝ උපකරණයකින් හෝ නගර සභාවේ ජලකර්මාන්තයකට සම්බන්ධකර තිබෙන පුද්ගලික ජලසම්පාදන සේවයකින් අඩි දෙකකට නොඅඩු දුරක සවිකරන පොළෝ තහඩුවක් මගිනි.

28. නගරසභාවේ ජලකර්මාන්තයට සම්බන්ධ කරන ලද ජලමාපන යන්ත්‍රයක් පිහිටුවා තිබෙන ඕනෑම ස්ථානයක පොළෝබද ඕනෑම විදුලි කම්බියක් සවිකරන කා පිහිනුත් ඒ සවිකිරීම කළයුත්තේ ඒ ජලමාපන යන්ත්‍රයට වතුර එන පැත්තෙහි. නැතහොත් ඒ ජල මාපන යන්ත්‍රය හරහට විදුලි කම්බියක් දැමීමෙනි.

පුද්ගලික ජලසම්පාදන සේවය ප්‍රධාන පයිප්පවලට සම්බන්ධ කිරීම

29. (1) අලුතෙන් පිහිටුවන ලද ජලසම්පාදන සේවයක් 25 වැනි උපනීතිය යටතේ පරීක්ෂා කොට අනුමතකළ කල ඉල්ලුම්කරු විසින්—

(අ) සභාපතිහු තක්සේරු කළ පරිදි කම්කරුවන්ට හා ද්‍රව්‍යවලට හා පරිපාලනයට යන වියදම ඇතුළුව නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජලකර්මාන්තයට ඒ පුද්ගලික ජල සම්පාදන සේවය සම්බන්ධ කිරීමට යන වියදමත්,

(ආ) ජලසම්පාදන සේවය සම්බන්ධ කිරීම හා ජලය සැපයීම සඳහා රුපියල් 25ක මුල් මුදලක් හෝ රුපියල් 25ක අමතර මුදලකුත්

නගර සභාවෙහි තැන්පත් කළ යුතුය.

(2) මේ උපනීතියේ 1 වැනි ඡේදයෙන් නියමිත මුදල් විධිවූ පරිදි තැන්පත්කරන තෙක් ජලසම්පාදන සේවය සම්බන්ධ කිරීම නොකළ යුතුය.

30. (1) යම් පුද්ගලික ස්ථානයකට වතුර දෙන පයිප්ප වූකලී සභාපතිහු විසින් බලය පවරනලද නගර සභාවේ නිලධාරියකුගේ පරිපාලනය යටතේ මිස වෙන අන්දමකට නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජලකර්මාන්තයට සම්බන්ධ නොකළ යුතුය.

(2) ඒ ස්ථානයට වතුර දීම පටන් ගත්තේ පයිප්ප විධිවූ පරිදි සම්බන්ධ කරන ලද වේලාවේ සිටයයි සියලු කටයුතු සම්බන්ධයෙන් සැලකිය යුතුය.

31. නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ජලකර්මාන්තයට පුද්ගලික ජලසම්පාදන සේවයක් සම්බන්ධ කළ පසු මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් "ඉ" ෆෝරමයේ ප්‍රකාරයට ලියා ඒ පිළිබඳ ගණන් බිලට ඉල්ලුම්කරු වෙත යැවිය යුතුය. ඒ සම්බන්ධ කිරීම සඳහා යන වියදම් වශයෙන් ඉල්ලුම්කරු තැන්පත් කළ මුදලෙන් වියදම් නොවී යමක් ඉතිරිව තිබේනොත් එය ඔහුට ආපසු දිය යුතුය. සැබැවින්ම වියදම් වූ මුදල තක්සේරු කරනලද වියදමට වඩා වැඩිවුවහොත් ඒ වැඩි මුදල, ඉහත සඳහන් ගණන් බිලට පිළිබඳ ලිපිය ලැබුණ වහාම ඉල්ලුම්කරු විසින් නගර සභාවට ගෙවිය යුතුය.

ජලමාපන යන්ත්‍ර

32. නගර සභාවේ ජලකර්මාන්තයෙන් ඕනෑම දේපලකට දෙන ජලය මනින සියලු මාපන යන්ත්‍ර නගරසභාව මගින් සපයා සවිකළ යුතුවා පමණක් නොව නගරසභාව සතු දේපල වශයෙන්ද තිබිය යුතුය.

33. (කම්කරුවන්ට හා උපකරණවලට හා පරිපාලනයට ගෙවන වියදම ඇතුළුව) මාපන යන්ත්‍ර සවිකිරීමට යන වියදම ජලය ලැබෙන ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් කලින් ගෙවිය යුතුය.

34. ජලමාපන යන්ත්‍රයක් මගින් ජලය ලැබෙන ඕනෑම ස්ථානයක අයිතිකාරයා හෝ පදිංචිකාරයා ඒ මාපන යන්ත්‍රය නඩත්තු කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට යන වියදම ගෙවීමට බැඳී නොසිටිය යුතුය.

එතකුදු වුවත් ඒ අයිතිකාරයා හෝ පදිංචිකාරයා හිතාමතාම කළ දෙයකින් හෝ ඔහුගේ නොසැලකිල්ලකින් සිදුවූ අලාභහානියක් නිසා ජලමාපන යන්ත්‍රය අලුත්වැඩියා කිරීම හෝ අලුත් කිරීම අවශ්‍ය වුව හොත් ඒ අලුත්වැඩියා කිරීම හෝ අලුත් කිරීමට යන වියදම සභාපතිහු නියමකළ විටෙක ඒ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් නගර සභාවට ගෙවිය යුතුය.

35. (1) ජලමාපන යන්ත්‍රයක් මගින් ජලය ලැබෙන ඕනෑම ස්ථානයක අයිතිකාරයා විසින් ඒ මාපන යන්ත්‍රය පාවිච්චි කිරීම වෙනුවෙන් පහත පෙනෙන රේට් ගණන් අනුව ගණන් බැලූ කුලියක් කාර්තුවකට (තුන් මාසයකට) වරක් බැගින් නගර සභාවට කලින් ගෙවිය යුතුය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය.

කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට කුලිය

| | රු. | ශ. |
|---|---|---|
| අඟල් 3යේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 33 | 50 |
| අඟල් 2යේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 20 | 0 |
| අඟල් 1½යේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 14 | 0 |
| අඟල් 1යේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 8 | 0 |
| අඟල් ¾යේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 6 | 50 |
| අඟල් ½යේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 5 | 50 |
| අඟල් ⅜යේ ජලමාපන යන්ත්‍රයක් වෙනුවෙන් ... | 4 | 50 |

(2) මේ උපනීතිය සම්බන්ධයෙන් කාර්තුව යන්නෙන් අදහස් කරන්නේ එක් එක් අවුරුද්දේ ජනවාරි මස 1 වැනිදසිත් හා අප්‍රේල් මස 1 වැනිදසිත් හා ජූලි මස 1 වැනිදසිත් හා ඔක්තෝබර් මස 1 වැනිදසිත් ආරම්භවන්නාවූද එක දිගටම වූද තුන් මාසයක කාලපරිච්ඡේදයකි.

36. (1) ඕනෑම කාර්තුවකට පාවිච්චි කරන වතුරේ ප්‍රමාණය ගණන් ගත යුත්තේ ඒ කාර්තුව ආරම්භයේදී මාපන යන්ත්‍රයේ වැටී තිබුණ ගණන හා ඒ කාර්තුව අවසානයේදී වැටී තිබුණ ගණන අතර ඇති අන්තරය කොපමණදැයි පහත පෙණෙන ආකාරයට ගණන් බැලීමෙනි.

(2) අලුතෙන් සවිකරන ජලමාපන යන්ත්‍රයක් සම්බන්ධයෙන් නම් එය සවිකරන විට වැටී තිබුණ ගණනද වෙන ජලමාපන යන්ත්‍රයක් සම්බන්ධයෙන් නම් එය ඊට කලින් ඒ එක්කමවූ කාර්තුව වෙනුවෙන් අන්තිමට වැටී තිබුණ ගණනද පළමුවැනි ගණන් ගැණීම වශයෙන් සැලකිය යුතුය. යම් කාර්තුවක් සඳහා අන්තිමට වැටෙන ගණන විය යුත්තේ ඒ කාර්තුව ඉකුත්වීමට දස දවසකට මත්තෙන් වූ දිනයකදී හෝ ඒ කාර්තුව ඉකුත් වී දස දවසකට මත්තෙන් වූ දිනයකදී ගණන් ගන්නාලද ගැණීමය.

එනමුදු වුවත් අලුත්වැඩියා කිරීම පිණිස ජලමාපන යන්ත්‍රය ඉවත් කිරීම නිසා පූර්වෝක්ත කාලපරිච්ඡේදය ඇතුළත අවසාන ගණන් ගැණීම කිරීමට පිළිවෙළක් නැති තැනකදී ජලමාපන යන්ත්‍රය ඉවත් කරන්ට මත්තෙන් අවසාන ගණන් ගැණීම කළ යුතුය.

(3) යම් කාර්තුවකදී යම් ස්ථානයක ජලමාපන යන්ත්‍ර දෙකක් හෝ ඊට වැඩි ගණනක් පාවිච්චි කොළොත් ඒ කාර්තුවේදී ප්‍රයෝජනයට ගන්නා ජලය ඒ ජලමාපන යන්ත්‍රවල වැටෙන ගණන්වල එකතුව විය යුතුය.

37. (1) ජලමාපන යන්ත්‍රයක් නරක්වූ විට හෝ අලුත්වැඩියා කිරීම පිණිස හෝ වෙනස් කොට හරිගැස්සීම පිණිස ඉවත් කරන විට හෝ අලුත් ජලමාපන යන්ත්‍රයක් සවිකරන විට හෝ පරණ ජලමාපන යන්ත්‍රයක් නැවත සවිකරන විට ඒ පිළිබඳ සන්දේශයක් ඒ ජලමාපන යන්ත්‍රය මගින් ජලය ලැබෙන ස්ථානයෙහි තබා තැබිය යුතුය.

(2) ජලමාපන යන්ත්‍රය නරක්වූ විට හෝ අලුත්වැඩියා කිරීම පිණිස හෝ වෙන යම් කරුණක් නිසා ඒ ස්ථානයෙන් ඉවතට ගෙනගිය විට 36 වැනි උපනීතියේ කවර විනිවිධානයක් යොදු තිබුණත් ඒ ජල මාපන යන්ත්‍රය නරක්වී තිබුණ කාලපරිච්ඡේදයේදී හෝ ජලමාපන යන්ත්‍රයක් නැතිව සේවය ලැබුණ කාලපරිච්ඡේදයේදී පාවිච්චි කළ ජලය ගණන් බැලිය යුත්තේ ඒ කාලපරිච්ඡේදය එක්කම ඊට කලින් වූ කාර්තුවේදී දින පතා පාවිච්චි කරන ලද ජලයේ මාධ්‍යය (පෙර ගණන්වල සාමාන්‍ය ගණන) අනුවය.

38. (1) යම් පදිංචිකාරයකු තමාගේ ස්ථානයෙහි වූ ජලමාපන යන්ත්‍රයේ නිවැරදි බව ගැන තමාට සැකයක් ඇතිවූයෙන් පරීක්ෂණ ගාස්තු වශයෙන් රුපියල් විස්සක් කලින් ගෙවා ඒ යන්ත්‍රයේ නිරවද්‍යතාවය පරීක්ෂා කරවන ලෙස සභාපතිහට කියා සිටියොත් ඔහු විසින් ඒ පදිංචිකාරයා හෝ ඒ පදිංචිකාරයා බලය පැවරූ වෙන කෙනෙකු ඉදිරියේදී ඒ ජලමාපන යන්ත්‍රය පරීක්ෂා කරවිය යුතුය. ඒ පරීක්ෂණයෙන් ප්‍රකාශවන දෙය පිළිගැනීමට සභාපතිහුත් පදිංචිකාරයාත් බැඳී සිටිය යුතුය. එසේම 35 (2) වැනි උපනීතියේ කියා තිබෙන පරිදි කාර්තුව වෙනුවෙන් ජලමාපන යන්ත්‍රයෙහි වැටී තිබුණ ජලයේ ප්‍රමාණය පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව හරිගැස්විය යුතුය.

(2) ජලමාපන යන්ත්‍රයෙහි වැටී ඇති ගණන හරි නම්, නැතහොත් නියම වශයෙන් ලැබුණ ජලයත් ලැබෙන්ට තිබුණ ජලයත් අතර ඇති වෙනස ලැබෙන්ට තිබුණ ජලයේ ප්‍රමාණයෙන් සියයට දෙකකට වැඩි නොවෙයොත්, (1) වැනි ඡේදය යටතේ කලින් ගෙවනලද පරීක්ෂණ ගාස්තුව නගර සභාව විසින් තබාගත යුතුය.

(3) ජලමාපන යන්ත්‍රයෙහි වැටී ඇති ගණනත් නියම වශයෙන් ලැබුණ ජලයත් අතර ඇති වෙනස වූකලී නියම වශයෙන් ලැබුණ ජලයෙන් සියයට දෙකකට වඩා වැඩි වූ විට (1) වැනි ඡේදය යටතේ කලින් ගෙවූ පරීක්ෂණ ගාස්තුව පදිංචිකාරයාට ආපසු ගෙවිය යුතුය.

39. (1) ජලමාපන යන්ත්‍රවල වැටී ඇති ගණන් සභාපතිහු නියම කරන වකවානුවලදී ගණන් ගත යුතුය. එහෙත් ඒ ගණන් ගැණීම කාර්තුවකට තුන් වාරයකට වඩා අඩු නොවිය යුතුය.

(2) ජලමාපන යන්ත්‍රයක වැටී ඇති ගණන් ගණන්ගත් කොයි විටත් ඒ ගණන් ඇතුළත්කොට සන්දේශයක් ඒ යන්ත්‍රය මගින් ජලය ලැබෙන ස්ථානයේ පදිංචිකාරයාගේ නමට ලියා තැබිය යුතුය.

### ජලය සැපයීම වෙනුවෙන් අයකරන ගාස්තු

40. (1) ගෙදර දෙරේ කටයුතු සඳහා ජලය සැපයීම නගර සභාවේ අභිමතය පරිදි මාපන යන්ත්‍රයක් මගින් හෝ වෙන විධියකින් කළ හැකිය. ඒ සඳහා අයකරන ගාස්තු නගර සභාවේ යෝජනාවකින් වරින් වර නියම කරන රේට් ගණන් අනුව විය යුතුය.

(2) ගෙදර දෙරේ කටයුතුවලට නොව වෙන කටයුතු සඳහා ජලය සැපයීම නගර සභාවේ අභිමතය පරිදි මාපන යන්ත්‍රයක් මගින් හෝ වෙන විධියකින් කළ හැකිය.

(3) නගරසභාවේ ජලකර්මාන්තයෙන් ජලය ලැබෙන ඕනෑම ස්ථානයක ජලමාපන යන්ත්‍රයක් ඕනෑම වේලාවකදී සවිකිරීමට නගර සභාවට බලය තිබේ.

41. (1) ගෙදර දෙරේ කටයුතුවලට නොව වෙන කටයුතු සඳහා ජලමාපන යන්ත්‍රයක් මගින් ජලය දෙන විට ඒ වෙනුවෙන් අයකරන ගාස්තුව ගණන් බැලිය යුත්තේ වතුර ගැලුම් දහසකට රුපියල බැගිනි.

(2) ගෙදර දෙරේ කටයුතුවලට නොව වෙන කටයුතු සඳහා ජලමාපන යන්ත්‍රයක් මගින් නොව වෙන විධියකින් ජලය සපයන විට එක් එක් පුද්ගලික ජල සේවය වෙනුවෙන් පහත පෙනෙන ගාස්තු මාස පතා නගර සභාවට කලින් ගෙවිය යුතුය.

මුළු ස්ථානයම හෝ එහි කොටසක් පාවිච්චියට ගත්—

(අ) කිරිපට්ටියක් හෝ බේකරියක් හෝ භෝජනාගාරයක් හෝ භෝජන ශාලාවක් හෝ බත්කඩයක් වැනි ස්ථානයක් සඳහා රුපියල් 2.

(ආ) තේ කෝපි කඩයක් හෝ කරනෑවෙම් මැදුරක් වැනි ස්ථානයක් සඳහා රුපියල් 1.

42. 41 වැනි උපනීතියේ (2) වැනි ඡේදයෙන් ඉඩ දී ඇති ස්ථානවලදී හැර පුද්ගලික ජල සේවයකින් ලැබෙන ජලය, ඒ ස්ථානයෙහි පදිංචිකාරයා මෙහි පහත ඇති උපලේඛනයේ " ඇ " ෆෝරමයේ ප්‍රකාර ගිවිසුමකට බැඳී ඇතොත් මිස නැත්නම්, ගෙදර දෙරේ කටයුතුවලට හැර වෙන කටයුත්තකට පාවිච්චි නොකළ යුතුය.

එනමුදු වුවත්, එසේ වතුර දීමෙන් වෙන පුද්ගලයකුට හෝ පුද්ගලයන්ට ගෙදර දෙරේ කටයුතුවලට වතුර දීම සම්බන්ධයෙන් බාධාවක් ඇති වෙතොත් පදිංචිකාරයා එබඳු ගිවිසුමකට බැඳී ඇතත්, ඔහුට ඒ කටයුතු සඳහා දෙන ජලය මොනම වන්දි ගෙවීමකට හෝ දඩුවමකට යටත් නොවී නැවැත්වීමට හෝ තාවකාලික වශයෙන් නතර කිරීමට හෝ අඩුකිරීමට නගර සභාවට බලය ඇත්තේය.

43. ඕනෑම පුද්ගලික ස්ථානයකට දෙන වතුර වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තුව, මෙහි පහත උපලේඛනයෙහි ඇති " එ " ෆෝරමයේ ප්‍රකාර ගණන් බිලට ලියා එවූ විට, ඒ ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා ඒ ලිපියේ සඳහන් දිනයේ සිට පහළොස් දවසක් ඇතුළතදී සභාපතිහට හෝ ඔහු විසින් බලය පවරනලද නිලධාරියකුට ගෙවිය යුතුය.

### ජලය අපතේ යාම වැළැක්වීම

44. (1) නගර සභාවේ ජලකර්මාන්තයට සම්බන්ධව ඇති ඕනෑම පුද්ගලික ස්ථානයක තිබෙන්නාවූද පුද්ගලික ජල සේවයක කොටසක් වශයෙන් පවතින්නාවූද පයිප්පයක හෝ කරාමයක හෝ ඉපියාවක හෝ ජලමාපන යන්ත්‍රයක හෝ වෙන උපකරණයක වින්‍යාසය හෝ ප්‍රමාණය හෝ පිහිටීම හෝ ස්වභාවය හෝ තත්ත්වය නිසා ජල කර්මාන්තයෙන් පොදු ප්‍රයෝජනය හෝ පුද්ගලික ප්‍රයෝජනය සඳහා දෙන ජලය අපතේ යාහැකිය කියා හෝ වැරදි ලෙස පාවිච්චි වේය කියා හෝ නොසැහෙන ලෙස පාවිච්චි වේය කියා හෝ නරක්විය හැකිය කියා හෝ ජලකර්මාන්තයෙන් ජලය දීම නිසි ලෙස පාලනය කිරීමට හෝ ජලය නිසි ලෙස බෙදා හැරීමට බාධාවක් වේය කියා සිතා ගැනීමට කරුණු ඇතිවූ කොයි විටකදී වුවත් සභාපතිහට ඒ ස්ථානයේ අයිතිකාරයා වෙත මෙහි පහත උපලේඛනයෙහි වූ " ම " ෆෝරමයේ ප්‍රකාර දැන්වීමක් හැරීමට බලය ඇත්තේය.

(2) ඒ හැම දැන්වීමකම සභාපතිහු අවශ්‍යයයි කල්පනාකරන වෙනස් කිරීම සඳහන් කළ යුතුවාත් හැර ඒ දැන්වීමේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුළතදී ඒ අයිතිකාරයා විසින් සභාපතිහු හොඳය කියා පිළිගන්නා පරිද්දෙන් ඒ වෙනස් කිරීම කළ යුතුය.

(3) අයිතිකාරයාගේ නම හෝ පදිංචි ස්ථානය නොදනිතොත් දැන්වීම හා සම්බන්ධ ස්ථානයේ කාටත් පෙනෙන තැනක ඒ දැන්වීම ඇලෙව් කල එය අයිතිකාරයාට විධිවූ පරිදි භාරදුන්නා කොට සැලකිය යුතුය.

45. පහත පෙනෙන අයුරු වූ විට, එනම් :—

(අ) යම් ස්ථානයක අයිතිකාරයාගේ හෝ පදිංචිකාරයාගේ ඉල්ලීම පිට, හෝ

(ආ) ඒ ස්ථානයේ අයිතිකාරයාගෙන් හෝ පදිංචිකාරයාගෙන් මේ උපනීතිවල විධිවිධාන යටතේ අයවිය යුතුවූ මුදලක් නොගෙවා තිබෙතොත්, හෝ

(ඇ) ඒ ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා යම් වතුර පයිප්පයක් සෑදීම හෝ දැමීම මේ උපනීතිවල විධිවිධාන අනුව නොකරවුව හොත් නැති නම් වෙනස් නොකරවුව හොත්, හෝ

(ඈ) ජලකර්මාන්තයට අලාභහානි සිදුවීම හෝ ජලකර්මාන්තය අපිරිසිදුවීම හෝ ජලය අපතේ යෑම හෝ ජලය අයථා අන්දමින් පාවිච්චි කිරීම පිළිබඳ යම් උපනීතිවල විධිවිධාන යන් අනුව ඒ ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා තමා විසින් කළයුතු යම් ක්‍රියාවක් හෝ දෙයක් නොකොළොත් නැතහොත් නොකළ යුතු යම් ක්‍රියාවක් හෝ දෙයක් කළොත්

නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලින් හෝ ජලකර්මාන්තයෙන් ඒ ස්ථානයට ජලය දීම නැවැත්වීමට හෝ තාවකාලික වශයෙන් නතර කිරීමට හෝ අඩුකිරීමට නැතහොත් ඒ ස්ථානයට දමා ඇති පුද්ගලික වතුර පයිප්පය වැස්සවීමට සභාපතිහට බලය ඇත්තේය.

46. නගරසභාවේ ජලකර්මාන්තයෙන් පුද්ගලික සේවයක් (වතුර පයිප්පයක්) දමා ඇති ගෙයක හෝ ස්ථානයක පදිංචිකාරයා විසින් ඒ සේවයේ කොටසක් වශයෙන් පවතින කරාමයකින් හෝ පයිප්පයකින් හෝ ජලමාපන යන්ත්‍රයකින් හෝ වෙන යම් උපකරණයකින් ජලය අපතේ යන කවරවිටකදී වුවත් ඒ බව වහාම සභාපතිහට දැන්විය යුතුය.

47. ඕනෑම ස්ථානයක ඇති පුද්ගලික ජල සේවයේ කොටසක්ව පවතින යම් කරාමයකින් හෝ පයිප්පයකින් හෝ ජලමාපන යන්ත්‍රයකින් හෝ වෙන යම් උපකරණයකින් ජලය අපතේ යන බව දැනගත් කවර විටකදී වුවත් සභාපතිහට හෝ ඔහු විසින් බලය පවරනලද ඕනෑම කෙනෙකුට ඒ ජලසේවයත් නගරසභාවේ ප්‍රධාන වතුර පයිප්පත් අතර ඇති සම්බන්ධය වහාම වැස්සවීමට බලය තිබේ. ඒ ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් ජලය එසේ අපතේ යෑමට ඇති හේතුව නැතිකරන තුරු එකී ජල සේවය නැවත සම්බන්ධ නොකළ යුතුය.

48. 45 වැනි උපනීතියේ කියා ඇති ඕනෑම හේතුවක් පිට වෙන්කරන ලද යම් පුද්ගලික ජල සේවයක් නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්ප වලට හෝ ජලකර්මාන්තයට නැවත සම්බන්ධ කිරීම සඳහා සභාපතිතුමාට හෝ ජලකර්මාන්තයට නැවත සම්බන්ධ කිරීම සඳහා සභාපතිතුමා තක්සේරු කළ මුදල ඒ ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් නගරසභාවට කලින් ගෙවිය යුතුය. එසින් යමක් ඉතිරි වුවහොත් වැඩ අවසන් වූ පසු අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට ආපසු දිය යුතුය. නියම වශයෙන් වියදම්වූ මුදල තක්සේරු කරනලද මුදලට වඩා වැඩිවුව හොත් ඒ වැඩි මුදල ඒ වැඩය අවසන්වූ විගස අයිතිකාරයා විසින් හෝ පදිංචිකාරයා විසින් ගෙවිය යුතුය.

සාමාන්‍ය

49. (අ) ජලකර්මාන්තයේ ජලය ප්‍රමාණවත් නොවේය කියා, හෝ
(ආ) ප්‍රධාන වතුර පයිප්පවල හෝ ජලකර්මාන්තය විශාල කිරීම හෝ වෙනස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම හෝ ප්‍රධාන වතුර පයිප්පවලට අතු පයිප්ප සම්බන්ධ කිරීම සඳහා ජලය සැපයීම සෝ තාවකාලික වශයෙන් නතර කිරීම හෝ වෙන අතකට හැරවීම සුදුසුය නොහොත් ආවශ්‍යකය කියා, හෝ
(ඇ) පොදු වතුර පයිප්ප කණුවකට අලාභහානියක් සිදුවන හෙයින් හෝ එයි ජලය අපවිත්‍රවන හෙයින් හෝ අපතේ යන හෙයින් එසේ කිරීම සුදුසුය නොහොත් ආවශ්‍යකය කියා, හෝ
(ඈ) ගින්නක් හට ගැනීමෙන් ජලකර්මාන්තයට යම් අලාභහානියක් සිදුවේය නැතහොත් සිදුවීමට ඉඩ තිබේය කියා හෝ

එන්තුයිය කවර විටකදී වුවත් සභාපතිගට මේ උපනීති යටතේ නගර සභාවට අයවන්ට තිබෙන හෝ අයවිය යුතුව තිබෙන යම් වතුර බද්දක් හෝ ජලමාපන යන්ත්‍ර බද්දක් හෝ වෙන මුදලක් සම්බන්ධ යෙන් කිසිම පාඩුවක් විඳීමට යටත් නොවී නගරසභාවේ ජලකර්මාන්ත යට සම්බන්ධ ප්‍රධාන වතුර පයිප්පවලින් හෝ පොදු වතුරමලකින් හෝ අතු පයිප්පවලින් හෝ වෙන උපකරණවලින් ජලය සැපයීම නැවැත්වීමට හෝ තාවකාලික වශයෙන් නතර කිරීමට හෝ වෙන අතකට හැරවීමට බලය තිබේ.

50. එක් එක් පුද්ගලික ජල සේවයේ රෝධකය හෝ ඉපියාවත් ඒ රෝධකය හෝ ඉපියාව හා ප්‍රධාන වතුර පයිප්පය අතරවූ අතු පයිප්පයේ කොටසත් නගරසභාවේ දේපල කොට සැලකිය යුතුය. එසේම ඒ පයිප්ප කොටස නඩත්තු කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට හෝ අලුතෙන් දැමීමට යන වියදමද නගරසභාව විසින් දැරිය යුතුය.

51. 25 වැනි උපනීතිය යටතේ යම් පුද්ගලික අතු පයිප්පයක් හෝ උපකරණයක් අනුමත කර තිබීම හෝ ඒ පුද්ගලික අතු පයිප්පය දමා ඇති ස්ථානයේ අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට මෙයින් යම් උපනීතියක් යටතේ යම් අවසරයක් හෝ අනුග්‍රහයක් දී තිබීම වූකලී පයිප්පයේ යම් කොටසක් පිපිරීයෑමෙන් හෝ පයිප්පයට සවිකරන ලද උපකරණයක යම් කොටසකින් වතුර පිටාරේ ගලා යෑමෙන් සිදුවන යම් අලාභහානියක් ගැන මොනම කරුණක් සම්බන්ධයෙන් වත් නගරසභාව කිසිම වගකීමකට බැඳී සිටීමක් කොට නොසැලකිය යුතුය.

52. කොන්තරාත්තුවක් පිට හෝ වේවා ගිවිසුමක් පිට හෝ වේවා වෙන විධියකට හෝ වේවා නගරසභාවෙන් සැපයිය යුතු ජලය දීමට ඒ සභාවට බැරිවූ කල ඒ බැරිවීම සිදුවූයේ බලාපොරොත්තු නුවූ නියඟක් නිසා හෝ යම් වැඩක් කිරීම කරණකොටගෙන ඇතිවූ බාධාවක් නිසා හෝ වැළැක්විය නොහැකි වෙන හේතුවක් නිසා හෝ අන්තරායක් නිසා නම් ඒ ගැන වන්දි ගෙවීමට නගරසභාව යටත් නොවිය යුතුය.

53. (1) ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි තැනීම පිණිස නගර සභාවේ ජලකර්මාන්තයෙන් යම් ස්ථානයකට තාවකාලික පයිප්පයකින් ජලය සපයන විටෙකදී ඒ ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි තැනීම අවසානවූ පසු ඒ සැපයීම නැවැත්විය යුතුය.

(2) 1 වැනි ඡේදයේ සඳහන් කටයුත්ත සඳහා ජලය සැපයීම වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු 41 වැනි උපනීතියේ කී ගෙදර දොරේ කටයුතුවලට ඇතුළත් නුවූ කටයුතු වෙනුවෙන් නියමිත රේට් ගණන් අනුව විය යුතුය.

54. මෙ උපනීතිය යටතේ නගරසභාවට ගෙවිය යුතු සියලු මුදල් සභාපතිගට හෝ ඔහු විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරන ලද නිලධාරියකුට ගෙවිය යුතුය.

55. මෙ උපනීතිවල කවර විධිවිධානයක් වුවත් කඩකරන හැම ප්‍රස්තාවකදීම රුපියල් පනහකට වැඩි නොවූ දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීමක් ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීමක් සිහිපත් කරවා සභාපතිතුමා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් බාර දුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසකට රුපියල් දහයකට වැඩි නුවූ අතිරේක දඩයක් ගැසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

නගරසභාව

ජලකර්මාන්ත දෙපාර්තමේන්තුව

"අ" පෝරමය

(9 වැනි උපනීතිය)

අංකය :————.

නගරසභාවේ සභාපති වෙතටයි.

මෙසි සඳහන් උපලේඛනයේ දක්වා ඇති ආකාරයට ———— කොට්ඨාශයේ————වීදියේ————වැනි අංකය දරණ ගෙට
*පුද්ගලික ජලසේවයක්,

*දැමීම,

*දමා ඇති සේවය වෙනස් කිරීම,

*දමා ඇති සේවය දීර්ඝ කිරීම,

*දමා ඇති පයිප්ප ශුද්ධ කිරීම

සඳහා ඔබේ අනුමතිය ලියවිල්ලකින් දෙන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

* බදුකාරයෙක් පදිංචිව සිටි නම් වාර්ෂික බද්ද: රුපියල් ————

* අයිතිකාරයා පදිංචිව සිටි නම් වාර්ෂික වටිනාකම: රුපියල්————.

* දැනට දමා තිබෙන පයිප්පවල විෂ්කම්භය :————.

ජලය වුවමනා ගෙදර දොරේ කටයුතු සඳහාද නැතහොත් වෙන කටයුතු සඳහාද යන වග :————.

ස්ථානය පාවිච්චි කරන්නේ කුමන කටයුත්තක් සඳහාද යන වග :————.

තැන්පත් කළ මුදල: රුපියල් :————.

* වුවමනා නැති වචන කපාහා දමන්න.

උපලේඛනය

| පුද්ගලික ස්ථානයකට දමන පයිප්ප | | කාමර | | | කැල් | |
|---|---|---|---|---|---|---|
| දිග | විෂ්කම්භය | ගණන | වර්ගය | ප්‍රමාණය | වතුර අල්ලන ප්‍රමාණය | වර්ගය |
| | | | | | | |

වෙනත් කරුණු :—

පැහැදිලි ලෙස ලියනු මැනවි.

* අයිතිකාරයාගේ අත්සන :————.

* අයිතිකාරයාගේ නම :————.

* අයිතිකාරයාගේ ලිපිනය :————.

* පදිංචිකාරයාගේ අත්සන :————.

* පදිංචිකාරයාගේ නම :————.

* වුවමනා නැති වචන කපාහා දමන්න.

කාර්යාලයේදී පිරවීම පිණිසයි

අනුමත කෙළෙමි.

————.

නගරසභාවේ සභාපති.

මුදල් තැන්පත් කළ දිනය :————.

ජලකර්මාන්ත දෙපාර්තමේන්තුවට ලැබූ දිනය :————.

වැඩ අවසන් කිරීමෙන් පසු වාර්තාව ලැබුණු දිනය :————.

කරාමවල පිහිටීම දක්වමින් ස්ථානයේ සැලැස්මක් (තනි ඉරේ සැලැස්මකි.) පහත සඳහන් කොටසේ අඳින්න.

සැලකිය යුතුය—
(1) ජලසේවය සඳහා එවන සියලු ඉල්ලුම්පත් නිත්‍යානුකූල "අ" පෝරමයේ ලිවිය විය යුතුය.

(2) ජලසේවය සඳහා එවන සියලු ඉල්ලුම්පත් නගරසභාව විසින් අනුමත කළ යුතුය.

(3) පුද්ගලික ජලසේවයක් පිහිටුවීම සඳහා අවසර දුන් විට, ඒ සේවයෙන් ජලය ලැබෙන ස්ථානය නගරසභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ප්‍රධාන අතිරේක (වතුර) පයිප්ප වලට සම්බන්ධ කළයුත්තේ සභාපතිතුමා විසින් බලය පවරන ලද නගරසභාවේ නිලධාරියකුගේ පරිපාලනය යටතේය.

(4) පුද්ගලික ජලසේවයක් වෙනුවෙන් රුපියල් 25 ක ගාස්තුවක් ගෙවිය යුතුය.

(5) වතුර පයිප්ප හා උපකරණ සවිකිරීම හා දැමීම කළ යුත්තේ සභාපතිතුමා විසින් විධිවූ පරිදි බලය පවරනලද අය විසින් පමණකි. එසේම සභාපතිතුමා විසින් බලය පවරනලද නගර සභාවේ නිලධාරියකු අනුමත කරන තුරු ඒවා පාවිච්චි නොකළ යුතුය.

(6) ගෙදර දොරේ කටයුතුවලට නොව වෙන කටයුතුවලට සපයන ජලය වෙනුවෙන් ගාස්තුව අයකරන්නේ ජලමාපන යන්ත්‍ර යෙහි වැටෙන ගණන් අනුවය. ජලමාපන යන්ත්‍ර සවිකර නැති ස්ථානවලින් ඒ අයකිරීම කරන්නේ නගරසභාව නියම කරන රේට් ගණන් අනුවය.

(7) පුද්ගලික ජලසේවයක් පිහිටුවා ඇති ගෙයක හෝ ස්ථානයක අයිතිකාරයා හෝ පදිංචිකාරයාගේ මාරුවීමක් වෙන්ට හදන කවර විටකදී වුවත් ඒ බව නගරසභාවේ සභාපතිහට යථා කාලයෙහි දැන්විය යුතුය.

(8) තමාගේ ස්ථානයට සවිකර තිබෙන යම් කරාමයකින් හෝ ජල මාපන යන්ත්‍රයකින් හෝ පයිප්පයකින් හෝ වෙන උපකරණයකින් ජලය අපතේ යන බව දැනගත් කොයි විටත් ඒ බව වහාම නගරසභාවේ සභාපතිහට දැන්වීම පුද්ගලික ජල සේවයක් පිහිටුවා ඇති හැම ගෙයකම හෝ ස්ථානයකම අයිතිකාරයාගේ හෝ පදිංචිකාරයාගේ යුතුකම විය යුතුය.

———.
ඉල්ලුම්කරු.

"ඉ" ෆෝරමය

(31 වැනි උපනීතිය)

195 ——— මස —— වැනි දින
නගරසභා කාර්යාලය.

අංකය :———.

නගරසභාවට ගෙවිය යුතු ගණන් හිලව් පිළිබඳ සටහන

| දිනය | විස්තරය | රු.ශ. | ශත |
|---|---|---|---|
| | ………………… වීදියේ ……වැනි අංකය දරන ස්ථානයට වතුර පයිප්ප දැමීම හෝ ඒ ස්ථානයෙහි ජලමාපන යන්ත්‍රය සවිකිරීම සම්බන්ධයෙන් දුන් උපකරණ වෙනුවෙන් | ……………… | …… |
| | ඉහත සඳහන් ……………… සම්බන්ධයෙන් කම්කරුවන් හා පරිපාලනය වෙනුවෙන් | ……………… | …… |
| | ප්‍රධාන වතුර පයිප්පයට කරාමයක් සවිකිරීම වෙනුවෙන්— … … | ……………… | …… |
| | මුළු ගණන | ……………… | …… |
| | තැන්පත් කළ මුදල | ……………… | …… |
| | ගෙවන්ට තවත් තිබෙන මුදල | | …… |
| | | | |

———,
නගරසභාවේ සභාපති.

——— නගර සභාව

"උ" ෆෝරමය

(42 වැනි උපනීතිය)

ගෙදර දොරේ කටයුතුවලට නොව වෙන කටයුතුවලට ජලමාපන යන්ත්‍රය මගින් ජලය සැපයීම සඳහා ——— පිහිටි ——— වැනි වරිපණම් අංකය දරණ ස්ථානයෙහි (මෙහි පහත "අයිතිකාරයාය" යි ව්‍යවහාර වන) අයිතිකාරයා වන ——— එක් පක්ෂයක් වශයෙන්ද ——— නගරසභාව අනික් පක්ෂය වශයෙන්ද සිටගෙන කරගන්නා පොරොන්දුවයි.

2. ගෙදර දොරේ කටයුතුවලට නොව වෙන කටයුතු, එනම්—

(අ) ———.
(ආ) ———.
(ඇ) ———,

සඳහා ඉහත සඳහන් ස්ථානයට ජලසම්පාදනය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් කොන්දේසි පිළිගැනීමට අයිතිකාරයා මෙසින් එකඟ වෙයි.

(අ) අඟල් ——ක ජලමාපන යන්ත්‍රයකින් ජලය සැපයිය යුතුය.

(ආ) ජලමාපන යන්ත්‍රයේ බද්ද වශයෙන් අයිතිකාරයා විසින් කාර්තුවක් වෙනුවෙන් රුපියල් ——— (රු.ශ.  )ක මුදලක් නගරසභාවේ සභාපතිහට කලින් ගෙවිය යුතුය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය.

(ඇ) එක් එක් මාසය තුළ සපයන ජලය වෙනුවෙන් අයිතිකාරයා ගැලුම් සියයකට රුපියල් ——— (රු.ශ.  ) ගණනේ නගරසභාවේ සභාපතිහට ගෙවිය යුතුය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය. පළමුවැනි ගෙවීම ——— මාසයේ මුල දවසේදී කළ යුතුය.

3. ජලමාපන යන්ත්‍රය වෙනුවෙන් ගෙවිය යුතු බද්ද හෝ ජලය වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තුව නියමිත දිනයේ සිට පහළොස් දවසක් ඇතුලතදී නගරසභාවේ සභාපතිහට නොගෙවුව හොත් ජල සේවය පාවිච්චි කිරීමට ඇති අයිතිවාසිකම නැතිවිය යුතුවාත් හැර නගරසභාව විසින් ජලසේවය නැවැත්විය යුතුද වේ.

4. පොරොන්දුව අවසන් කරගැනීමට අදහස් කරන බැව් එක් පාර්ශවයක් විසින් අනික් පාර්ශවයට තිස් දවසක් කලින් දන්වා කොයි පාර්ශවයකට වුවත් එය අවසන් කරගත හැකිය. එසේ පොරොන්දුව අවසන් කරගත හොත් අලුතෙන් පොරොන්දුවකට බැඳෙන තුරු ස්ථානයේ අයිතිකාරයාට වත් පදිංචිකාරයාට වත් ජල සේවය පාවිච්චි කිරීමට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

5. පදිංචිකාරයන් වෙනස්වීමට හදන කවර අවස්ථාවකදී වුවත් ඒ බව අයිතිකාරයා විසින් කල් ඇතිව දැන්විය යුතුය. එසේම ඉහත සඳහන් කොන්දේසි පිළිගැනීමට කැමති බව ලියවිල්ලකින් දන්වන තුරු ඒ ජලසේවය පාවිච්චි කිරීමට කිසිම පදිංචිකාරයකුට අයිතිවාසි කමක් නොතිබිය යුතුය.

එක්වාදහස් නවසිය ———වූ ——— මස —— වැනිදා වන මෙදින ———දී අත්සන් කෙළෙමි.

———,
(අයිතිකාරයා).

——— නගරසභාවේ
සභාපති ධුරන්ධර ———
———
මහතා සවනටයි.

සාක්කිකාරයෝ :—
(1) ———.
(2) ———.

"එ" ෆෝරමය

(143 වැනි උපනීතිය)

අංකය :———.

195 ——— මස —— වැනි දින
——— නගරසභා කාර්යාලය.

——— නම් වීදියේ පිහිටි —— වැනි අංකය දරණ ස්ථානයට ——— වැනිදාසින් අවසන් වන කාර්තුව තුළ සපයනලද ජලය වෙනුවෙන් නගරසභාවට ගෙවිය යුතු ගණන් හිලව් පිළිබඳ සටහනයි.

| සම්බන්ධාංකය | ජලය පිළිබඳ ගණන් හිලව් | රු. | ශත |
|---|---|---|---|
| | ජලමාපන යන්ත්‍රයෙහි වැටී තිබුණ ගණන ………………වැනි දින ජලමාපන යන්ත්‍රයෙහි වැටී තිබුණ ගණන … | ……… | …… |
| | පාවිච්චි කරන ලද ජලය—ගැලුම් දහසකට රු.ශ. ………… ගණනේ ය. … | ……… | …… |
| | ගෙදර දොරේ කටයුතුවලට නොව වෙන කටයුතුවලට සපයනලද්දවූද ජලමාපන යන්ත්‍රයෙන් නොමනිනලද්දවූද ජලය … | ……… | …… |
| | අයවිය යුතු මුදල | ……… | …… |
| | | | |

———,
සභාපති.

සංලක්ෂ්‍යය :—ඉහත පෙනෙන දිනයේ සිට පහළොස් දවසක් ඇතුලතදී ඉහත සඳහන් මුදල ——— නගරසභා කාර්යාලයට ගෙවන ලෙස ඔබට නියම කරමි.

"ග" ආකෘතිය

(44 වැනි උපනීතිය)

නරක් වී තිබෙන සේවය වෙනස් කොට හරිගැස්සීමට කරන දැන්වීමයි

195 ——— මස ——— වැනි දින

——— නගරසභා කාර්යාලය.

——— නම් වීදියේ පිහිටි ——— වැනි අංකය දරණ ගෙයි අයිතිකාරයා හෝ පදිංචිකාරයා වෙතටයි.

ඉහත කී ස්ථානයට සවිකර ඇති වතුර පයිප්ප පරීක්ෂා කරන ලදින්, ඒවායෙහි යම් යම් දෝෂ තිබෙන බැව් දැනගන්ට ලැබුණෙන් මෙහි පහත සඳහන් වෙනස් කිරීම් හෝ අලුත්වැඩියා කිරීම් ආවශ්‍යක බව සහතික කරමින් ඒ වෙනස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම් කරවන ලෙස ඔබට මෙයින් දන්වමි.

මේ දැන්වීම ලැබී දවස් ———ක් ඇතුළතදී එකී වෙනස් කිරීම් හා අලුත්වැඩියා කිරීම් හොඳයයි මට පිළිගත හැකි පරිද්දෙන් නොකරවුව හොත් ඔබේ ස්ථානයට සවිකර තිබෙන පයිප්පත් ජලකණ්ඩායත් අතර ඇති සම්බන්ධය වස්සවනු ලැබේ. ඉන් පසු ඒ පයිප්ප හොඳයයි මට පිළිගත හැකි පරිදි අලුතෙන් දමන තුරු හෝ වෙනස් කොට හරිගස්සන තුරු හෝ අලුත්වැඩියා කරන තුරු ජල කණ්ඩායට නැවත සම්බන්ධ කරනු නොලැබේ.

———,

නගරසභාවේ සභාපති.

වෙනස් කිරීම හා/හෝ අලුත්වැඩියා කිරීම් ;

## XXVII වැනි කාණ්ඩය

### ආහාර විකිණීම පිළිබඳ උපනීති

1. දුවිල්ලෙන් හෝ මැස්සන්ගෙන් අපිරිසිදුවීම වළකෙන්නාවූද කල් පවතින ද්‍රව්‍යයකින් සාදන ලද්දාවූද පෙට්ටියක හෝ භාජනයක දමා මිය නැත්නම් පිසූ කිසිම ආහාරයක් හෝ කෑදු පිටි කෑමක් හෝ කැවිලි වර්ගයක් හෝ පැණිරස කෑම වර්ගයක් හෝ සරුවත් වර්ගයක් හෝ මිශ්‍රිත පාන වර්ගයක් හෝ දෝසි දැමූ පලතුරක් හෝ ලෙලි ගැසූ හෝ පොතු ඇරිය පලතුරක් හෝ කැපූ පලතුරක් හෝ එවලේම කෑමට වෙන විදියකින් සකස් කළ පලතුරක් නැතින් නැත ගෙනගොස් විකිණීම හෝ විකිණීම පිණිස තැබීම හෝ විකිණීම පිණිස ඉදිරිපත් කිරීම කිසිවකු විසින් නොකළ යුතුය. ඒ පෙට්ටිය හෝ භාජනය නිතරම ශුද්ධපවිත්‍රව තබාගත යුතුය. ආහාර වර්ග තබන වේලාවලදී හැර වෙන වේලාවලදී එය ඇරලා හෝ ශුද්ධපවිත්‍ර කරන වේලාවලදී හැර වෙන වේලාවලදී එය ඇරලා නොතැබිය යුතුය.

2. (1) විකිණීම පිණිස තබා තිබෙන්නාවූ හෝ ඉදිරිපත් කර තිබෙන්නාවූ ඕනෑම මසක් හෝ කුකුළු, තාරා ආදී සතකු හෝ අලුත් හෝ වේළා ලුණු දැමූ හෝ වේළා අයිස් දැමූ හෝ වේළා මාලු ජාතියක් හෝ දඩමසක් හෝ එළවළුවක් හෝ පලතුරක් හෝ පිසූ ආහාරයක් හෝ පිටි කෑමක් හෝ කැවිල්ලක් හෝ පැණිරස කෑමක් හෝ සරුවත් හෝ මිශ්‍රිත පාන වර්ගයක් හෝ වෙන ආහාර වර්ගයක් පරීක්ෂා කිරීමටත් ඒ ආහාර වර්ගය හෝ පාන වර්ගය මනුෂ්‍යයන්ගේ පරිභෝග *යට අපථ්‍යය කියා හෝ අයෝග්‍යය කියා තමාට පෙනී ගියොත්* එය අල්ලා තහනම් කරගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතු කරා ගෙන යෑමටත් සෞඛ්‍ය පරීක්ෂකහට හෝ සභාපතිතු විසින් පත්කරනලද වෙන නිලධාරියකුට නීතියෙන් බලය තිබිය යුතුය.

(2) 1 වැනි ඡේදය යටතේ අල්ලා තහනම් කළ යම් ආහාර වර්ගයක් හෝ පාන වර්ගයක් මනුෂ්‍යයන්ගේ පරිභෝගයට අපථ්‍යය කියා හෝ අයෝග්‍යය කියා සෞඛ්‍යය වෛද්‍ය නිලධාරිතු සහතික කළොත් අයිතිකාරයාට වන්දි ගෙවීමක් නොකොට එය විනාශකර දැමිය හැකිය.

3. 1 වැනි උපනීතිය කඩකරන ඕනෑම කෙනෙකු වරදක් කළා විය යුතුවාත් හැර වැරදිකාරයා බැව් ඔප්පුවූ විට රුපියල් දෙසිය පනහ කට නොවැඩි දඩයකට වැරදිකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩ කිරීම ගැන සිහිපත් කරවා සභාපතිතු හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දැන්වීම් පතක් බාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට නොවැඩි අතිරේක දඩයකටද යටත් විය යුතුය.

## XXVIII වැනි කාණ්ඩය

### ළිං හෑරීම පිළිබඳ උපනීති

1. සභාපතිතුමගෙන් ලිඛිත අවසරයක් ලබාගෙන ඇතොත් මිස නැත්නම් කිසිවකු විසින් නගරසභා පාලන සීමාව ඇතුළත ළිඳක් හෑරීම හෝ හෑරවීම නොකළ යුතුය.

2. (1) ළිඳක සැලැස්ම හා වැඩ විස්තර පත්‍රිකාව සභාපතිතු ලිය විල්ලකින් අනුමත කර ඇතොත් මිස හෝ එසේ අනුමත කරනලද සැලැස්මට හා වැඩ විස්තර පත්‍රිකාවට අනුකූලව මිස නැත්නම් කිසිවකු විසින් බීම සඳහා හෝ ගෙදර දොරේ කටයුතු සඳහා හෝ මහා ජනයාට විකිණීමට හෝ සැපයීමට ජලය ලබාගැනීම පිණිස ළිඳක් හෑරීම හෝ හෑරවීම නොකළ යුතුය.

(2) යම් කසළ වළකින් හෝ මලමුත්‍ර වළකින් හෝ වැසිකිළි වතුර (බී ගන්නා) වළකින් හෝ ඌරු කොටුවකින් හෝ ගාලකින් හෝ ගවමඩුවකින් හෝ වළවැසිකිළියකින් හෝ නරක්වූ හෝ නොබඳිනලද කාණුවකින් හෝ වගා කිරීමක් සඳහා අවුරුදු පතා නිත්‍ය වශයෙන් පොර දමන ඉඩමකින් අඩුම ගණනේ අඩි සියයක් ඇතුළත කිසිම ළිඳක් හෑරීමට අවසර දීම හෝ ඒ සම්බන්ධයෙන් මොනම සැලැස් මක් වත් අනුමත කිරීම සභාපතිතු විසින් නොකළ යුතුය. එහෙත්, යටපස හෝ ජල මට්ටම හෝ වෙන යම්කිසි කරුණක් ගැන සලකා බලා විශේෂ තත්වයන් යටතේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතැනගේ උපදෙස් පිට යට කී දුර ප්‍රමාණයට අඩු දුරක් අනුමත කිරීමට සභාපතිහට බලය තිබේ.

3. බීමට හෝ ගෙදර දොරේ කටයුතුවලට වතුර ගන්නා ළිඳක සිට අඩි සියයකින් මෙපිට කිසිම තැනක කිසිවකු විසින්—

(අ) කසළ වළක් හෝ මලමුත්‍ර වළක් හෝ වැසිකිළි වතුර (බී ගන්නා) වළක් හෝ වළවැසිකිළියක් හෝ ගාලක් හෝ ගව මඩුවක් හෝ නොබඳින ලද කාණුවක් තැනීම හෝ තැනවීම හෝ තැනීමට ඉඩ දීම, නැතහොත්

(ආ) කිසිම පොර වර්ගයක් හෝ කුණුවෙන සතකු හෝ වෘක්ෂලතා දියව අයිනී කොළ ආදී දිරාපත්වන දේ තැන්පත් කිරීම හෝ තැන්පත් කරවීම හෝ තැන්පත් කිරීමට ඉඩ දීම, නැතහොත්

(ඇ) අඩුම ගණනේ හුණුනායකට වරක් වත් ඉවත් නොකරවන කැලිකසළ එකතුකරවීම හෝ එකතුවීමට ඉඩ දීම, නැතහොත්

(ඈ) කිසිම කාණුවක් නරක්වී තිබෙන්ට ඉඩ හැරීම,

නොකළ යුතුය.

4. බීමට හෝ ගෙදර දොරේ වෙන කටයුතුවලට වතුර ගන්නා ළිඳක් තිබෙන ඕනෑම ඉඩමක අයිතිකාරයා හෝ බදුකාරයා හෝ පදිංචිකාරයා විසින් නිතරම—

(1) (අ) කිසියම් දුරක සිට ළිඳ ඇතුළට කෙළින්ම දෝර යලා ඊම ;

(ආ) ළින් ගැට්ටේ සිට අඩි පහළොහකට අඩු දුරකින් දෝර ළිඳ ඇතුළට කාන්දුවීම ;

(ඇ) ළිඳ එක්කම ඊට යාබදව පිහිටි පොළෝ මට්ටමේ සිට අඩි දහයකට අඩු ගැඹුරින් ළිඳ ඇතුළට පොළෝ දිය කාන්දුවීම

වළකෙන තත්වයක ඒ ළිඳ තබාගැනීම හෝ අළුත්වැඩියා කොට තබා ගැනීමද

(2) ඒ ළිඳේ සිට අඩි 100කින් මෙපිට ඇති හැම කාණුවක්ම ශුද්ධ පවිත්‍රකොට කැඩුම් බිඳුම් නැතිව සවසථානුකූල තත්වයක තබා ගැනීමද

කළ යුතුය.

5. බීමට හෝ ගෙදර දොරේ වෙන කටයුතුවලට වතුර ගන්නා ළිඳ කින් වතුර ඇදීම පිණිස අපවිත්‍ර භාජනයක් කිසිවකු විසින් පාවිච්චි නොකළ යුතුය.

6. මහාජනයාගේ ප්‍රයෝජනයට වතුර ගන්නා ළිඳක සිට අඩි පහළොවකින් මෙබිමෙහි කිසිවකු විසින් රෙදි පිළි ආදිය නොසේදිය යුතුය.

7. බීමට හෝ ගෙදර දොරේ වෙන කටයුතුවලට වතුර ගන්නා ළිඳක් තිබෙන ඉඩමක අයිතිකාරයා හෝ බදුකාරයා හෝ පදිංචිකාරයා වෙත දැන්වීම් පතක් යවමින් ඒ දැන්වීමේ සඳහන් කාලපරිච්ඡේදය ඇතුළතදී ඒ ළිඳ ඉස ශුද්ධපවිත්‍ර කොට විෂබීජ විනාශ කිරීමටත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතැනගේ උපදේශය පරිදි මැනවයි තමාට සිතෙන වෙන යම් අලුත්වැඩියාවක් කිරීමටත් නියම කිරීම යෙහෙකැයි තමාට කල්පනාවෙන කොයි ප්‍රස්තාවයකදී වුවත් එසේ කිරීමට සභාපතිහට බලය ඇත්තේය. ඒ ඉඩමේ අයිතිකාරයා හෝ බදුකාරයා හෝ පදිංචිකාරයා විසින් ඒ දැන්වීමේ සඳහන් කාලපරිච්ඡේදය ඇතුළතදී ඒ නියමයන් පිළිපැදිය යුතුය.

8. ළිං පිළිබඳ මේ උපනීතිවලින් කවරක වුවත් ඇති විධිවිධාන කඩකරන ඕනෑම කෙනකු වරදක් කළා වියයුතුවාත් හැර වරදකාරයා බැව් ඔප්පු වූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකටද (හැතෙන බැව් ඔප්පු... අධිකරණ බලය ඇති) උසාවියකින් ඒ කඩකිරීම ගැන වරදකාරයකු කරනු ලැබූ පසු හෝ ඒ කඩකිරීම සිහිපත් කරවා සභාපතිතු විසින් බලය පවරනලද යම් නිලධාරියකු ලිඛිත දැන්වීමක් බාරදුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට නොවැඩි අතිරේක දඩයකටද යටත් විය යුතුය.

## XXIX වැනි කාණ්ඩය

### බැම්මක් බැඳලා නැති ළිං පිළිබඳ උපනීති

1. නගරසභාවේ පාලන සීමාව ඇතුළත පිහිටියාවූද යම්කිසි ළිඳක් තිබෙන්නාවූද ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් ඒ ළිඳ වටා පොළෝ මට්ටමේ සිට අඩුම ගණනේ අඩි තුනක් වත් උසට තාප්පයක් හෝ වෙන සුදුසු බැම්මක් බන්දවා ඒ තාප්පය හෝ බැම්ම කැඩුම් බිඳුම් නැතිව මනා තත්වයක තබාගත යුතුය.

2. හැම පාලු ළිඳක්ම පිහිටි ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් ඒ ළිඳ වැසීමට සභාපතිතුමගෙන් දැන්වීම් පතක් ලැබී මාසයක් ඇතුළතදී ඒ ළිඳ වසා දැමිය යුතුය.

3. මේ උපනීති මාලාවෙන් කවරක් වුවත් කඩකරන කවරෙකුට වුවත් රුපියල් පනහකට නොවැඩි දඩයක් ගැසීමෙන්ද ඒ කඩකිරීම ගැන වරදකාරයා බව ඔප්පුවූ පසු හෝ ඒ කඩකිරීම සිහිපත් කරවා සභාපතිතු හෝ ඔහු විසින් බලය පවරනලද නිලධාරියකු දැන්වීම් පතක් බාර දුන් පසු ඒ කඩකිරීම කරගෙන ගියොත් එසේ කඩකරන එක් එක් දවසට රුපියල් විසිපහකට නොවැඩි අතිරේක දඩයක් ගැසීමෙන්ද දඬුවම් දියහැකි විය යුතුය.

කෝට්ටේ-ගල්කිස්ස ගම්සභාව

පුස්තකාල සහායක තනතුර

අංක 168 සහ 1975. 06. 13 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ (IV වන කාණ්ඩයේ) පළවූ ඉහත සඳහන් තනතුර සඳහාවූ නිවේදනය ප්‍රකාර එම තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 1975. 10. 15 දින දක්වා දීර්ඝ කළ බව මෙයින් දන්වමි.

ලෙස්ලි රණසිංහ,
විශේෂ කොමසාරිස්,
කෝට්ටේ-ගල්කිස්ස ගම් සභාව.

1975 අගෝස්තු මස 28 දින,
කෝට්ටේ-ගල්කිස්ස ගම්සභා කාර්යාලය ය,
බොරලැස්ගමුව.

9-226—75.09.12 දින අංක 181 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

**පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

(261 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන සහ 4 වන වගන්ති යටතේ, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව මෙහි පහත දක්වා ඇති කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව ඒ පනතේ 2 වන වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවේ අන්තර්ගත විධිවිධාන ඇතුළත් කොට අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීමට (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 153 වන සහ 157 වන වගන්තිවලින් නගර සභාවලට බලය පැවරී ඇති අතර, පෙර එකී 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ පනතට අනුව එකී අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිගැනීමට ද බලය දෙනු ලැබේ.

ෆීලික්ස් ආර්. ඩ. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍ය.

1975 අගෝස්තු 05 වන දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධිතව 1972 මාර්තු මස 10 වන දින අංක 15,001 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවලින් අන්තිම වරට සංශෝධිත 1953 නොවැම්බර් මස 6 වන දින අංක 10,600 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XXIX වන කාණ්ඩයට ඉන් මතුවට පහත දැක්වෙන කාණ්ඩ එකතු කිරීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

XXX වන කාණ්ඩය

**සිනමා ශාලා තුළ දුම් පානය කිරීමට අදාළ අතුරු ව්‍යවස්ථා**

1. යම් සිනමා ශාලාවක හෝ නාට්‍ය ශාලාවක ප්‍රේක්ෂකාගාරය තුළ දී කිසිම තැනැත්තකු විසින් යම් නිශ්චිත කාලසීමාවක් ඇතුළත දුම්පානය නොකළ යුතු ය.

2. සෑම සිනමා ශාලාවක හෝ නාට්‍ය ශාලාවක බලපත්‍රධාරියා විසින්—

(අ) සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් උසින් අඟල් තුනකට නොඅඩු නොබැඳි අකුරෙන් පැහැදිලි ලෙස ලියූ "දුම්බීම තහනම්" යන වචන ඇතුළත් දැන්වීම් ප්‍රේක්ෂකාගාරය ඇතුළත ප්‍රකටව පෙනෙන ස්ථානවල ප්‍රදර්ශනය කළ යුතුය; තවද

(ආ) පැහැදිලි ලෙස ලියූ "ප්‍රේක්ෂකාගාරය ඇතුළත දුම්බීම තහනම්" යන වචන ඇතුළත් දැන්වීමක් ශාලාවේ පෙර හලේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතුය.

3. යම් නිශ්චිත කාලසීමාවක් තුළ දී ප්‍රේක්ෂකාගාරය ඇතුළත කිසිම ආකාරයකට දුම්කොළ විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම සිනමා ශාලාවක බලපත්‍රධාරියකු විසින් නොකළ යුතුය.

4. සිනමා ශාලා හා නාට්‍ය ශාලා තුළ දුම් පානය කිරීමට අදාළ යම් අතුරු ව්‍යවස්ථා කඩ කරනු ලබන සෑම අවස්ථාවක ම රුපියල් පනහක දඩයක් පැනවීමෙන් දඬුවම් කළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"සිනමා ශාලාව" යන්නෙන් සිනමැටෝග්‍රාපයක් හෝ මැජික් ලාන්තරුවක් හෝ එවැනි වෙනත් උපකරණයක් මාර්ගයෙන් පින්තූර දැක්වීමක රංගප්‍රයෝග මහජනයාට ප්‍රදර්ශනය කිරීම සඳහා (176 වන අධිකාරය වූ) ප්‍රසිද්ධ රැඟුම් දැක්වීමේ ආඥාපනත යටතේ සාදන ලද රීතිවලට අනුව බලපත්‍ර ලද ගොඩනැගිල්ලක් අදහස් වේ;

"නිශ්චිත කාල සීමාව" යන්නෙන් යම් මහජන ප්‍රදර්ශනයක් ආරම්භ කිරීමට විනාඩි තිහකට කලින් පටන් ගෙන එම මහජන ප්‍රදර්ශනය නිම වෙනතෙක් සමගම අවසන් වන කාලසීමාවක් අදහස් වේ;

"දුම්බීම" යන්නෙන් සුරුට්ටු, සිගරට්, බීඩි වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ දුම්කොළවක (පයිප්පයක) ගබ්ගුවක ආධාරයෙන් හෝ වෙනත් ආකාරයකින් දුම්කොළ පාවිච්චි කිරීම අදහස් වේ; තවද

"ප්‍රසිද්ධ රඟ දැක්වීම" යන්නට (176 වැනි අධිකාරය වූ) ප්‍රසිද්ධ රැඟුම් දැක්වීමේ ආඥාපනතෙහි ඒ සඳහා දී ඇති අර්ථයම වේ.

XXXI වන කාණ්ඩය

**පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. සභාව විසින් වෙළෙඳ පොළක් පිහිටුවනු ලැබිය හැකි අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් එය නම් කිරීම විස්තර කිරීම කළ හැකි ය.

2. (1) සභාපති විසින් හෝ සභාපතිගේ බලය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන්නකු හෝ එලෙස අවසර පත්‍රයක් දරන්නකුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු මිස වෙනත් කිසිම තැනැත්තකු විසින් පොළ පිහිටි භූමිය ඇතුළත කිසියම් කඩ පිලක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම හෝ වාසයට ගැනීම නොකළ යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් ම මෙහි I වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට අනුකූල විය යුතු අතර, එය නිකුත් කරන ලද දිනයට පමණක් වලංගු විය යුතු ය.

3. පොළ පිහිටි භූමිය ඇතුළත වූ කඩ පිලක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම සඳහා 2 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන සෑම තැනැත්තකු විසින් ම සභාපතිවරයා විසින් නියම කරනු ලබන ප්‍රමාණ අනුව ගාස්තුවක් ගෙවිය යුතු ය.

4. 3 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තු එකතු කර ගැනීම සඳහා සභාව විසින් නිලධරයකු යොදවනු නොලබන විට සභාව විසින් එම ගාස්තු එකතු කර ගැනීමේ අයිතිය—

(අ) පෞද්ගලික ගිවිසුමක් මගින්, හෝ

(ආ) වෙන්දේසි කැඳවීමෙන්, හෝ

(ඇ) ගාස්තුව එකතු කිරීමේ අයිතිය ප්‍රසිද්ධ වෙන්දේසියේ දැමීමෙන්,

සභාපතිවරයා විසින් අනුමත කරන ලද යම් තැනැත්තකුට බදු දිය හැකිය.

5. 2 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර දරන්නන් සහ ඔවුන්ගේ සේවකයන් හෝ නියෝජිතයන් අතර හෝ අවසර පත්‍ර දරන්නන් හෝ ඔවුන්ගේ සේවකයන් හෝ නියෝජිතයන් සහ මහජනයා අතර හෝ වෙළෙඳ පොළ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් කිසියම් ආරාවුලක් උද්ගතවන අවස්ථාවක සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ, රාජකාරියේ යෙදී සිටින කිසියම් නිලධාරියෙකු විසින් එම ආරාවුල පොළ පිහිටි භූමිය තුළදී නිරවුල් කළ හැකිය.

6. පොළ පිහිටි භූමිය තුළ සාමය පවත්වා ගැනීම, එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් පත් කරනු ලැබුවාවූද පොළ පිහිටි භූමිය තුළ රාජකාරියේ යෙදී සිටින්නාවූ ද නිලධරයකු විසින් කළ යුතුය.

7. බඩු විකිණීම සඳහා හෝ මිලදී ගැනීම සඳහා පොළට පැමිණෙන සෑම තැනැත්තෙකු විසින් ම කිසියම් ආරාවුලක් නිරවුල් කිරීම සඳහා හෝ සාමය ආරක්ෂා කිරීම සඳහා සභාවේ නිලධරයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් දෙනු ලබන යම් නීත්‍යානුකූල නියෝගයක් පිළිපැදිය යුතුය.

8. කිසිම තැනැත්තෙකු විසින් පොළ පිහිටි භූමිය ඇතුළත—

(අ) යම් සිඟමක් කරගෙන යාම;

(ආ) අධිනිහ අන්දමින් ගැටීම හෝ කිසියම් ශබ්දයක් හෝ කරදරයක් කිරීම හෝ වෙනත් යම් තැනැත්තෙකු සමග දබර කර ගැනීම හෝ අපහාසාත්මක, නින්දා සහගත හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම;

(ආ) සෞඛ්‍ය නිලධරයකු විසින් හෝ ග්‍රාම සේවක නිලධාරියකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් හෝ සභාපතිවරයාගේ බලය යටතේ කටයුතු කරන යම් තැනැත්තෙකු විසින් හෝ ස්ථානයෙන් ඉවත්ව යන ලෙස නියම කරනු ලැබීමෙන් අනතුරුව සැනෙන් ඒ පොළෙන් හෝ ස්ථානය ඇතුළතින් රැඳී සිටීම හෝ නිකරුණේ ගැවසීම;

(ඇ) පොළට පැමිණෙන තැනැත්තන්ගෙන් සිඟමන් ඉල්ලීම; හෝ

(ඈ) යම්කිසි ආගමක් දේශනා කිරීම හෝ ප්‍රසිද්ධ කථා පැවැත්වීම හෝ පොළට පැමිණෙන තැනැත්තන්ගෙන් ආයාධන මුදල් එකතු කිරීම

නොකළ යුතුය.

9. (1) සභාපතිවරයා විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ සභාපතිවරයාගේ බලය යටතේ ක්‍රියා කරන යම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු විසින්, ආහාර පිණිස නුසුදුසු යැයි තමාට පෙනී යන, වෙළඳ පොළ භූමිය ඇතුළත විකිණීම පිණිස තබා ඇති යම් ආහාර ද්‍රව්‍යයක් පරීක්ෂා කොට තහනමට ගැනීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන ඡේදය යටතේ තහනමට ගන්නා ලද යම් ද්‍රව්‍ය යක් ආහාරයට නුසුදුසු යැයි රජයේ වෛද්‍ය නිලධරයකු විසින් සහතික කරනු ලබන අවස්ථාවක ඒ ද්‍රව්‍ය තහනමට ගනු ලැබූවේ යම් තැනැත්තකුගේ සන්තකයෙන් ද ඒ තැනැත්තාට වන්දියක් නොගෙවා ඒ ද්‍රව්‍ය විනාශ කළ හැකිය.

10. (1) සභාපතිවරයා විසින් වෙළෙඳ පොළ පරිපාලනය කිරීම පිණිස පත් කරන ලද යම් නිලධරයකු හෝ තැනැත්තකු රාජකාරි යේ යෙදී සිටියදී කිසිම තැනැත්තකු විසින් ඔහුට විරුද්ධකම් කිරීම අවහිර කිරීම, බාධා කිරීම හෝ හිරිහැර කිරීම නොකළ යුතුය.

(2) ගාස්තු අයකර ගැනීම පිණිස සභාව විසින් පත් කරනු ලැබූ යම් තැනැත්තකු හෝ ගාස්තු අයකර ගැනීමේ අයිතිය බද්දට දී ඇති අවස්ථාවක එම බදු ගැනුම්කරු හෝ රාජකාරියේ යෙදී සිටියදී කිසිම තැනැත්තකු විසින් ඔහුට විරුද්ධකම් කිරීම, අවහිර කිරීම, බාධා කිරීම හෝ හිරිහැර කිරීම නොකළ යුතුය.

11. කිසිම තැනැත්තකු විසින්—

(අ) පොළ පැවැත්වෙන දිනයට පෙර දිනයෙහි ප. ව. 10 පෙර පොළ පිහිටි භූමිය ඇතුළත යම් මඩුවක් හෝ ආවරණයක් ඉදි කිරීම හෝ පැදුරු හෝ ගෝනි මිටි තැබීම; හෝ

(ආ) පොළ පැවැත්වෙන දිනයට පසු දින පෙ. ව. 9න් පසුව පොළ පිහිටි භූමිය තුළ යම් මඩු ආවරණ පැදුරු, ගෝනිමලු හෝ වෙනත් බඩු තැබීම

නොකළ යුතුය.

12 පොළ පැවැත්වෙන දිනයට පසු දිනයෙහි පෙ. ව. 10 පසුව පොළ පිහිටි භූමිය ඇතුළත ඉවත් නොකොට තිබෙන යම් මඩු, ආවරණ, පැදුරු, ගෝනිමලු හෝ වෙනත් බඩු සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයාගේ බලය යටතේ ක්‍රියා කරන සභාවේ සේවයේ නිලධරයෙකු විසින් ඉවත් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

13. මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් සම්බන්ධයෙන් කරනු ලබන සෑම වරදක් කිරීමක්ම රුපියල් එක් සියයකට වැඩි නොවන දඩයකින් දඬුවම් ලැබිය යුතු අතර, ඒ වරද සම්බන්ධයෙන්, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ ඊමෙන් පසුව හෝ ඊට නව කිරීම පිළිබඳව අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුව වරද දිගටම කරගෙන යන විට ඒ වරද දිගටම කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් විස්සකට නොවැඩි අතිරේක දඩයකින් ද දඬුවම් ලැබිය යුතුය.

## I වන උපලේඛනය

පාවිච්චි කිරීමේ බලපත්‍රය—ගෙවූ ගාස්තුව රු. :————

පොළ භාරකරු විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් මෙමින් කර දෙන ලද කඩ පිළගී හෝ ස්ථානයෙහි————සිට————දක්වා වූ කාලය ඇතුළත බඩු විකිණීම සඳහා————පදිංචි————වෙනු මෙයින් අවසර දෙනු ලැබේ.

සභාපති/බලයලත් නිලධාරී,
————නගර සභාව.

දිනය :————.

## XXXII වන කාණ්ඩය

### ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. කිසිම තැනැත්තෙකු විසින් කිසියම් වීදියක, පාරක, ඇලක හෝ පදික මගක සිට දෘෂ්‍යමාන වන පරිදි යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ කරවීම, ඒ සම්බන්ධයෙන් සභාපති විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ මිස, නොකළ යුතුය :

එසේ වුවද, මේ අතුරු ව්‍යවස්ථාවේ ඉහත කී විධිවිධාන පහත සඳහන් ප්‍රචාරක දැන්වීම්වලින් යම් කිසිවක් සම්බන්ධයෙන්, ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදීපන ප්‍රචාරක දැන්වීමක් හෝ ඉහළින් සවි කරන සැඟ දැන්වීමක් වෙතොත් මිස, අදාළ නොවිය යුතුය :—

(අ) එකතුවන ශුද්ධ ලාභ පුණ්‍යාධාර කටයුතු සඳහා යෙදවීම පිණිස පමණක්වනු ලබන විනෝද කටයුත්තකට අදාළ කෙරෙන යම් ප්‍රචාරක දැන්වීමක් ;

(ආ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනයට කොට තබා ඇති ස්ථානයේ පත්වනු ලබන යම් විනෝද කටයුත්තකට අදාළ යම් ප්‍රචාරක දැන්වීමක් ;

(ඇ) රජය මගින් ප්‍රදර්ශනය කෙරෙන යම් ප්‍රචාරක දැන්වීමක් ;

(ඈ) යම් ආගමික, දේශපාලන හෝ වෙනත් ප්‍රසිද්ධ රැස්වීමකට අදාළ වූ ප්‍රචාරක දැන්වීමක් ;

(ඉ) යම් ගොඩනැගිල්ලක ජනේලයක වූ ප්‍රචාරක දැන්වීමක් ;

(ඊ) "බද්දට දීමට තිබේ" යන වචන අඩංගු ප්‍රචාරක දැන්වීමක් ;

(උ) "විකිණීමට තිබේ" යන වචන අඩංගු ප්‍රචාරක දැන්වීමක් ;

(ඌ) යාග නාම තහඩුවක් ;

(එ) ප්‍රමාණයෙන් වර්ග අඩි එකකට වැඩි නොවන, වෘත්තීය කාර්ය සඳහා පාවිච්චි කෙරෙන නාම තහඩුවක් ;

(ඒ) වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන වාහනයක, ඒ වාහනය අයිතිකරුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ; සහ

(ඔ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කෙරෙන ස්ථානයේ පවත්වා ගෙන යනු ලබන වෙළඳාමකට හෝ ව්‍යාපාර කටයුත්තකට අදාළ ප්‍රචාරක දැන්වීමක්.

2. (1) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා කෙරෙන සෑම ඉල්ලීමක්ම ඒ දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයට යටත් පිරිසෙයින් දින හතකටවත් ප්‍රථම යෙන් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය :

එසේ වුවද, විශේෂ අවස්ථාවලදී මේ ඡේදය ඉහත සඳහන් විධිවිධානවල නියමිත කාල සීමාව තුළ ඉදිරිපත් කරනු නොලැබූ යම් ඉල්ලුම් පත්‍රයක් සභාපතිවරයා විසින් භාරගනු ලැබිය හැකිය.

(2) (1) වන ඡේදයේ සඳහන් සෑම ඉල්ලීමක් සමගම ඉල්ලුම් කරු විසින් ප්‍රචාරය කිරීමට බලාපොරොත්තු වන ප්‍රචාරක දැන්වීමේ පිටපතක් ද තිබිය යුතුය.

(3) (1) වන ඡේදයේ සඳහන් ඉල්ලීමක් සභාපතිවරයා විසින් අනුමත කරනු ලබන අවස්ථාවක සභාව විසින් නියම කර ඇති ප්‍රමාණ අනුව ගණන් බලන ලද ගාස්තුවක් ගෙවන ලෙස ඔහු විසින් ඉල්ලුම්කරුට විධාන කළ යුතුය. ඒ ගාස්තුව ගෙවන තෙක් එවැනි අවසර පත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් නොකළ යුතුය.

3. (1) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍ර යක් යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතකම අවසර පත්‍රයේ අංකය සහ දිනය සඳහන් කරන ලෙස; හෝ

(ආ) අවසර පත්‍රය සඳහා ගාස්තුව ගෙවූ බවට සළකුණක් වශයෙන් මුද්‍රා තැබීමේ කාර්යය සඳහා එම ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතක්ම සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට සලස්වන ලෙස

සභාපතිවරයා විසින් ඒ තැනැත්තාට විධාන කළ යුතුය.

4. (1) කිසිම තැනැත්තකු විසින්—

යම් ප්‍රචාරක දැන්වීමක් සභාපතිවරයා විසින් අනුමත කරන ලද ආකාරයට තනන ලද හෝ ගොඩනගන ලද තොරණ සංඥ දැන්වීමක් වෙතොත් මිස, ගොඩනැගිලි සීමාවෙන් තිරස් අතට කෙලින් මැනීමෙන් පසුව යම් වීථියක් හෝ පාරක් උඩින් අඩි හයකට වඩා දුර තෙරා යන ආකාරයට යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම ;

(2) පොළොවේ සිට අඩි විසි පහකට වඩා උස් වූ හෝ යම්කිසි වීථියක් හෝ පාරක් උඩින් තෙරා යන යම් දැන්වීම් පුවරුවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම.

(3) යම් වීථියකට හෝ පාරකට යාබද ගොඩනැගිල්ලක මුහුණත, ඒ මුහුණතේ සීමාවලින් පිටතට නෙරා සිටිනසේ දික් වූ නැතහොත් උසින් පදික වේදිකාවේ හෝ පොළොවේ මධ්‍ය සමතලයේ සිට සංඥාවේ යටි ප්‍රාන්තය දක්වා ඇති දුර ප්‍රමාණයෙන් ගතහොත් එකකට අඩ කිසිම තැනක් වැඩි වූ යම් වෙළඳ නාම සංඥාවක් සවි කිරීම හෝ එල්ලා තැබීමට සැලැස්වීම;

(4) සභාපතිවරයා විසින් අනුමත නොකරන ලද ආකාරයකට ඉහළින් සවි කරන සංඥා දැන්වීමක් සැදවීම හෝ ඉදි කරවීම

නොකළ යුතුය.

5. කිසිම තැනැත්තකු විසින් යම් පොදු පූජනීය ස්ථානයක, පොදු උද්‍යානයක හෝ වැසිකිළියක නැතහොත් යම් පාලමක, වීථියක, පහන් කණුවක, විදුලි සංඥා හෝ විදුලි පණිවුඩ කණුවක කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම නොකළ යුතුය.

6. කිසිම තැනැත්තකු විසින් යම් පාරකදී හෝ වීථියකදී ප්‍රචාරක කාර්යය සඳහා කිසියම් ශ්‍රවණ විදුලි යන්ත්‍රයක්, ග්‍රැමෆෝනයක්, සංගීත භාණ්ඩයක්, සීනුවක් හෝ වෙනයම් උපකරණයක් පාවිච්චි නොකළ යුතුය.

7. (1) යම් ප්‍රචාරක දැන්වීමක් සභාපතිවරයාගේ අදහසට අනුව අශෝභන හෝ නොතිසි තත්ත්වයක තිබේ නම් ඔහු විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නියමිත කාලය තුළ ඒ ප්‍රචාරක දැන්වීම ඉවත් කරන ලෙස එම ප්‍රචාරක ප්‍රදර්ශනය කරවන තැනැත්තා වෙත අණ කළ හැකිය.

(2) සභාපතිවරයා විසින් (1) වන ඡේදය යටතේ දැන්වීමක් යවනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින් ඒ දැන්වීමේ කාලය ඇතුළත දී ඒ දැන්වීම අනුව ක්‍රියා කළ යුතුය.

8. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් දැන්වීම් පුවරුවක අයිතිකරු හෝ බදුකරු විසින්—

(අ) එම දැන්වීම් පුවරුව නිසි පරිදි අළුත්වැඩියා කර සුරක්ෂිත තත්ත්වයක පවත්වා ගෙන යා යුතුය; තවද

(ආ) තමාගේ නම සහ ලිපිනය පහසුවෙන් කියවිය හැකි පැහැදිලි අකුරෙන් ඒ දැන්වීම් පුවරුවේ ඉදිරිපසින් ප්‍රකටව පෙනෙන ස්ථානයක පෙන්නුම් කළ යුතුය.

9. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ අවසර පත්‍රය සඳහා මුදල් ගෙවූ බවට සලකුණක් වශයෙන් සභාපතිවරයා විසින් එම දැන්වීමේ තබන ලද යම් සංඥාවක්, සලකුණක්, අකුරක්, වචනයක් හෝ ඉලක්කමක් මැකීම හෝ මකා දැමීමට සැලැස්වීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

10. කිසිම තැනැත්තකු විසින්—

(අ) සභාපතිවරයා විසින් අනුමත කරන ලද ආකාරයට වෙනස් ආකාරයකින් යම් ප්‍රචාරක දැන්වීමක් වාහනයක ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම; හෝ

(ආ) පොලිස් අධිකාරි විසින් අනුමත කරන ලද ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් හැර වෙන යම් ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් ඇතිව යම් වාහනයක් යම් වීථියක හෝ පාරක පදවා ගෙන යෑමට සැලැස්වීම

නොකළ යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලින් යම් විධිවිධානයක් කඩ කරමින් කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතුය; තවද කඩ කිරීම දිගටම සිදු කරන අවස්ථාවකදී එසේ වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කොට සභාපතිවරයා විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුව ඒ වරද සිදු කරන එක් එක් දිනය වෙනුවෙන් රුපියල් පහළොවකට නොවැඩි තවත් දඩයකට ද යටත් විය යුතුය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රචාරක දැන්වීම" යන්නට ප්‍රචාරක දැන්වීමක ස්වභාවයේ වූ හෝ ප්‍රචාරක දැන්වීමක කාර්යයන් සඳහා සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් පාවිච්චි කරනු ලබන්නා වූ ද, යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් මත තිබෙන්නා වූ ද නැතහොත් රඳවා ඇත්තා වූ ද, යම් වචනයක්, අකුරක්, අංකයක්, සංඥාවක්, දැන්වීම් පත්‍රයක්, පුවරුවක්, දැන්වීමක්, උපක්‍රමයක්, ආදර්ශනයක් හෝ නිරූපනයක් ඇතුළත් වේ;

"දැන්වීම් පුවරුව" යන්නෙන් යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ඉදි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන යම් ඉදි කිරීමක්, ආධාරකයක්, කණුවක්, පුවරුවක්, තාප්පයක්, පෙට්ටියක් හෝ වෙනත් උපක්‍රමයක් අදහස් වේ; තවද

"ඉහළින් සවි කරන සංඥා දැන්වීම" යන්නෙන් යම් වීථියක, මාර්ගයක, ඇලක හෝ පටු මගක යම් තැනක සිට බලනු විට සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් අහස පසුබිම කොට දෘශ්‍යමාන වන පරිදි යම් ඉඩමක, ගොඩනැගිල්ලක හෝ වෙනත් ඉදිකිරීමක හෝ එබන්දකට උඩින් යම් කණුවකට, විටකට, ද්වජයකට, රාමුවකට හෝ වෙනත් ආධාරයකට සවි කරන ලද ප්‍රචාරක දැන්වීමක කාර්යයන් සඳහා වූ යම් වචනයක්, අකුරක්, ආදර්ශනයක්, සංඥාවක්, උපක්‍රමයක් හෝ නිරූපනයක් අදහස් වන අතර සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් ප්‍රචාරක දැන්වීමක කාර්යයන් සඳහා යම් ඉඩමක, ගොඩනැගිල්ලක, ඉදි කිරීමක, වීථියක හෝ මාර්ගයක හෝ එබන්දකට උඩින් පාවිච්චි කරනු ලබන යම් බැලූනයක්, පැරෂූටයක්, වලෝලරයක් හෝ වෙනත් එබඳු උපක්‍රමයක් එයට ඇතුළත් වේ.

## XXXIII වන කොටස

### ගොඩනැගිලි සැලැස්මවලට අදාළ අතුරු ව්‍යවස්ථා

1. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන යෝජනා සම්මුතියක් මගින් සභාව විසින් නිශ්චය කරනු ලබන සහ මෙහි උපලේඛනයේ දක්වා ඇති සීමාව නොඉක්මවන ප්‍රමාණවලට අනුව නිර්ණය කරනු ලබන ගාස්තුවක් අලුත් ගොඩනැගිලි සඳහා හෝ පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා හෝ (268 වන අධිකාරය වූ) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලබන සැලැස්මවල් පරීක්ෂා කිරීම හා සලකා බැලීම සම්බන්ධයෙන්, ගෙවිය යුතුය.

2. 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තුව, සභාපතිගෙන් දැන්වීමක් ලැබුණු දින සිට දින හතක් ඇතුළත, අනුමතිය හෝ අවසරය සඳහා ඉල්ලීම ඉදිරිපත් කරන තැනැත්තා විසින් ගෙවිය යුතුය.

3. 1 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරනු ලැබූ ගාස්තුව ගෙවන තුරු කිසිම සැලැස්මක් පරීක්ෂා කිරීම හා සලකා බැලීම නො කළ යුතුය.

### උපලේඛනය

1. අළුත් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ අතිරේක බිම් ප්‍රමාණයක් එකතු කිරීම අවශ්‍ය වන දැනට පවතින ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා වූ සැලැස්මවල් සඳහා—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) සමස්ත බිම් ප්‍රමාණය වර්ග අඩි 600 කට වැඩි නොවන කල්හි ... ... | 5 | 0 |
| (ආ) සමස්ත බිම් ප්‍රමාණය වර්ග අඩි 600 කට වැඩි එහෙත්, වර්ග අඩි 1,000 කට වැඩි නොවන කල්හි ... ... | 10 | 0 |
| (ඇ) සමස්ත බිම් ප්‍රමාණය වර්ග අඩි 1,000 කට වැඩි එහෙත්, වර්ග අඩි 2,000 කට වැඩි නොවන කල්හි ... | 15 | 0 |
| (ඈ) ඊට අතිරේක සෑම වර්ග අඩි 1,000ක ඒකකයකට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| 2 අතිරේක බිම් ප්‍රමාණයක් එකතු කිරීම අවශ්‍ය නොවන දැනට පවතින ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා වූ සැලැස්මවල් සඳහා ... ... | 5 | 0 |
| 3. අළුත් සැලැස්මවල් ඉදිරිපත් නොකර අනුමතිය අළුත්කර ගැනීම සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පතක් වෙනුවෙන් ... ... | 5 | 0 |
| 4. ගොඩනැගිලි අවසර පත්‍රයක වලංගු කාලසීමාව දීර්ඝ කර ගැනීම සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පතක් වෙනුවෙන් ... ... ... | 3 | 0 |

මෙම උපලේඛනයේ "ගෙබිමේ ප්‍රමාණය" යන්නෙන්, බිම මහල යයි හෝ වෙනත් මාලයක බිම් ප්‍රමාණය අදහස් වේ.

9-208—75.09.12 දින අංක 181 දරණ ගැසට් පත්‍රය